# රාජ්‍ය මූල්‍ය කළමනාකරණ වාර්තාව 2024

මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

ශ්‍රී ලංකාව

2023 නොවැම්බර් 13

# රාජ්‍ය මූල්‍ය කළමනාකරණ වාර්තාව 2024

**රනිල් වික්‍රමසිංහ**
**මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය**

**2023 නොවැම්බර් 13**

2003 අංක 3 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම) පනත යටතේ, රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපාය පිළිබඳ ප්‍රකාශය - 2024 (4, 5 සහ 6 වගන්තිවලට අනුකූලව) සහ අයවැය ආර්ථිකය හා රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව - 2024 (7, 8 සහ 9 වගන්තිවලට අනුකූලව) ගරු මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමා විසින් නිකුත් කරනු ලැබේ.

**ISBN 978-624-5674-17-6**

කොළඹ 08, ආචාර්ය ඩැනිස්ටර් ද සිල්වා මාවත, අංක 118 දරන ස්ථානයේ පිහිටි රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව විසින් මුද්‍රණය කරන ලදුව, ශ්‍රී ලංකාවේ කොළඹ 01, මහලේකම් කාර්යාලයේ පිහිටි මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය විසින් පළ කරන ලදී.

පටුන


| | පිටු අංකය |
|---|---|
| මූලික ආර්ථික දර්ශක | vii |
| 2003 අංක 3 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම) පනත යටතේ ඉදිරිපත් කළ යුතු වාර්තා | viii |
| අනුකූලතාවය - 2023 | ix |
| රාජ්‍ය මූල්‍ය කළමනාකරණ වාර්තාව - 2024 | xi |
| **I කොටස** | |
| **රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපාය පිළිබඳ ප්‍රකාශය - 2024** | 3 |
| **01. මධ්‍යකාලීන රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපාය** | |
| 1.1 සමාලෝචනය | 7 |
| 1.2 මධ්‍යකාලීන රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපාය | 10 |
| **II කොටස** | |
| **අයවැය, ආර්ථිකය හා රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව - 2024** | 17 |
| **01. රාජ්‍ය මූල්‍ය උපනතීන්, භාණ්ඩාගාර මෙහෙයුම් සහ විදේශ මූල්‍යයනය** | |
| 1.1 සමාලෝචනය | 21 |
| 1.2 රජයේ ආදායම | 23 |
| 1.3 රජයේ වියදම | 40 |
| 1.4 භාණ්ඩාගාර මෙහෙයුම් | 43 |
| 1.5 විදේශ මූල්‍යයනය | 44 |
| **02. ආර්ථික උපනතීන්** | |
| 2.1 සමාලෝචනය | 53 |
| 2.2 ආර්ථික වර්ධනය | 53 |
| 2.3 මුදල් අංශයේ වර්ධනයන් | 61 |
| 2.4 කොටස් වෙළඳපොල | 63 |
| 2.5 විදේශ අංශයේ වර්ධනයන් | 64 |
| 2.6 ලෝක ආර්ථික සන්දර්භය | 67 |
| **03. රජය සතු වාණිජ ව්‍යවසායයන්හි කාර්යසාධනය** | |
| 3.1 සමාලෝචනය | 73 |
| 3.2 රජය සතු ප්‍රධාන ව්‍යවසායයන් දහය පිළිබඳ සමාලෝචනය | 73 |
| **04. 2024 අයවැය සැකසීම සඳහා පදනම් වූ සාධක** | 81 |

| වගු | | |
|---|---|---|
| | | පිටු අංකය |
| **I කොටස** | | |
| වගුව 1.1 | මධ්‍යකාලීන සාර්ව රාජ්‍ය මූල්‍ය රාමුව : 2023 - 2028 | 14 |
| **II කොටස** | | |
| වගුව 1.1 | රාජ්‍ය මූල්‍ය මෙහෙයුම් සාරාංශය | 22 |
| වගුව 1.2 | ඇස්තමේන්තුගත හා තත්‍ය ආදායම සහ වියදම - 2023 | 23 |
| වගුව 1.3 | රාජ්‍ය ආදායම් කාර්යසාධනයේ සාරාංශය | 24 |
| වගුව 1.4 | ආදායම් බදු කාර්යසාධනය | 25 |
| වගුව 1.5 | එකතු කළ අගය මත බදු කාර්යසාධනය | 26 |
| වගුව 1.6 | නිෂ්පාදන බදු/සුරාබදු කාර්යසාධනය | 27 |
| වගුව 1.7 | මෝටර් රථ වාහන ආනයන සහ නව ලියාපදිංචි කිරීම් | 28 |
| වගුව 1.8 | නිදහස් වෙළඳ ගිවිසුම් මගින් ආවරණය වන තීරු බදු සහන යටතේ ආනයනය/අපනයනය කරන ලද භාණ්ඩ හා වටිනාකම | 29 |
| වගුව 1.9 | ජාත්‍යන්තර වෙළඳාමෙන් ලද සෙස් බදු ආදායම | 29 |
| වගුව 1.10 | රාජ්‍ය ආදායමෙහි විචලතා විශ්ලේෂණය - 2023 ජනවාරි සිට සැප්තැම්බර් | 30 |
| වගුව 1.11 | රාජ්‍ය වියදම් කාර්යසාධනය | 40 |
| වගුව 1.12 | රජයේ සුරැකුම්පත් මත ගෙවන පොළී අනුපාතයන්හි සහ විනිමය අනුපාතයන්හි හැසිරීම (%) : 2022 ජනවාරි සිට 2023 සැප්තැම්බර් දක්වා | 41 |
| වගුව 1.13 | 2023 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා සුබසාධන වියදම් | 42 |
| වගුව 1.14 | රජයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශය | 43 |
| වගුව 1.15 | දළ දේශීය ණය - 2023 ජනවාරි සිට සැප්තැම්බර් | 44 |
| වගුව 1.16 | 2023 ජනවාරි 01 සිට සැප්තැම්බර් 30 දක්වා අදාල විදේශ මූල්‍යයන එකඟතා, අදාළ මූල්‍ය කොන්දේසි | 45 |
| වගුව 1.17 | එක් එක් සංවර්ධන පාර්ශවකරු විසින් 2023 ජනවාරි 1 සිට සැප්තැම්බර් 30 දක්වා සිදුකරන ලද ප්‍රතිලබ්ධි | 48 |
| වගුව 2.1 | ස්ථාවර (2015) මිල ගණන් අනුව ද.දේ.නි. යේ ආංශික සංයුතිය | 54 |
| වගුව 2.2 | සේවා අංශයේ තෝරාගත් දර්ශකයන් | 59 |
| වගුව 2.3 | සංචාරක අංශයේ කාර්යසාධනය | 60 |
| වගුව 2.4 | ද.දේ.නි. වර්ධනයේ ආංශික ව්‍යාප්තිය (%) | 61 |
| වගුව 2.5 | පාරිභෝගික මිළ දර්ශකය | 63 |
| වගුව 2.6 | ප්‍රාග්ධන වෙළඳපොළ වෙනස්වීම් | 64 |
| වගුව 2.7 | විදේශීය වෙළඳාම | 66 |
| වගුව 2.8 | තෝරගත් රටවල ප්‍රධාන ආර්ථික දර්ශක - 2023 (පුරෝකථනය) | 69 |
| වගුව 3.1 | විදුලි උත්පාදන සහ ධාරිතාවයේ සංයුතිය | 75 |
| වගුව 3.2 | රාජ්‍ය ව්‍යවසායයන් 52හි බද්දට පෙර ලාභය | 74 |
| වගුව 3.3 | රාජ්‍ය ව්‍යවසායන් වෙතින් ලද අය බදු/ ලාභාංශ ආදායම | 79 |

## රූපසටහන්

පිටු අංකය

### II කොටස

| | |
|---|---|
| රූපසටහන 1.1 මුළු ආදායම් සංයුතිය - 2023 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා | 24 |
| රූපසටහන 1.2 මූලාශ්‍ර අනුව මුළු බදු ආදායම - 2023 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා | 25 |
| රූපසටහන 1.3 නිෂ්පාදන බදු/සුරාබදු කාර්යසාධනය - 2023 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා | 27 |
| රූපසටහන 1.4 මූලාශ්‍ර අනුව දළ දේශීය ණය - 2023 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා | 44 |
| රූපසටහන 1.5 2023 ජනවාරි 1 සිට සැප්තැම්බර් 30 දක්වා සිදුවූ ප්‍රතිලබ්ධි-ප්‍රධාන ආර්ථික අංශ අනුව (එ.ජා.ඩො. මිලියන) | 49 |
| රූපසටහන 1.6 2023 සැප්තැම්බර් 30 වන විට පළකරන ලද එකඟතා අනුව ප්‍රතිලබ්ධි වීමට නියමිත ශේෂය එක් එක් සංවර්ධන පාර්ශවකරු අනුව (එ.ජා.ඩො. මිලියන) | 49 |
| රූපසටහන 1.7 2023 සැප්තැම්බර් 30 වන විට පළකරන ලද එකඟතා අනුව ප්‍රතිලබ්ධි වීමට නියමිත ශේෂය ප්‍රධාන ආර්ථික අංශ අනුව (එ.ජා.ඩො. මිලියන) | 49 |
| රූපසටහන 2.1 දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය | 53 |
| රූපසටහන 2.2 දළ දේශීය නිෂ්පාදිතයේ සංයුතිය - 2023 පළමු භාගය | 53 |
| රූපසටහන 2.3 කෘෂිකාර්මික අංශයේ සංයුතිය - 2023 පළමු භාගය | 56 |
| රූපසටහන 2.4 කර්මාන්ත අංශයේ සංයුතිය - 2023 පළමු භාගය | 57 |
| රූපසටහන 2.5 නිෂ්පාදන අංශයේ සංයුතිය - 2023 පළමු භාගය | 57 |
| රූපසටහන 2.6 සේවා අංශයේ සංයුතිය - 2023 පළමු භාගය | 58 |
| රූපසටහන 2.7 ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතය සහ සේවා වියුක්තිය | 60 |
| රූපසටහන 2.8 පොලී අනුපාත, මුදල් සමස්තයන් සහ පෞද්ගලික අංශයට ලබා දුන් ණයෙහි වර්ධනය | 62 |
| රූපසටහන 2.9 මතුපිට, මූලික සහ ආහාර උද්ධමනයේ විචලතා | 62 |
| රූපසටහන 2.10 වෙළඳ ශේෂය සහ විනිමය අනුපාත වෙනස් වීම් | 65 |
| රූපසටහන 2.11 අපනයන සංයුතිය | 66 |
| රූපසටහන 2.12 ආනයන සංයුතිය | 66 |

## විශේෂ සටහන්

| | |
|---|---|
| විශේෂ සටහන 1.1 ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ක්‍රියාමාර්ග : 2023 ජනවාරි සිට නොවැම්බර් 01 දක්ව | 33 |

## ඇමුණුම්

| | | |
|---|---|---|
| ඇමුණුම I | 2023 සැප්තැම්බර් 30 දිනට භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලද බැංකු ඇපකර හා සහන ලිපි ලැයිස්තුව | 87 |
| ඇමුණුම II | සාර්ව ආර්ථික දර්ශක | 89 |
| ඇමුණුම III | 2023 ආදායම් ඇස්තමේන්තු සඳහා පාදක වූ උපකල්පන | 96 |

# මූලික ආර්ථික දර්ශක

| දර්ශකය | කාලපරිච්ඡේදය | ඒකක | වටිනාකම | |
|---|---|---|---|---|
| | | | 2022 | 2023 |
| **මූර්ත අංශය** | | | | |
| ආර්ථික වර්ධනය | පළමු භාගය | % | -3.6 | -7.9 |
| කෘෂිකර්මාන්ත | පළමු භාගය | % | -6.2 | 2.2 |
| කර්මාන්ත | පළමු භාගය | % | -6.6 | -18.3 |
| සේවා | | % | 0.2 | -3.2 |
| උද්ධමනය (ලක්ෂ්‍යමය) (2013=100) | ඔක්. අවසානයට | % | 66.0 | 1.5[අ] |
| උද්ධමනය (සාමාන්‍ය) (2013=100) | ඔක්. අවසානයට | % | 38.3 | – |
| සේවා වියුක්ති අනුපාතය | දෙවන කාර්තුව | % | 4.6 | 5.2 |
| ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතය | දෙවන කාර්තුව | % | 50.1 | 48.6 |
| **රාජ්‍ය මූල්‍ය අංශය** | | | | |
| අයවැය හිඟය | ජන-සැප් | රු.බිලි. | -1,244 | -1,614 |
| මුළු ආදායම | ජන-සැප් | රු.බිලි. | 1,448 | 2,110 |
| බදු ආදායම | ජන-සැප් | රු.බිලි. | 1,283 | 1,934 |
| බදු නොවන ආදායම | ජන-සැප් | රු.බිලි. | 165 | 176 |
| මුළු වියදම | ජන-සැප් | රු.බිලි. | 2,695 | 3,732 |
| වර්තන වියදම් | ජන-සැප් | රු.බිලි. | 2,300 | 3,328 |
| රාජ්‍ය ආයෝජන | ජන-සැප් | රු.බිලි. | 418 | 443 |
| රාජ්‍ය ණය | ජූනි අවසානයට | රු.බිලි. | 24,264 | 26,916 |
| **විදේශ අංශය** | | | | |
| අපනයන | ජන-සැප් | ඇ.ඩො.මිලි. | 9,992 | 8,982 |
| කෘෂි අපනයන | ජන-සැප් | ඇ.ඩො.මිලි. | 1,940 | 1,945 |
| කාර්මික අපනයන | ජන-සැප් | ඇ.ඩො.මිලි. | 8,012 | 6,998 |
| රෙදිපිළි හා ඇගළුම් | ජන-සැප් | ඇ.ඩො.මිලි. | 4,577 | 3,689 |
| අනෙකුත් | ජන-සැප් | ඇ.ඩො.මිලි. | 3,435 | 3,309 |
| ආනයන | ජන-සැප් | ඇ.ඩො.මිලි. | 14,085 | 12,323 |
| පාරිභෝගික භාණ්ඩ | ජන-සැප් | ඇ.ඩො.මිලි. | 2,147 | 2,243 |
| අන්තර් භාණ්ඩ | ජන-සැප් | ඇ.ඩො.මිලි. | 9,497 | 8,105 |
| එයින් ඛනිජ තෙල් නිෂ්පාදන | ජන-සැප් | ඇ.ඩො.මිලි. | 3,694 | 3,476 |
| ආයෝජන භාණ්ඩ | ජන-සැප් | ඇ.ඩො.මිලි. | 2,433 | 1,963 |
| වෙළඳ ශේෂය | ජන-සැප් | ඇ.ඩො.මිලි. | -4,093 | -3,342 |
| සංචාරක පැමිණීම් | ජන-සැප් | සංඛ්‍යාව | 526,232 | 1,016,256 |
| සංචාරක ඉපයීම් | ජන-සැප් | ඇ.ඩො.මිලි. | 873 | 1,457 |
| සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ | ජන-සැප් | ඇ.ඩො.මිලි. | 2,574 | 4,345 |
| කොටස් වෙළඳපොල විවිධ ආයෝජනය (ශුද්ධ) | ජන-සැප්. | ඇ.ඩො.මිලි. | 138 | 11 |
| සමස්ත ගෙවුම් ශේෂය (BOP) | ජන-සැප් | ඇ.ඩො.මිලි. | -2,927 | 1,863 |
| දළ නිල සංචිත | සැප්. අවසානයට | ඇ.ඩො.මිලි. | 1,779 | 3,540 |
| විනිමය අනුපාතය (මාසය අග) | ඔක්. අවසානයට | ඇ.ඩො./රු. | 363.30 | 327.38 |
| විනිමය අනුපාතය (මාසික සාමාන්‍ය ) | ජන-ඔක් | ඇ.ඩො./රු. | 363.15 | 324.73 |
| **මූල්‍ය අංශය** | | | | |
| නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය (SDFR) | ඔක්. අවසානයට | % | 14.50 | 10.00 |
| නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය (SLFR) | ඔක්. අවසානයට | % | 15.50 | 11.00 |
| ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය (SRR) | සැප්. අවසානයට | % | 4.00 | 2.00 |
| වාණිජ බැංකුවල බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය අනුපාතිකය (සතිපතා) | සැප්. අවසානයට | % | 25.95 | 14.67 |
| භාණ්ඩාගාර බිල්පත් බරිත සමාන්‍ය ඵලදා අනුපාතිකය (දින 91) | සැප්. අවසානයට | % | 31.94 | 17.42 |
| භාණ්ඩාගාර බිල්පත් බරිත සමාන්‍ය ඵලදා අනුපාතිකය (දින 364) | සැප්. අවසානයට | % | 29.85 | 13.30 |
| මුදල් සැපයුම් වර්ධනය ($M_{2b}$) | 22 සැප්./23 සැප්. | % | 14.9 | 6.3 |
| පෞද්ගලික අංශයට ලබාදුන් ණයෙහි වර්ධනය | 22 සැප්./23 සැප්. | % | 11.0 | -5.4 |

[අ] පදනම් වර්ෂය (2021=100)

**2003 අංක 3 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම) පනත යටතේ ඉදිරිපත් කළ යුතු වාර්තා**

| වගන්තිය | අවශ්‍යතාව | අවශ්‍ය අන්තර්ගතය | අනුකූලතාවය |
| --- | --- | --- | --- |
| 4, 5 සහ 6 වගන්ති | රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපාය පිළිබඳ ප්‍රකාශය ඉදිරිපත් කිරීම* | රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය පිළිබඳ මහජන දැනුවත්භාවය ඉහළ නැංවීම සහ රජයේ රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපායේ භාවිතය ඇගයීම සඳහා සම්මතයක් ඇති කර ගැනීම සඳහා වන රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය | විසර්ජන පනත් කෙටුම්පත දෙවන වරට කියවන දිනයේ දී මහජනතාවට සහ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතුය. |
| 7, 8 සහ 9 වගන්ති | අයවැය, ආර්ථිකය හා රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව ඉදිරිපත් කිරීම* | රාජ්‍ය මූල්‍ය ක්‍රියාකාරීත්වය රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපායට සාපේක්ෂව ඇගයීම සඳහා අවශ්‍ය අයවැය, ආර්ථිකය හා රාජ්‍ය මූල්‍ය තත්ත්ව වාර්තාව | විසර්ජන පනත් කෙටුම්පත දෙවන වරට කියවන දිනයේ දී මහජනතාවට සහ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතුය. |
| 10, 11 සහ 12 වගන්ති | වසර මැද රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව ඉදිරිපත් කිරීම* | වසරේ පළමු මාස හතරට අදාලව රජයේ රාජ්‍ය මූල්‍ය ක්‍රියාකාරීත්වය පිළිබඳ නවතම තොරතුරු මහජනතාවට දැනගැනීමට සැලැස්වීම සහ රජයේ රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපායට සාපේක්ෂව රාජ්‍ය මූල්‍ය ක්‍රියාකාරීත්වය පිළිබඳව ඇගයීමක් සිදු කිරීමට හැකියාවක් ලබා දීම සඳහා වන, වසර මැද රාජ්‍ය මූල්‍ය තත්ත්ව වාර්තාව | අදාල වර්ෂයේ ජුනි මස අවසාන දිනට හෝ විසර්ජන පනත සම්මත වීමෙන් මාස හයක් ඉක්ම යාමට පෙර යන කාල පරිච්ඡේද දෙකෙන් පසුව එළඹෙන දිනට ප්‍රථම, මහජනතාවට නිකුත් කළ යුතුය. එම නිකුත් කිරීමේ දින සිට සති දෙකක කාලයක් තුළ මෙය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතුය. |
| 13, 14 සහ 15 වගන්ති | අවසාන අයවැය තත්ත්වය පිළිබඳ වාර්තාව ඉදිරිපත් කිරීම (වාර්ෂික වාර්තාව)* | පවත්නා වසරට අදාලව රජයේ රාජ්‍ය මූල්‍ය ක්‍රියාකාරීත්වය පිළිබඳ නවතම තොරතුරු මහජනතාවට දැන ගැනීමට සැලැස්වීම සහ රජයේ රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපායට සාපේක්ෂව ක්‍රියාකාරීත්වය පිළිබඳව ඇගයීමක් සිදු කිරීමට හැකියාවක් ලබා දීම සඳහා වන, අවසාන අයවැය තත්ත්වය පිළිබඳ වාර්තාව (වාර්ෂික වාර්තාව) | මුදල් වර්ෂය අවසාන වී මාස පහක් ඉක්මවා යාමට පෙර මහජනතාවට නිකුත් කර එම නිකුත් කිරීමේ දින සිට සති දෙකක කාලයක් තුළ මෙය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතුය. |
| 16, 17, 18 සහ 19 වගන්ති | පූර්ව මැතිවරණ අයවැය තත්ත්වය පිළිබඳ වාර්තාව ඉදිරිපත් කිරීම** | රටේ රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ නවතම තොරතුරු මහජනතාවට දැනගැනීමට සැලැස්වීම සඳහා වන පූර්ව මැතිවරණ අයවැය තත්ත්වය පිළිබඳ වාර්තාව | පාර්ලිමේන්තුවට මන්ත්‍රීවරුන් තෝරාපත් කර ගැනීම සඳහා මහ මැතිවරණයක් පැවැත්වීමට නියම කිරීමේ ප්‍රකාශයෙන් සති තුනක් ඇතුළත රටේ රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ තොරතුරු ඇතුළත් මැතිවරණ පූර්ව තත්ත්වය පිළිබඳ වාර්තාවක් මහජනතාව වෙත ඉදිරිපත් කළ යුතුය. නව පාර්ලිමේන්තුව රැස් කිරීමේ දින සිට සති දෙකක කාලයක් තුළ මෙය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතුය. |

* මුදල් ඇමතිවරයා විසින්

** මුදල් අමාත්‍යාංශයේ ලේකම් විසින්

- **අවසාන අයවැය තත්ත්වය පිළිබඳ වාර්තාව - මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ 2022 වාර්ෂික වාර්තාව**

  2022 වසරේ රාජ්‍ය මූල්‍ය හා ආර්ථික තත්ත්වය පිළිබඳ කරුණු ඉදිරිපත් කරමින් 2023 මැයි මස අවසන් වන විට මහජනතාවට නිකුත් කර 2023 ජුනි මස 20 වන විට එය පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලදී.

- **වසර මැද රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව - 2023**

  2023 වසරේ පළමු මාස හතරෙහි රාජ්‍ය මූල්‍ය හා ආර්ථික තත්ත්වය පිළිබඳ කරුණු ඉදිරිපත් කරමින් 2023 ජුනි මස අවසන් වන විට මහජනතාව වෙත ඉදිරිපත් කර 2022 ජුලි මස 18 දින වන විට එය පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලදී.

**රාජ්‍ය මූල්‍ය කලමනාකරණ වාර්තාව - 2024 හි පහත සඳහන් වාර්තා අන්තර්ගත වේ.**

- **රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපාය පිළිබඳ ප්‍රකාශය - 2024,** මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය ඉදිරිපත් කරන මෙම වාර්තාවේ, සමස්ත රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීමේදී වැදගත් ලෙස සළකනු ලබන පුළුල් රාජ්‍ය මූල්‍ය ක්‍රියාමාර්ගයන් දක්වමින් රජයේ ප්‍රධාන ක්‍රමෝපායික ප්‍රමුඛතාවයන් ඇතුලත් වේ. විසර්ජන පනත් කෙටුම්පත දෙවනවර කියවන දිනයේ මෙය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතුය.

- **අයවැය ආර්ථිකය හා රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව - 2024,** මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන මෙම වාර්තාවේ රජයේ ආදායම, වියදම සහ රජයේ ණය ගැනීම් යනාදියේ ඇස්තමේන්තු ඇතුලත් වන අතර, රජයේ රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපායට සාපේක්ෂව රජයේ මූල්‍ය ක්‍රියාකාරීත්වය ඇගයීමට පදනම් වන කරුණු ඇතුලත් වේ. විසර්ජන පනත් කෙටුම්පත දෙවනවර කියවන දිනයේ මෙය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතුය.

## රාජ්‍ය මූල්‍ය කළමනාකරණ වාර්තාව 2024

මෙම වාර්තාව කොටස් දෙකකින් සමන්විතය: **I** කොටස මඟින් රජයේ රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය - 2024 ඉදිරිපත් කරනු ලබන අතර; **II** කොටස මඟින් රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශයට සාපේක්ෂව රජයේ රාජ්‍ය මූල්‍ය කාර්යසාධනය ඇගයීම සඳහා වූ පදනමේ ප්‍රතිපාදන ඉදිරිපත් කෙරේ.

# I කොටස

## රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපාය පිළිබඳ ප්‍රකාශය - 2024

### 2003 අංක 3 දරන රාජ්‍ය මූල්‍ය කළමණාකරණ (වගකීම) පනතේ 4, 5 සහ 6 වගන්ති යටතේ ගරු මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් නිකුත් කරන ලදී.

2003 අංක 3 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම) පනතේ 4, 5 සහ 6 වගන්ති අනුව විසර්ජන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවේ දී දෙවන වර කියවන දිනයේදී මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් රජයේ රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපාය පිළිබඳ ප්‍රකාශය මහජනතාවට සහ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු වන අතර ඒ අනුව මෙම වාර්තාව ඉදිරිපත් කරනු ලැබේ.

අයවැය සඳහා පදනම් වූ පුළුල් ක්‍රමෝපායික ප්‍රමුඛතාවයන් සහ රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපාය හා සමස්ත රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ දී වැදගත් විය හැකි යැයි රජය විසින් සලකනු ලබන ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ක්‍රියාමාර්ග මෙමෙ වාර්තාව මඟින් පැහැදිලි කරනු ලබයි.

# මධ්‍යකාලීන රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපාය 01

1.1 සමාලෝචනය

ශ්‍රී ලංකා ඉතිහාසයෙහි දරුණුතම ආර්ථික අර්බුදයෙහි අභියෝග සමනය කිරීම සඳහා පුළුල් ප්‍රතිසංස්කරණ සහ ප්‍රතිපත්තිමය මැදිහත්වීම් ඔස්සේ රජය විසින් නිවැරදි කිරීම සඳහා ගන්නා ලද ක්‍රියාමාර්ග හේතුවෙන් 2022 වසර අවසානය වන විට ආර්ථිකය ස්ථාවරත්වයට පත්වීමෙහි ආරම්භක සළකුණු පිළිඹිබු කරන්නට විය. ප්‍රධානතම ප්‍රතිපත්තිමය මැදිහත්වීම්වලින් එකක් ලෙස, 2023 වසරේ මාර්තු මස 20 වන දින ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි සිව් අවුරුදු විස්තීරණ ණය පහසුකම් වැඩසටහනට රජය ඇතුළත් වීම දැක්විය හැක. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල මඟින් සහය දක්වනු ලබන වැඩසටහනෙහි අරමුණු අතරට සාර්ව ආර්ථික ස්ථාවරත්වය සහ ණය තිරසරභාවය ප්‍රතිෂ්ඨාපනය කිරීම, මූල්‍ය අංශයෙහි ස්ථාවරත්වය සුරක්ෂිත කිරීම, පාලනය ශක්තිමත් කිරීම, සමාජ ආරක්ෂණ ජාල වැඩසටහන් සුරක්ෂිත කිරීම සහ ආර්ථික වර්ධනය ඉහළ නැංවීම ආදිය ඇතුළත් වේ. කෙසේ වුවද, දීර්ඝ කාලයක් තිස්සේ පවතින එනමුත් මෙතෙක් නොසලකා හරින ලද සාර්ව ආර්ථික අසමතුලිතතාවයන් තවදුරටත් උග්‍ර වන අවදානම් මධ්‍යයේ ආර්ථිකය ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්වෙමින් පවතින බැවින් ද, සාර්ව ආර්ථික ස්ථායිතාවය ස්ථාපනය කිරීමට තව බොහෝ කාලයක් ගතවන බැවින් ද ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහනට අඛණ්ඩව අනුකූල වීම අත්‍යාවශ්‍ය වේ. ආර්ථික අර්බුදය නිවැරදි කිරීමේ ප්‍රබල ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීමත් සමඟ සාර්ව ආර්ථිකයෙහි ප්‍රධාන අංශයන්හි කැපී පෙනෙන වර්ධනයන් නිරීක්ෂණය විය. පුළුල් පරාසයක විහිදුණු රාජ්‍ය ආදායම ඉහළ නැංවීමේ සහ රාජ්‍ය වියදම් කළමනාකරණය කිරීමේ ක්‍රියාමාර්ග අනුගමනය කිරීම හේතුවෙන්, 2023 වසරේ පළමු මාස නවය තුළ රු. බිලියන 123.8 ක සැළකිය යුතු ප්‍රාථමික අතිරික්තයක් ශ්‍රී ලංකාව ළඟා කර ගන්නා ලද අතර, එය 2022 වසරේ දී දළ දේශීය නිශ්පාදිතයෙහි (ද.දේ.නි.යෙහි) ප්‍රතිශතයක් ලෙස සියයට 3.7 ක් වූ ප්‍රාථමික හිඟයට සාපේක්ෂව කැපී පෙනෙන වර්ධනයකි.

උද්ධමනය මැඩපැවැත්වීම සඳහා ගන්නා ලද තීරණාත්මක මුදල් ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ගවල ප්‍රතිඵලයක් ලෙස, කොළඹ පාරිභෝගික මිල දර්ශකයට අනුව උද්ධමනය 2022 වසරේ සැප්තැම්බර් මස පැවති සියයට 70 ක උපරිම අගයක සිට 2023 වසරේ ඔක්තෝබර් මස අවසානය වන විට සියයට 1.5 ක තනි ඉලක්කමක් දක්වා අඩු විය. විදේශ මුදල් ද්‍රවශීලතාව ඉහළ යාම හේතුවෙන් ශ්‍රී ලංකා රුපියලෙහි අගය ඇමෙරිකානු ඩොලරයට සාපේක්ෂව අධිප්‍රමාණය වීමට ආරම්භ වූ අතර 2023 ඔක්තෝබර් මස අවසානයේ දී ඇමෙරිකානු ඩොලරයක් සඳහා ශ්‍රී ලංකා රුපියලෙහි අගය 327ක ස්ථාවර වීමට ප්‍රථම 2023 මැයි මාසය අවසානයේදී 296 ක් දක්වා අධිප්‍රමාණය විය. ශ්‍රමික ප්‍රේෂණ ප්‍රබල ලෙස යථා තත්ත්වයට පත්වීම, අපනයනවලින් ලද ආදායම අර්ධ වශයෙන් යථා තත්වයට පත් වීම සහ සංචාරක අංශයේ ඉපැයීම් ක්‍රමානුකූලව ඉහළ යාම හේතුවෙන් දළ නිල සංචිත ප්‍රමාණය වර්ධනය වීමට ආරම්භ විය. දළ නිල සංචිත ප්‍රමාණය 2022 වසර අවසානය වන විට පැවති ඇ.ඩො. මිලියන 1,896 සිට 2023 වසරේ සැප්තැම්බර් මස අවසානය වන විට ඇ.ඩො. මිලියන 3,530 ක් දක්වා වැඩි විය. කෙසේ වුවද, 2022 වසරේ පළමු භාගයේ දී වාර්තා වූ සියයට 3.6 ක ආර්ථික වර්ධනයෙහි සංකෝචනයෙන් අනතුරුව, 2023 වසරෙහි පළමු භාගයේ දී තවදුරටත් සියයට 7.9 ක ආර්ථිකය සංකෝචනයක් වාර්තා කරමින් ආර්ථික වර්ධනය තවදුරටත් යටපත් විය. ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය වැනි අනාගතය ගැන පුරෝකථනය කිරීමට යොදා ගත හැකි ඉහළ සංඛ්‍යාතයකින් යුත් දර්ශකවල දත්ත මඟින් 2023 වසරෙහි තුන්වන කාර්තුවේ සිට ධනාත්මක ආර්ථික වර්ධනයක් කරා යථා තත්ත්වයට පත්වීමක් පිළිඹිබු කරයි.

ආර්ථික වර්ධනය සඳහා වන ඉදිරි දැක්ම දුර්වල මට්ටමක පැවතිය ද, 2023 වසරේ පළමු භාගයේදී ලෝක ආර්ථිකය බලාපොරොත්තු වූවාට වඩා අහිතකර තත්ත්වයන්ට ඔරොත්තු දෙනු ඇතැයි පුරෝකථනය කර ඇත. අපේක්ෂිත මට්ටමට වඩා අඩු මට්ටමකින් චීනය යථා තත්ත්වයට පත්වීම, දිගුකාලීන වශයෙන් පවතින උද්ධමනය, ඉහළ පොළී අනුපාත, භූ දේශපාලනික ආතතීන් සහ තිරසාර නොවන ලෙස ඉහළ මට්ටමක පවතින ගෝලීය රාජ්‍ය ණය ලෝක ආර්ථික වර්ධනයෙහි අඩු කාර්යසාධනයට පාදක වූ හේතු වේ. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් 2023 ඔක්තෝබර් මාසයේ දී ප්‍රකාශයට පත් කරන ලද ලෝක ආර්ථික ඉදිරිදැක්මට (World Economic Outlook) අනුව, ලෝක ආර්ථිකය 2023 වසරේ දී සියයට 3.0 කින් වර්ධනය වීමෙන් පසු, එහි වර්ධනය 2024 වසරේ දී සියයට 2.9 ක් දක්වා අඩු වනු ඇතැයි අපේක්ෂා කරන අතර මෙය ශ්‍රී ලංකා ආර්ථිකය කෙරෙහි ද බලපෑමක් ඇතිකරනු ඇත.

නොනිසි කාලයේ දී ක්‍රියාත්මක වූ ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග පිළිබඳව කටයුතු කරමින්, ව්‍යුහාත්මක දුර්වලතාවයන් නිවැරදි කරමින් සහ බදු ක්‍රමය සහ බදු පරිපාලනය නැවත යථා තත්ත්වයට පත් කිරීම සඳහා සංශෝධන ඇතුළත් කරමින් රාජ්‍ය ආදායම ඉහළ නැංවීම සඳහා වන ප්‍රතිසංස්කරණ හඳුන්වා දෙන ලදී. 2022 වසරේ ජූනි මාසයේ දී එකතු කල අගය මත බදු අනුපාතය සියයට 8 සිට සියයට 12 දක්වා ඉහළ නැංවීම, ඉන් අනතුරුව 2022 වසරේ සැප්තැම්බර් මාසයේ දී සියයට 15 දක්වා ඉහළ නැංවීම, 2022 වසරේ ඔක්තෝබර් මාසයේ සිට බලපැවැත්වෙන පරිදි එකතු කළ අගය මත බදු සඳහා ලියාපදිංචි වීමේ සීමාව රු. මිලියන 300 සිට රු. මිලියන 80 දක්වා අඩුකිරීම මෙම ප්‍රධාන බදු ප්‍රතිසංස්කරණවලට ඇතුළත් විය. 2022 වසරේ ඔක්තෝබර් මාසයේ සිට ක්‍රියාත්මක වන

පරිදි ආංශීය වශයෙන් විශේෂිත සංස්ථාපිත ආදායම් බදු නිදහස් කිරීම් සහ සහනදායී අනුපාත ඉවත් කරන අතරම සංස්ථාපිත ආදායම් බද්ද සඳහා වන සම්මත බදු අනුපාතය සියයට 24 සිට සියයට 30 දක්වා ඉහළ නංවන ලදී. 2023 වසරේ ජනවාරි මාසයේ මුල සිට ක්‍රියාත්මක වන පරිදි, අත්තිකාරම් පුද්ගල ආදායම් බදු අනුපාත වර්ෂයකට සෑම රුපියල් 500,000 ක් සඳහාම සියයට 6 සිට සියයට 36 දක්වා වැඩි වන පරිදි සංශෝධනය කරන ලද අතර, අත්තිකාරම් පුද්ගල ආදායම් බදු නිදහස් සීමාව වසරකට රු. මිලියන 3 සිට වසරකට රු. මිලියන 1.2 දක්වා අඩු කිරීම, ලාභාංශ හැර අනෙකුත් සියළුම ගෙවීම් සඳහා අනිවාර්යය අවසානාත්මක නොවන රඳවා තබා ගැනීමේ බද්දක් හඳුන්වාදීම සහ ලාභාංශ සඳහා අවසානාත්මක රඳවා තබා ගැනීමේ බද්දක් හඳුන්වා දීම සිදු කරන ලදී.

කෙසේ වුවද, ආර්ථික ක්‍රියාකාරකම් මන්දගාමී වීම, අපේක්ෂිත මට්ටමට වඩා වැඩි වේගයකින් සිදුවන නිර්උද්ධමනය, ඉහළ රාජ්‍ය ආදායමක් ලබාගත හැකි අයිතම ආනයනය සීමා කිරීම, විනිමය අධිප්‍රමාණය වීම සහ බදු පරිපාලනය ආශ්‍රිත අඩුපාඩු හේතුවෙන් රාජ්‍ය ආදායම් ඉහළ නැංවීම තවමත් එහි පූර්ණ විභවතාවයට ලඟා වී නොමැත. 2025 වසර වන විට ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස බදු ආදායම අවුම තරමින් සියයට 14 දක්වා ඉහළ නැංවීමේ අරමුණ ඇතිව, එකතු කළ අගය මත බද්දට අදාලව නිෂ්පාදන සඳහා විශේෂිත වූ නිදහස් කිරීම් සියල්ලම පාහේ ඉවත් කිරීම සහ සරල කරන ලද එකතු කළ අගය මත බදු ක්‍රමය අහෝසි කිරීමට පියවර ගන්නා අතරතුර එකතු කළ අගය මත බදු ආපසු ගෙවීම සඳහා ශක්තිමත් ක්‍රමවේදයක් ස්ථාපනය කිරීම තුළින් එකතු කල අගය මත බදු පද්ධතියට තවදුරටත් ප්‍රතිසංස්කරණ හඳුන්වා දීම මගින් 2024 වසර සහ ඉන් ඔබ්බට රාජ්‍ය ආදායම ඉහළ නැංවීම සඳහා රජය කැපවීමෙන් යුතුව කටයුතු කරමින් සිටියි. මීට අමතරව, රජය ධන බද්ද සැළසුම් කිරීමේ ක්‍රියාවලියක නිරත වී සිටින අතර, 2025 වසරේ දී එම බද්ද ක්‍රියාත්මක වීමට නියමිතයි. මෙම ප්‍රතිසංස්කරණ මඟින් රාජ්‍ය ආදායම ඉහළ නැංවීම සඳහා වඩාත් ප්‍රගතිශීලී ක්‍රියාමාර්ග හඳුන්වා දෙන අතරම, බදු පදනම වඩාත් පුළුල් කිරීම ද අරමුණු කරනු ලබයි. තවද, රාජ්‍ය ආදායම ඉහළ නැංවීමේ ක්‍රියාමාර්ගවලට රුකුලක් ලෙස ආදායම් එකතු කිරීමේ ආයතනවල ආයතනික ප්‍රතිසංස්කරණ කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් බදු පරිපාලනය ශක්තිමත් කිරීම කෙරෙහි රජය අවධානය යොමු කර ඇත.

2022 වසරේ ජූනි මාසයේ සිට රාජ්‍ය ආදායම ඉහළ නැංවීමේ ප්‍රධාන ක්‍රියාමාර්ග ක්‍රියාවට නැංවීමත් සමග රුපියලෙහි අගය අවප්‍රමාණය වීම සහ උද්ධමනයෙහි බලපෑම සංකලනය වීම හේතුවෙන් 2022 වසරෙහි මුල් මාස නවය තුළ දී රු. බිලියන 1,450.4 ක් වූ ප්‍රදාන ද ඇතුළත් වූ රාජ්‍ය ආදායම සියයට 46.1 කින් 2023 වසරේ සමාන කාලපරිච්ඡේදයේ දී රු. බිලියන 2,118.7 ක් දක්වා වැඩි විය. ආදායම් බද්දෙන් ලද ආදායම 2022 වසරේ පළමු මාස නවය තුළ ලද රු. බිලියන 431.8 සිට 2023 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළදී සියයට 53.7 කින් රු. බිලියන 663.6 දක්වා වැඩි විය. මෙය වාර්ෂික ආදායම් ඇස්තමේන්තුවෙන් සියයට 72.8 ක ආදායම් ලඟා කර ගැනීමක් සනිටුහන් කරන ලදී. අත්තිකාරම් පුද්ගල ආදයම් බද්ද/උපයන විට ගෙවීම් බද්ද මගින් ලද ආදායම සියයට 497.8 කින් රු. බිලියන 107.0 තෙක් වැඩිවීම සහ රඳවා තබා ගැනීමේ බද්ද මඟින් ලද ආදයම සියයට 672.7 කින් රු. බිලියන 110.4 තෙක් වැඩිවීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. 2023 වසරේ මුල් මාස නවය තුළ එකතු කළ අගය මත බද්ද මගින් ලද ආදායම සියයට 62.6 කින් රු. බිලියන 505.0 තෙක් ඉහළ යාම සහ අළුතින් හඳුන්වා දෙන ලද සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද මඟින් රු. බිලියන 158.4 ක් ලැබීම පිළිබිඹු කරමින් භාණ්ඩ හා සේවා මත බදු මඟින් ලද ආදායම 2022 වසරේ පළමු මාස නවය තුළ වූ රු. බිලියන 597.6 සිට සියයට 68.1 කින් රු. බිලියන 1004.3 ක් දක්වා වැඩි විය. කෙසේ වුවද, විදේශ වෙළෙඳාම මත බදු මඟින් ලද ආදායම 2022 වසරේ මුල් මාස නවය තුළ වූ රු. බිලියන 254.0 සිට 2023 වසරේ සමාන කාල පරිච්ඡේදය තුළ සියයට 4.7 කින් රු. බිලියන 266.0 දක්වා සුළු වශයෙන් වර්ධනය විය. වරාය සහ ගුවන්තොටුපොළ සංවර්ධන බද්ද සහ සෙස් බද්ද ඉවත් කිරීම සඳහා ප්‍රතිපත්තිමය තීරණයක් ගැනීම සහ විදේශ සංචිත මත වන පීඩනය අවම කිරීම සඳහා ආනයන සීමා කිරීම, විනිමය අධිප්‍රමාණය වීම, සහ 2023 වසරේ මුල් භාගය තුළ ගෝලීය භාණ්ඩ මිල පහළ මට්ටමක පැවතීම, සළකා බලන කාලය තුළ විදේශ වෙළෙඳාම මත බදුවල පහළ කාර්යසාධනයට ප්‍රධාන වශයෙන්ම හේතු විය. බදු නොවන ආදායම 2022 වසරේ මුල් මාස නවය තුළ ලද රු. බිලියන 165.1 සිට 2023 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ සියයට 6.9 කින් රු. බිලියන 176.5 දක්වා වැඩි විය. මෙය වාර්ෂික ආදායම් ඇස්තමේන්තුවෙන් සියයට 63.5 ක් ළඟා කර ගැනීමක් සනිටුහන් කරන ලදී.

රාජ්‍ය ආදායම ඉහළ නැංවීමේ ක්‍රියාමාර්ගවලට සමගාමීව, ඉහළ ගුණාත්මක තත්ත්වයෙන් යුත් ප්‍රතිඵල ලබා දෙන වියදම් සිදු කිරීම පිළිබඳ වැඩි අවධානයක් යොමු කිරීම සහ රාජ්‍ය ආයෝජනයන්හි වැය කළ පිරිවැයට නිසි වටිනාකමක් ලැබෙන බව (value for money) තහවුරු කිරීම සඳහා වියදම් කළමනාකරණය කිරීමේ ක්‍රියාමාර්ග රජය මඟින් අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී. මහා භාණ්ඩාගාරය විසින් 2022 වසරේ අප්‍රේල් මාසයේ සිට නිකුත් කරන ලද චක්‍රලේඛ ගණනාවක් මඟින් හදිසි නොවන ප්‍රාග්ධන වියදම් හා පුනරාවර්තන වියදම් කපා හැරීම සඳහා වන ක්‍රියාමාර්ග ක්‍රියාවට නංවන ලදී. කෙසේ වුවද, විශාල වශයෙන් පොළී වියදම් ඉහළ යාම හේතුවෙන් 2022 වසරේ මුල් මාස නවය තුළ පැවැති රු. බිලියන 2,694.8 ක්වූ රාජ්‍ය වියදමට සාපේක්ෂව 2023 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ රාජ්‍ය

වියදම සියයට 38.5 කින් රු. බිලියන 3,732.3 ක් දක්වා වැඩි විය. ඒ අනුව, වාර්ෂික ඇස්තමේන්තුව වන රු. බිලියන 5,819.0 න් සියයට 64.1 කට ළඟා වෙමින්, රාජ්‍ය වියදම ඇස්තමේන්තුගත වියදම සඳහා වන නියමිත මාර්ගයේ ගමන් කරමින් පවතී. පුනරාවර්තන වියදම්, 2022 වසරේ මුල් මාස නවයෙහි වූ රු. බිලියන 2,300.2 ට සාපේක්ෂව 2023 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ සියයට 44.7 කින් රු. බිලියන 3,327.7 ක් දක්වා වැඩි විය. පොළී ගෙවීම් 2022 වසරේ මුල් මාස නවය තුළ රු. බිලියන 927.4 සිට 2023 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ සියයට 87.3 කින් රු. බිලියන 1,737.3 ක් දක්වා වැඩි විය. 2022 වසරේ මුල් මාස නවයට සාපේක්ෂව 2023 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දේශීය වශයෙන් වන පොළී ගෙවීම් සියයට 101.6 කින් වැඩි වීමත් සමඟ පොළී ගෙවීම් සම්පූර්ණ වසර සඳහා වන ඇස්තමේන්තුවෙන් සියයට 79.2 කට ළඟා විය. 2022 වසර මූලාරම්භයේ සිට රුපියල අවප්‍රමාණය වීම සහ ඉහළ උද්ධමනය සංකලනය වීමෙහි ප්‍රතිඵලයක් ලෙස, භාණ්ඩ හා සේවා මත වියදම 2022 වසරේ මුල් මාස නවය තුළ වූ රු. බිලියන 118.1 සිට 2023 වසරේ දී රු. බිලියන 208.7 ක් දක්වා සියයට 76.8 කින් වැඩි විය.

2026 වසර සහ ඉන් ඔබ්බට ද.දේ.නි. යෙහි ප්‍රතිශතයක් ලෙස අයවැය හිඟය ක්‍රමයෙන් සියයට 5 ට අඩු මට්ටමක් දක්වා අඩු කර පවත්වා ගැනීමට රජය අපේක්ෂා කරයි. රාජ්‍ය ආදායම සහ රාජ්‍ය වියදම අතර පරතරය මෑත වසරවල දී සැලකිය යුතු ලෙස පුළුල් විය. බොහෝ දුරට අනම්‍ය සහ අභිමතානුසාරී නොවන රාජ්‍ය වියදම ද.දේ.නි. යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 18 ත් 20 ත් අතර අගයක් ගන්නා අතර, එම අගය සමාන ආදායමක් ලබන සහ කලාපීය රටවල් සමඟ සැසඳීමේ දී ඉහළ අගයක නොපවතියි. එබැවින්, අයවැය හිඟය ඉහළ නැංවීමට හේතු වූයේ රාජ්‍ය ආදායම් තියුණු ලෙස පහළ වැටීම යි. මෙහි ප්‍රතිඵලයක් ලෙස 2020 වසරේ සිට එක දිගට වසර තුනක් සඳහා අයවැය හිඟය ද.දේ.නි. යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 10 ට වඩා වැඩි අගයක් වාර්තා කරන ලදී. 2022 වසරේ ජූනි මාසයේ සිට ආරම්භ කරන ලද ආදායම පදනම් කරගත් රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ප්‍රයත්නයන් අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමත් සමඟ අයවැය හිඟය ද.දේ.නි. යෙහි ප්‍රතිශතයක් ලෙස 2023 වසරේ දී සියයට 8.7 ක සහ 2024 වසරේ දී ද.දේ.නි. යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 7.6 ක තනි ඉලක්කමක අගයක් ලෙස පවත්වා ගැනීමට රජය අපේක්ෂා කරයි. අයවැය හිඟ යෙහි නාමික අගය 2022 වසරේ මුල් මාස නවය තුළ පැවැති රු. බිලියන 1,244.4 සිට 2023 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 1,613.6 ක් දක්වා පුළුල් විය. 2022 වසරේ මුල් මාස නවය තුළ වාර්තා වූ රු. බිලියන 317.0 ක ප්‍රාථමික හිඟයට සාපේක්ෂව 2023 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ ප්‍රාථමික ශේෂය රු. බිලියන 123.8 ක අතිරික්තයක් බවට පත් විය. වැඩි දියුණු වූ රාජ්‍ය ආදයම 2023 වසරේ ප්‍රාථමික හිඟය ඉලක්කය වන රු. බිලියන 209 ක අගය වෙත ලඟා කර ගැනීමට උපකාරී වනු ඇත. 2023 වසර සහ ඉන් ඔබ්බට ප්‍රාථමික හිඟය අඩු කිරීමට අපේක්ෂා කල ද සැලකිය යුතු ලෙස ඉහළ පොළී ගෙවීම් හේතුවෙන් සමස්ත ශේෂය ඉහළ අගයක පවතිනු ඇත. කෙසේ වුවද, මධ්‍ය කාලීන වශයෙන්, ණය ප්‍රතිව්‍යුහගත කිරීම අවසන් කර ආදායම් මත පදනම් වූ රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය සම්පූර්ණයෙන් ස්ථාපිත වීමත් සමඟ සමස්ත ශේෂය අඩු වනු ඇතැයි අපේක්ෂා කෙරේ. ජාත්‍යන්තර මූල්‍ය වෙළෙඳපොළ සඳහා වන සීමිත ප්‍රවේශය හේතුවෙන් අයවැය හිඟය මූල්‍යකරණය සඳහා රජය දැඩි ලෙස දේශීය මූලාශ්‍ර මත රඳා පැවතුණි. 2023 වසරේ මුල් මාස නවය තුළ අයවැය හිඟය පියවීම සඳහා ශුද්ධ දේශීය මූල්‍යකරණය රු. බිලියන 1,516.8 ක් සහ ශුද්ධ විදේශීය මූල්‍යකරණය රු. බිලියන 96.7 ක් විය.

2022 වසර අවසානයේ දී පැවති රු. බිලියන 27,492.0 ක සිට පියවීමට ඇති මධ්‍යම රජයේ සමස්ත ණය ප්‍රමාණය 2023 වසරේ ජූනි මස අවසානයේ දී සියයට 2.1 කින් රු. බිලියන 26,916.2 ක් දක්වා අඩු විය. 2023 වසරේ ජූනි මස අවසානය වන විට පියවීමට ඇති සමස්ත දේශීය ණය ප්‍රමාණය සියයට 6.2 කින් රු. බිලියන 15,961.4 ක් දක්වා වැඩි වූ අතර පියවීමට ඇති සමස්ත විදේශීය ණය ප්‍රමාණය සියයට 12.1 කින් රු. බිලියන 10,954.8 ක් දක්වා අඩු විය. ඉහළ සහ තිරසාර නොවන මට්ටමක ණය පැවතීම හේතුවෙන්, දේශීය සහ විදේශීය යන ණය දෙවර්ගයම ප්‍රතිව්‍යුහගත කිරීම අත්‍යවශ්‍ය බව ශ්‍රී ලංකාව හඳුනා ගන්නා ලදී.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි විස්තීරණ ණය පහසුකම් වැඩසටහන අනුමත වීමෙන් අනතුරුව දේශීය විදේශ විනිමය වෙළෙඳපොලේ ද්‍රවශීලතාවය අඛණ්ඩව වැඩි දියුණු වීම මුදල් මූල්‍යකරණය අඩුවීම සහ විශ්වාසය වර්ධනය වීම හේතුවෙන් 2023 ජනවාරි - මැයි කාලය තුළ ශ්‍රී ලංකා රුපියල ඇමෙරිකානු ඩොලරයට සාපේක්ෂව සියයට 22 කට වඩා කැපී පෙනෙන ලෙස අධිප්‍රමාණය වීමක් පෙන්නුම් කරන ලදී. කෙසේ වුවද, ඉන් අනතුරුව 2023 වසරේ මැයි සහ අගෝස්තු කාලය තුළ මුදල් ඒකකය සියයට 8 කින් පමණ ක්‍රමයෙන් අවප්‍රමාණය විය. දේශීය ණය ප්‍රශස්තකරණයෙන් අනතුරුව ශුද්ධ නිරාවරණ තත්ත්වය ශුන්‍ය කිරීම සඳහා බැංකු අංශය වෙළෙඳපොලින් අමතර විදේශ විනිමය මිලදී ගැනීම හේතුවෙන් ගෙවුම් ශේෂයේ මූල්‍ය ගිණුම මත දේශීය ණය ප්‍රශස්තකරණයෙහි තාවකාලික බලපෑම් බොහෝ දුරට මෙයට හේතු විය.

උද්ධමනය මැඩ පැවැත්වීමේ අරමුණ ඇතිව ශ්‍රී ලංකා මහ බැංකුව 2022 වසරේ දී සමුච්චිත පදනම් අංක 950 කින් සහ 2023 වසරේ මාර්තු මාසයේ දී තවත් පදනම් අංක 100 කින් ප්‍රතිපත්ති පොළී අනුපාත ඉහළ නංවන ලදී. උද්ධමනය අඩු වීම හමුවේ ප්‍රතිපත්ති පොළී අනුපාත 2023 වසරේ ජූනි මාසයේ දී පදනම් අංක 250 කින් අඩු කරන ලද අතර 2023 වසරේ ජූලි මාසයේ දී තව දුරටත් පදනම් අංක 200 කින් හා ඔක්තෝබර් මාසයේ දී පදනම් අංක 100 කින් පහත හෙළමින් ශ්‍රී ලංකා මහ බැංකුව මුදල් ප්‍රතිපත්තිය ලිහිල් කරන ලදී. ඒ අනුව, නිත්‍ය ණය පහසුකම් අනුපාතය සියයට 12 ක් වන අතර, නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතය සියයට 11 ක් වේ.අඩු ඉල්ලුම සහ උද්ධමන අපේක්ෂාවන් නැවත ඉලක්කගත කිරීම මධ්‍යයේ,

උද්ධමනය ඉලක්කගත මධ්‍යම තනි ඉලක්කම් අගයක පවතිනු ඇතැයි පුරෝකථනය කර ඇත. මුදල් මූල්‍යකරණය ඉවත් කිරීම සහ උද්ධමනය ඉලක්කගත කිරීම පිළිබඳව නීති සම්පාදනය, මධ්‍ය සහ දිගුකාලීන වශයෙන් උද්ධමනය ඉලක්කගත මට්ටම්වල පවත්වා ගැනීමට උපකාරී වනු ඇත.

මෙම සන්දර්භය තුළ, ඉහතින් සඳහන් කළ පුළුල් ප්‍රතිසංස්කරණ සහ ප්‍රතිපත්තිමය මූල පිරිම් ක්‍රියාත්මක කිරීමත් සමග 2025 වසර වන විට සහ ඉන් අනතුරුව එළඹෙන වසරවල දී ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 2.3 ක ප්‍රාථමික අතිරික්තයක් පවත්වා ගැනීමට රජය අපේක්ෂා කරයි. ඵලදායි ලෙස ආදායම් ඉහළ නංවාලීමේ ක්‍රියාමාර්ග සහ සුපරික්ෂාකාරී අයුරින් වියදම් කළමනාකරණය කිරීමේ ක්‍රියාමාර්ග ඔස්සේ මේ ඉලක්කය ලඟා කර ගැනීමට කටයුතු කරනු ඇත. ආර්ථික ස්ථාවරත්වය යථා තත්ත්වයට පත් කිරීම සඳහා නියමිත කාලය තුළ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීරණ ණය පහසුකම පිළිබඳ වැඩසටහන අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමට සහ එහි පරාමිතීන් සාක්ෂාත් කර ගැනීමට රජය කැප වී සිටියි. දැනටමත් ක්‍රියාත්මක කර ඇති රාජ්‍ය ආදායම ඉහළ නැංවීමේ ක්‍රියාමාර්ග අඛණ්ඩව පවත්වාගෙන යාම, දැනට පවතින ආදායම් ක්‍රියාමාර්ග හා සමගාමීව නව ප්‍රතිසංස්කරණ හඳුන්වා දීම, බදු පදනම සහ බදු අනුකූලතාවය ශක්තිමත් කිරීම, සහ බදු ගෙවීමෙන් වැලකීම අවම කිරීම, බදු පැහැර හැරීම සහ ආදායම් නිසි පරිදි ලබා නොග ැනීම අවම කිරීම සඳහා ආදයම් පරිපාලනය කිරීමේ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම ආදිය රජයෙහි මෙම කැපවීම සම්බන්ධ ක්‍රියාමාර්ග අතරට ඇතුළත් වේ. මීට අමතරව, රාජ්‍ය ණය තිරසරභාවය නැවත ඇති කිරීම සඳහා ණය ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලිය කඩිනම් කිරීම, රාජ්‍ය වියදම්වල ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා වියදම් කළමනාකරණ පියවර අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම සහ අවදානමට ලක්විය හැකි කණ්ඩායම් ආරක්ෂා කිරීම සඳහා සමාජ ආරක්ෂණ ජාලය තවදුරටත් ශක්තිමත් කිරීම ආදියෙහි රජය නියැලී සිටියි. එමෙන්ම, රජය සතු ව්‍යවසායයන්ගෙන් පැන නඟින රාජ්‍ය මූල්‍ය අවදානම් මැඩපැවැත්වීම සඳහා රජය සතු ව්‍යවසායයන් ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩසටහන් රජය අඛණ්ඩව ක්‍රියාත්මක කරයි. තවද, අධ්‍යාපනය, සෞඛ්‍ය, සමාජ ආරක්ෂණය, ඩිජිටල්කරණය, දේශගුණික විපර්යාස අවම කිරීම සහ හරිත ආර්ථිකය වැනි තීරණාත්මක මෙන්ම ප්‍රමුඛතා අංශවල වියදම් පවත්වාගෙන යාම සහතික කිරීමට රාජ්‍ය ආයෝජන ප්‍රමුඛතාගත කරනු ඇත.

### 1.2 මධ්‍යකාලීන රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපාය

2003 අංක 3 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනත සහ එම පනතට පසු කාලීනව සිදු කරන ලද සංශෝධන මගින් රජයෙහි රාජ්‍ය මූල්‍ය මෙහෙයුම් පාලනය වේ. රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනත යටතේ අයවැය හිඟය සඳහා වන ඉලක්ක, ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස මධ්‍යම රජයෙහි ඇපකර සහ රජයෙහි සමස්ත වගකීම් ආදී රාජ්‍ය මූල්‍ය රීති රාජ්‍ය මූල්‍ය මෙහෙයුම් තිරසාර ලෙස පාලනය කළ හැකි වන පරිදි සකස් කර ඇත. කෙසේ වුවද, ඉතිහාසයේ කවරදාකවත් රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනත යටතේ දක්වන ලද රාජ්‍ය මූල්‍ය රීති සතුටුදායක අයුරින් අපේක්ෂා කළ පරිදි අනිවාර්යයෙන්ම අනුකූල නොවීය. 2003 වසරේ දී ප්‍රකාශයට පත් කරන ලද ඉලක්ක වෙනස් කරමින් 2013, 2016 සහ 2021 යන වසරවල දී රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනත යටතේ දක්වන ලද රාජ්‍ය මූල්‍ය රීති සංශෝධනය කරන ලදී. මෙහි ප්‍රතිඵලයක් ලෙස රාජ්‍ය මූල්‍ය මෙහෙයුම් විචක්ෂණශීලී ලෙස කළමනාකරණය කිරීම තහවුරු කිරීම පිණිස අනිවාර්යයෙන්ම අනුකූල නොවූ රාජ්‍ය මූල්‍ය රීතින් මඟින් සත්‍ය වශයෙන්ම බලපෑමක් නොවීය. රාජ්‍ය මූල්‍ය අසමතුලිතතාවයන් තුරන් කිරීම සහ රාජ්‍ය මූල්‍ය විනය ප්‍රතිෂ්ඨාපනය කිරීම සඳහා අනිවාර්යයෙන්ම අනුකූල වූ රාජ්‍ය මූල්‍ය රීති පැවතීමේ වැදගත්කම වටහා ගනිමින් නව රාජ්‍ය මුදල් කළමනාකරණ නීතිය බලාත්මක කිරීමේ ප්‍රයත්නයක රජය නියැලී සිටියි. මෙම නව නීතිය මගින් පවතින රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනත අවලංගු වනු ඇති අතර 2025 වසර සඳහා වන අයවැයේ සිට ක්‍රියාත්මක වන පරිදි නව රාජ්‍ය මූල්‍ය රීති රාමුවක් ස්ථාපිත කරනු ඇත. රජයෙහි ප්‍රතිසංස්කරණ වැඩසටහනට සමගාමීව අයවැය සකස් කිරීම මෙන්ම අයවැය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් උපායමාර්ගික මග පෙන්වීමක් ලබා දීම සඳහා රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපාය පිළිබඳ නව ප්‍රකාශයක් (Fiscal Strategy Statement) ප්‍රකාශයට පත් කිරීමට තීරණය කර තිබේ. දැනට රජය මෙම රාජ්‍ය මූල්‍ය උපායමාර්ග ප්‍රකාශය සැකසීමේ ක්‍රියාවලියෙහි නිරතව සිටින අතර 2024 වසරේ ජූනි මස අවසානය වන විට මෙය ප්‍රකාශයට පත් කිරීමට නියමිතය.

රජයේ ප්‍රධාන මධ්‍ය කාලීන රාජ්‍ය මූල්‍ය අරමුණු වන්නේ ප්‍රධාන වශයෙන් ආදායම් මත පදනම් වූ රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය සහ වියදම් කළමනාකරණය තුළින් රාජ්‍ය මූල්‍ය විනය නැවත ස්ථාපනය කිරීම ඉලක්ක කර ගන්නා අතරම සමාජයේ වඩාත්ම ආන්තික හා අවදානමට ලක්විය හැකි කොටස්වල යහපැවැත්ම සහතික කිරීම සහ ඉහළ ගුණාත්මක තත්ත්වයෙන් යුත් ප්‍රාග්ධන වියදම් පවත්වාගෙන යාම තුළින් දිගු කාලීන ආර්ථික වර්ධනය සඳහා අනුබලයක් සැපයීමයි. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි විස්තීරණ ණය පහසුකම් වැඩසටහන මඟින් සහය දක්වන ආර්ථික ප්‍රතිසංස්කරණ වැඩසටහන හා සමගාමීව දක්වා ඇති රාජ්‍ය මූල්‍ය ඉලක්ක සපුරා ගැනීමට රජය සම්පූර්ණයෙන්ම කැපවී සිටී. ඒ අතුරින්, 2022 වසරේ ජූනි මස 1 වනදා සිට හඳුන්වා දුන් ඉතා පුළුල් රාජ්‍ය ආදායම වැඩි දියුණු කිරීමේ ප්‍රතිසංස්කරණවල සහාය ඇතිව, 2025 වසර සහ ඉන් ඔබ්බට ද.දේ. නි.

යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 2.3 කට වඩා වැඩි ප්‍රාථමික අතිරික්තයක් වෙත ලඟා වීම ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ඉලක්කවලින් එකක් වේ. මෙම ඉලක්කය ලඟා කරගැනීම සඳහා ප්‍රදානද ඇතුළු රාජ්‍ය ආදයම 2023 වසරේ දී ද.දේ.නි. යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 10.1 ක්, 2024 වසරේ දී ද.දේ.නි. යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 13.1 ක් සහ 2025 වසරේ දී ද.දේ.නි. යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 15.0 ක අගයකට ඉහළ නැංවීමටත් මධ්‍යකාලීන වශයෙන් රාජ්‍ය වියදම ද.දේ.නි. යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 20.0 ක පවත්වා ගැනීමටත් එමඟින් අයවැය හිඟය 2023 වසරේ දී ද.දේ.නි.යෙන් සියයට 8.7 ක්, 2024 වසරේ දී ද.දේ.නි.යෙන් සියයට 7.6 ක් සහ 2025 වසරේ දී ද.දේ.නි.යෙන් සියයට 5.3 ක් ලෙස පාලනය කිරීමට අපේක්ෂා කෙරේ.

මෑතකදී ක්‍රියාත්මක කරන ලද බොහෝමයක් ප්‍රතිසංස්කරණ ක්‍රියාමාර්ග ආර්ථිකයේ බොහෝ ක්ෂේත්‍රවල ප්‍රකෘතිමත් වීමේ ආරම්භක සලකුණු සනිටුහන් කර තිබේ. කෙසේ වුවද, රාජ්‍ය මූල්‍ය අවකාශයට ආවේණික වූ ඉතා තදින් මුල් බැස ගත් ව්‍යුහාත්මක ගැටළු සැලකිල්ලට ගනිමින්, මැදි ආදායම් ලබන රටක් සඳහා සුදුසු මට්ටමේ රාජ්‍ය ආදායම් සහ වියදම් සහිත තිරසාර අයවැය ශේෂයක් ස්ථාපිත කිරීම සඳහා තවදුරටත් ක්‍රියාමාර්ග ක්‍රියාවට නැංවීම අත්‍යාවශ්‍ය වේ. ආදායම ඉහළ නැංවීමේ ක්‍රියාමාර්ග අතර, බදු පදනම පුළුල් කිරීම සඳහා අවශ්‍ය බදු පරිපාලනයෙහි පවතින අඩුපාඩු මඟහැර ගැනීම සහ අවශ්‍ය ආයතනික ප්‍රතිසංස්කරණ සිදු කිරීම තුළින් බලාත්මක කිරීම ඉහළ නැංවීම ආදායම් පරතරය පියවා ගැනීම සඳහා ඉතා වැදගත් වේ. මීට අමතරව, රාජ්‍ය මූල්‍ය තිරසරභාවය නැවත ස්ථාපනය කිරීම සහ රාජ්‍ය මූල්‍ය විනය ශක්තිමත් කිරීම සඳහා පිරිවැය නිරූපිත බලශක්ති මිලකරණයෙහි අඛණ්ඩව නියැලීම සහ රාජ්‍ය ණය තිරසාරභාවය යථා තත්ත්වයට පත් කිරීම සඳහා ස්වෛරී ණය ප්‍රතිව්‍යුහගත කිරීම අත්‍යවශ්‍ය වේ. වර්තමානයේ දී, 2023 වසරේ පළමු මාස නවය තුළ පොලී ගෙවීම සඳහා වන පිරිවැය රාජ්‍ය ආදායමෙන් සියයට 82 ක් පමණ පරිභෝජනය කර ඇති බැවින් රාජ්‍ය මූල්‍ය අවකාශය අතිශයින් සීමා වී ඇති අතර ඒ හේතුවෙන් වැටුප්, කුලී , විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ගෙවීම් වැනි අනිවාර්ය ගෙවීම් සිදු කිරීම අභියෝගාත්මක වී ඇත. මේ අනුව, ක්‍රමෝපායික වශයෙන් වැදගත් අංශවල වැඩි වශයෙන් රාජ්‍ය ආයෝජන සිදු කිරීම සඳහා මධ්‍ය කාලීන වශයෙන් රාජ්‍ය මූල්‍ය අවකාශය පුළුල් කිරීම අත්‍යවශ්‍ය වේ. පුද්ගලික අංශය මගින් මෙහෙයවනු ලබන දිගුකාලීන ආර්ථික වර්ධනය වැඩි දියුණු කිරීම සඳහා තිරසාර උසස් ගුණාත්මක තත්ත්වයෙන් යුතු රාජ්‍ය ආයෝජන තීරණාත්මක වනු ඇති අතර එය අනෙක් අතට, රාජ්‍ය මූල්‍ය සහ ණය තිරසාරභාවය යන අංශ දෙකෙහිම අත්‍යවශ්‍ය අංගයකි.

**1.2.1 රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපාය**

රජයේ මධ්‍ය කාලීන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය සකස් කර ඇත්තේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් සහාය දක්වනු ලබන ප්‍රතිසංස්කරණ වැඩසටහන යටතේ දක්වා ඇති රාජ්‍ය මූල්‍ය ඉලක්ක මත පදනම්වය. මේ සඳහා අවශ්‍ය ආයතනික ප්‍රතිසංස්කරණ සමඟින් ආදායම් මත පදනම් වූ රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ඉලක්ක සපුරා ගැනීමට රජය දැඩි ලෙස කැපවී සිටී. මෙම අපේක්ෂා සහගත ආදායම් ඉහළ නැංවීමේ ප්‍රයත්නයන්, පාලනය වැඩි දියුණු කිරීම සහ දූෂණ අවදානම අවම කිරීම, සමාජ ආරක්ෂණ ජාල වැඩසටහන් ශක්තිමත් කිරීම, මිල ස්ථායීතාවය නැවත ඇති කිරීම, මූල්‍ය ස්ථාවරත්වය ආරක්ෂා කිරීම, විදේශීය සංචිත යළි ගොඩනැගීම සහ පුළුල් ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ හරහා ශ්‍රී ලංකාවේ වර්ධන විභවය විවෘත කිරීම ආදී ක්‍රියාමාර්ගවලින් සමන්විත වේ.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමග එකඟ වූ ණය තිරසාර ඉලක්ක, බාහිර ණය ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා නිල ණය හිමියන් සහ වාණිජ ණය හිමියන් සමග අඛණ්ඩව සාකච්ඡා සිදු කිරීම ඔස්සේ සාක්ෂාත් කර ගැනීමට අපේක්ෂා කෙරේ. මූල්‍ය පද්ධතියේ ස්ථායීතාවය ආරක්ෂා කරමින් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් නියම කර ඇති ණය පහත හෙලීමේ ඉලක්කවලට අනුකූල වන පරිදි දේශීය ණය ප්‍රශස්තකරණ වැඩසටහනේ ප්‍රධාන කොටස් දැනටමත් අවසන් කර ඇත. එලෙස, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි විස්තීරණ ණය පහසුකම් වැඩසටහන යටතේ එකඟ වූ පුළුල් ආර්ථික ප්‍රතිසංස්කරණ පැකේජය ක්‍රියාත්මක කිරීමට රජය කැපවී සිටින අතර, වැඩසටහන් පරාමිතීන්වල සඳහන් රාජ්‍ය මූල්‍ය ඉලක්ක මත පදනම්ව රජයෙහි රාජ්‍ය මූල්‍ය උපායමාර්ගය දක්වා ඇත.

2023-2028 කාලපරිච්ඡේදයට අදාළ රාජ්‍ය මූල්‍ය තිරසාරභාවය ප්‍රතිෂ්ඨාපනය කිරීම සඳහා වන ගමන් මග පහතින් දක්වා ඇත.

**රාජ්‍ය මූල්‍ය ගමන් මග**

- මූලික බදු කෙරෙහි අවධානය යොමු කරමින් පදනම් පුළුල් කිරීම, බදු ක්‍රමය සරල කිරීම, බදු පරිපාලනය සහ අනුකූලතාව වැඩිදියුණු කරන අතරම බදු පැහැර හැරීම හා බදු ගෙවීම වැළක්වීම ඩිජිටල්කරණය හරහා මග හැරීම වැනි වඩා හොඳ ආදායම් ඉහළ නැංවීමේ ප්‍රයත්නයන් තුළින් 2025 වසර වන විට සහ ඉන් අනතුරුව එළඹෙන වසරවල දී ද.දේ. නි.යෙන් සියයට 2.3 ක ප්‍රාථමික අතිරික්තයක් ළඟා කර ගැනීම.

- ඉලක්කගත ආදයම ඉහළ නැංවීම සඳහා සහය දක්වනු ලබන දැනට ක්‍රියාවට

නංවන ලද ආදායම් ක්‍රියාමාර්ග අඛණ්ඩව පවත්වාගෙන යාම, දැනටමත් ක්‍රියාත්මක කර ඇති ආදායම් වැඩිදියුණු කිරීමේ ප්‍රයත්නයන් සම්පූර්ණ කිරීම සඳහා අතිරේක ප්‍රගතිශීලී ආදායම් පියවර හඳුන්වාදීම තුළින් 2025 වසර සහ ඉන් ඔබ්බට ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස ආදායම අවම වශයෙන් සියයට 15 ට ඉහළ නැංවීම.

- බදු අනුකූලතාව ශක්තිමත් කිරීම සඳහා වන ආදායම් පරිපාලන ප්‍රතිසංස්කරණ ඩිජිටල්කරණය, ආයතනික ප්‍රතිසංස්කරණ, වැඩිදියුණු කරන ලද අවදානම් මත පදනම් වූ විගණනය, ආදායම් එකතු කරන ප්‍රධාන ආයතන සඳහා ප්‍රධාන කාර්ය සාධන දර්ශක (KPI) හඳුන්වාදීම සහ දත්ත විශ්ලේෂණ ආදිය කෙරෙහි අවදානය යොමු කරමින් ප්‍රමුඛතාගත කරනු ලැබේ. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සඳහා ප්‍රමුඛතා ප්‍රතිසංස්කරණ ක්ෂේත්‍ර හතරක් හඳුනාගෙන ඇත: (i) විශාල බදු ගෙවන්නන්ගේ අනුකූලතාව, පුළුල් කළ බදු පදනම සහ විධිමත් ක්‍රියාවලීන් කෙරෙහි අවධානය යොමු කරමින් ආදායම සහ අනුකූලතාවය ඉහළ නැංවීම; (ii) දූෂණ අවදානම් අවම කිරීම; (iii) දේශීය ආදායම් දෙපාර්තමේන්තුව නවීකරණය; සහ (iv) ඵලදායී කළමනාකරණය සහ පාලනය.

- බදු පදනම තවදුරටත් පුළුල් කිරීමට සහ බදු නොගෙවන්නන් බදු ජාලයට ඇතුළත් කිරීම සඳහා, වයස අවුරුදු 18ට වැඩි සියලුම පුද්ගලයින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමඟ ලියාපදිංචි වීම අනිවාර්ය වේ. වෘත්තිකයන් කෙරෙහි අවධානය යොමු කරමින් සියලුම බදු නොගෙවන්නන් සඳහා බදු ලිපිගොනු විවෘත කිරීම දැනටමත් ආරම්භ කර ඇත.

- විගණනය, බදු වාර්තා ගොනු කිරීම, එකතු කිරීමේ හැකියාව සහිත බදු අයකර ගැනීම සහ ලියාපදිංචිය ආදිය කෙරෙහි අවධානය යොමු කරන ප්‍රධාන කාර්යසාධන දර්ශක 7ක් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත හඳුන්වා දී ඇත.

- සියලුම බදු එකතු කිරීම් ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතිය (RAMIS) හරහා සිදු කිරීම සහතික කිරීම සඳහා ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතිය තවදුරටත් වැඩිදියුණු කෙරෙනු ඇත.

- රාජ්‍ය වියදම් කළමනාකරණය මෙන්ම රාජ්‍ය වියදම් මෙහෙයවීම, පාලනය, තාර්කීකරණය සහ ප්‍රමුඛතාගත කිරීම තුළින් පුනරාවර්තන වියදම් ද.දේ. නි. යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 16 හි පවත්වාගැනීමට කටයුතු කරනු ඇත. එමෙන්ම, ඒකාබද්ධ භාණ්ඩාගාර කළමනාකරණ තොරතුරු පද්ධතිය (ITMIS) සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කිරීම ඔස්සේ කැපවීම් පාලනය (commitment control) මනාව සිදු කිරීම වියදම් විනය ඇති කිරීම සඳහා ප්‍රධාන වනු ඇත.

- සංවර්ධන කටයුතු මනාව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය රාජ්‍ය මූල්‍ය අවකාශය වැඩි කිරීම පිණිස රාජ්‍ය වියදම්වල ගුණාත්මක භාවය වැඩිදියුණු කිරීම සහ එමඟින් 2024 වසරේ සිට සහ ඉන් ඔබ්බට ද.දේ. නි. යෙන් සියයට 4 කට වැඩි ප්‍රමාණයකට රාජ්‍ය ආයෝජන ක්‍රමානුකූලව වැඩි කර පවත්වාගෙන යනු ඇත.

- අයවැය හිඟය 2026 වසරේ සිට සහ ඉන් ඔබ්බට ද.දේ.නි. යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 5 ට වඩා පහළ අගයක ක්‍රමානුකූලව පාලනය කොට තබා ගනු ඇත. කෙටිකාලීන වශයෙන් පවතින මූල්‍ය බාධාවන් සැලකිල්ලට ගනිමින්, අඛණ්ඩ ණය සේවාකරණයක් සහතික කිරීම, වැටුප් හා විශ්‍රාම වැටුප් වැනි අනිවාර්ය වියදම් නියමිත වේලාවට පියවීම සහ හිඟ මුදල් අනවශ්‍ය පරිදි එක්රැස්වීම වැළැක්වීම සඳහා භාණ්ඩාගාර මුදල් කළමණාකරණය වඩාත් උද්‍යෝගයකින් සහ කැපවීමකින් යුතුව සිදු කරනු ඇත.

- පිරිවැය යථා තත්ත්වයට පත් කර ගැනීම සඳහා 2018 වසරේ හඳුන්වා දුන් ඉන්ධන මිල සූත්‍රය මගින් නියම කර ඇති පරිදි මාසික සිල්ලර ඉන්ධන මිල ගැලපීම් ස්වයංක්‍රීය කිරීම ඇතුළුව ස්වයංක්‍රීය ඉන්ධන සහ විදුලි මිලකරණ යාන්ත්‍රණය අඛණ්ඩව ක්‍රියාත්මක කරනු ඇත. බලශක්තිය සම්බන්ධ රාජ්‍ය ව්‍යවසායයෙහි මූල්‍ය ශක්‍යතාව, තරඟකාරිත්වය සහ පාලනය ශක්තිමත් කිරීම සඳහා නිත්‍ය පිරිවැය-ප්‍රතිසාධනය මත පදනම් වූ විදුලි මිල ගැලපීම අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමට නියමිතය.

- තවද, ශක්තිමත් මූල්‍ය තත්ත්වය සහතික කිරීම සහ පාලනය වැඩි දියුණු කිරීම තුළින් තරඟකාරිත්වය ඉහළ නැංවීම සඳහා රජය සතු ප්‍රධාන ව්‍යවසායයන් වෙත හඳුන්වා දෙන ලද ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ අඛණ්ඩව

ක්‍රියාත්මක කරනු ඇත. මෙම ප්‍රතිසංස්කරණ අතරට රජය සතු ව්‍යවසායයන්වල වෘත්තීය නායකත්වය සහතික කිරීම, ප්‍රසම්පාදනය, ණය ගැනීම් සහ මූල්‍ය කළමනාකරණය පිළිබඳ විනය වැඩි දියුණු කිරීම සහ රජය සතු ව්‍යවසායයන් සඳහා රජයේ ඇපකර නිකුත් කිරීමේ දැඩි සීමාවන් ඇතුළත් වේ.

- සමාජයේ වඩාත් අවදානමට ලක්විය හැකි කොටස ආරක්ෂා කිරීම පිණිස ඉලක්කගත ආකාරයෙන් සමාජ ආරක්ෂණ ජාල වැඩසටහන ශක්තිමත් කිරීම සඳහා අරමුදල් වැඩි වශයෙන් රැස් කර යොමු කරනු ඇත. ප්‍රතිලාභීන් තෝරා ගැනීමේ නිර්ණායක සහ දුක්ගැනවිලි හැසිරවීමේ මනා යාන්ත්‍රණයක් සමඟින් සමාජ ආරක්ෂණ ජාල සඳහා වන ආයතනික යාන්ත්‍රණය ශක්තිමත් කෙරෙනු ඇත.

- ඇස්තමේන්තු කිරීම නිවැරදිව සිදු කිරීම, විනිවිදභාවය තහවුරු කිරීම සහ අයවැය ක්‍රියාත්මක කිරීම මනාව අධීක්ෂණය කිරීම සහතික කරන අතරම මධ්‍යකාලීන රාජ්‍ය මූල්‍ය රාමුවට අනුකූලව වාර්ෂික අයවැය සකස් කිරීම තුළින් අයවැය විනය වැඩි දියුණු කෙරෙනු ඇත.

- ණය ප්‍රතිව්‍යුහගත කිරීම අවසන් වීමෙන් අනතුරුව, රාජ්‍ය ණය ප්‍රවේශමෙන් කළමනාකරණය කිරීම තුළින් රාජ්‍ය ණය තිරසාර මාවතක පවතින බව සහතික කරනු ඇත. යෝජිත රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය (PDMO) ස්ථාපනය කිරීම තුළින් නිසි අවදානම් අවම කිරීමේ ව්‍යුහයන් සමඟ ණය කළමනාකරණය වෘත්තීය වශයෙන් සිදු වීම සහතික කිරීම සඳහා ආයතනික රාමුව සැපයීමට අපේක්ෂා කෙරේ.

ඉහත දක්වා ඇති පරිදි රාජ්‍ය මූල්‍ය උපායමාර්ගය පදනම් වී ඇත්තේ බදු ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ, ආයතනික දුර්වලතා ආමන්ත්‍රණය කරන බදු පරිපාලන ප්‍රතිසංස්කරණ, බදු අනුකූලතා ප්‍රතිසංස්කරණ සහ වියදම් කළමනාකරණයේ ප්‍රතිසංස්කරණ ඇතුළු සමස්ත වශයෙන් ආදායම් වැඩි දියුණු කිරීමේ ප්‍රතිසංස්කරණ මත ය. වෙළෙඳාම් කළ හැකි භාණ්ඩ හා සේවා පිළිබඳ ආයෝජන සඳහා ප්‍රමාණවත් සම්පත් උත්පාදනය කිරීම පිණිස පරිභෝජනය සහ ඉතුරුම් අතර මනා සමතුලිතතාවයක් සමඟ සාර්ව ආර්ථික ස්ථායීකරණයට සහාය වීම සඳහා රාජ්‍ය මූල්‍ය උපාය මාර්ගය සකස් කර ඇත. භාණ්ඩ හා සේවා අපනයනය සහ ඍජු විදේශීය ආයෝජන ඇතුළුව ණය-නිර්මාණය නොවන ලැබීම් සඳහා පහසුකම් සැළසීම පිණිස ස්ථාවර සාර්ව ආර්ථික රාමුවක් පැවතීම ඉතා වැදගත් වේ. වෙළෙඳාම සහ ආයෝජන සඳහා කලාපීය සහ ගෝලීය වටිනාකම් දාමයන් සමඟ ඒකාබද්ධ වීම වැඩිදියුණු කරන කලාපීය වෙළෙඳ ගිවිසුම් සමඟ වැඩි වශයෙන් සම්බන්ධ වීමෙන් එවැනි පියවරයන් තවදුරටත් පහසු කරනු ඇත.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදල මඟින් සහය ලබන ප්‍රතිසංස්කරණ වැඩසටහන යටතේ එකඟ වූ පරිදි අපේක්ෂිත ආදායම් ඉලක්ක සපුරා ගැනීමේ දී වැඩිදියුණු කරන ලද ආදායම් පරිපාලනය සහ අනුකූලතාවය තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරනු ඇත. ආදායම් පරිපාලන ප්‍රතිසංස්කරණ මගින් බදු අනුකූලතාව, අවදානම් මත පදනම් වූ බදු විගණන, දූෂණ අවදානම් තුරන් කිරීම සඳහා ආයතනික ප්‍රතිසංස්කරණ සහ අනුකූලතාව වැඩි දියුණු කිරීම සහ ව්‍යාපාර කිරීමේ පහසුව වැඩිදියුණු කිරීම සඳහා පද්ධති සහ ක්‍රියාවලීන් ඩිජිටල්කරණය කෙරෙහි අවධානය යොමු කරනු ඇත. එමෙන්ම, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතිය , ශ්‍රී ලංකා රේගුවේ යෝජිත තනි කවුළු පද්ධතිය සුරාබදු දෙපාර්තමේන්තුවේ ආදායම් පරිපාලන පද්ධතිය සහ ඒකාබද්ධ භාණ්ඩාගාර කළමනාකරණ තොරතුරු පද්ධතිය වැනි විවිධ ඩිජිටල් පද්ධති ශක්තිමත් කෙරෙනු ඇත.

නව රාජ්‍ය මුදල් කළමනාකරණ පනත ඉදිරියේදී බලාත්මක කිරීම තුළින් රාජ්‍ය මූල්‍ය කළමනාකරණය වැඩිදියුණු කිරීමේ ක්‍රියාමාර්ගවලට ව්‍යවස්ථාදායක බලය ලබා දෙනු ඇත. නව රාජ්‍ය මුදල් කළමනාකරණ පනත තුළින් රාජ්‍ය මූල්‍ය රීති රාමුව, අයවැය සම්පාදනය සහ විනිවිදභාවය පිළිබඳ නීතිරීති, අයවැය ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය සහ රජයේ ප්‍රසම්පාදනය පිළිබඳ විනය ඇතුළත් කරමින් මූල්‍ය විනය ශක්තිමත් කෙරෙනු ඇත . නව ණය කළමනාකරණ නීතියක් බලාත්මක කිරීම සහ ස්වාධීන රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලයක් ස්ථාපිත කිරීම තුළින් රාජ්‍ය ණය කළමනාකරණය ඉහළ නංවනු ඇත. උද්ධමනය ඉලක්ක කර ගැනීම සඳහා ව්‍යවස්ථාදායක සහ ආයතනික රාමුවක් ස්ථාපිත කිරීමේ නව මහ බැංකු පනත සහ දූෂණ විරෝධී නීති දැනටමත් පාර්ලිමේන්තුව විසින් අනුමත කර ඇත. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ලංකා විදුලිබල මණ්ඩලය, ශ්‍රී ලන්කන් ගුවන් සේවය සහ මාර්ග සංවර්ධන අධිකාරියේ ශේෂ පත්‍ර ප්‍රතිව්‍යුහගත කිරීම, මුදල් අමාත්‍යාංශය යටතේ පවතින රජය සතු ව්‍යවසායයන් ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා විශේෂයෙන් ම කටයුතු කරනු ලබන ඒකකය විසින් මෙහෙයවනු ලබන රජය සතු තෝරාගත් ව්‍යවසායයන් ප්‍රතිව්‍යුහගත කිරීම ඇතුළු ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ හරහා රජය සතු ව්‍යවසායයන්හි පාලනය ශක්තිමත් කර වැඩිදියුණු කරනු ඇත. එමෙන්ම, බාහිර ණය හිමියන් සමඟ සාකච්ඡා අවසන් කිරීම සහ ණය කළමනාකරණයේ විනිවිදභාවය වැඩිදියුණු කිරීම තුළින් රාජ්‍ය ණය තිරසාර මට්ටමකට ගෙන එනු ඇත.

### 1.2.2 මධ්‍යකාලීන සාර්ව රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති රාමුව

2023 වසරේ අතුරු අයවැය සමඟ ඉදිරිපත් කරන ලද මධ්‍යකාලීන සාර්ව රාජ්‍ය මූල්‍ය රාමුව වත්මන් ආර්ථික වර්ධනයන් ඇතුළත් කරමින් සංශෝධනය කර ඇත. ඒ අනුව, මධ්‍ය කාලීන සාර්ව රාජ්‍ය මූල්‍ය රාමුව සමඟ අනුකූලව, 2023-2028 කාලය සඳහා රජයේ ප්‍රමුඛතා වන්නේ;

- 2025 වසරේ දී ද.දේ.නි. යෙහි ප්‍රතිශතයක් ලෙස රාජ්‍ය ආදායම සියයට 15 දක්වා ඉහළ නැංවීම සහ අවම වශයෙන් මෙම මට්ටම හෝ ඉන් පසුව ඉහළ මට්ටමක පවත්වා ගැනීම.
- සෞඛ්‍ය, අධ්‍යාපනය, පොදු ප්‍රවාහනය සහ සමාජ ආරක්ෂණය ඇතුළු ප්‍රමුඛතා ක්ෂේත්‍ර සඳහා සුදුසු පරිදි වියදම් වෙන් කර ඇති බව සහතික කරන අතරම, ද.දේ.නි.යෙන් සියයට 20 ක් තුළ වියදම් කළමනාකරණය කිරීම.
- 2026 වසර වන විට සහ ඉන් අනතුරුව එළඹෙන වසරවල දී අයවැය හිඟය ද.දේ.නි. යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 5 කට වඩා අඩු මට්ටමකට පවත්වා ගැනීම.
- 2025 වසර සහ ඉන් අනතුරුව එළඹෙන වසරවල දී අවම වශයෙන් සියයට 2.3 ක ප්‍රාථමික අතිරික්තයක් පවත්වා ගැනීම.
- ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි විස්තීරණ ණය පහසුකම් වැඩසටහනෙහි ඉලක්කවලට අනුකූලව මධ්‍යම රජයේ ණය ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස, දළ මූල්‍ය අවශ්‍යතා සහ විදේශ ණය සේවා තිරසාර මට්ටමකට අඩු කිරීම.

මධ්‍ය කාලීන රාජ්‍ය මූල්‍ය ගමන් මඟ ලඟා කර ගැනීම, ආර්ථිකයේ සියලුම අංශ හරහා දිගුකාලීනව නොසලකා හරින ලද ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණවල ප්‍රගතිය මත රඳා පවතිනු ඇත. රාජ්‍ය මූල්‍ය අංශයේ සැළකිය යුතු වෙනස්කම් දැනටමත් ප්‍රකාශයට පත් කර ඇති අතර, සමහර ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක වෙමින් පවතින අතර ක්‍රියාත්මක කරන ලද ඇතැම් ප්‍රතිසංස්කරණවල සම්පූර්ණ බලපෑම තවමත් ලඟා කර ගැනීමට නොහැකි වී තිබේ. දැනටමත් ක්‍රියාත්මක කර ඇති ආර්ථික ස්ථායීකරණ ක්‍රියාමාර්ග විශ්වාසය ඉහළ නංවන අතර ණය ප්‍රතිව්‍යුහගත කිරීම අවසන් වීමෙන් පසු ද්විපාර්ශ්වික සහ බහුපාර්ශ්වික සංවර්ධන හවුල්කරුවන්ගෙන් මූල්‍ය ආධාර ආකර්ෂණය කර ගැනීමට අපේක්ෂා කෙරේ. රාජ්‍ය මූල්‍ය, මුදල්, විදේශීය සහ මූල්‍ය අංශවල ව්‍යුහාත්මක ගැලපීම් ක්‍රියාවට නැංවීමේ ප්‍රගතිය නුදුරු කාලීනව ආර්ථික ස්ථාවරත්වය ඉහළ නංවනු ඇති අතර ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ ක්‍රියාවට නැංවීමත් සමග සිදුවන ණය නොවන ලැබීම් සහ ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම තුළින් මධ්‍ය කාලීනව මෙන්ම දිගුකාලීනව වශයෙන් වඩාත් ශක්තිමත් සහ තිරසාර වර්ධන මාවතක් සාක්ෂාත් කර ගැනීම සඳහා පදනම සැකසෙනු ඇත.

1.1 වගුව මධ්‍යකාලීන සාර්ව රාජ්‍ය මූල්‍ය රාමුව : 2023-2028 (ද.දේ.නි යෙහි ප්‍රතිශතයක් ලෙස)

| දර්ශකය | 2022 තත්‍ය | 2023 සංශෝධිත ඇස්තමේන්තුව | 2024 ඇස්තමේන්තුව | පුරෝකථන 2025 | 2026 | 2027 | 2028 |
|---|---|---|---|---|---|---|---|
| **මුළු ආදායම හා ප්‍රදාන** | **8.3** | **10.1** | **13.1** | **15.0** | **15.0** | **15.1** | **15.2** |
| මුළු ආදායම | 8.2 | 10.1 | 13.0 | 14.9 | 15.0 | 15.1 | 15.2 |
| බදු ආදායම | 7.3 | 9.2 | 12.1 | 14.0 | 14.0 | 14.1 | 14.2 |
| බදු නොවන ආදායම | 0.9 | 0.9 | 0.9 | 0.9 | 0.9 | 1.0 | 1.0 |
| **ප්‍රදාන** | **0.14** | **0.04** | **0.06** | **0.04** | **0.04** | **0.04** | **0.04** |
| **මුළු වියදම** | **18.5** | **18.9** | **20.7** | **20.3** | **19.7** | **19.3** | **19.4** |
| වර්තන වියදම | 14.6 | 16.0 | 16.8 | 15.9 | 15.4 | 14.9 | 14.9 |
| පොලී ගෙවීම් | 6.5 | 8.0 | 8.4 | 7.6 | 7.0 | 6.5 | 6.5 |
| ප්‍රාග්ධන හා ශුද්ධ ණය දීම | 3.9 | 2.9 | 4.0 | 4.4 | 4.4 | 4.4 | 4.5 |
| **ජංගම ගිණුමේ අතිරික්තය (+) / හිඟය (-)** | **(6.4)** | **(5.9)** | **(3.7)** | **(0.9)** | **(0.4)** | **0.2** | **0.3** |
| **ප්‍රාථමික අතිරික්තය (+) / හිඟය(-)** | **(3.7)** | **(0.7)** | **0.8** | **2.3** | **2.3** | **2.3** | **2.3** |
| **අයවැය අතිරික්තය (+) / හිඟය (-)** | **(10.2)** | **(8.7)** | **(7.6)** | **(5.3)** | **(4.7)** | **(4.2)** | **(4.2)** |

*මූලාශ්‍ර : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව, ජාතික අයවැය දෙපාර්තමේන්තුව සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි වැඩසටහනේ පරාමිතීන්*

# II කොටස

## 2003 අංක 3 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම) පනතේ 7, 8 සහ 9 වගන්ති යටතේ ගරු මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් නිකුත් කරන ලදී.

2003 අංක 3 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම) පනතේ 7, 8 සහ 9 වගන්ති අනුව රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපායට සාපේක්ෂව රාජ්‍ය මූල්‍ය කටයුතු ඇගයීම සඳහා අයවැය, ආර්ථිකය සහ රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව නිකුත් කළ යුතු අතර එය විසර්ජන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවේ දී දෙවන වර කියවන දිනයේ දී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතුය. ඒ අනුව දළ දේශීය නිෂ්පාදිතය, පාරිභෝගික මිල ගණන් සහ ගෙවුම් ශේෂය සඳහා අදාළ වන ඇස්තමේන්තු සහ ආදායම් සහ වියදම් ඇස්තමේන්තු කිරීම සඳහා පදනම් වූ උපකල්පන ද මෙම වාර්තාවේ ඇතුළත් වේ.

ඒ අනුව, 2023 වසරේ පළමු මාස නවය තුළ රජයේ ආදායම, වියදම සහ ණය ගැනීම පිළිබඳ තාවකාලික දත්ත මෙම වාර්තාවේ ඇතුළත් වේ. මෙම රාජ්‍ය මූල්‍ය ක්‍රියාකාරකම් සිදු කරනු ලැබ ඇති සමස්ත ආර්ථික තත්ත්වය පිළිබඳ මනා අවබෝධයක් ලබාගැනීමට හැකි වන පරිදි මෙම කාලපරිච්ඡේදයට අදාළ ප්‍රධාන සාර්ව ආර්ථික උපනතීන් මෙම වාර්තාවේ ඇතුලත් වේ. 2024 වසර සඳහා ඇස්තමේන්තු සකස් කිරීමේ දී පදනම් කරගත් ආර්ථික සහ අනෙකුත් උපකල්පන පිළිබඳ තොරතුරු, මෙම උපකල්පන වලට අදාළ විය හැකි අවදානම් සාධක සහ රාජ්‍ය මූල්‍ය කාර්යසාධනය කෙරෙහි බලපෑමක් ඇති කළ හැකි අනෙකුත් තොරතුරු ද මෙම වාර්තාවේ ඇතුළත් වේ.

# රාජ්‍ය මූල්‍ය උපනතීන්, භාණ්ඩාගාර මෙහෙයුම් සහ විදේශ මූල්‍යයනය

# 01

## 1.1 සමාලෝචනය

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීරණ ණය පහසුකම් වැඩපිළිවෙළ යටතේ 2023 වසරේ මුල් මාස නවය සඳහා ලබා දී ඇති රු. බිලියන 160.0 ක ප්‍රාථමික හිඟය පිළිබඳ ඉලක්කය, රු. බිලියන 123.8 ක ප්‍රාථමික අතිරික්තයක් බවට පත් විය. මේ සඳහා හේතු වූයේ, 2022 වසරේ ජූනි මාසයේ සිට ආදායම් ක්‍රියාමාර්ග මාලාවක් අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම සමග රාජ්‍ය වියදම මනාලෙස කළමනාකරණය කිරීම ය.

ප්‍රදාන ද ඇතුළුව සමස්ත රාජ්‍ය ආදායම 2022 වසරේ පළමු මාස නවය තුළ වූ රු. බිලියන 1,450.4 ට සාපේක්ෂව 2023 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 2,118.8 ක් දක්වා සියයට 46.1 කින් වැඩි විය. 2023 වසරේ පළමු මාස නවය තුළ බදු ආදායම රු. බිලියන 1,934.0 ක් දක්වා සියයට 50.7 කින් වැඩි වූ අතර බදු නොවන ආදායම රු. බිලියන 176.5 ක් දක්වා සියයට 6.9 කින් වැඩි විය. 2023 වසරේ පළමු මාස නවය තුළ ප්‍රදාන ද ඇතුළු සමස්ත රාජ්‍ය ආදායම, වාර්ෂික ඇස්තමේන්තුව වන රු. බිලියන 3,415.0 න් සියයට 62.0 ක් ළඟා කර ගැනීමකි.

පුද්ගල ආදායම් බදු ව්‍යුහය සංශෝධනය කිරීම, සංස්ථාපිත ආදායම් බදු අනුපාතය ඉහළ දැමීම හා සංස්ථාපිත ආදායම් බද්ද සඳහා එක් එක් අංශ වෙත ලබා දී තිබූ සහනදායී අනුපාත හා නිදහස් කිරීම් ඉවත් කිරීම, අනිවාර්ය අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද හා රඳවා ගැනීමේ බද්ද නැවත හඳුන්වා දීම සහ එකතු කළ අගය මත බදු අනුපාත ඉහළ දැමීම ඇතුළු බදු ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග මෙම ආදායම් ඉහළ යෑම සඳහා හේතු විය.

කෙසේ වුවද, පළමු කාර්තු තුන තුළ එකතු කළ බදු ආදායම ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීරණ ණය පහසුකම් යටතේ ලබා දී ඇති ඉලක්කයන්ට වඩා අඩු විය. මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු වූයේ අඛණ්ඩව ආනයන සීමා කිරීමේ ප්‍රතිඵලයක් ලෙස ආනයන මත පදනම් වූ බදුවල කාර්ය සාධනය අඩු වීම, දුර්වල බදු පරිපාලනය සහ සාර්ව ආර්ථික විචල්‍යවල අනපේක්ෂිත වර්ධනයන්ය. ඒ අනුව, ආදායමෙහි හිඟය පියවා ගැනීම සඳහා අතිරේක ආදායම් ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කර ඇති අතර, බදු අනුකූලතාවය වැඩි කිරීම සහ බදු පැහැර හැරීම අවම කිරීම සඳහා ආදායම් එකතු කිරීමේ ආයතන තුනෙහි බදු පරිපාලනය ශක්තිමත් කිරීම සඳහා වැඩි අවධානයක් යොමු කර ඇත.

2023 අයවැයෙන් ප්‍රකාශයට පත් කළ පරිදි දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා රේගුව සහ සුරාබදු දෙපාර්තමේන්තුවට අදාළ තාක්ෂණය, රෙගුලාසි සහ ක්‍රියාවලීන් වැඩිදියුණු කිරීම සහ මානව සම්පත් හි ආයෝජනය කිරීම මඟින් බදු පරිපාලන ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කරමින් පවතී.

පළමුවෙන් වෘත්තිකයින් කෙරෙහි අවධානය යොමු කරමින් වයස අවුරුදු 18 ට වැඩි සියළු පුද්ගලයින්ට බදු ගොනුවක් විවෘත කිරීමේ ප්‍රතිපත්තිය සමග බදු නොගෙවන්නන් බදු ජාලයට ගෙන ඒම මඟින් බදු පදනම පුළුල් කිරීම සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව මූලික පියවර ගෙන ඇත. විශාල බදු ගෙවන්නන්ගේ ඒකකය (LTU) සහ මෑතක දී ස්ථාපිත ඉහළ වත්කම් සහිත පුද්ගලයන්ගේ (HNWI) ඒකකය ශක්තිමත් කිරීම තුළින් බදු නීතිවලට අනුකූල වීම තවදුරටත් වැඩි වනු ඇත. ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතිය (RAMIS) 2.0 වැඩි දියුණු කිරීම සමඟ, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වර්තමාන කාලපරිච්ඡේදයේ බදු වාර්තා ගොනු කිරීම හා විශාල/ධනවත් බදු ගෙවන්නන් තක්සේරු කිරීම කෙරෙහි අවධානය යොමු කර ඇත. මින් ඉදිරියට සියළුම බදු එකතු කිරීම් RAMIS පද්ධතිය තුළින් පමණක් සිදු කරනු ඇත. තවද, බදු ගෙවන්නා හඳුනා ගැනීමේ අංකය (TIN) ලියාපදිංචිය සහ පුද්ගල ආදායම් බදු (PIT) ගොනු කිරීම සඳහා වන මාර්ගගත ද්වාරය සරල කරනු ඇත. එසේම විගණන ඵලදායිතාව වැඩි කිරීම, බදු වාර්තා ගොනු කිරීම වැඩි දියුණු කිරීම, එකතු කළ හැකි ආදායම් අයකර ගැනීම සහ ලියාපදිංචිය ඉහළ නැංවීම සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට මූලික කාර්යය සාධන දර්ශක (KPIs) හඳුන්වා දෙනු ලැබේ.

2022 වසරේ පළමු මාස නවය තුළ වාර්තා වූ රු. බිලියන 2,694.8 ට සාපේක්ෂව 2023 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී සමස්ත රාජ්‍ය වියදම රු. බිලියන 3,732.3 ක් දක්වා සියයට 38.5 කින් වැඩි විය. පුනරාවර්තන වියදම රු. බිලියන 3,327.7 ක් දක්වා සියයට 44.7 කින් වැඩි වූ අතර ප්‍රාග්ධන වියදම් හා ශුද්ධ ණය දීම් රු. බිලියන 404.6 ක් දක්වා සියයට 2.5 කින් වැඩි විය. පොලී වියදම සඳහා පමණක් රජයේ බදු ආදායමින් සියයට 89.8 ක් වැය වීම රාජ්‍ය වියදම කළමනාකරණයට අඛණ්ඩ අභියෝගයක්ව පවතී.

පුනරාවර්තන වියදම් වැඩි වීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ පොලී ගෙවීම්, භාණ්ඩ හා සේවා, සහනාධාර හා පැවරුම් සඳහා වන වියදම් ඉහළ යාම ය. 2022 වසරේ පළමු මාස නවයට සාපේක්ෂව 2023 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී පොලී ගෙවීම් රු. බිලියන 1,737.3 ක් දක්වා සියයට 87.3 කින් වැඩි විය. රජයේ සුරැකුම් පත්වන භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර මත ඉහළ පොලී අනුපාත හේතුවෙන් 2023 වසරේ මුල් මාස නමය තුළ දී මුළු පොලී වියදමෙන් සියයට 95 ක් වන දේශීය ණය මත පොලී ගෙවීම රු. බිලියන 1,652.1 ක් දක්වා සියයට 101.6 කින් වැඩි වූ අතර 2023 වසරේ පළමු

වගුව 1.1 : රාජ්‍ය මූල්‍ය මෙහෙයුම් සාරාංශය

| අයිතමය | ජනවාරි-සැප්තැම්බර් | රු. මිලියන |
|---|---|---|
| | 2022 | 2023(අ) |
| **ආදායම් හා ප්‍රදාන** | **1,450,381** | **2,118,755** |
| **ආදායම** | **1,448,482** | **2,110,487** |
| බදු | 1,283,368 | 1,933,980 |
| බදු නොවන | 165,114 | 176,507 |
| **ප්‍රදාන** | **1,899** | **8,269** |
| **වියදම්** | **2,694,788** | **3,732,331** |
| **පුනරාවර්තන** | **2,300,171** | **3,327,685** |
| වැටුප් | 714,280 | 696,995 |
| පොලී ගෙවීම් | 927,366 | 1,737,338 |
| අනෙකුත් | 658,525 | 893,351 |
| **රාජ්‍ය ආයෝජන** | **417,527** | **442,906** |
| **අනෙකුත්** | **-22,910** | **-38,260** |
| **ආදායම් හිඟය (-)/අතිරික්තය (+)** | **-851,689** | **-1,217,198** |
| **සමස්ත අයවැය හිඟය (-)/අතිරික්තය (+)** | **-1,244,407** | **-1,613,576** |
| **මූල්‍යයනය** | **1,244,407** | **1,613,576** |
| විදේශ මූල්‍යයනය (ශුද්ධ) | -59,125 | 96,745 |
| දේශීය මූල්‍යයනය (ශුද්ධ) | 1,303,531 | 1,516,831 |

*මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව*

*(අ) තාවකාලික*

මාස නවය තුළ දී විදේශීය ණය මත පොලී ගෙවීම රු. බිලියන 85.3 ක් දක්වා සියයට 21.0 කින් පහළ ගියේය. ඉන්ධන, විදුලිය සහ අනෙකුත් භාණ්ඩවල මිල ඉහළ යාමත් සමඟ භාණ්ඩ සහ සේවා සඳහා වන වියදම රු. බිලියන 208.7 ක් දක්වා සියයට 76.8 කින් ඉහළ යන ලදී. මේ අතර ප්‍රධාන වශයෙන් සමාජ ආරක්ෂණ ජාල වැඩසටහන් සඳහා වන වියදම් ඉහළ යෑම හේතුවෙන් 2023 වසරේ පළමු මාස නවය තුළ සහානාධාර සහ පැවරුම් සඳහා වන වියදම රු. බිලියන 684.6 ක් දක්වා සියයට 26.7 කින් වැඩි විය. කෙසේ වුවද, රාජ්‍ය අංශයට බඳවා ගැනීම් අත්හිටුවීම සහ රාජ්‍ය සේවකයින්ට දිවයින තුළ හෝ දිවයිනෙන් බැහැරව ගත කිරීම සඳහා නිවාඩු ලබා දීමට වූ රජයේ තීරණයේ ප්‍රතිඵලයක් ලෙස 2023 වසරේ පළමු මාස නවය තුළ රාජ්‍ය සේවකයින්ගේ වැටුප් හා වේතන සඳහා වන වියදම රු. බිලියන 697.0 දක්වා සියයට 2.4 කින් අඩු විය. අනිවාර්යය විශ්‍රාම යෑමේ වයස අවුරුදු හැට ලෙස සංශෝධනය කිරීම හේතුවෙන් 2023 වසරේ පළමු මාස නවය තුළ විශ්‍රාම වැටුප් සඳහා වන වියදම රු. බිලියන 264.0 දක්වා සියයට 15.5 කින් වැඩි විය.

2022 වසරේ පළමු මාස නවයට සාපේක්ෂව 2023 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ රාජ්‍ය ආයෝජන රු. බිලියන 442.9 ක් දක්වා සියයට 6.1 කින් සුළු වශයෙන් ඉහළ යන ලදී. කෙසේ වුවද, ප්‍රධාන වශයෙන් විදේශ ව්‍යාපෘති මූල්‍යකරණයේ හිඟය නිසා රාජ්‍ය ආයෝජන වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 36.3 ක් පමණක් ළඟා කරගන්නා ලදී.

2022 වසරේ පළමු මාස නවය තුළ වාර්තා වූ රු. බිලියන 1,244.4 ට සාපේක්ෂව, 2023 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ සමස්ත අයවැය හිඟය රු. බිලියන 1,613.6 කි. මෙයට ප්‍රධාන ලෙසම 2023 වසරේ පළමු මාස නවය තුළ රු. බිලියන 810.0 කින් වැඩි වීම සමඟ පොලී වියදම ආසන්න වශයෙන් දෙගුණ වීම හේතු විය. කෙසේ නමුත්, ප්‍රාථමික අයවැය ශේෂය, 2022 වසරේ පළමු මාස නවය තුළ වාර්තා වූ රු. බිලියන 317.0 ක හිඟයට සාපේක්ෂව 2023 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 123.8 ක අතිරික්තයක් දක්වා වර්ධනය විය. ඒ අනුව, 2023 වසර අවසානයේ දී රු. බිලියන 209.0 ක ප්‍රාථමික ශේෂ හිඟය පිළිබඳ ඉලක්කය ළඟා කර ගැනීමේ මාවතට රජය පිවිස ඇත.

වගුව 1.2 : ඇස්තමේන්තුගත හා තත්‍ය ආදායම සහ වියදම - 2023

රු. බිලියන

| අයිතමය | වාර්ෂික ඇස්තමේන්තුව | ජන.-සැප්. තත්‍ය[(අ)] | ළඟාකර ගැනීම % |
|---|---|---|---|
| මුළු ආදායම | **3,408.0** | **2,110.5** | **61.9** |
| බදු ආදායම | **3,130.0** | **1,934.0** | **61.8** |
| **දේශීය ආදායම් දෙපාර්තමේන්තුව** | | | |
| ආදායම් සහ ලාභ මත බද්ද | 912.0 | 663.6 | 72.8 |
| එකතු කල අගය මත බද්ද - දේශීය (ශුද්ධ) | 553.0 | 351.6 | 63.6 |
| ජාතිය ගොඩනැගීමේ බද්ද - දේශීය | 0.0 | 0.04 | - |
| සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද - දේශීය | 186.0 | 122.0 | 65.6 |
| **උප එකතුව** | **1,651.0** | **1,137.2** | **68.9** |
| **ශ්‍රී ලංකා රේගු දෙපාර්මේන්තුව** | | | |
| එකතු කල අගය මත බද්ද - ආනයන (ශුද්ධ) | 355.0 | 153.4 | 43.2 |
| ජාතිය ගොඩනැගීමේ බද්ද - ආනයන | 0.0 | 0.2 | - |
| සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද - ආනයන | 64.0 | 36.4 | 56.9 |
| වරාය සහ ගුවන් තොටුපොල සංවර්ධන බද්ද | 220.0 | 123.6 | 56.2 |
| සෙස් බද්ද | 85.0 | 39.5 | 46.5 |
| විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද | 70.0 | 36.8 | 52.5 |
| ආනයන බද්ද | 80.0 | 66.1 | 82.6 |
| **නිෂ්පාදන (විශේෂ විධිවිධාන) බද්ද** | | | |
| දුම්වැටි | 140.0 | 90.0 | 64.3 |
| ඛනිජ තෙල් නිෂ්පාදන | 142.0 | 72.3 | 50.9 |
| මෝටර් වාහන සහ අනෙකුත් | 64.0 | 24.6 | 38.4 |
| **උප එකතුව** | **1,220.0** | **642.9** | **52.7** |
| **සුරාබදු දෙපාර්තමේන්තුව** | | | |
| මත්පැන්/දුම්කොළ | 214.0 | 124.0 | 58.0 |
| **උප එකතුව** | **214.0** | **124.0** | **58.0** |
| **අනෙකුත්** | | | |
| විදුලි සංදේශ බද්ද | 20.0 | 13.8 | 69.1 |
| බලපත්‍ර ගාස්තු සහ අනෙකුත් | 25.0 | 16.1 | 64.3 |
| **උප එකතුව** | **45.0** | **29.9** | **66.4** |
| බදු නොවන ආදායම | **278.0** | **176.5** | **63.5** |
| මුළු වියදම | **5,819.0** | **3,732.3** | **64.1** |
| වර්තන වියදම | **4,609.0** | **3,327.7** | **72.2** |
| වැටුප් හා වේතන | 1,002.0 | 697.0 | 69.6 |
| පොලී ගෙවීම | 2,193.0 | 1,737.3 | 79.2 |
| විශ්‍රාම වැටුප් ගෙවීම | 376.0 | 264.0 | 70.2 |
| රාජ්‍ය සංස්ථා සහ ආයතනවලට පැවරුම් | 738.0 | 420.6 | 57.0 |
| අනෙකුත් | 300.0 | 208.7 | 69.6 |
| ප්‍රාග්ධන වියදම් සහ ශුද්ධ ණය | **1,210.0** | **404.6** | **33.4** |

*මූලාශ්‍ර : භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව සහ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව*

*[(අ)] තාවකාලික*

## 1.2 රාජයේ ආදායම

2022 වසරේ පළමු මාස නවය තුළ රු. බිලියන 1,448.5 ක් වූ සමස්ත රාජ්‍ය ආදායම 2023 වසරේ සමාන කාල පරිච්ඡේදය තුළ සියයට 45.7 කින් රු. බිලියන 2,110.5 ක් දක්වා සියයට 45.7 කින් සැළකිය යුතු ලෙස වර්ධනය වූ අතර, එය 2023 වසරේ, වාර්ෂික ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 61.9 ක ලඟා කර ගැනීමකි.

මෙලෙස ආදායම් වැඩිවීමට ප්‍රධාන ලෙසින්ම හේතු වූයේ 2022 වසරේ පළමු මාස නවය තුළ රු. බිලියන 1,283.4 ක් වූ බදු ආදායම, 2023 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 1,934.0 දක්වා සියයට 50.7 කින් වර්ධනය වීමයි. 2023 වසරේ පළමු මාස නවය තුළ දී සමස්ත ආදායමෙන් සියයට 91.6 ක් වන බදු ආදායම, එම වසරේ ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 61.8 ක් ලඟාකර ගැනීමකි.

රූපසටහන 1.1 : මුළු ආදායම් සංයුතිය 2023 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා




*මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව*

සංස්ථාපිත හා සංස්ථාපිත නොවන බදුවලින් ලද ආදායම වැඩි වීම පිළිබිඹු කරමින්, 2022 වසරේ පළමු මාස නවය තුළ රු. බිලියන 431.8 ක් වූ ආදායම් බද්දෙන් ලද ආදායම 2023 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 663.6 දක්වා සියයට 53.7 කින් වර්ධනය වී ඇත. ආදායම් බද්ද සඳහා වැඩිම දායකත්වයක් දක්වන සංස්ථාපිත බදුවලින් ලද ආදායම, 2022 වසරේ පළමු මාස නවය තුළ රු. බිලියන 382.2 සිට 2023 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 415.6 ක් දක්වා සියයට 8.7 කින් වර්ධනය විය. බදු නිදහස් සීමාව පහත හෙළීමෙන් හා බදු පදනම පුළුල් කිරීම හේතුවෙන් පුද්ගල ආදායම් බද්ද සහ උපයන විට ගෙවීම් බද්ද/අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද (PAYE/APIT) ඇතුළත් සංස්ථාපිත නොවන බදුවලින් උපයාගත් ආදායම රු. බිලියන 137.4 ක් දක්වා සියයට 291.7 කින් වැඩි වී ඇත. උපයන විට ගෙවීම් බද්ද/අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද 2023 වසරේ පළමු මාස නවය තුළ රු. බිලියන 107.0 ක් දක්වා සියයට 497.8 කින් වර්ධනය වූ අතර, එය වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 107.0 ක ළඟා කරගැනීමකි. රඳවා ගැනීමේ බද්ද/අත්තිකාරම් ආදායම් බද්ද අනිවාර්ය කිරීම හේතුවෙන්, රඳවා ගැනීමේ බද්දෙන් ලද ආදායම 2023 වසරේ පළමු මාස නවය තුළ රු. බිලියන 110.4 ක් දක්වා සියයට 672.7 කින් තියුණු ලෙස වර්ධනය විය.

තවද, 2022 වසරේ පළමු මාස නවය තුළ රු. බිලියන 310.5 ක් වූ එකතුකළ අගය මත බද්දෙන් (VAT) ලද ආදායම 2023 වසරේ සමාන කාල පරිච්ඡේදය තුළ දී රු. බිලියන 505.0 ක් දක්වා සියයට 62.6 කින් වැඩි විය. එසේම, 2022 වසරේ පළමු මාස නවය තුළ රු. බිලියන 262.1 ක් වූ නිෂ්පාදන/සුරා බදු ආදායම 2023 වසරේ සමාන කාල පරිච්ඡේදය තුළ රු. බිලියන 310.9 ක් දක්වා සියයට 18.6 කින් වර්ධනය විය. මෑතක දී හඳුන්වා දුන් සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද (SSCL) සමස්ත ආදායමට රු. බිලියන 158.4 ක දායකත්වයක් ලබා දී ඇත.

වගුව **1.3** : රාජ්‍ය ආදායම් කාර්යසාධනයේ සාරාංශය

රු. මිලියන

| අයිතමය | ජනවාරි-සැප්තැම්බර් 2022 | ජනවාරි-සැප්තැම්බර් 2023(අ) | වෙනස (%) |
|---|---|---|---|
| බදු ආදායම | **1,283,368** | **1,933,980** | **50.7** |
| ආදායම් බදු | **431,795** | **663,586** | **53.7** |
| දේශීය පරිභෝජනය මත පදනම් වූ බදු | **405,914** | **690,731** | **70.2** |
| එකතු කල අගය මත බද්ද (වැට්) | 193,829 | 351,591 | 81.4 |
| නිෂ්පාදන/සුරා බද්ද | 211,766 | 217,118 | 2.5 |
| සමාජ ආරක්ෂණ දායකත්ව බදු | – | 121,982 | – |
| ජාතිය ගොඩනැගීමේ බදු | 319 | 40 | -87.6 |
| ආනයන මත පදනම් වූ බදු | **421,050** | **549,770** | **30.6** |
| නිෂ්පාදන බද්ද | 36,587 | 66,100 | 80.7 |
| එකතු කල අගය මත බද්ද (වැට්) | 116,686 | 153,420 | 31.5 |
| සමාජ ආරක්ෂණ දායකත්ව බදු | - | 36,412 | - |
| ජාතිය ගොඩනැගීමේ බදු | 23 | 171 | 638.9 |
| වරාය සහ ගුවන් තොටුපොල සංවර්ධන බද්ද | 135,434 | 123,625 | -8.7 |
| විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද | 29,232 | 36,783 | 25.8 |
| නිෂ්පාදන බද්ද | 50,337 | 93,738 | 86.2 |
| සෙස් බද්ද | 52,751 | 39,521 | -25.1 |
| බලපත්‍ර ගාස්තු සහ අනෙකුත් | **24,609** | **29,893** | **21.5** |
| බදුනොවන ආදායම | **165,114** | **176,507** | **6.9** |
| මුළු ආදායම | **1,448,482** | **2,110,487** | **45.7** |

*මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව*

(අ) *තාවකාලික*

කෙසේ වෙතත්, විදේශ වෙළඳාමට අදාළ බදුවලින් ලද ආදායම 2022 වසරේ පළමු මාස නවය තුළ රු. බිලියන 254.0 ක සිට 2023 වසරේ සමාන කාලපරිච්ඡේදයේ දී රු. බිලියන 266.0 ක් දක්වා සියයට 4.7 කින් ආන්තික ලෙස වර්ධනය විය.

2022 වසරේ පළමු මාස නවය තුළ රු. බිලියන 165.1 ක් වූ බදු නොවන ආදායම 2023 වසරේ සමාන කාලපරිච්ඡේදයේ දී රු. බිලියන 176.5 ක් දක්වා සියයට 6.9 කින් වැඩි වූ අතර, එය සමස්ත ආදායම සඳහා සියයට 8.4 ක දායකත්වයක් ලබා දී ඇත.

**රූපසටහන 1.2 : මූලාශ්‍ර අනුව මුළු බදු ආදායම 2023 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා**




*මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව*

**ආදායම් බද්ද**

2022 වසරේ පළමු මාස නවය තුළ රු. බිලියන 431.8 ක් වූ ආදායම් බද්දෙන් ලද ආදායම 2023 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 663.6 ක් දක්වා සියයට 53.7 කින් කැපී පෙනෙන වර්ධනය වූ අතර එය වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 72.8 ක ළඟා කර ගැනීමකි. 2023 වසරේ ජනවාරි මස 01 දින සිට ආදායම් බදු ව්‍යුහයේ සිදු කරන ලද සංශෝධන සහ අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද සහ රඳවා ගැනීමේ බද්ද/අත්තිකාරම් ආදායම් බද්ද අනිවාර්යය කිරීම සහ 2022 වසරේ ඔක්තෝබර් 01 දින සිට සංස්ථාපිත ආදායම් බදු අනුපාතිකය සියයට 30 දක්වා වැඩිකිරීම සහ සංස්ථාපිත ආදායම් බදු නිදහස් කිරීම් සහ සහනදායී අනුපාත ඉවත් කිරීම ඇතුළු බදු ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම මේ සඳහා ප්‍රධාන වශයෙන් බලපා ඇත.

සංස්ථාපිත හා සංස්ථාපිත නොවන බදු ආදායම 2022 වසරේ පළමු මාස නවයේ දී වාර්තා කළ රු. බිලියන 399.4 සිට 2023 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 445.9 ක් දක්වා සියයට 11.7 කින් වර්ධනය විය. සංස්ථාපිත ආදායම් බද්දෙන් ලද ආදායම 2022 වසරේ පළමු මාස නවයේ දී වාර්තා කළ රු. බිලියන 382.2 ට සාපේක්ෂව 2023 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 415.6 ක් දක්වා සියයට 8.7 කින් වැඩි විය. තවද, අත්තිකාරම් පුද්ගල ආදායම් බද්දෙන් ලද ආදායම 2022 වසරේ පළමු මාස නවය තුළ වාර්තා කළ රු. බිලියන 17.9 ට සාපේක්ෂව 2023 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 107.0 ක් දක්වා සියයට 497.8 කින් සැළකිය යුතු ලෙස වැඩි විය. පුද්ගල ආදායම් බදු නිදහස් සීමාව වසරකට රු. මිලියන 3.0 සිට රු. මිලියන 1.2 දක්වා අඩු කිරීම සහ බදු සහනය ඉක්මවන සෑම රු. 500,000 ක් සඳහා සියයට 6 සිට සියයට 36 දක්වා ප්‍රගතිශීලීව බදු අනුපාතික සංශෝධනය කිරීම මේ සඳහා බලපා ඇත. 2023 වසරේ පළමු මාස නවය තුළ අත්තිකාරම් පුද්ගල ආදායම් බද්දෙන් එකතු වූ ආදායම වාර්ෂික ඇස්තමේන්තුව වූ රු. බිලියන 100 ඉක්මවා ගොස් ඇත.

රඳවා ගැනීමේ බද්ද/අත්තිකාරම් ආදායම් බද්ද මඟින් ලද ආදායම 2022 වසරේ පළමු මාස නවය තුළ රු. බිලියන 14.3 ක සිට 2023 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 110.4 ක් දක්වා සියයට 672.7 කින් සැළකිය යුතු ලෙස වර්ධනය විය. 2023 වසරේ පළමු මාස නවය තුළ රඳවා ගැනීමේ බද්ද/අත්තිකාරම් ආදායම් බද්දෙන් එකතු වූ ආදායම වාර්ෂික ඇස්තමේන්තුව වූ රු. බිලියන 90.0 දැනටමත් ඉක්මවා ඇත. කෙසේ වෙතත්, උපයනවිට ගෙවීමේ බද්ද/අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද හැර පුද්ගල ආදායම් බද්දෙන් ලද ආදායම රු. බිලියන 30.3 දක්වා වැඩි වූ අතර එය ආදායම් ඇස්තමේන්තුවෙන් සියයට 26.4 ක් වන බැවින් එය දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ බදු පරිපාලනය ශක්තිමත් කිරීමේ වැදගත් කම පිළිඹිබු කරයි. එසේම දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ආදායම් එකතු කිරීම ශක්තිමත් කිරීම සඳහා අඛණ්ඩව ප්‍රයත්න දැරීම අත්‍යවශ්‍ය වේ.

**වගුව 1.4 : ආදායම් බදු කාර්යසාධනය**

රු. මිලියන

| බදු පදනම | ජන.-සැප්. 2022 | ජන.-සැප්. 2023 (අ) | වර්ධනය % |
|---|---|---|---|
| සංස්ථාපිත හා සංස්ථාපිත නොවන | 399,372 | 445,916 | 11.7 |
| උපයන විට ගෙවීම් | 17,907 | 107,045 | 497.8 |
| පොළී ආදායම මත බදු | 14,290 | 110,422 | 672.7 |
| ආර්ථික සේවා ගාස්තු | 226 | 203 | -9.8 |
| **එකතුව** | **431,795** | **663,586** | **53.7** |

*මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව*

(අ) *තාවකාලික*

**එකතු කල අගය මත බද්ද**

2022 වසරේ පළමු මාස නවය තුළ එකතු කළ අගය මත බද්දෙන් ලද රාජ්‍ය ආදායම රු. බිලියන 310.5 සිට 2023 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 505.0 දක්වා සියයට 62.6 කින් සැළකිය යුතු ලෙස වැඩි වූ අතර, එය 2023 වසර සඳහා ඇස්තමේන්තු කළ එකතු කළ අගය මත බදු ආදායමෙන් සියයට 55.6 කි.

2023 වසරේ පළමු මාස නවය තුළ දේශීය ආර්ථික ක්‍රියාකාරකම් සහ ආනයන වලින් යන දෙආකාරයෙන්ම ලද එකතු කළ අගය මත බදු ආදායම වර්ධනය විය. දේශීය ආර්ථික ක්‍රියාකාරකම් වලින් ලද එකතු කළ අගය මත බදු ආදායම, 2022 වසරේ පළමු මාස නවය තුළ රු. බිලියන 193.8 සිට 2023 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 351.6 ක් දක්වා සියයට 81.4 කින් වැඩි වූ අතර, ආනයන මඟින් ලද එකතු කළ අගය මත බදු ආදායම, 2022 වසරේ පළමු මාස නවය තුළ රු. බිලියන 116.7 සිට 2023 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 153.4 දක්වා සියයට 31.5 කින් වැඩි විය.

2022 වසරේ සිදු කරන ලද එකතු කළ අගය මත බදු අනුපාතය වැඩි කිරීම් සහ එකතු කළ අගය මත බදු ලියාපදිංචි කිරීමේ සීමාව පහත හෙලීම මෙසේ එකතු කළ අගය මත බදු ආදායම ඉහළ යාමට ප්‍රධාන වශයෙන් බලපාන ලදී. 2022 වසරේ ජූනි මස 01 දින සිට බලපැවැත්වෙන පරිදි එකතු කළ අගය මත බදු අනුපාතය සියයට 8 සිට සියයට 12 දක්වා වැඩි කරන ලද අතර, නැවතත්, 2022 වසරේ සැප්තැම්බර් 01 දින සිට බලපැවැත්වෙන පරිදි සියයට 12 සිට සියයට 15 දක්වා වැඩි කරන ලදී. එකතු කළ අගය මත බදු ලියාපදිංචි කිරීමේ සීමාව 2022 වසරේ ඔක්තෝබර් මස 01 දින සිට බලපැවැත්වෙන පරිදි වසරකට රු. මිලියන 300 සිට රු. මිලියන 80 දක්වා අඩු කරන ලදී. මෙම ආදායම් ක්‍රියාමාර්ගයන්හි ප්‍රතිඵලයක් ලෙස, 2023 වසරේ පළමු මාස නවය තුළ සමස්ත ආදායම් කාර්යයසාධනය සඳහා එකතු කළ අගය මත බදු ආදායමේ දායකත්වය සියයට 23.9 ක් විය. කෙසේ වෙතත්, 2023 වසරේ පළමු මාස නවය තුළ ආනයන සීමා බහුතරයක් තවදුරටත් ක්‍රියාත්මක වීම හේතුවෙන් එකතු කළ අගය මත බද්ද සඳහා සිදු කරන ලද ප්‍රතිසංස්කරණයන්ගේ බලපෑම ආනයන මත එකතු කළ අගය මත බද්දෙන් ලද ආදායමේ ඉහළයාම මඟින් පූර්ණ වශයෙන් පිළිඹිබු නොවීය. තවද, 2023 වසරේ දෙසැම්බර් මාසයේ සිට බල පැවැත්වෙන පරිදි එකතු කළ අගය මත බදු නිදහස් කිරීම් ලබා දී ඇති අයිතම 137 කින් 87 ක් ඉවත් කිරීම මඟින් එකතු කළ අගය මත බදු ආදායම ශක්තිමත් කිරීමටත්, එකතු කළ අගය මත බදු කාර්යක්ෂමතාවය වැඩි කිරීමටත් ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන ඇත.

**වගුව 1.5 : එකතු කළ අගය මත බදු කාර්යසාධනය**

රු. මිලියන

| බදු පදනම | ජනවාරි-සැප්තැම්බර් | | වර්ධනය (%) |
|---|---|---|---|
| | 2022 | 2023[අ] | |
| දේශීය | 193,829 | 351,591 | 81.4 |
| ආනයන | 116,686 | 153,420 | 31.5 |
| **එකතුව** | **310,516** | **505,011** | **62.6** |

*මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව*

[අ] තාවකාලික

**නිෂ්පාදන / සුරා බද්ද**

මද්‍යසාර සහ පැණි බීම වර්ග හා ශීතකරණ වැනි අනෙකුත් නිෂ්පාදන බදු අයිතමවලින් ලද ආදායම සුළු වශයෙන් පහත වැටුණද, ප්‍රධාන වශයෙන් ඛනිජ තෙල් නිෂ්පාදන, සිගරට් සහ මෝටර් වාහනවලින් ලද ආදායම වැඩිවීම හේතුවෙන් 2022 වසරේ පළමු මාස නවය තුළ වාර්තා වූ රු. බිලියන 262.1 ට සාපේක්ෂව 2023 වසරේ සමාන කාල පරිච්ඡේදය තුළ දී නිෂ්පාදන/සුරා බදු ආදායම රු. බිලියන 310.9 ක් දක්වා සියයට 18.6 කින් වැඩි විය. මෙය වාර්ෂික ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 55.5 ක් ළඟා කර ගැනීමක් වන අතර නිෂ්පාදන/සුරා බදු ආදායම 2023 වසරේ පළමු මාස නවය තුළදී සමස්ත ආදායමෙන් සියයට 14.7 කට දායක වී ඇත.

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවෙන් මහා භාණ්ඩාගාරය වෙත මාරුකරන ලද වගකීම් සඳහා මුදල් යෙදවීමට, 2023 වසරේ දී දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 0.3 ක් ලබා ගැනීම සඳහා ආනයනික සියලු වර්ගවල පෙට්‍රල් සහ ඩීසල් මත නිෂ්පාදන බද්ද, 2023 ජනවාරි මස 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ලීටරයට රු. 25 කින් ද, නැවත වරක් 2023 ජූනි මස 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ලීටරයකට රු. 25 කින් ද වැඩි කිරීම හේතුවෙන්, ඛනිජ තෙල් නිෂ්පාදන මත නිෂ්පාදන බදු ආදායම 2022 වසරේ පළමු මාස නවය තුළ වාර්තා වූ රු. බිලියන 36.7 ට සාපේක්ෂව 2023 වසරේ සමාන කාල පරිච්ඡේදය තුළ දී රු. බිලියන 72.3 ක් දක්වා සියයට 97.1 කින් සැළකිය යුතු ලෙස වැඩි විය.

2022 වසරේ පළමු මාස නවයේ වූ සිගරට් මිලියන 2,203.9 ට සාපේක්ෂව 2023 වසරේ පළමු මාස නවය තුළ සිගරට් අලෙවිය සිගරට් මිලියන 1,743.0 ක් දක්වා සියයට 20.9 කින් පහත වැටී තිබිය දීත්, සිගරට් මත නිෂ්පාදන බදු ආදායම 2022 වසරේ පළමු මාස නවය තුළ වාර්තා වූ රු. බිලියන 82.6 සිට 2023 වසරේ සමාන කාල පරිච්ඡේදය තුළ රු. බිලියන 90.0 ක් දක්වා සියයට 8.9 කින් වැඩි විය. දුම්වැටි සඳහා නිෂ්පාදන බද්ද 2023 වසරේ ජනවාරි මස 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි සියයට 20 කින් ඉහළ දැමීමත්, ඉන් පසු නැවත වරක් 2023 ජුලි මස 01 වන දින සිට සියයට 20 කින් ඉහළ දැමීමත් මෙම ආදායම වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු විය.

මොටර් වාහන මත නිෂ්පාදන බදු ආදායම ද, 2022 වසරේ පළමු මාස නවයේ වූ රු. බිලියන 13.7 ට සාපේක්ෂව 2023 වසරේ සමාන කාල පරිච්ඡේදය තුළ රු. බිලියන 21.5 ක් දක්වා සියයට 57.1 කින් වැඩි විය. විගමණික සේවකයන්ට දිරිගැන්වීම් ලබා දීම සඳහා විද්‍යුත් වාහන ආනයනය කිරීමට අවසර ලබා දීමට රජය ගත් තීරණය මෙයට ප්‍රධාන වශයෙන් හේතු විය.

කෙසේ වුවද, සුරා බදු ආදායම 2022 වසරේ පළමු මාස නවයේ වූ රු. බිලියන 124.6 ට සාපේක්ෂව 2023 වසරේ සමාන කාල පරිච්ඡේදය තුළ රු. බිලියන 124.0 ක් දක්වා සියයට 0.4 කින් සුළු වශයෙන් අඩු විය. ආදායම අඩු වී තිබියදීත්, සුරා බද්ද සමස්ත නිෂ්පාදන/සුරා බදු ආදායම සඳහා සියයට 39.9 ක විශාලම දායකත්වය ලබා දී ඇත. සුරා බදු අනුපාත 2023 ජනවාරි මස 03 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි සියයට 20 කින් ඉහළ නංවන ලද අතර, 2023 ජුලි මස 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි දෙවන වරට ද සියයට 20 කින් ඉහළ නැංවීය. 2023 වසරේ පළමු මස නවය තුළ සුරා බදු ආදායම 2023 වසරේ ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 58.0 ක් ලගා කර ගැනීමකි. 2022 වසරේ පළමු මාස නවය තුළ වූ නිරපේක්ෂ මද්‍යසාර ලීටර මිලියන 31.2 ට සාපේක්ෂව, මද්‍යසාර නිෂ්පාදනය 2023 වසරේ සමාන කාල පරිච්ඡේදය තුළ දී නිරපේක්ෂ මද්‍යසාර ලීටර මිලියන 27.0 ක් දක්වා සියයට 13.4 කින් අඩු විය. මත්පැන් සහ මද්‍යසාර ආශ්‍රිත නිෂ්පාදනවලින් බදු ආදායම ඉහළ නැංවීම සඳහා ආදායම් පරිපාලක ක්‍රියාමාර්ගයක් ලෙස, බලපත්‍රලාභී නිෂ්පාදකයන්

**වගුව 1.6 : නිෂ්පාදන බදු/සුරාබදු කාර්යසාධනය**

රු. මිලියන

| බදු පදනම | ජනවාරි-සැප්තැම්බර් 2022 | ජනවාරි-සැප්තැම්බර් 2023[අ] | වර්ධනය (%) |
|---|---|---|---|
| මත්පැන් | 124,558 | 124,035 | -0.4 |
| දුම්වැටි/දුම්කොළ | 82,630 | 90,015 | 8.9 |
| මෝටර් වාහන | 13,672 | 21,484 | 57.1 |
| ඛනිජ තෙල් නිෂ්පාදන | 36,665 | 72,254 | 97.1 |
| අනෙකුත් | 4,577 | 3,067 | -33.0 |
| **එකතුව** | **262,103** | **310,856** | **18.6** |

*මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව*

*[අ] තාවකාලික*

සහ ආනයනකරුවන් සඳහා 2022 ජනවාරි මස 03 දින සිට බලපැවැත්වෙන පරිදි ආරක්ෂිත සලකුණු සහ ආරක්ෂිත සලකුණු කළමනාකරණ පද්ධතිය සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කරන ලදී. කෙසේ වුවද, අපේක්ෂිත ආදායම ලබා ගැනීමට නොහැකි වන පරිදි ව්‍යාජ/ අනුකරණය කරන ලද ස්ටිකර් රටේ බොහෝ ප්‍රදේශවලින් අනාවරණය කර ගන්නා ලදී. එබැවින්, මත්පැන්වලින් ලැබිය යුතු ආදායම සාක්ෂාත් කර ගැනීම සඳහා ඉහත පද්ධතිය දැඩි ලෙස ක්‍රියාත්මක කිරීම අත්‍යාවශ්‍ය වේ.

මේ අතර, අත්‍යාවශ්‍ය නොවන නිෂ්පාදන සඳහා පනවා ඇති ආනයන සීමා කිරීම්වල බලපෑම පිළිඹිබු කරමින්, පැණි බීම, ශීතකරණ, පාම් ඔයිල් සහ මේද අම්ල වැනි අනෙකුත් නිෂ්පාදන බදු අය කල යුතු අයිතම මඟින් උපයන ලද නිෂ්පාදන බදු ආදායම, 2022 පළමු මාස නවයේ වූ රු. බිලියන 4.6 ට සපේක්ෂව 2023 වසරේ සමාන කාල පරිච්ඡේදය තුළ රු. බිලියන 3.1 දක්වා සියයට 33.0 කින් අඩු වී ඇත.

**රූපසටහන 1.3 : නිෂ්පාදන බදු / සුරාබදු කාර්යසාධනය 2023 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා**




*මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව*

වගුව 1.7 : මෝටර් රථ වාහන ආනයන සහ නව ලියාපදිංචි කිරීම

(සංඛ්‍යාව)

| අයිතමය | ආනයන ජනවාරි-අගෝස්තු | | | | නව ලියාපදිංචි කිරීම ජනවාරි-සැප්තැම්බර් | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | 2022 | 2023 | වෙනස | % | 2022 | 2023 | වෙනස | % |
| මෝටර් රථ | 198 | 596 | 398 | 201 | 1,141 | 1376 | 235 | 21 |
| බස් රථ හා මගී වැන් රථ | 37 | 380 | 343 | 927 | 275 | 584 | 309 | 112 |
| ත්‍රීරෝද රථ | 223 | 34 | -189 | -85 | 27 | 30 | 3 | 11 |
| යතුරු පැදි | 10,017 | 4,193 | -5,824 | -58 | 7,067 | 12,518 | 5,451 | 77 |
| භාණ්ඩ ප්‍රවාහන රථ (අ) | 236 | 92 | -144 | -61 | 1,401 | 264 | -1,137 | -81 |
| ඉඩම් වාහන (ආ) | 52 | 5 | -47 | -90 | 6,025 | 2,399 | -3,626 | -60 |
| අනෙකුත් (ඇ) | – | – | – | – | 755 | 376 | -379 | -50 |
| **එකතුව** | **10,763** | **5,300** | **-5,463** | **-51** | **16,691** | **17,547** | **856** | **5** |

*මූලාශ්‍ර : මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව*

*(අ) ලොරි රථ, වෙනත් භාණ්ඩ ප්‍රවාහන වාහන සහ විශේෂිත වාහන*

*(ආ) ට්‍රැක්ටර්, අත් ට්‍රැක්ටර් සහ ටේලර් ඇතුළුව*

*(ඇ) තනි කැබ් රථ, ද්විත්ව කාර්ය වාහන, ක්වඩ්‍රි සයිකල්, (Quadri Cycle) සහ මෝටර් නිවාස, ගිලන් රථ, අවමංගල්‍ය රථ ඇතුළත් වේ.*

**සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද**

2022 වසරේ ඔක්තෝබර් 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අලුතින් හඳුන්වා දුන් සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද, වාර්ෂික පිරිවැටුම රු. මිලියන 120.0 ඉක්මවනු ලබන ආනයනකරුවන්, නිෂ්පාදකයින්, සේවා සපයන්නන් සහ තොග වෙළෙන්දන් සහ සිල්ලර වෙළෙන්දන්ගෙන් බද්දට යටත් පිරිවැටුම මත සියයට 2.5 ක අනුපාතයකින් අයකරනු ලැබේ. 2023 වසරේ පළමු මාස නවය තුළ සමාජ ආරක්ෂණ දායකත්ව බද්දෙන් ලද මුළු ආදායම රු. බිලියන 158.4 ක් විය. මෙය 2023 වසරේ වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 63.4 ක් වූ අතර මුළු ආදායමෙන් සියයට 7.5 ක් වේ.

**විදුලි සංදේශ බද්ද**

විදුලි සංදේශ බද්දෙන් උපයන ලද ආදායම 2022 වසරේ පළමු මාස නවය තුළ වූ රු. බිලියන 10.7 සිට 2023 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 13.8 ක් දක්වා සියයට 29.4 කින් වැඩි විය. 2022 වසරේ ජූනි මස 01 දින සිට බලපැවැත්වෙන පරිදි විදුලි සංදේශ බදු අනුපාතය සියයට 11.25 සිට සියයට 15 දක්වා සංශෝධනය කිරීම මෙයට අර්ධ වශයෙන් හේතු විය.

**රේගු ආනයන බද්ද**

රේගු ආනයන බද්දෙන් ලද ආදායම 2022 වසරේ පළමු මාස නවය තුළ පැවති රු. බිලියන 36.6 ට සාපේක්ෂව 2023 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 66.1 ක් දක්වා සියයට 80.7 කින් වැඩි විය. ආනයනික ද්‍රව්‍ය බොහොමයක් සඳහා පනවා තිබූ ආනයන සීමාවන් ඉවත් කිරීම සහ කිරිපිටි, තිරිඟු පිටි සහ තිරිඟු ධාන්‍ය සඳහා රේගු ආනයන බදු අනුපාත ඉහළ නැංවීම මෙම වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත. තවද, තීරු බදු නොවන ආනයන බදු ක්‍රමිකව ඉවත් කිරීම මඟින් රාජ්‍ය ආදායමට වන බලපෑම අවම කිරීම සඳහා 2023 මාර්තු 29 දින සිට ක්‍රියාත්මක වන පරිදි රේගු ආනයන බදු අනුපාත සියයට 0, සියයට 10 සහ සියයට 15 සිට සියයට 0, සියයට 15 සහ සියයට 20 දක්වා ඉහළ නැංවීම රේගු ආනයන බද්දෙන් ලද ආදායම වැඩි කිරීමට ධනාත්මක ලෙස දායක විය.

**විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද**

විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්දෙන් එකතු කරන ලද ආදායම 2022 වසරේ පළමු මාස නවය තුළ පැවති රු. බිලියන 29.2 ට සාපේක්ෂව 2023 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 36.8 ක් දක්වා සියයට 25.8 කින් වැඩි විය. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ ප්‍රධාන භාණ්ඩවල ආනයන පරිමාව ඉහළ යාමයි.

**වරාය හා ගුවන් තොටුපොළ සංවර්ධන බද්ද**

වරාය හා ගුවන් තොටුපොළ සංවර්ධන බද්දෙන් එකතු වූ මුළු ආදායම 2022 වසරේ පළමු මාස නවය තුළ වාර්තා වූ රු. බිලියන 135.4 ට සාපේක්ෂව 2023 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 123.6 ක් දක්වා සියයට 8.7 කින් අඩු විය. වෙළඳාම සහ ආයෝජන වැඩි දියුණු කරන අතරම ආර්ථික තරඟකාරිත්වයට සහාය වීම සඳහා තීරු බදු නොවන ආනයන බදු තාර්කිකකරණය කිරීම පිළිබඳ 2023 අයවැය යෝජනාවට අනුව වසර 05 ක් ඇතුළත වරාය හා ගුවන් තොටුපොළ සංවර්ධන බද්ද ඉවත් කිරීමේ අරමුණින් 2023 වසරේ අප්‍රේල් මස 04 දින සිට ක්‍රියාත්මක වන පරිදි වරාය හා ගුවන් තොටුපොළ සංවර්ධන බද්දට යටත් මුළු අයිතමවලින් සියයට 20 ක් හෝ අයිතම 1,631 ක වරාය හා ගුවන් තොටුපොළ සංවර්ධන බද්ද ඉවත් කිරීම මෙයට ප්‍රධාන වශයෙන් හේතු විය.

**වගුව 1.8 : නිදහස් වෙළෙඳ ගිවිසුම් මගින් ආවරණය වන තීරු බදු සහන යටතේ ආනයනය/අපනයනය කරන ලද භාණ්ඩ හා වටිනාකම්**

| නිදහස් වෙළෙඳ ගිවිසුම | ජනවාරි-සැප්තැම්බර් 2023 | | |
|---|---|---|---|
| | තීරුබදු සහන සඳහා යටත්වන නිෂ්පාදන සංඛ්‍යා | ආනයන වටිනාකම (මි.ර.ගැ./ රු.මිලියන) | අපනයන වටිනාකම (නැ.තෙ.මි./ රු.මිලියන) |
| ඉන්දියා - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (ISFTA) | 5,329 | 122,506 | 28,447 |
| පාකිස්ථාන - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (PSFTA) | 6,200 | 10,547 | 2,029 |
| දකුණු ආසියා නිදහස් වෙළඳ ගිවිසුම (SAFTA) | 5,932 | 20,069 | 1,197 |
| ආසියා-ශාන්තිකර වෙළඳ ගිවිසුම (APTA) | 808 | 46,308 | 1,612 |
| **එකතුව** | **18,269** | **199,430** | **33,285** |

*මූලාශ්‍රය : වෙළෙඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව*

**වෙළෙඳ භාණ්ඩ අපනයන සහනාධාර ක්‍රමය යටතේ වන බද්ද (සෙස් බද්ද)**

සෙස් බද්දෙන් එකතු වූ ආදායම 2022 වසරේ පළමු මාස නවය තුළ වාර්තා වූ රු. බිලියන 52.8 ට සාපේක්ෂව 2023 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 39.5 ක් දක්වා සියයට 25.1 කින් සැලකිය යුතු ලෙස අඩු විය. තීරු බදු නොවන ආනයන බදු තාර්කිකකරණය කිරීම පිළිබඳ 2023 වසරේ අයවැය යෝජනාවට සමගාමීව වසර 03 ක් ඇතුළත සෙස් බද්ද ඉවත් කිරීමේ අරමුණින් 2023 වසරේ මාර්තු මස 29 දින සිට ක්‍රියාත්මක වන පරිදි අයිතම 2,618 ක් සඳහා අදාළ වන සෙස් ගාස්තු අඩු කිරීම මෙයට ප්‍රධාන වශයෙන් හේතු විය. කෙසේ වුවද, ක්ලින්කර් සහ සිමෙන්ති ආනයනය සඳහා වන සෙස් බදු අනුපාත 2023 ජුනි 16 සිට ක්‍රියාත්මක වන පරිදි වැඩි කරන ලදී.

කෙසේ වුවද, අපනයන මත සෙස් බද්දෙන් උපයාගත් ආදායම 2022 වසරේ පළමු මාස නවය තුළ වාර්තා වූ රු. බිලියන 1.71 ට සාපේක්ෂව 2023 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 1.73 ක් දක්වා සියයට 0.8 කින් වැඩි විය. කෙසේ වෙතත්, ආනයන මත සෙස් බද්දෙන් උපයාගත් ආදායම 2022 වසරේ පළමු මාස නවය තුළ වාර්තා වූ රු. බිලියන 51.0 ට සාපේක්ෂව 2023 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 37.8 ක් දක්වා සියයට 26.0 කින් අඩු විය.

**වගුව 1.9 : ජාත්‍යන්තර වෙළඳාමෙන් ලද සෙස් බදු ආදායම**

රු. මිලියන

| අයිතමය | ජනවාරි-අගෝස්තු | |
|---|---|---|
| | 2022 | 2023(අ) |
| **අපනයන සෙස් බද්ද** | **2,243** | **1,167** |
| තේ - (බදු සහ අපනයන පාලන) පනත, තේ මණ්ඩල නීති යටතේ | 465 | 249 |
| රබර් - රබර් නැවත වගා කිරීමේ සහනාධාර පනත යටතේ | 10 | 2 |
| පොල් - පොල් සංවර්ධන අධිකාරී පනත යටතේ | 189 | 97 |
| අ.සං.ම. සෙස් බද්ද - ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ | 1,579 | 820 |
| **ආනයන සෙස් බද්ද - ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ** | **66,990** | **25,563** |
| **එකතුව** | **69,232** | **26,730** |

*මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව*

*(අ) තාවකාලික*

**බදු නොවන ආදායම**

සමස්ත ආදායමෙන් සියයට 8.4 ක දායකත්වයක් සපයමින් බදු නොවන ආදායම, 2022 වසරේ පළමු මාස නවය තුළ වූ රු. බිලියන 165.1 ට සපේක්ෂව 2023 වසරේ සමාන කාල පරිච්ඡේදයේ දී රු. බිලියන 176.5 ක් දක්වා සියයට 6.9 කින් සුළු වශයෙන් වර්ධනය වී ඇත. විකුණුම් හා ගාස්තු, ලාභ සහ ලාභාංශ සහ පොලී ආදායම්වලින් ලද ආදායම වැඩි වීම මෙයට ප්‍රධාන වශයෙන් හේතු විය.

ඒ අනුව, ප්‍රධාන වශයෙන් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව, ආගමන හා විගමන දෙපාර්තමේන්තුව සහ පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ ගාස්තු සංශෝධනය හේතුවෙන් සමස්ත බදු නොවන ආදායමෙන් සියයට 48.4 ක දායකත්වයක් ලබා දෙමින් විකුණුම් හා ගාස්තු 2022 වසරේ පළමු මාස නවය තුළ රු. බිලියන 56.8 සිට 2023 සමාන කාලපරිච්ඡේදයේ දී රු. බිලියන 85.4 ක් දක්වා සියයට 50.3 කින් සැලකියයුතු ලෙස වර්ධනය වී ඇත.

2022 වසරේ පළමු මාස නවයේ දී රජය සතු ව්‍යවසායයන්ගෙන්, ලාභ සහ ලාභාංශ ලෙස ලද රු. බිලියන 18.9 ක් වූ බදු නොවන ආදායම 2023 දී රු. බිලියන 22.8 දක්වා සියයට 20.6 කින් වර්ධනය විය. පොලී ආදායම ලෙස ලද බදු නොවන ආදායම 2022 වසරේ පළමු මාස නවයේ දී රු. බිලියන 4.6 සිට 2023 වසරේ සමාන කාල පරිච්ඡේදයේ දී රු. බිලියන 14.3 ක් දක්වා සියයට 212.0කින් වර්ධනය විය.

කෙසේ වුවද, සමාජ ආරක්ෂණ දායකත්වයෙන් ලද බදු නොවන ආදායම 2022 වසරේ පළමු මාස නවය තුළ වූ රු. බිලියන 27.7 ට සාපේක්ෂව 2023 වසරේ සමාන කාල පරිච්ඡේදයේ දී රු. බිලියන 26.7 ක් දක්වා සියයට 3.6 කින් පහත වැටී ඇත. 2023 වසරේ දී රු. බිලියන 278.0 ක් වූ බදු නොවන ආදායමෙහි වාර්ෂික ඇස්තමේන්තුවෙන් 2023 වසරේ පළමු මාස නවය තුළ සියයට 63.5 ක ප්‍රතිශතයක් ළඟා කරගෙන ඇත.

**වගුව 1.10 රාජ්‍ය ආදායමෙහි විචලතා විශ්ලේෂණය (2023 ජනවාරි සිට සැප්තැම්බර්)**

| අයිතමය | රු. බිලියන | | | හේතු |
|---|---|---|---|---|
| | 2022 ජන - සැප් | 2023 ඇස්තමේන්තුව | 2023 ජන - සැප් (තාවකාලික) | |
| ආදායම් බද්ද | 431.8 | 912.0 | 663.6 | 2023 වසර සඳහා වූ වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 72.8 ක් ලඟාකර ගනිමින්, 2022 වසරේ පළමු මාස නවය තුළ රු. බිලියන 431.8 සාපේක්ෂව 2023 වසරේ සමාන කාල පරිච්ඡේදය තුළ දී ආදායම් බදු මඟින් ලද ආදායම රු. බිලියන 663.6 දක්වා සියයට 53.7 කින් වැඩි විය. 2022 සහ 2023 වසරවල ක්‍රියාත්මක කරන ලද බදු ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ සමග, සංස්ථාපිත හා සංස්ථාපිත නොවන බදු ආදායම වැඩි වීම, උපයන විට ගෙවීම් බද්ද/අත්තිකාරම් පුද්ගල ආදායම් බදු (APIT) ආදායම සහ රඳවා ගැනීමේ බදු ආදායම (WHT) වැඩි වීම මෙයට ප්‍රධාන වශයෙන් හේතු විය. සංස්ථාපිත හා සංස්ථාපිත නොවන බදු ආදායම 2022 වසරේ පළමු මාස නවය තුළ වූ රු. බිලියන 399.4 ට සාපේක්ෂව 2023 වසරේ සමාන කාල පරිච්ඡේදයේ දී රු. බිලියන 445.9 දක්වා සියයට 11.7 කින් වැඩි විය. පුද්ගල ආදායම් බදු අනුපාතය ක්‍රමාණුකූලව සියයට 6 සිට සියයට 36 දක්වා සංශෝධනය වීම ඇතුළුව පුද්ගල ආදායම් බදු අනුපාත ව්‍යුහය සංශෝධනය වීම හේතුවෙන් උපයන විට ආදායම් බද්ද/අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද (APIT) රු. බිලියන 17.9 සිට රු. බිලියන 107.0 දක්වා සියයට 497.8 කින් සැලකිය යුතු ලෙස වැඩි විය. රඳවා ගැනීමේ බද්ද 2022 වසරේ පළමු මාස නවය තුළ වූ රු. බිලියන 14.3 ට සාපේක්ෂව 2023 වසරේ සමාන කාල පරිච්ඡේදයේ දී රු. බිලියන 110.4 දක්වා එනම් සියයට 672.7 කින් සැලකිය යුතු ලෙස වැඩි වීමක් වාර්තා වී ඇත. එමෙන්ම සළකා බලනු ලබන කාල පරිච්ඡේදය තුළ ප්‍රාග්ධන ලාභ බද්ද රු. බිලියන 3.2 දක්වා සියයට 140.7 කින් ඉහළ ගොස් ඇත. |
| එකතු කළ අගය මත බදු | 310.5 | 908.0 | 505.0 | 2023 වසර සඳහා වූ වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 55.6 ක් ළඟා කර ගනිමින්, 2022 වසරේ පළමු මාස නවය තුළ වූ රු. බිලියන 310.5 ට සාපේක්ෂව, 2023 වසරේ සමාන කාලපරිච්ඡේදයේ දී එකතු කළ අගය මත බදු ආදායම රු. බිලියන 505.0 දක්වා සියයට 62.6 කින් සැලකිය යුතු ලෙස ඉහළ ගොස් ඇත. 2022 වසරේ ජූනි 01 වනදා සිට බලාත්මක වන පරිදි එකතු කළ අගය මත බදු අනුපාතිකය සියයට 8 සිට සියයට 12 දක්වා ද 2022 වසරේ සැප්තැම්බර් මස 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි සියයට 12 සිට සියයට 15 දක්වා ඉහළ දැමීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. තවද, 2022 වසරේ ඔක්තෝම්බර් මස 01 වන දා සිට ක්‍රියාත්මක වන පරිදි වාර්ෂික එකතු කළ අගය මත බදු සඳහා ලියාපදිංචි සීමාව රු. මිලියන 300 සිට රු.මිලියන 80 දක්වා අඩු කිරීම මෙම වර්ධනය සඳහා දායක වී ඇත. දේශීය ආර්ථික ක්‍රියාකාරකම් සහ ආනයන ආශ්‍රිත ක්‍රියාකාරකම් මත අය කරනු ලබන එකතු කළ අගය මත බදු ආදායම පිළිවෙළින් රු. බිලියන 351.6 දක්වා සියයට 81.4 කින් ද, රු. බිලියන 153.4 දක්වා සියයට 31.5 කින් ද සළකා බලනු ලබන කාලපරිච්ඡේදය තුළ වැඩි විය. |

| අයිතමය | රු. බිලියන | | | හේතු |
|---|---|---|---|---|
| | 2022 ජන - සැප් | 2023 ඇස්තමේන්තුව | 2023 ජන - සැප් (තාවකාලික) | |
| නිෂ්පාදන බදු | 262.1 | 560.0 | 310.9 | නිෂ්පාදන බදු මගින් උපයන ලද ආදායම 2023 වසර සඳහා වූ වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 55.5 ක් ළඟා කර ගනිමින්, 2022 වසරේ පළමු මාස නවය තුළ රු. බිලියන 262.1 ට සාපේක්ෂව, 2023 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 310.9 දක්වා සියයට 18.6 කින් වැඩි වී ඇත. මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු වූයේ මත්පැන් සහ නිෂ්පාදන බද්දට අයත් අනිකුත් අයිතම වලින් ලද ආදායමේ සුළු අඩු වීමක් තිබියදීත් සිගරට්, ඛණිජ තෙල් නිෂ්පාදන සහ මෝටර් රථ මගින් ලබන බදු ආදායම වැඩි වීමයි. නිෂ්පාදන බද්දෙන් ලැබෙන ආදායම වෙත වැඩිම ආදායම් දායකත්වයක් ලබා දෙන සුරාබදු ආදායම 2022 වසරේ පළමු මාස නවයේ වූ රු. බිලියන 124.6 ට සාපේක්ෂව 2023 වසරේ සමාන කාල පරිච්ඡේද තුළ රු. බිලියන 124.0 ක් දක්වා සියයට 0.4 කින් සුළු වශයෙන් අඩු විය. දුම්වැටි සඳහා නිෂ්පාදන බද්ද 2023 වසරේ සමාන කල පරිච්ඡේදය තුළ රු. බිලියන 90.0 ක් දක්වා සියයට 8.9 කින් වැඩි වී ඇති අතර, 2023 වසරේ ජනවාරි මස 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි දුම්වැටි මත නිෂ්පාදන බදු සියයට 20 කින් ඉහළ දැමීමත්, ඉන් පසු 2023 ජුලි මස 01 වන දින සිට නැවත වරක් සියයට 20 කින් ඉහළ දැමීමත් මෙම ආදායම වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු විය. තවද, මොටර් වාහන මත නිෂ්පාදන බදු ආදායම ද, 2022 වසරේ පළමු මාස නවයේ වූ රු. බිලියන 13.7 ට සාපේක්ෂව 2023 වසරේ සමාන කාල පරිච්ඡේදය තුල රු. බිලියන 21.5 ක් දක්වා සියයට 57.1 කින් වැඩි විය. විගමණික සේවකයන්ට දිරිගැන්වීම් ලබා දීම සඳහා විද්‍යුත් වාහන ආනයනය කිරීමට අවසර ලබා දීමට රජය ගත් තීරණය මෙයට ප්‍රධාන වශයෙන් හේතු විය. තවද, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවෙන් මහා භාණ්ඩාගාරය වෙත මාරුකරන ලද වගකීම් සඳහා මුදල් යෙදවීමට, 2023 වසරේ දී දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 0.3 ක් ලබා ගැනීම සඳහා ආනයනික සියළු වර්ගවල පෙට්‍රල් සහ ඩීසල් මත නිෂ්පාදන බද්ද, 2023 ජනවාරි මස 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ලීටරයට රු.25/- කින් ද , 2023 ජුනි මස 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ලීටරයකට රු.25/- කින් නැවත වරක් ද වැඩි කිරීම හේතුවෙන්, ඛනිජ තෙල් නිෂ්පාදන මත නිෂ්පාදන බදු ආදායම 2022 වසරේ පළමු මාස නවය තුළ වාර්තා වූ රු. බිලියන 36.7 ට සාපේක්ෂව 2023 වසරේ සමාන කාල පරිච්ඡේදය තුළ දී රු.බිලියන 72.3 ක් දක්වා සියයට 97.1 කින් සැලකිය යුතු ලෙස වැඩිවිය. |
| ආනයන බදු | 36.6 | 80.0 | 66.1 | 2023 වසර සඳහා වූ වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 82.6 ක් ළඟා කරගනිමින්, ආනයන බදු මගින් උපයන ලද ආදායම 2022 වසරේ පළමු මාස නවය තුළ වූ රු. බිලියන 36.6 ට සාපේක්ෂව, 2023 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 66.1 දක්වා සියයට 80.7 කින් සැලකිය යුතු ලෙස වැඩි වී ඇත. ආනයනික බොහෝ භාණ්ඩ සඳහා පනවා තිබූ ආනයන සීමා ඉවත් කිරීම, කිරි පිටි, තිරිඟු පිටි සහ තිරිඟු ධාන්‍ය මත පනවා ඇති රේගු ආනයන බදු වැඩි කිරීම මෙයට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත. තවද, 2023 වසරේ මාර්තු මස 29 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි ආනයන බදු අනුපාත සියයට 0, සියයට 10 සහ සියයට 15 සිට සියයට 0, සියයට 15, සියයට 20 දක්වා වැඩි වන පරිදි සංශෝධනය කිරීම ද ආනයන බදු මගින් උපයන ලද ආදායම වර්ධනය වීම කෙරෙහි දායක වී ඇත. |
| වරාය හා ගුවන්තොටුපල සංවර්ධන බදු | 135.4 | 220.0 | 123.6 | 2023 වසර සඳහා වූ වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 56.2 ක් ළඟා කර ගනිමින්, 2022 වසරේ පළමු මාස නවය තුළ වාර්තා කරන ලද රු.බිලියන 135.4 ට සාපේක්ෂව 2023 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ වරාය හා ගුවන්තොටුපොළ සංවර්ධන බදු ආදායම රු. බිලියන 123.6 දක්වා සියයට 8.7 කින් අඩු වී ඇත. 2023 වසරේ අයවැය යෝජනාවට අනුකූලව වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බද්ද වසර 5 ක් ඇතුළත ඉවත් කිරීමේ අරමුණින් 2023 අප්‍රේල් මස 04 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බදු සහිත අයිතම වලින් සියයට 20 ක් එම බද්දෙන් නිදහස් කිරීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. |

| අයිතමය | රු. බිලියන | | | හේතු |
|---|---|---|---|---|
| | 2022 ජන - සැප් | 2023 ඇස්තමේන්තුව | 2023 ජන - සැප් (තාවකාලික) | |
| විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද | 29.2 | 70.0 | 36.8 | 2023 වසර සඳහා වූ වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 52.6 ක් ළඟා කර ගනිමින්, 2022 වසරේ පළමු මාස නවය තුල වාර්තා කරන ලද රු. බිලියන 29.2 ට සාපේක්ෂව, 2023 වසරේ සමාන කාලපරිච්ඡේදය තුල දී විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මඟින් උපයන ලද ආදායම රු. බිලියන 36.8 දක්වා සියයට 25.8 සැලකිය යුතු ලෙස වැඩි වී ඇත. ප්‍රධාන භණ්ඩවල ආනයන පරිමාව වැඩි වීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී ඇත. |
| සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද | – | 250.0 | 158.4 | 2023 වසර සඳහා වූ වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 63.4 ක් ළඟා කර ගනිමින්, 2023 වසරේ පළමු මාස නවය තුල දී සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද මගින් උපයන ලද ආදායම රු. බිලියන 158.4 ක් වූ අතර එහි දායකත්වය මුළු ආදායමෙන් සියයට 7.5 කි. |
| වෙනත් බදු | 77.7 | 130.0 | 69.6 | වෙනත් බදු අදායම, 2023 වසර සඳහා වූ වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 53.6 ක් ළඟා කර ගනිමින්, 2022 වසරේ පළමු මාස නවය තුළ රු. බිලියන 77.7 සිට, 2023 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 69.6 දක්වා සියයට 10.4 කින් අඩු වී ඇත. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ තීරු බදු නොවන ආනායන බදු තාර්කීකරණය කිරීම පිළිබඳ 2023 වසරේ අයවැය යෝජනාවට සමගාමීව වසර තුනක් ඇතුළත සෙස් බද්ද ඉවත් කිරීමේ අරමුණින් 2023 වසරේ මාර්තු මස 29 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි අයිතම 2,618 ක් සඳහා අදාළ වන සෙස් බදු අඩු කිරීම පිළිඹිබු කරමින් සෙස් බදු ආදායම 2023 වසරේ පළමු මාස නවය තුළ රු. බිලියන 39.5 ක් දක්වා සියයට 25.1 කින් අඩු වීමයි. කෙසේ වුවද, 2022 වසරේ ජූනි මස 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි විදුලි සංදේශ බද්ද සියයට 11.25 සිට සියයට 15 දක්වා වැඩි වන ලෙස සංශෝධනය කිරීම හේතුවෙන් විදුලි සංදේශ බද්දෙන් ලද ආදායම 2022 වසරේ පළමු මාස නවය තුල රු. බිලියන 10.6 සිට 2023 වසරේ සමාන කාලපරිච්ඡේදය තුලදී විදුලි සංදේශ බද්දෙන් ලද ආදායම රු. බිලියන 13.8 දක්වා සියයට 29.4 කින් සැලකිය යුතු ලෙස වැඩි විය. |
| බදු නොවන ආදායම | 165.1 | 278.0 | 176.5 | 2023 වසර සඳහා වූ වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 63.5 ක් ළඟා කර ගනිමින්, 2023 වසරේ පළමු මාස නවය තුළ බදු නොවන ආදායම රු. බිලියන 176.5 දක්වා සියයට 6.9 කින් වැඩි වී ඇත. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ, මෝටර් රථ ප්‍රවාහන, ආගමන හා විගමන සහ පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තු වල ගාස්තු හා ගෙවීම් සංශෝධනය කිරීම මගින් දඩ, ගාස්තු සහ ගෙවීම් වලින් ලැබෙන ආදායම රුපියල් බිලියන 85.4 දක්වා සියයට 50.3 කින් වැඩි වීමයි. තවද, රාජ්‍ය ව්‍යාපාර වලින් ලැබෙන ලාභ සහ ලාභාංශ, පොලී ආදායම සහ කුලී ආදායම මඟින් ඉහළ ආදායමක් වාර්තා කර ඇත.කෙසේ වෙතත්, මෙම සළකා බලනු ලබන කාල පරිච්ඡේදය තුළ සමාජ ආරක්ෂණ දායකත්ව ආදායම රු.බිලියන 26.7 දක්වා සියයට 3.6 කින් පහත වැටී ඇත. |
| එකතුව | **1,448.5** | **3,408.0** | **2,110.4** | |

*මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව*

විශේෂ සටහන 1.1 ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ක්‍රියාමාර්ග : 2023 වසරේ ජනවාරි සිට නොවැම්බර් 01 දක්වා

| ක්‍රියාත්මක වන දිනය | ක්‍රියාමාර්ග |
|---|---|
| **ආදායම් බද්ද - 2017 අංක 24 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත** | |
| 2023.06.01 | 2023.05.31 දිනැති අංක 2334/21 දරන ගැසට් නිවේදනය<br>– 2022 අතුරු අයවැයේ යෝජනා කර ඇති පරිදි , වාර්ෂික ආදායම සහ බදු නිදහස් සීමාවන් නොසලකා වයස අවුරුදු 18ට වැඩි සියලුම වාසික පුද්ගලයන් සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ අනිවාර්ය බදු ලියාපදිංචිය හඳුන්වා දීම. |
| **2022 අංක 45 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත** | |
| 2023.01.01 | **පුද්ගල ආදායම් බද්ද** |
| | වාර්ෂික බදු ආදායම |
| | මූලික රු. 1,200,000 -නිදහස්<br>රු.500,000-රු. 1,000,000- 6 %<br>රු. 1,000,000-රු. 1,500,000- 12 %<br>රු. 1,500,000-රු. 2,000,000 - 18 %<br>රු. 2,500,000-රු. 3,000,000 - 24 %<br>රු. 3,000,000-රු. 3,500,000 - 30 %<br>රු. 3,500,000 ට වැඩි -36 % |
| 2023.01.01 | **රඳවාගැනීමේ බද්ද** |
| | **රඳවාගැනීමේ බදු අනුපාත** |
| | ලාභාංශ - 15%<br>පොලිය හෝ වට්ටම් - 5%<br>මසකට රු.100,000 ඉක්මවන කුලීගෙවීම් - 10%<br>මසකට රු. 100,000 ඉක්මවන සේවා ගෙවීම් - 5%<br>අනෙකුත් සියළු අවස්ථා- 14% |
| **2023 අංක 04 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත** | |
| 2023.05.08 | i. පුද්ගලික ආදායම් බදු ගෙවන්නන් සඳහා ඉලෙක්ට්‍රොනික බදු ගොනු කිරීම අනිවාර්ය කිරීම.<br>ii. ආපසු ගෙවීමේ ක්‍රියාවලිය විධිමත් කිරීම සහ නේවාසික පුද්ගලයන් විසින් බදු වගකීම ඉක්මවා ගෙවන ලද මුදල් ආපසු ගෙවීම කඩිනම් කිරීම.<br>iii. මුදල් ගනුදෙනු අධෛර්යමත් කිරීම. දිනකට සමස්තයක් ලෙස ගෙවීම රු. 500,000/= හෝ ඊට වැඩි , හෝ තනි ගනුදෙනුවකදී හෝ එක් අවස්ථාවකදී බදු අරමුණු සඳහා වියදම් ලෙස අඩු කිරීමට ඉඩ නොදේ.<br>iv. දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට (IRD) පුද්ගල මට්ටමින් බදු ගෙවන්නන්ගේ ගනුදෙනු තොරතුරු ඉදිරිපත් කිරීමට මූල්‍ය ආයතන බැඳීයාව.<br>v. ශ්‍රී ලංකා රජයේ ව්‍යාපෘතියක නියැලීමෙන් අනේවාසික පුද්ගලයකු විසින් ලබා ගන්නා මුදල් නිදහස් කිරීමග |
| **2023 අංක 14 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත** | |
| 2023.04.01 | – සේවක භාර අරමුදලට, අනුමත අර්ථසාධක හෝ විශ්‍රාම වැටුප් අරමුදලකට හෝ අනුමත අවසන් කිරීමේ අරමුදලට 30% දක්වා අදාළ වන ආදායම් බදු අනුපාතය සහ දේශීය ණය ප්‍රශස්ත කිරීමේ ක්‍රියාවලියට ඵලදායී ලෙස සහභාගී වන අරමුදල් සඳහා ආදායම් බදු අනුපාතිකය 14% ලෙස අදාළ වන පරිදි ඉහළ නැංවීම. |

විශේෂ සටහන 1.1 ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ක්‍රියාමාර්ග : 2023 වසරේ ජනවාරි සිට නොවැම්බර් 01 දක්වා

| ක්‍රියාත්මක වන දිනය | ක්‍රියාමාර්ග |
|---|---|
| **ඔට්ටු ඇල්ලීම සහ සූදුබදු- 1988 අංක 40 දරන ඔට්ටු ඇල්ලීම සහ සූදුබදු පනත** | |
| 2023.04.01 | **2023 අංක 11 දරන ඔට්ටු ඇල්ලීම සහ සූදුබදු (සංශෝධන) පනත**<br>i. 2010 අංක 17 දරන කැසිනෝ ව්‍යාපාර (නියාමන) පනත යටතේ බලපත්‍රයක් ලබා ගන්නා නව කැසිනෝ ව්‍යාපාර සඳහා, ඔට්ටු ඇල්ලීම හා සූදුබදු පනත යටතේ පනවා ඇති බදු ගෙවීමට දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමඟ ලියාපදිංචිවීම සම්බන්ධයෙන් පවතින සීමාව ඉවත්කිරීමට.<br>ii. පිරිවැටුම මත දළ එකතු කිරීමේ බද්ද 10% සිට 15% දක්වා වැඩිකිරීම.<br>iii. සූදු ව්‍යාපාරික ස්ථානයකට ඇතුළු වන ශ්‍රී ලංකාවේ සෑම පුරවැසියෙකුගෙන්ම කැසිනෝ ඇතුල්වීමේ බද්ද ඇ.ඩො. 100 (මේ වන තෙක් එකතු නොකරන ලද) සිට ඇ.ඩො. 50 දක්වා හෝ ඊට සමාන ශ්‍රී ලංකා රුපියල් ප්‍රමාණයක් දක්වා අඩුකිරීම.<br>iv. 2023 අප්‍රේල් 01 වැනිදා හෝ ඉන්පසුව ආරම්භවන සෑම වසරක් සඳහාම සූදුව්‍යාපාර පවත්වාගෙ නයනු ලබන පුද්ගලයකු විසින් ගෙවියයුතු වාර්ෂික බද්ද රු. මිලියන 200 සිට රු. මිලියන 500 ක් දක්වා වැඩිකිරීම.<br>v. 2023 අප්‍රේල් 01 දින හෝ ඉන් පසුව ආරම්භවන සෑම වසරක් සඳහාම බුකී ව්‍යාපාරය කරගෙනයන පුද්ගලයෙකු විසින් ගෙවියයුතු වාර්ෂික බද්ද පහත පරිදි වැඩිකිරීම;<br>- නියෝජිතයෙකු හරහා රු. මිලියන 4 සිට රු. මිලියන 5 දක්වා<br>- සජීවී විකාශන පහසුකම් භාවිතයෙන් රු. 600,000 සිට රු.1,000,000 දක්වා<br>- සජීවී විකාශන පහසුකම් භාවිතයෙන් තොරව රු. 50,000 සිට රු.75,000 දක්වා<br>vi. මාර්ගගත ක්‍රියාකාරකම් ඇතුළත් කිරීම සඳහා බුකිකරු සහ සූදුක්‍රීඩා වැනි යෙදුම් නැවත අර්ථ දැක්වීම.<br>vii. දැනට බලාත්මකව පවතින අනෙකුත් පනත් වෙත යොමුකිරීම සඳහා ඔට්ටු ඇල්ලීම හා සූදුබදු පනතේ අදාළ වගන්ති නැවත කෙටුම්පත් කිරීම. |
| **සමාජ අරක්ෂණ දායකත්ව බද්ද - 2022 අංක 25 දරන සමාජ අරක්ෂණ දායකත්ව බදු පනත** | |
| 2023.09.08 | **2023 අංක 15 දරන සමාජ ආරක්ෂණ දායකත්ව (සංශෝධන) බදු පනත** |
| | 1. පහත අයිතම සමාජ ආරක්ෂණ දායකත්ව බද්දෙන් නිදහස් කිරීම සඳහා සමාජ ආරක්ෂණ දායකත්ව බදු පනතෙහි පළමුවන උපලේඛනයේ Iඅ කොටස සංශෝධනය කිරීමට,<br>i 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ හඳුන්වාදුන් නිෂ්පාදන බද්ද, බදු ව්‍යුහය සරල කිරීමට හඳුන්වා දුන් බද්දක් වන බැවින් ආනයනයේදී නිෂ්පාදන බද්දට යටත්වන ඕනෑම මෝටර් රථයක්.<br>ii විශේෂ අවශ්‍යතා ඇති පුද්ගලයන් මත බදු බර අඩු කිරීම සඳහා එවැනි පුද්ගලයන් භාවිතා කරන උපකරණ.<br>iii කපා ඔප දැමීමෙන් පසු ප්‍රතිඅපනයනය කිරීමේ ශ්‍රී ලාංකික ව්‍යාපාර වල බදු බර අඩු කිරීමෙන් ගෝලීය වෙළඳපොළ තුළ තරගකාරීත්වය පවත්වාගෙන යාමට ප්‍රති අපනයනය කිරීම සඳහා ආනයනය කරන රළු ඔපදමා නොමැති මැණික් ගල්.<br>iv අනෙකුත් ආනයන බදු ඉවත්කර ඇති ලෙසම තීරුබදු රහිත සාප්පු වල විකුණනු ලබන ඕනෑම භාණ්ඩයක්.<br>v ඉහළ යන ජීවන වියදම අවම කිරීමට දේශීයව නිෂ්පාදනය කරන වී වලින් නිපදවන සහල්.<br><br>2. බෙදාහැරීමේ බලපත්‍රයක් යටතේ සිදුකරන විදුලිය සැපයීම හැර, විදුලිය නිපදවීම හා සැපයීම සමාජ ආරක්ෂණ දායකත්ව බද්දෙන් නිදහස් කිරීම සඳහා සමාජ ආරක්ෂණ දායකත්ව බදු පනතෙහි පළමු උපලේඛනයේ II කොටසෙහි i අයිතමය සංශෝධනය කිරීම.<br><br>3. සිවිල් ගුවන් සේවා පනතේ 97 වැනි වගන්තිය යටතේ නිකුත් කරන ලද ද්‍රව්‍ය ප්‍රවාහන සේවා බලපත්‍රයක් දරනු ලබන සාමාන්‍ය අලෙවි නියෝජිතයන්ගේ අඩු ලාභ මට්ටම් සලකා එවැනි අලෙවි නියෝජිතයන් සපයන සේවා නිදහස් කිරීමට සමාජ ආරක්ෂණ දායකත්ව බදු පනතෙහි පළමු උපලේඛනයේ II වන කොටස සංශෝධනය කිරීමට. |

විශේෂ සටහන 1.1 ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ක්‍රියාමාර්ග : 2023 වසරේ ජනවාරි සිට නොවැම්බර් 01 දක්වා

| ක්‍රියාත්මක වන දිනය | ක්‍රියාමාර්ග |
|---|---|
| **එකතු කළ අගය මත බද්ද - 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත** | |
| 2023.01.01 | 2022 අංක 44 දරන එකතු කළ අගය මත (සංශෝධන) බදු පනත<br>– සභාධිපත්‍ය නේවාසික මහල් නිවාස මත එකතු කළ අගය මත බදු නිදහස් කිරීම ඉවත් කිරීම. |
| **නිෂ්පාදන බද්ද - 1989 අංක 13 දරන නිෂ්පාදන බදු විශේෂ (විධිවිධාන) පනත** | |
| 2023.01.01 | 2022.12.31 දිනැති අංක 2312/68 දරන ගැසට් නිවේදනය<br>– ශ්‍රී ලංකා රේගුව විසින් ක්‍රියාත්මක කරන ලද 2022 සංයෝජිත වර්ගීකරණ සංකේත සංශෝධන අනුවාදයට අනුව , හඳුන්වාදෙන ලද නව සංයෝජිත වර්ගීකරණ සංකේත/ ජාතික උපබෙදුම් සංයෝජිත වර්ගීකරණ සංකේත සහ සංශෝධිත සංයෝජිත වර්ගීකරණ සංකේත සඳහා අදාළ වන නිෂ්පාදන බදු නියම කිරීම.<br>– ඛනිජ තෙල් නිෂ්පාදන සඳහා අදාළ වන නිෂ්පාදන බද්ද වැඩි කිරීමට.<br>– දුම්වැටි සඳහා අදාළ වන නිෂ්පාදන බද්ද වැඩි කිරීමට. |
| 2023.06.01 | 2023.05.31 දිනැති අංක 2334/23 දරන ගැසට් නිවේදනය<br>– ඉන්ධන (පෙට්‍රල් සහ ඩීසල්) මත වන නිෂ්පාදන බදු අනුපාතය ලීටරයකට රු. 25 කින් වැඩි කිරීම. |
| 2023.06.17 | 2023.06.16 දිනැති අංක 2336/69 දරන ගැසට් නිවේදනය<br>– පැල්මිටික් අම්ලය (HS කේත 2915.70.10) සහ ලෝරික් අම්ලය( HS කේත 2915.90.10) සඳහා CIF අගයෙන් 29%ක නිෂ්පාදන බදු අනුපාතයක් පැනවීම. |
| 2023.07.01 | 2023.06.30 දිනැති අංක 2338/58 දරන ගැසට් නිවේදනය<br>– ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ අරමුදල් පහසුකම් වැඩසටහනට අනුකූලව සියලුම දුම්වැටි වර්ග සඳහා නිෂ්පාදන බද්ද සියයට 20 කින් වැඩි කිරීම. |
| සුරා බද්ද - සුරාබදු ආඥා පනත (52 වන අධිකාරය) | |
| 2023.01.03 | සුරාබදු නිවේදන අංක 07/2022(2022.12.31 දිනැති අංක 2312/70 දරන ගැසට් නිවේදනය)<br>– මත්පැන් මත සුරා බද්ද වැඩිකිරීම. |
| 2023.06.17 | සුරාබදු නිවේදන අංක 01/2023 (2023.06.16 දිනැති අංක 2336/70 දරන ගැසට් නිවේදනය)<br>– බලපත්‍ර සහිතව හෝ රහිතව සන්තකයේ තබාගත හැකි අයිසො ප්‍රොපයිල් (Isopropyl) මධ්‍යසාරවල වර්තමාන සීමාවන් වැඩි කිරීම. |
| 2023.07.01 | සුරාබදු නිවේදන අංක 02/2023 (2023.06.30 දිනැති අංක 2338/57 දරන ගැසට් නිවේදනය)<br>– ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීරණ අරමුදල් පහසුකම් වැඩසටහනට අනුකූලව සියලුම මත්පැන් වර්ග සඳහා නිෂ්පාදන බද්ද සියයට 20කින් වැඩි කිරීම. |
| **දුම්කොළ බදු - 1999 අංක 08 දරන දුම්කොළ බදු පනත** | |
| 2023.01.01 | 2022.12.31 දිනැති අංක 2312/71 දරන ගැසට් නිවේදනය<br>– බීඩියක් මත රුපියල් දෙකක බද්දක් පැනවීම. |
| රේගු අධිභාරය - රේගු ආඥාපනත (235 වන අධිකාරය) | |
| 2023.01.05 | 2023.01.04 දිනැති අංක 2313/35 දරන ගැසට් නිවේදනය<br>– 2017 රේගු සංයෝජිත සංකේතාංක අඩංගුව දැනට පවතින නියෝගය 2022 හි නව රේගු සංයෝජිත සංකේතාංක සංකේත අනුව නැවත නිකුත් කිරීම. |
| 2023.06.01 | 2023.05.31 දිනැති අංක 2334/28 දරන ගැසට් නිවේදනය<br>– 2023 දෙසැම්බර් 31 දක්වා තවත් මාස හයක කාලයක් සඳහා තෝරාගත් භාණ්ඩ සඳහා රේගු ආනයන බද්දේ ප්‍රතිශතයක් ලෙස අධිභාරය දිගටම පවත්වාගෙන යෑම සඳහා 2022.11.30 දිනැති අංක 2308/16 දරන ගැසට් නිවේදනය නැවත නිකුත් කිරීම. |

විශේෂ සටහන 1.1 ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ක්‍රියාමාර්ග : 2023 වසරේ ජනවාරි සිට නොවැම්බර් 01 දක්වා

| ක්‍රියාත්මක වන දිනය | ක්‍රියාමාර්ග |
|---|---|
| **වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බද්ද - 2011 අංක 18 දරන වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බදු පනත** | |
| 2023.01.01 | 2022.12.31 දිනැති අංක 2312/67 දරන ගැසට් නිවේදනය<br>– ශ්‍රී ලංකා රේගුව විසින් ක්‍රියාත්මක කරන ලද 2022 සංයෝජිත වර්ගීකරණ සංකේත සංශෝධන අනුවාදයට අනුව , හඳුන්වාදෙන ලද නව සංයෝජිත වර්ගීකරණ සංකේත / ජාතික උපබෙදුම් සංයෝජිත වර්ගීකරණ සංකේත සහ සංශෝධිත සංයෝජිත වර්ගීකරණ සංකේත සඳහා අදාළ වන වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බද්ද නියම කිරීම. |
| 2023.04.04 | 2023.04.03 දිනැති අංක 2326/02 දරන ගැසට් නිවේදනය<br>– අයවැය 2023 හි යෝජනාවට අනුව වසර පහක් තුල වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බද්ද ඉවත් කිරීමේ පළමු පියවර ලෙස 1631 තීරුබදු අයිතම මත අදාළ වන වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බද්ද නිදහස් කිරීම. |
| 2023.09.22 | 2023.09.21 දිනැති අංක 2350/45 දරන ගැසට් නිවේදනය<br>– 2021 අගෝස්තු මාසයේ සිට කිරිපිටි ආනයනය සඳහා නිදහස් කරන ලද වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බද්ද 10% ක් පැනවීම. |
| **සෙස් බද්ද - 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත** | |
| 2023.01.01 | 2023.01.01 දිනැති අංක 2312/76 දරන ගැසට් නිවේදනය<br>– ශ්‍රී ලංකා රේගුව විසින් ක්‍රියාත්මක කරන ලද 2022 සංයෝජිත වර්ගීකරණ සංකේත සංශෝධන අනුවාදයට අනුව , හඳුන්වාදෙන ලද නව සංයෝජිත වර්ගීකරණ සංකේත / ජාතික උපබෙදුම් සංයෝජිත වර්ගීකරණ සංකේත සහ සංශෝධිත සංයෝජිත වර්ගීකරණ සංකේත සඳහා අදාළ වන සෙස් බද්ද නියම කිරීම. |
| 2023.03.29 | 2023.03.28 දිනැති අංක 2325/06 දරන ගැසට් නිවේදනය<br>– 2023 අයවැයෙන් යෝජනා කර ඇති පරිදි වසර තුනක් ඇතුළත සෙස් බද්ද ඉවත් කිරීමේ පළමු පියවර ලෙස සංයෝජිත සංකේතාංක කේත 8155 කින් සංයෝජිත සංකේතාංක කේත 2668 ක සෙස් බද්ද අඩු කිරිම. |
| 2023.06.17 | 2023.06.16 දිනැති අංක 2336/71 දරන ගැසට් නිවේදනය<br>– පෝට්ලන්ඩ් සිමෙන්ති ආනයනය මත සෙස් බද්ද වැඩි කිරීම සහ ක්ලින්කර් ආනයනය මත කිලෝග්‍රෑමයකට රු. 1/- ක සෙස් බද්දක් පැනවීම. |
| 2023.07.22 | 2023.07.21 දිනැති අංක 2341/63 දරන ගැසට් නිවේදනය<br>– තීරුබදු විෂමතා ඉවත් කිරීම සඳහා දේශීය මුද්‍රණ තීන්ත නිෂ්පාදනය සඳහා අමුද්‍රව්‍ය ආනයනය කිරීමේදී සෙස් බදු සහන ලබා දීම. |
| **සෙස් බද්ද - 2021 අංක 19 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනත** | |
| 2023.01.31 | 2023.01.26 දිනැති අංක 2316/32 දරන ගැසට් නිවේදනය<br>– කොළඹ කොටස් වෙළඳපොළ හරහා ආයතනික ණය සුරැකුම්පත් වල නැවත මිලදී ගැනීමේ ගණුදෙනු සඳහා 0.006 %ක සෙස් බද්දක් පැනවීම. |
| **රේගු ආනයන බද්ද - 1962 අංක 19 දරන ආදායම් සංරක්ෂණ පනත** | |
| 2023.01.01 | ආදායම් සංරක්ෂණ ආඥා අංක 07/2022 (2023.01.01 දිනැති අංක 2312/75 දරන ගැසට් නිවේදනය)<br>– ජාත්‍යන්තර වෙළෙඳ ප්‍රවාහයන්ට පහසුකම් සැලසීම සඳහා සෑම වසර 05කට වරක්ම රේගු සංයෝජිත සංකේතාංක යාවත්කාලීන කිරීම.ශ්‍රී ලංකාවේ ඉලක්කම් අටකින් යුතු රේගු සංකේතාංක 7,842 ක් ඇත. කෙසේ වුවත්, 2022 සංස්කරණය මගින් එම රේගු සංකේතාංක සංඛ්‍යාව 8,155 ක් දක්වා වැඩි වී ඇත. |
| 2023.03.29 | ආදායම් සංරක්ෂණ ආඥා අංක 01/2023 (2023.03.28 දිනැති අංක 2325/07 දරන ගැසට් නිවේදනය)<br>– 0%, 10% සහ 15% සිට 0%, 15%, 20% දක්වා රේගු ආනයන බදු අනුපාත සංශෝධනය කිරීම මගින් සෙස් බද්ද සියයට 20 කින් අඩු කිරීම සලකා ආදායම් මධ්‍යස්ථභාවය පවත්වා ගැනීම සඳහා නිශ්චිත අයිතම සඳහා රේගු ආනයන බදු අනුපාතය වැඩි කිරීම. |
| 2023.06.17 | ආදායම් සංරක්ෂණ ආඥා අංක 02/2023 (2023.06.16 දිනැති අංක 2336/72 දරන ගැසට් නිවේදනය)<br>– දේශීය රූපලාවණ්‍ය කර්මාන්තයට පහසුකම් සැලසීම සඳහා පාම් ඔයිල් මේද අම්ලයේ තීරුබදු ව්‍යුහයට සමාන තීරුබදු ව්‍යුහයක් පැනවීම සහ පැල්මිටික් අම්ලය සහ ලෝරික් අම්ලය සඳහා නව සංයෝජිත සංකේතාංක කේතයන් (ජාතික උපබෙදුම්) නිර්මාණය කිරීම. |

විශේෂ සටහන 1.1 ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ක්‍රියාමාර්ග : 2023 වසරේ ජනවාරි සිට නොවැම්බර් 01 දක්වා

| ක්‍රියාත්මක වන දිනය | ක්‍රියාමාර්ග |
|---|---|
| 2023.07.01 | ආදායම් සංරක්ෂණ ආඥ අංක 03/2023 (2023.06.30 දිනැති අංක 2338/54 දරන ගැසට් නිවේදනය)<br>– ශ්‍රී ලංකා සිංගප්පූරු නිදහස් වෙළඳ ගිවිසුම යටතේ තීරුබදු 1,238 ක රේගු ආනයන තීරුබදු ලිබරල්කරණ වැඩසටහනේ (TLP) "6" කාණ්ඩය යටතේ වාර්ෂික වාරික හයෙන් පළමු වාරිකය ඉවත් කිරීම. |
| 2023.07.22 | ආදායම් සංරක්ෂණ ආඥ අංක 04/2023 (2023.07.21 දිනැති අංක 2341/64 දරන ගැසට් නිවේදනය)<br>– තීරුබදු විෂමතා ඉවත් කිරීම සඳහා දේශීය මුද්‍රණ තීන්ත නිෂ්පාදනය සඳහා අමුද්‍රව්‍ය ආනයනය කිරීමේදී රේගු ආනයන බදු සියයට 5ක සහනදායී අනුපාතයක් හඳුන්වා දීම. |
| 2023.08.30 | ආදායම් සංරක්ෂණ ආඥ අංක 05/2023 (2023.08.29 දිනැති අංක 2347/06 දරන ගැසට් නිවේදනය)<br>– තිරිඟු පිටි ආනයනය සඳහා ආනයන බද්ද සියයට 15කින් හෝ කි.ග්‍රෑ. රු. 16 සිට සියයට 20 හෝ කි.ග්‍රෑ. රු. 27 දක්වා වැඩි කිරීම. |
| **විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද - 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත** | |
| 2023.01.05 | 2023.01.04 දිනැති අංක 2313/34 දරන ගැසට් නිවේදනය<br>– 2017 රේගු සංයෝජිත සංකේතාංක අඩංගුව දැනට පවතින නියෝගය 2022 හි නව රේගු සංයෝජිත සංකේතාංක සංකේත අනුව නැවත නිකුත් කිරීම. |
| 2023.01.26 | 2023.01.25 දිනැති අංක 2316/28 දරන ගැසට් නිවේදනය<br>– දේශීය සත්ව ආහාර නිෂ්පාදන කර්මාන්තයට පහසුකම් සැලසීම සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ නිර්දේශය ඇතිව 2023 ජනවාරි 15 හෝ ඊට පෙර ශ්‍රී ලංකාවේ වරාය/ගුවන්තොටුපලවල බඩඉරිඟු තොග ගෙනඒමට යටත්ව සහනය දීර්ඝ කිරීම. |
| 2023.02.21 | 2023.02.20 දිනැති අංක 2320/04 දරන ගැසට් නිවේදනය<br>– බිත්තර ආනයනයේදී බිත්තරයකට රුපියල් 50/-ක විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද හඳුන්වා දීම සහ බේකරි කර්මාන්තය සඳහා සාධාරණ මිලකට බිත්තර ලබා දීමට රාජ්‍ය වාණිජ සංස්ථාව සඳහා බිත්තරයකට රු. 1/- ක සහන මිලක් ලබා දීම. |
| 2023.03.04 | 2023.03.04 දිනැති අංක 2321/76 දරන ගැසට් නිවේදනය<br>– දේශීය ගොවීන් සඳහා වඩා හොඳ මිලක් සහතික කිරීම පිණිස කළු ඇට, කව්පි, කුරක්කන් සහ අනෙකුත් මෙනේරි සඳහා පනවා ඇති විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද තවත් වසරක කාලයක් සඳහා දීර්ඝ කිරීම. |
| 2023.03.08 | 2023.03.07 දිනැති අංක 2322/20 දරන ගැසට් නිවේදනය<br>– දේශීය ගොවීන්ගේ අස්වැන්න සඳහා සාධාරණ වෙළඳපල මිලක් සහතික කිරීම මගින් ඔවුන් දිරිමත් කිරීම පිණිස අර්තාපල් ආනයනය මත විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද රු.50/- ක් දක්වා වැඩි කිරීම. |
| 2023.03.08 | 2023.03.07 දිනැති අංක 2322/21 දරන ගැසට් නිවේදනය<br>– රාමසාන් උත්සව සමය නිමිත්තෙන් කිසිදු විදේශ විනිමය පදනමක් නොමැතිව පරිත්‍යාග හෝ තෑගි වශයෙන් ලැබෙන රට ඉඳි ආනයනය කිරීම සඳහා පමණක් කිලෝවකට රුපියලක සහනයක් සැලසීම. |
| 2023.03.18 | 2023.03.17 දිනැති අංක 2323/40 දරන ගැසට් නිවේදනය<br>– වෙළඳ, වාණිජ සහ ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ නිර්දේශයට යටත්ව ශීත කළ සම්පූර්ණ බිත්තර දියර ආනයනය කිරීම සඳහා කිලෝවකට රු.200/ ක සහනදායී මිලක් අය කිරීම. |
| 2023.05.18 | 2023.05.17 දිනැති අංක 2332/14 දරන ගැසට් නිවේදනය<br>– ත්‍රිපෝෂ නිෂ්පාදනය සඳහා බඩ ඉරිඟු ආනයනය මත කිලෝවකට රු. 50/-ක බදු සහනයක් සැලසීම, බඩ ඉරිඟු ආනයනය මත කිලෝවකට රු.75/-ක විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද පැනවීම, සහල් ආනයනය මත කිලෝවකට ශත 25 ක සිට රුපියල් 65 දක්වා විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද වැඩි කිරීම සහ වලංගු කාලය දීර්ඝ කිරීම සහ අනෙකුත් භාණ්ඩ 34ක වලංගු කාලය එම තීරු බදු අනුපාතය ලෙස දීර්ඝ කිරීම. |
| 2023.05.21 | 2023.05.20 දිනැති අංක 2332/53 දරන ගැසට් නිවේදනය<br>– බේකරි කර්මාන්තය සඳහා සාධාරණ මිලකට බිත්තර ලබා දීමට රාජ්‍ය වාණිජ සංස්ථාව සඳහා බිත්තරයකට රු. 1/-ක සහනදායී මිලක් ලබා දීම සහ බිත්තර ආනයනය කිරීමේදී බිත්තරයකට රු.50/- ක විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද අඛණ්ඩව පවත්වාගෙන යාම. |
| 2023.06.23 | 2023.06.22 දිනැති අංක 2337/16 දරන ගැසට් නිවේදනය<br>– ආහාර ප්‍රතිපත්ති කමිටුවේ තීරණය සලකා බලා, වෙළඳ, වාණිජ සහ ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ නිර්දේශයට යටත්ව ශීත කළ සම්පූර්ණ බිත්තර දියර ආනයනය කිරීම සඳහා කිලෝවකට රු.200/- ක සහනදායී මිලක් අය කිරීම. |

විශේෂ සටහන 1.1 ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ක්‍රියාමාර්ග : 2023 වසරේ ජනවාරි සිට නොවැම්බර් 01 දක්වා

| ක්‍රියාත්මක වන දිනය | ක්‍රියාමාර්ග |
|---|---|
| 2023.07.14 | 2023.07.13 දිනැති අංක 2340/45 දරන ගැසට් නිවේදනය<br>– ආනයනික මිල සහ ත්‍රිපෝෂ නිෂ්පාදනය සඳහා ටෙන්ඩර් මිලෙහි වෙනස සලකා බඩඉරිඟු ආනයනයේදී ලබා දී ඇති සහන ඉවත් කිරීම සහ සාමාන්‍ය තීරු බදු ව්‍යුහය පැනවීම. |
| 2023.08.01 | 2023.07.31 දිනැති අංක 2343/11 දරන ගැසට් නිවේදනය<br>– භාණ්ඩ 6ක් සඳහා වලංගු කාලය දීර්ඝ කිරීම සහ ඖෂධ නිෂ්පාදනය සඳහා යොදා ගන්නා ලුණු ආනයනය මත තීරුබදු නිදහස් කිරීම හා සෙයිල් මාළු, මාර්ලින් මාළු සහ ක්වීන් මාළු වැනි මත්ස්‍ය ප්‍රභේද ආනයනය කිරීමේදී තීරු බදු සහනයට යටත් වන HS කේතයන් සංශෝධනය කිරීම. |
| 2023.08.18 | 2023.08.17 දිනැති අංක 2345/64 දරන ගැසට් නිවේදනය<br>– බඩඉරිඟු ආනයනය සඳහා රුපියල් 25 ක සහනදායී විශේෂ වෙළඳ භාණ්ඩ තීරුබදු අනුපාතයක් හඳුන්වා දීම සහ කළු ඇට සහ මුං ආනයනය සඳහා තීරු බදු අනුපාතය සංශෝධනය කිරීම. |
| 2023.08.21 | 2023.08.21 දිනැති අංක 2346/16 දරන ගැසට් නිවේදනය<br>– බිත්තර ආනයනය කිරීමේදී බිත්තරයකට රු.50/- ක විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද අඛණ්ඩව පවත්වාගෙන යාම සහ රාජ්‍ය වාණිජ සංස්ථාව සඳහා බිත්තරයකට රු. 1/-ක සහනදායී මිලක් ලබා දීම. |
| 2023.09.08 | 2023.09.08 දිනැති අංක 2348/44 දරන ගැසට් නිවේදනය<br>– කෘෂිකර්ම අමාත්‍යාංශයේ සහ වෙළෙඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශයේ නිර්දේශ සැලකිල්ලට ගනිමින් අර්තාපල් ආනයනය මත විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද අඛණ්ඩව පවත්වාගෙන යාම. |
| 2023.10.14 | 2023.10.14 දිනැති අංක 2353/77 දරන ගැසට් නිවේදනය<br>– මාළු, උම්බලකඩ, පරිප්පු, මැන්ගුස් සහ කිවි පලතුරු ආනයනය සඳහා පවතින විශේෂ වෙළඳ භාණ්ඩ බද්දේ වලංගු කාලය වසරක කාලයක් සඳහා දීර්ඝ කිරීම සහ දේශීය ටින් මාළු කර්මාන්තයේ භාවිතය සඳහා මැකරල් මාළු ආනයනය සඳහා තීරු බදු සහනය දීර්ඝ කිරීම. |
| 2023.11.02 | 2023.11.01 දිනැති අංක 2356/20 දරන ගැසට් නිවේදනය<br>– සීනි සඳහා පවතින විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද කිලෝ ග්‍රෑමයකට සත 25 සිට කිලෝ ග්‍රෑමයකට රු. 50/- දක්වා වැඩි කිරීම |
| ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි - 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත | |
| 2023.01.01 | 2023 අංක 01 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි (2023.01.01 දිනැති අංක 2312/77 දරන ගැසට් නිවේදනය)<br>– ආනයන පාලන බලපත්‍ර ඒකාබද්ධ කිරීම. |
| 2023.01.01 | 2023 අංක 02 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි (2023.01.01 දිනැති අංක 2312/78 දරන ගැසට් නිවේදනය)<br>– තාවකාලික අත්හිටුවීම ඒකාබද්ධ කිරීම. |
| 2023.01.19 | 2023 අංක 03 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි (2023.01.19 දිනැති අංක 2315/46 දරන ගැසට් නිවේදනය)<br>– ගෙවීම් නියමයන් පිළිබඳ රෙගුලාසි සංශෝධනය කිරීම. |
| 2023.02.22 | 2023 අංක 04 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි (2023.02.22 දිනැති අංක 2320/46 දරන ගැසට් නිවේදනය)<br>– ගෙවීම් නියමයන් පිළිබඳ රෙගුලාසි සංශෝධනය කිරීම. |
| 2023.02.22 | 2023 අංක 05 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි (2023.02.22 දිනැති අංක 2320/47 දරන ගැසට් නිවේදනය<br>– ආනයන සහ අපනයන පාලන රෙගුලාසි සංශෝධනය කිරීම. |
| 2023.03.24 | 2023 අංක 06 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි (2023.03.24 දිනැති අංක 2324/45 දරන ගැසට් නිවේදනය)<br>– පිටාර විමෝචනය සහ ආරක්ෂක පියවරයන්/ සම්මත රෙගුලාසි සංශෝධනය කිරීම. |
| 2023.04.06 | 2023 අංක 07 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි (2023.04.06 දිනැති අංක 2326/40 දරන ගැසට් නිවේදනය)<br>– ගෙවීම් නියමයන් මත ආනයන අපනයන පාලන රෙගුලාසි සංශෝධනය කිරීම. |
| 2023.06.01 | 2023 අංක 08 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි (2023.04.06 දිනැති අංක 2326/41 දරන ගැසට් නිවේදනය)<br><br>– තනි භාවිත ප්ලාස්ටික් ද්‍රව්‍ය සඳහා රෙගුලාසි පැනවීම. |

විශේෂ සටහන 1.1 ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ක්‍රියාමාර්ග : 2023 වසරේ ජනවාරි සිට නොවැම්බර් 01 දක්වා

| ක්‍රියාත්මක වන දිනය | ක්‍රියාමාර්ග |
|---|---|
| 2023.06.10 | 2023 අංක 09 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි (2023.06.09 දිනැති අංක 2335/26 දරන ගැසට් නිවේදනය)<br>– උපලේඛනයේ විස්තර කර ඇති පරිදි HS කේතයන් යටතේ වර්ගීකරණය කර ඇති භාණ්ඩ, 2023 අංක 02 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසිවල I උපලේඛනයෙන් මකා දැමීම. |
| 2023.06.14 | 2023 අංක 10 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි (2023.06.14 දිනැති අංක 2336/45 දරන ගැසට් නිවේදනය)<br>– තිරිඟු හෝ මෙස්ලින් පිටි මත ආනයන පාලන බලපත්‍රය ඇතුළත් කිරීම. |
| 2023.07.20 | 2023 අංක 11 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි (2023.07.20 දිනැති අංක 2341/38 දරන ගැසට් නිවේදනය)<br>– උපලේඛනයේ විස්තර කර ඇති පරිදි HS කේතයන් යටතේ වර්ගීකරණය කර ඇති භාණ්ඩ, 2023 අංක 02 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසිවල I උපලේඛනයෙන් මකා දැමීම. |
| 2023.08.14 | 2023 අංක 12 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි (2023.08.14 දිනැති අංක 2345/03 දරන ගැසට් නිවේදනය)<br>– මගීන්, භාණ්ඩ සහ විශේෂ කාර්ය මෝටර් රථ ප්‍රවාහනය සඳහා භාවිතා කරන මෝටර් රථ සඳහා තාවකාලික අත්හිටුවීම ඉවත් කිරීම. (2023.08.14 සිට මාසයක කාලයක් සඳහා වලංගු වේ.) |
| 2023.08.29 | 2023 අංක 13 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි (2023.08.29 දිනැති අංක 2347/08 දරන ගැසට් නිවේදනය)<br>– 2023.06.14 දින අංක 2336/45 දරන ගැසට් නිවේදනය මගින් පනවා තිබූ තිරිඟු පිටි බලපත්‍ර අවශ්‍යතාවය ඉවත් කිරීම. |
| 2023.10.09 | 2023 අංක 14 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි (2023.10.09 දිනැති අංක 2353/16 දරන ගැසට් නිවේදනය)<br>– උපලේඛනයේ විස්තර කර ඇති පරිදි HS කේතයන් යටතේ වර්ගීකරණය කර ඇති භාණ්ඩ, 2023 අංක 02 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසිවල I උපලේඛනයෙන් මකා දැමීම. |
| අපගමන බද්ද - 2003 අංක 25 දරන මුදල් පනත | |
| 2023.01.12 | 2023.01.11 දිනැති අංක 2314/16 දරන ගැසට් නිවේදනය<br>– අපගමන බද්ද පනවන ලද 2003 වසරේ සිට මෙතෙක් නැව් මගින් පිටත්වන මගීන්ගෙන් අපගමන බද්ද අය කිරීමට නියමයන් පනවා නැත. එබැවින්, ගුවන් යානයකින් මෙන්ම නැවකින් ද ශ්‍රී ලංකාවෙන් පිටත්වන මගීන් සඳහා අපගමන බද්ද අයකිරීමට රෙගුලාසි හඳුන්වා දී ඇත. |
| 2023.04.25 | 2023.04.25 දිනැති අංක 2329/19 දරන ගැසට් නිවේදනය<br>– කොළඹ ජාත්‍යන්තර ගුවන් තොටුපළ, රත්මලාන වෙතින් නියමිත ගුවන් ගමන් මෙහෙයුම් ආරම්භ කරන ගුවන් සමාගම් අදාළ අපගමන බද්ද සඳහා වන ඇ.එ.ජ. ඩොලර් 60 න් 50% ක් ගෙවීමෙන් ඉවත් කිරීම (එනම් ඇමරිකානු ඩොලර් 30 දක්වා අඩු කිරීමට) 2023 අප්‍රේල් මස 25 දින සිට තවත් වසරක කාලයක් දක්වා දීර්ඝ කිරීම. |
| 2023.07.25 | 2023.07.25 දිනැති අංක 2342/24 දරන ගැසට් නිවේදනය<br>– යාපනය ගුවන් තොටුපළ වෙතින් ආරම්භ කරන ගුවන් ගමන් මෙහෙයුම් සඳහා අදාළ අපගමන බද්ද වන ඇ.එ.ජ. ඩොලර් 60 න් 50% ක් ගෙවීමෙන් ඉවත් කිරීම 2023 ජූලි මස 25 දින සිට තවත් මාස හයක කාලයක් දක්වා දීර්ඝ කිරීම. |
| ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරු බද්ද - 2004 අංක 11 දරන මුදල් පනත | |
| 2023.01.01 | 2023.01.01 දිනැති අංක 2312/80 දරන ගැසට් නිවේදනය<br>– පැමිණෙන ජාත්‍යන්තර ඇමතුම්, විශේෂිත දුරකථන අංක(STN) මත පැමිණෙන ජාත්‍යන්තර ඇමතුම්, දේශීය ප්‍රවේශ ගාස්තු (ILAC) , විදුලි සංදේශ සංවර්ධන ගාස්තු (TDC)සහ පිටතට යන දේශීය ප්‍රවේශ ගාස්තු (OLAC) සඳහා ගෙවිය යුතු බදු අනුපාතය 2023 ජනවාරි 01 සිට 2024 දෙසැම්බර් 31 දක්වා තවත් වසර දෙකක් සඳහා දීර්ඝ කිරීම. |
| මෝටර්රථ සඳහා සුඛෝපභෝගී බද්ද - 2018 අංක 35 දරන මුදල් පනත | |
| 2023.01.01 | 2022.12.31 දිනැති අංක 2312/69 දරන ගැසට් නිවේදනය<br>– ශ්‍රී ලංකා රේගුව විසින් ක්‍රියාත්මක කරන ලද 2022 සංයෝජිත වර්ගීකරණ සංකේත සංශෝධන අනුවාදයට අනුව , හඳුන්වාදෙන ලද නව සංයෝජිත වර්ගීකරණ සංකේත / ජාතික උපබෙදුම් සංයෝජිත වර්ගීකරණ සංකේත සහ සංශෝධිත සංයෝජිත වර්ගීකරණ සංකේත සඳහා අදාළ වන සුඛෝපභෝගී බද්ද නියම කිරීම. |

විශේෂ සටහන 1.1 ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ක්‍රියාමාර්ග : 2023 වසරේ ජනවාරි සිට නොවැම්බර් 01 දක්වා

| ක්‍රියාත්මක වන දිනය | ක්‍රියාමාර්ග |
| --- | --- |
| 2023.02.10 | 2023.02.10 දිනැති අංක 2318/53 දරන ගැසට් නිවේදනය<br>– සංක්‍රමණික සේවකයන් ආනයනය කරනු ලබන පූර්ණ විදුලි මෝටර් රථ සඳහා බදු රහිත සීමාව රු. මිලියන 6 සිට මිලියන 12 ක් දක්වා ඉහල නැංවීම. |
| 2023.05.31 | 2023.05.31 දිනැති අංක 2334/24 දරන ගැසට් නිවේදනය<br>– 2023.02.10 දිනැති අංක 2318/53 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත්කරන ලද ප්‍රේෂණය කිරීම, ණයවර ලිපි (LC) පිහිටුවීම සහ මෝටර් වාහන ලියාපදිංචි කිරීම සලකා බැලීමේ කාලය දීර්ඝ කිරීම. (සංක්‍රමණික සේවකයින් සඳහා පූර්ණ විදුලි මෝටර් රථ වල බදු රහිත සීමාව රුපියල් මිලියන 6 සිට රුපියල් මිලියන 12 දක්වා වැඩි කිරීම.) |
| 2023.07.13 | 2023.07.13 දිනැති අංක 2340/42 දරන ගැසට් නිවේදනය<br>– රාජ්‍ය තාන්ත්‍රිකයන් හෝ රාජ්‍යතාන්ත්‍රික සංවිධාන විසින් 100% තීරුබදු රහිත පදනම මත ආනයනය කරන ලද වාහන සඳහා භාවිත කළ වර්ෂ අනුව බැහැර කිරීමේ යාන්ත්‍රණය තීරණය කිරීම. |

## 1.3 රජයේ වියදම

2023 වසරේ පළමු මාස නවය තුළ රජයේ වියදම රු. බිලියන 3,732.3 ක් වූ අතර ඉන් රු. බිලියන 3,327.7 ක් පුනරාවර්තන වියදම් ද, රු. බිලියන 404.6 ක් ප්‍රාග්ධන හා ශුද්ධ ණය දීමේ වියදම් ද විය. රජයේ වියදම් සඳහා වාර්ෂිකව පාර්ලිමේන්තුව විසින් බලය දීම සිදු කළ යුතු ය. ඒ අනුව, 2023 වර්ෂයේදී රජයට වියදම් දැරීමට හැකි වන පරිදි 2022 අංක 43 දරන විසර්ජන පනත පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලදි.

ණය ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලිය තුළ ණය නිකුත් කිරීම සැලකිල්ලට ගෙන, 2022 අංක 43 දරන විසර්ජන පනත මගින් 2023 වසර සඳහා නියම කර ඇති ණය ගැනීමේ සහ ණය සේවාකරණ වියදම් පිළිබඳ උපරිම සීමාවන්, 2023 අංක 12 දරන විසර්ජන (සංශෝධන) පනත මගින් සංශෝධනය කරන ලදි.

වගුව 1.11 රාජ්‍ය වියදම් කාර්යසාධනය

රු. මිලියන

| අයිතමය | ජනවාරි-සැප්තැම්බර් 2022 | ජනවාරි-සැප්තැම්බර් 2023 [අ] |
| --- | --- | --- |
| පුනරාවර්තන | 2,300,171 | 3,327,685 |
| වැටුප් | 714,280 | 696,995 |
| විශ්‍රාම | 228,609 | 263,998 |
| පොලී ගෙවීම | 927,366 | 1,737,338 |
| වෙනත් | 429,916 | 629,354 |
| මූලධන වියදම හා ශුද්ධ ණය ගෙවීම | 394,617 | 404,647 |
| මුළු වියදම | 2,694,788 | 3,732,331 |

*මූලාශ්‍ර : ජාතික අයවැය දෙපාර්තමේන්තුව හා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව*

[අ] *තාවකාලික*

### පුද්ගල පඩිනඩි හා විශ්‍රාම වැටුප්

2023 වසරේ පළමු මාස නවය තුළ පළාත් සභාවල සේවය කරන සේවකයින්ද ඇතුළුව රාජ්‍ය සේවකයින්ගේ පුද්ගල පඩිනඩි සඳහා වන සමස්ත වියදම රු. බිලියන 697.0 ක් වූ අතර 2022 වසරේ සමාන කාල පරිච්ඡේදය තුළ වාර්තා වූ රු. බිලියන 714.3 ට සාපේක්ෂව සියයට 2.4 ක අඩුවීමකි. මේ අතර, 2023 වසරේ පළමු මාස නවය තුළ විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා වන වියදම වූ රු. බිලියන 264.0, 2022 වසරේ සමාන කාල පරිච්ඡේදය තුළ වාර්තා වූ රු. බිලියන 228.6 ට සාපේක්ෂව සියයට 15.5 කින් වැඩි විය. මෙම වැඩිවීමට මූලික හේතුව වූයේ රාජ්‍ය සේවයේ අනිවාර්ය විශ්‍රාම ගැනීමේ කාලය වසර 65 සිට 60 දක්වා අඩු කිරීම සඳහා ගනු ලැබූ ප්‍රතිපත්තිමය තීරණයයි. ඒ අනුව, 2022 වසර තුළ වයස අවුරුදු 60 අභිබවා සිටි රාජ්‍ය සේවකයින් 2022.12.31 දින සිට ක්‍රියාත්මක වන පරිදි විශ්‍රාම ගැන්වූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස 2023 වසරේ පළමු මාස 09 තුළ දී විශ්‍රාම වැටුප් සඳහා දරන ලද සමස්ත වියදම, 2022 වසරේ එම කාලයට සාපේක්ෂව සැලකිය යුතු ලෙස ඉහළ යන ලදී.

### පොලී ගෙවීම

2022 වසරේ පළමු මාස නවය තුළ රු. බිලියන 927.4 ක් වූ දේශීය සහ විදේශීය ණය මත පොලී ගෙවීම, 2023 වසරේ එම කාලය සීමාව තුළ රු. බිලියන 1,737.3 ක් දක්වා සියයට 87.3කින් වැඩි විය. මෙයට ප්‍රධාන හේතුව වන්නේ දේශීය ණය මත වූ පොලී ගෙවීම, රු. බිලියන 1652.1 ක් දක්වා සියයට 101.6 කින් වැඩිවීමයි. කෙසේ වෙතත්, 2023 වසරේ පළමු මාස නවය තුළ විදේශීය ණය මත වූ පොලී ගෙවීම, රු. බිලියන 85.3 ක් දක්වා සියයට 21 කින් අඩු විය.

**වගුව 1.12 : රජයේ සුරැකුම්පත් මත ගෙවන පොලී අනුපාතයන්හි සහ විනිමය අනුපාතිකයන්හි හැසිරීම (%) 2022 සිට 2023 දක්වා**

| කාලපරිච්ඡේදය | | භාණ්ඩාගාර බිල්පත් (%) | | | භාණ්ඩාගාර බැඳුම්කර (%) | | | | සාමාන්‍ය විනිමය අනුපාතය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | දින 91 | දින 182 | දින 364 | වසර 2 | වසර 3 | වසර 4 | වසර 5 | රු./ඇ.ඩො. |
| **2022** | ජනවාරි | 8.63 | 8.55 | 8.55 | | 11.49 | | | 201.46 |
| | පෙබරවාරි | 8.61 | 8.53 | 8.53 | | 12.25 | | 11.92 | 201.74 |
| | මාර්තු | 12.92 | 12.25 | 12.28 | 14.41 | | | 14.70 | 255.81 |
| | අප්‍රේල් | 23.53 | 23.96 | 24.09 | | 22.01 | | 22.16 | 319.44 |
| | මැයි | 23.65 | 24.22 | 24.30 | | 22.38 | | 22.69 | 358.94 |
| | ජූනි | 23.85 | 24.40 | 23.84 | | 23.77 | | 21.18 | 360.24 |
| | ජූලි | 28.86 | 29.24 | 29.53 | | 28.45 | | | 360.87 |
| | අගෝස්තු | 32.89 | 31.28 | 30.50 | | 29.16 | | | 361.00 |
| | සැප්තැම්බර් | 31.94 | 30.59 | 29.85 | | 30.95 | | 31.50 | 362.38 |
| | ඔක්තෝබර් | 33.05 | 32.53 | 29.60 | 32.71 | 32.63 | | 31.78 | 363.15 |
| | නොවැම්බර් | 32.91 | 32.27 | 29.46 | 33.01 | 31.69 | | | 363.39 |
| | දෙසැම්බර් | 32.64 | 32.20 | 29.27 | 32.19 | 31.36 | | | 363.17 |
| **2023** | ජනවාරි | 29.91 | 28.72 | 27.78 | | 30.85 | 29.21 | 29.79 | 362.42 |
| | පෙබරවාරි | 29.72 | 28.67 | 27.67 | | | 29.37 | | 361.98 |
| | මාර්තු | 25.99 | 25.79 | 24.31 | 29.99 | | 28.11 | | 329.47 |
| | අප්‍රේල් | 25.74 | 25.27 | 23.00 | | | | | 321.42 |
| | මැයි | 25.65 | 25.29 | 22.91 | | | | | 310.16 |
| | ජූනි | 23.00 | 19.49 | 16.99 | | | | | 301.26 |
| | ජූලි | 19.96 | 17.69 | 14.29 | | | | 15.74 | 319.29 |
| | අගෝස්තු | 18.48 | 15.36 | 13.58 | | 15.80 | | 15.03 | 321.58 |
| | සැප්තැම්බර් | 17.42 | 15.13 | 13.30 | | 15.64 | | 14.52 | 322.77 |

*මූලාශ්‍ර : භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව, රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා මහ බැංකුව*

**සුබසාධන වියදම්**

සුබසාධන වැඩසටහන් සඳහා වන රජයේ වියදම් මඟින් සෞඛ්‍යය හා පෝෂණය, අධ්‍යාපනය, ජීවනෝපාය සහායයන්, සමාජ සුබසාධන සහ සමාජ ආරක්ෂණ ජාල වැඩසටහන් සඳහා වන වියදම් ආවරණය කරනු ලබයි. 2022 වසරේ මුල් මාස නවය තුළ රු. බිලියන 213.7 ක් වූ සුබසාධන වැඩසටහන් සඳහා වන වියදමට සාපේක්ෂව 2023 වසරේ මුල් මාස නවය තුළ එම වියදම, රු. බිලියන 312.5 ක් දක්වා සියයට 46.2 න් වැඩි විය.

2023 වසරේ පළමු මාස නවය තුළ වූ රු. බිලියන 97.1 ක් වූ සෞඛ්‍ය වියදම ප්‍රධාන වශයෙන් "සැමට නොමිලේ ඖෂධ", "ත්‍රිපෝෂ" සහ "පෝෂණ මල්ල" යන වැඩසටහන්වලින් සමන්විත විය. "සැමට නොමිලේ ඖෂධ" වැඩසටහන සෞඛ්‍යය සහ පෝෂණය වෙනුවෙන් දරන ලද විශාලතම වියදම විය. ඖෂධ මිල ඉහල යාම හේතුවෙන් "සැමට නොමිලේ ඖෂධ වැඩසටහන" වෙනුවෙන් 2023 වසරේ පළමු මාස නවය තුළ දරන ලද වියදම, 2022 වසරේ එම කාලය තුළ දී දරන ලද වියදමට සාපේක්ෂව සියයට 93.4 ක ඉහළ යාමකි.

2022 වසරේ පළමු මාස නවයක කාල සීමාව තුළ අධ්‍යාපනයට අදාළ සුබසාධන වියදම් සඳහා රජය විසින් දරන ලද රු. බිලියන 12.8 ට සාපේක්ෂව 2023 වසරේ පළමු මාස නවය තුළ එම වියදම් සඳහා රජය විසින් රු. බිලියන 35.1 ක් වැය කර ඇත. මුද්‍රණ ද්‍රව්‍යයන්හි මිල ඉහළ යාම සහ ආනයන ද්‍රව්‍යයන් සඳහා තීරුබදු ගෙවීම් ඉහළ යාම හේතුවෙන්, 2022 වසරේ පළමු මාස නවයක කාල සීමාවට සාපේක්ෂව 2023 වසරේ පළමු මාස නවයේදී "නොමිලේ පාසල් පොත් ලබාදීම" සඳහා දරන ලද වියදම, රු. මිලියන 836 සිට රු. බිලියන 18.1 දක්වා වැඩි වී ඇත.

2022 වසරේ පළමු මාස නවය තුළ ජීවනෝපාය සහාය වැඩසටහන් සඳහා රජය විසින් දරන ලද රු. බිලියන 127.0 ක වියදමට සාපේක්ෂව 2023 වසරේ අදාළ කාලසීමාව තුළ එම වියදම රු. බිලියන

155.6 ක් විය. සමෘද්ධි, වැඩිහිටි, ආබාධිත හා වකුගඩු රෝගීන් සඳහා ලබා දුන් මූල්‍ය ආධාර උදෙසා දරන ලද වියදම් අඩු වීම සඳහා වර්ග දෙකක ප්‍රතිලාභ ලබා ගැනීම වැළැක්වෙන අයුරින්, විද්‍යාත්මක පදනමක් මත ප්‍රතිලාභීන් තෝරා ගැනීම හේතු විය. 2023 වසරේ පළමු මාස නවය තුළ දී සමෘද්ධි ආධාර යටතේ දීමනා ගෙවීම සඳහා රු. බිලියන 114.3 ක් වැය කොට ඇත.

**වගුව 1.13 2023 වසරේ ජනවාරි සිට සැප්තැම්බර් දක්වා සුභසාධන වියදම්**

රු. මිලියන

| අයිතමය | ජනවාරි-සැප්තැම්බර් | |
|---|---|---|
| | **2022** | **2023** |
| **සෞඛ්‍ය හා පෝෂණ** | **51,827** | **97,074** |
| සැමට නොමිලේ ඖෂධ | 48,425 | 93,659 |
| ත්‍රිපෝෂ වැඩසටහන | 226 | 851 |
| පෙර පාසල් දරුවන් සඳහා උදෑසන ආහාරය | 73 | 204 |
| පෝෂණ මල්ල | 3,103 | 2,360 |
| **අධ්‍යාපන** | **12,770** | **35,127** |
| නොමිලේ පෙළපොත් | 836 | 18,074 |
| නොමිලේ පාසැල් නිල ඇඳුම් | 1,993 | 2,536 |
| නොමිලේ වාර ප්‍රවේශපත්‍ර | 3,407 | 5,200 |
| පාසල් පෝෂ්‍යදායී ආහාර | 3,342 | 7228 |
| දුෂ්කර හා අතිදුෂ්කර ප්‍රදේශවල පාසල් සිසුන්ට පාවහන් | 900 | - |
| 5 වසර ශිෂ්‍යත්ව | 321 | 586 |
| මහපොළ ශිෂ්‍යත්ව | 650 | 508 |
| ශිෂ්‍යාධාර | 710 | 896 |
| දහම් පාසල් ගුරුවරුන් සඳහා ආධාර | 611 | 99 |
| **ජීවනෝපාය සහායයන්** | **127,043** | **155,614** |
| පොහොර සහනාධාරය | 33,038 | 39,905 |
| සමෘද්ධි සහනාධාරය/ කටුම්භ සඳහා මූල්‍යාධාර වැඩසටහන් | 93,337 | 114,299 |
| නැවත වගා කිරීම සඳහා සහනාධාරය (තේ/රබර්) | 557 | 1258 |
| අපනයන බෝග සංවර්ධනය සඳහා ගොවීන්ට ආධාර කිරීම | 71 | 152 |
| කොවිඩ්-19 නිසා බලපෑමට ලක්වූ පුද්ගලයන්ට ජීවනෝපාය සහායයන් | 40 | – |
| **සමාජ සුභසාධනය සහ ආරක්ෂණ ජාලය** | **22,017** | **24,639** |
| විශේෂ හැකියා ඇති පුද්ගලයින් හා වකුගඩු රෝගීන් සඳහා ආධාර | 5,795 | 5,634 |
| වැඩිහිටි පුද්ගලයින් සඳහා ආධාර | 12,056 | 14,787 |
| රණවිරු මාපිය සමාජ සත්කාර | 1,726 | 1,694 |
| ආහාර ආධාර, ගංවතුර හා නියං සහනාධාර | 40 | 24 |
| ආර්ථික වශයෙන් වාසිදායක නොවන මාර්ගවල බස් සේවා | 2,400 | 2,500 |
| **එකතුව** | **213,657** | **312,454** |

*මූලාශ්‍රය : ජාතික අයවැය දෙපාර්තමේන්තුව*

### රාජ්‍ය ආයෝජන

පහතින් දක්වා ඇති අංශද අතුළත්ව, මහාමාර්ග, ජල සම්පාදන, ප්‍රවාහන, කෘෂිකර්ම සහ අධ්‍යාපන යන ප්‍රමුඛ ක්ෂේත්‍ර ආවරණය වන පරිදි යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා 2023 වසරේ පළමු මාස නවය තුළ ආසන්න වශයෙන් රු. බිලියන 412 ක් වැය කර ඇත.

- මාර්ග, මහාමාර්ග, පාලම් සහ අධිවේගී මාර්ග සංවර්ධනය සඳහා රු. බිලියන 173
- සැමට ප්‍රමාණවත් සහ සුරක්ෂිත පානීය ජලය සහතික කිරීම සඳහා රු. බිලියන 29.5
- ප්‍රවාහන ජාලයේ කාර්යක්ෂමතාව, ධාරිතාව සහ සම්බන්ධතාව වැඩිදියුණු කිරීම සඳහා රු. බිලයන 44
- නවීන තාක්ෂණය හඳුන්වාදීම සහ නව බීජ වර්ග හඳුන්වා දීම මගින් කෘෂිකාර්මික අගය දාමයේ (Value Chain) ඵලදායීතාව සහ කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම සඳහා රු. බිලියන 15.9
- බහුකාර්ය වාරිමාර්ග යෝජනා ක්‍රම සහ ඇළ මාර්ග ඉදිකිරීම මගින් කෘෂිකර්මාන්තයට ජලය ලබා ගැනීම සහතික කිරීම වෙනුවෙන් රු. බිලියන 28
- යටිතල පහසුකම් සංවර්ධනය සහ අධ්‍යාපන පද්ධතියේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සඳහා රු. බිලියන 18.6

## 1.4 භාණ්ඩාගාර මෙහෙයුම්

### භාණ්ඩාගාර මුදල් ප්‍රවාහයේ කාර්යසාධනය

2023 වර්ෂයේ මුල් මාස නවය තුළ භාණ්ඩාගාරයට ආදායම් සහ වෙනත් ප්‍රභවයන්ගෙන් මුදල් ගලාඒම් රු. බිලියන 2028.2 ක් වූ අතර එය රු. බිලියන 2,446.5 ඇස්තමේන්තුවට සාපේක්ෂව සියයට 82.9 කි. එය 2022 වර්ෂයේ අදාල කාලපරිච්ඡේදයේ රු. බිලියන 1361.9 හා සැසඳීමේදී සියයට 49 ක වැඩිවීමකි. මේ අතර 2023 වර්ෂයේ මුල් මාස නවය තුළ පුනරාවර්තන හා රාජ්‍ය ආයෝජන සඳහා මුදල් ගලායාම් රු. බිලියන 3,936 ක් වූ අතර, එය 2022 වර්ෂයේ අදාල කාලපරිච්ඡේදයේ රු. බිලියන 2,743 සමඟ සැසඳීමේදී සියයට 43 වැඩිවීමක් පෙන්නුම් කරයි.

2023 සැප්තැම්බර් 30 දිනට ශුද්ධ මුදල් හිඟය රු. බිලියන 1907.9 ක් වූ අතර 2022 වර්ෂයේ සැප්තැම්බර් 30 දිනට පැවති රු. බිලියන 1381.1ට සාපේක්ෂව එය සියයට 38.1 වැඩිවීමකි. ණය පොලී ගෙවීම් ඇතුළු මෙහෙයුම් වියදම් සහ රාජ්‍ය ආයෝජන පිළිවෙලින් සියයට 52.2 කින් සහ සියයට 5.4 කින් වැඩිවීම මෙයට ප්‍රධාන වශයෙන් හේතු විය. කෙසේවුවද, අදාල කාලය තුල ශුද්ධ ණය ගැනීම් ඇතුළුව මුදල් ගලාඒම් වැඩිවීමේ ප්‍රතිඵලයක් ලෙස 2022 වර්ෂයේ සැප්තැම්බර් 30 දිනට රු. බිලියන 48.2 ක් වූ සමස්ත මුදල් ශේෂ අයිරාව 2023 වර්ෂයේ සැප්තැම්බර් 30 දිනට රු. බිලියන 183.5 ක ධනාත්මක අගයක් දක්වා වැඩි වී ඇත.

**වගුව 1.14: රජයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

රු. බිලියන

| අයිතමය | ජනවාරි - සැප්තැම්බර් | | |
|---|---|---|---|
| | 2022 | 2023 | |
| | තථ්‍ය | ඇස්තමේන්තුව | තථ්‍ය |
| ආරම්භක මුදල් ශේෂය | -831.6 | -84.2 | -84.2 |
| ආදායම් හා වෙනත් ලැබීම් මගින් සමස්ථ මුදල් ගලා ඒම | 1,361.9 | 2,446.6 | 2,028.1 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වල සමස්ථ මුදල් ගලා යෑම් | -2,232.2 | -3,556.7 | -3,397.5 |
| ආයෝජන කටයුතු සඳහා සමස්ථ මුදල් ගලායාම් * | -510.8 | -749.1 | -538.5 |
| ශුද්ධ මුදල් අතිරික්තය / (හිඟය) | -1,381.1 | -1,859.2 | -1,907.9 |
| දළ ණය ගැනීම් * | 3,017.4 | 3,193.6 | 6,936.1 |
| ණය ආපසු ගෙවීම් | -995.3 | -1,228.7 | -4,773.7 |
| ශුද්ධ ණය ගැනීම් | 2,022.1 | 1,964.8 | 2,162.4 |
| පෙර වසරේ ස්වෛරීත්ව බැඳුම්කර ශේෂය | 4.5 | – | – |
| ගැලපීම් ගිණුමේ ශේෂය (TEB/ ශුද්ධ තැන්පතු යනාදිය) | 137.9 | – | 13.2 |
| **අවසාන මුදල් ශේෂය** | **-48.2** | **21.4** | **183.5** |

*මූලාශ්‍රය : භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව*

* *2023.09.30 දක්වා ලැබුණු වැඩසටහන් හා ව්‍යාපෘති ණය ඇතුළත් වේ.*

**රාජ්‍ය ණය කළමණාකරනය**

2023 වර්ෂයේ පාර්ලිමේන්තුව මගින් අනුමත කරන ලද මුළු ණය ගැනීමේ සීමාව වු රු. බිලියන 4,979 වන සීමාව පසුව දේශීය ණය ප්‍රශස්ත කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීමට පහසුකම් සැලසීම සඳහා රු. බිලියන 13.979 ක් දක්වා සංශෝධිත අයවැය හරහා වැඩිකරන ලදී. 2023 වර්ෂයේ ජනවාරි 01 වනදා සිට සැප්තැම්බර් මස 30 වනදා දක්වා කාලය තුළ රජයේ ණය උපයෝජනය රු. බිලියන 6,833.9 (පොත් අගය මත) ලෙස වාර්තා කර තිබූ අතර, දේශීය ණය ප්‍රශස්තකරණ වැඩසටහන ක්‍රියාත්මක කිරිම හේතුවෙන් භාණ්ඩාගාර බිල්පත්/ ශ්‍රී ලංකා මහ බැංකු අත්තිකාරම් අඩුවීමේ බලපෑම හැර එම අගය, වසර ආරම්භයේදී පැවති බැංකු අයිරාව හරහා මූල්‍යකරණය කර තිබූ රුපියල් බිලියන 84.2 ක් වු සමස්ථ මුදල් ශේෂ හිඟය, 2023 සැප්තැම්බර් 30 දිනට රු. බිලියන 183.5 දක්වා අඩුවීම සැලකිල්ලට ගැනීමෙන් පසුව රු. බිලියන 6,732.7 ක් ලෙස සැලකිය හැකිය. 2023 සැප්තැම්බර් 30 දිනට පිළිවෙලින් රු. බිලියන 6,732.7 ක් සහ රු. බිලියන 595.4 ක් වු දේශීය හා විදේශීය ණය වලින් සමන්විත මුළු ණය ගැනීම් මෙම කාලපරිඡේදය තුළ මුදල් ප්‍රවාහ මෙහෙයුම්, දේශීය ණය ප්‍රශස්තකරණ වැඩසටහනේ කොටසක් ක්‍රියාත්මක කිරීම හා සංවර්ධන ව්‍යාපෘති මූල්‍යණයට භාවිතා කර ඇත.

මෙලෙස දේශීය ණය ප්‍රශස්තකරණ වැඩසටහන ක්‍රියාත්මක කිරීමත් සමඟ ශ්‍රී ලංකා මහ බැංකුවේ භාණ්ඩාගාර බිල්පත් සහ මහ බැංකු අත්තිකාරම්, ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවලින් කොටසක් සහ අධි විශ්‍රාමික අරමුදල්වල භාණ්ඩාගාර බැඳුම්කරවලින් කොටසක් දිගුකාලීන භාණ්ඩාගාර බැඳුම්කර වෙත පරිවර්තනය කරන ලදී.

2023 වර්ෂයේ පළමු මාස නවය තුළ මුළු ණය ගැනීම් වලින් සියයට 90 ක්ම දේශීය ණය ගැනීම් වලින් සමන්විත විය.

**වගුව 1.15 දළ දේශීය ණයන මූලාශ්‍ර අනුව**

රු. බිලියන

| මූලාශ්‍ර | ජනවාරි-සැප්තැම්බර් 2023 |
|---|---|
| භාණ්ඩාගාර බැඳුම්කර | 6,833.6 |
| ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර | 0.3 |
| **එකතුව** | **6,833.9** |
| බැංකු අයිරා | -84.2 |
| විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකක ණය ආපසු ගෙවීම් | -17.0 |
| **දේශීය ණය භාවිතය** | **6,732.7** |

*මූලාශ්‍රය : භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව*

**රූපසටහන 1.4 : මූලාශ්‍ර අනුව දළ දේශීය ණය 2023 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා**




*මූලාශ්‍රය : භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව*

## 1.5 විදේශ මූල්‍යයනය

**සමාලෝචනය**

රජයේ අයවැය මූල්‍යකරණ අවශ්‍යතා සපුරාලීම සඳහා, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ලද විස්තීරණ අරමුදල් පහසුකම (2023-2026), මගින් අපේක්ෂිත අරමුණු ළඟාකර ගැනීමේ සහාය සඳහා, බහුපාර්ශ්වික ණයහිමියන් වෙතින් සැලකිය යුතු ප්‍රතිපත්තිමය විදේශ මූල්‍යන ප්‍රමාණයක් ලද අතර, ඒ යටතේ, ආර්ථික ස්ථායීකරණ වැඩසටහන සඳහා එ.ජ.ඩො මිලියන 350 ක් ආසියානු සංවර්ධන බැංකුව වෙතින් ද, ශ්‍රී ලංකාවේ ප්‍රත්‍යස්ථ, ස්ථාවර හා ආර්ථික හැරවුම් සංවර්ධන ප්‍රතිපත්ති මෙහෙයුම් වැඩසටහන සඳහා එ.ජ.ඩො මිලියන 247.6 ක් ලෝක බැංකුව වෙතින් ද ලැබුණි.

2023 වර්ෂයේ තෙවන කාර්තුව අවසන්වන විට ඉන්දියාව, නෙදර්ලන්තය, සෞදි අරාබිය, ජර්මනිය සහ ප්‍රංශය යන ද්විපාර්ශ්වික ණයහිමියන් වෙතින් එ.ජ.ඩො. මිලියන 158.0 ක විදේශ ප්‍රතිලබ්ධි ප්‍රමාණයක් ලැබී ඇත. තවද, 2022 වර්ෂයේදී ඉන්දීය රජය සමඟ එකඟතා ඇති කර ගත් හදිසි ණය මාලාව යටතේ 2023 වර්ෂයේ පළමු කාර්තුවේදී ලද ප්‍රතිලබ්ධීන් අත්‍යවශ්‍ය ද්‍රව්‍ය ආනයනය සඳහා වූ විදේශ මූල්‍යයන අවශ්‍යතා සැලකිය යුතු ලෙස සපුරා ගැනීමට උපකාර විය.

ඒ අනුව, 2023 ජනවාරි 1 සිට 2023 සැප්තැම්බර් 30 දින දක්වා වූ කාල සීමාව තුළ එ.ජ.ඩො. මිලියන 1,516.3 ක සැලකිය යුතු විදේශ මූල්‍යයන ප්‍රමාණයක් ලබා ගැනීමට රජයට හැකි විය.

**වගුව 1.16: 2023 ජනවාරි 1 සිට සැප්තැම්බර් 30 දක්වා ඇතිකර ගත් විදේශ මූල්‍යයන එකඟතා, අදාළ මූල්‍ය කොන්දේසි සමග**

| සංවර්ධන පාර්ශ්වකරු/ණය දෙන ආයතනය | ණය හෝ ප්‍රදානය | එකඟතා ගිවිසුම අත්සන් කරන ලද දිනය | ව්‍යාපෘතිය වැඩසටහන හෝ ණය | එකඟතා ප්‍රමාණය (මිලියන) | | | | මූල්‍ය කොන්දේසි | | | | වෙනත් කොන්දේසි | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | විනිමය | අත්සන් කරන ලද විනිමයෙන් | රුපියල් | ඇ.එ.ජ. ඩොලර් | පොලිය | | | වෙනත් ගාස්තු | සහන කාලය (වර්ෂ) | පරිණත කාලය/ උපයෝජ්‍යතා කාලය (ගිවිසුම්ගත දිනයේ සිට) (වර්ෂ) |
| | | | | | | | | වර්ගය | වාර්ෂික අනුපාතය (සියයට) | සීමාන්තිකය (පදනම් අංක සියයට) | | | |
| **ද්වීපාර්ශ්වික** | | | | | | | | | | | | | |
| ජපානය | ප්‍රදාන | 22-02-23 | ජපාන ආර්ථික හා සමාජ සංවර්ධන වැඩසටහන යටතේ ඉන්ධන ප්‍රදාන සහයෝගීතාවය | යෙන් | 5,000.0 | 13,423.0 | 37.1 | | | අදාළ නොවේ | | | 3 |
| ජපානය | ප්‍රදාන | 26-04-23 | වෛද්‍ය හෝ සායනික අපද්‍රව්‍ය කළමනාකරණය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය | යෙන් | 503.0 | 1,211.7 | 3.8 | | | අදාළ නොවේ | | | 3 |
| ජපානය | ප්‍රදාන | 08-09-23 | මානව සම්පත් සංවර්ධන ශිෂ්‍යත්ව ව්‍යාපෘතිය | යෙන් | 284.0 | 636.2 | 2.0 | | | අදාළ නොවේ | | | 3 |
| කොරියාව | ප්‍රදාන | 31-05-23 | චන්ද්‍රිකා වැව සහ කිරිඉබ්බන් වැව යන ජලාශයන්හි මතුපිට අවකාශය මත ධාරිතාවය මෙගා වොට් 1 බැගින් වන පාවෙන සූර්ය පැනල පද්ධති බලාගාර ස්ථාපිත කිරීමේ නියමු ව්‍යාපෘතිය | කොරියානු වොන් | 6,830.0 | 1,524.5 | 5.2 | | | අදාළ නොවේ | | | 1 |

| සංවර්ධන පාර්ශ්වකරු/ණය දෙන ආයතනය | ණය හෝ ප්‍රදානය | එකඟතා ගිවිසුම අත්සන් කරන ලද දිනය | ව්‍යාපෘතිය වැඩසටහන හෝ ණය | එකඟතා ප්‍රමාණය (මිලියන) | | | | මූල්‍ය කොන්දේසි | | | | වෙනත් කොන්දේසි | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | විනිමය | අත්සන් කරන ලද විනිමයෙන් | රුපියල් | ඇ.එ.ජ. ඩොලර් | පොලිය | | | වෙනත් ගාස්තු | සහන කාලය (වර්ෂ) | පරිණත කාලය/ උපයෝජ්‍යතා කාලය (ගිවිසුම්ගත දිනයේ සිට) (වර්ෂ) |
| | | | | | | | | වර්ගය | වාර්ෂික අනුපාතය (සියයට) | සීමාන්තිකය (පදනම් අංක සියයට) | | | |
| කොරියාව | ප්‍රදාන | 12-05-23 | ශ්‍රී ලංකාවේ නියාගම ජාතික වෘත්තීය පුහුණු ආයතනයේහි ශ්‍රම වෙළෙඳපොළ ඉල්ලුම මත පදනම් වූ කාර්මික, වෘත්තීය අධ්‍යාපන සහ පුහුණු ක්ෂේත්‍රය ශක්තිමත් කිරීම. | කොරියානු වොන් | 2,150.0 | 516.2 | 1.6 | | | අදාළ නොවේ | | | 1 |
| කොරියාව | ප්‍රදාන | 15-02-23 | ශ්‍රී ලංකාවේ මධ්‍යම සහ උතුරු නැගෙනහිර පළාත් කේන්ද්‍ර කරගනිමින් ප්‍රජා පාදක සංචාරක ව්‍යාපෘතිය | කොරියානු වොන් | 400.0 | 117.8 | 0.3 | | | අදාළ නොවේ | | | 1 |
| ඇමරිකා එක්සත් ජනපදය | ප්‍රදාන | 28-07-23 | ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීම හා ජනජීවිතය සමෘද්ධිමත් කිරීමේ ආධාර වැඩසටහන (අරමුදල් ඉහළ දැමීම) | එ.ජ.ඩො. | 13.2 | 4,356.3 | 13.2 | | | අදාළ නොවේ | | | 4 |
| ඇමරිකා එක්සත් ජනපදය | ප්‍රදාන | 17-08-23 | ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීම හා ජනජීවිතය සමෘද්ධිමත් කිරීමේ ආධාර වැඩසටහන (අරමුදල් ඉහළ දැමීම) | එ.ජ.ඩො. | 6.0 | 1,926.6 | 6.0 | | | අදාළ නොවේ | | | 4 |

| සංවර්ධන පාර්ශ්වකරු/ණය දෙන ආයතනය | ණය හෝ ප්‍රදානය | එකඟතා ගිවිසුම අත්සන් කරන ලද දිනය | ව්‍යාපෘතිය වැඩසටහන හෝ ණය | එකඟතා ප්‍රමාණය (මිලියන) | | | | මූල්‍ය කොන්දේසි | | | | වෙනත් කොන්දේසි | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | විනිමය | අත්සන් කරන ලද විනිමයෙන් | රුපියල් | ඇ.එ.ජ. ඩොලර් | පොලිය | | | වෙනත් ගාස්තු | සහන කාලය (වර්ෂ) | පරිණත කාලය/ උපයෝජ්‍යතා කාලය (ගිවිසුම්ගත දිනයේ සිට) (වර්ෂ) |
| | | | | | | | | වර්ගය | වාර්ෂික අනුපාතය (සියයට) | සීමාන්තිකය (පදනම් අංක සියයට) | | | |
| **බහුපාර්ශ්වික** | | | | | | | | | | | | | |
| ආසියානු සංවර්ධන බැංකුව | ණය | 29-05-23 | ආර්ථික ස්ථායීකරණ වැඩසටහන | එ.ජ.ඩො. | 350.0 | 104,689.1 | 350.0 | විචල්‍ය | SOFR | 2 | පොරොන්දු ගාස්තු **0.75%** | 3.5 | 8 |
| ලෝක බැංකුවේ ජාත්‍යන්තර සංවර්ධන සමායතනය | ණය | 28-06-23 | ශ්‍රී ලංකාවේ ප්‍රත්‍යස්ත, ස්ථාවර හා ආර්ථික හැරවුම් සංවර්ධන ප්‍රතිපත්ති මෙහෙයුම් වැඩසටහන | වි.ගැ.හි. (SDR) | 371.2 | 153,049.4 | 495.6 | - | පොලී රහිත | | පොරොන්දු ගාස්තු 0.5% | 6 | 12 |
| ලෝක බැංකුවේ ජාත්‍යන්තර සංවර්ධන සමායතනය | ණය | 21-09-23 | සමාජ ආරක්ෂණ ව්‍යාපෘතිය | වි.ගැ.හි. (SDR) | 148.5 | 63,724.8 | 196.3 | ස්ථාවර | 1.25 | අදාළ නොවේ | පොරොන්දු ගාස්තු 0.5% සේවා ගාස්තු 0.5% | 5 | 30 |
| ලෝක බැංකුවේ ජාත්‍යන්තර සංවර්ධන සමායතනය | ප්‍රදාන | 06-07-23 | ශ්‍රී ලංකාවේ රාජ්‍ය මූල්‍ය කළමනාකරණය ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය | එ.ජ.ඩො. | 4.2 | 1,289.3 | 4.2 | | අදාළ නොවේ | | | | 3 |
| ජාත්‍යන්තර මූල්‍ය අරමුදල | ණය | 20-03-23 | ශ්‍රී ලංකාවේ 2023-26 විස්තීරණ අරමුදල් පහසුකම | වි.ගැ.හි. (SDR) | 254.0 | 122,055.3 | 364.0 * | | Amount Based | | පොරොන්දු ගාස්තු 0.5% සේවා ගාස්තු 0.5% | 4.5 | 10 |
| | | | එකතුව | | | **468,520.2** | **1,479.3** | | | | | | |

*මූලාශ්‍රය : විදේශ සම්පත් දෙපාර්තමේන්තුව*

*සටහන : විවිධ විදේශ විනිමයෙන් අත්සන් කරන ලද එකඟතා, අගයයන් රුපියල් හා ඇ.එ.ජ.ඩො. බවට පත් කිරීමේදී එක් එක් එකඟතාවන්යට අත්සන් කරන ලද දිනයේ පැවති විනිමය අනුපාතිකයන් භාවිතා කර ඇත.*
*2023.03.20 වන විට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රකාශිත වි.ගැ.හි. (SDR) 1 = 480.5327 (2023.02.28)*

## විදේශ මූල්‍යයන එකඟතා

2023 ජනවාරි 1 සිට සැප්තැම්බර් 30 දක්වා වූ කාල පරිච්ඡේදය තුළදී විවිධ විදේශ සංවර්ධන පාර්ශ්වකරුවන් හා ණය දෙන ආයතන සමග විදේශ මූල්‍යයන එකඟතා ගිවිසුම් 13 ක් මගින් එ.ජ. ඩොලර් මිලියන 1,479 ක එකඟතා ඇතිකරගෙන ඇත.

මෙය, ශ්‍රී ලංකාවේ 2023-26 විස්තීරණ අරමුදල් පහසුකම යටතේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ලද එ.ජ.ඩො. මිලියන 333.0, ආර්ථික ස්ථායීකරණ වැඩසටහන සඳහා ආසියානු සංවර්ධන බැංකුවෙන් ලද එ.ජ.ඩො. මිලියන 350.0, ශ්‍රී ලංකාවේ ප්‍රත්‍යාස්ථ, ස්ථාවර හා ආර්ථික හැරවුම් සංවර්ධන ප්‍රතිපත්ති මෙහෙයුම් වැඩසටහන සඳහා එ.ජ.ඩො. මිලියන 495.6 ක් ද සමාජ ආරක්ෂණ ව්‍යාපෘතිය සඳහා එ.ජ.ඩො. මිලියන 196.3 ක් ලෙස ද, ලෝක බැංකුවේ ජාත්‍යන්තර සංවර්ධන සමායතනයෙන් සමග ඇතිකර ගත් විදේශ මූල්‍යයන එකඟතා හා ජපානය, කොරියාව, ඇමරිකා එක්සත් ජනපදය, ජාත්‍යන්තර සංවර්ධන සමායතනය යන විදේශ සංවර්ධන ප්‍රදායකයින් සමඟ ගිවිසුම් වලට එළඹීමෙන් ලද එ.ජ.ඩො. මිලියන 73.4 ක පූර්ණ ප්‍රදානවලින් ලෙස ද ලැබී ඇත

## විදේශ මූල්‍යයන ප්‍රතිලබ්ධි හා උපයෝජනය

2023 ජනවාරි 1 සිට සැප්තැම්බර් 30 දක්වා, ලද මුළු විදේශ ප්‍රතිලබ්ධි ප්‍රමාණය එ.ජ.ඩොලර් මිලියන 1,516.3 කි. එම ප්‍රතිලබ්ධි ප්‍රමාණයෙන් එ.ජ.ඩොලර් මිලියන 343.7 ක් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ලද පළමු ණය වාරිකය ලෙසද එ.ජ.ඩොලර් මිලියන 1,006.1 ක් අනෙකුත් බහුපාර්ශ්වික ණය ගිවිසුම් අනුව සිදුවූ ප්‍රතිලබ්ධි ලෙසද, එ.ජ.ඩොලර් මිලියන 155.9 ක් ද්වීපාර්ශ්වික ණය ගිවිසුම් අනුව සිදුවූ ප්‍රතිලබ්ධි ලෙසද, එ.ජ.ඩොලර් මිලියන 10.6 ක් පූර්ණ ප්‍රදාන වශයෙන් ලද ප්‍රතිලබ්ධි ලෙස ද ලැබී ඇත.

2023 වර්ෂය තුළ ලද මෙම ප්‍රතිලබ්ධිවලින් ඉහළම ප්‍රමාණය ආසියානු සංවර්ධන බැංකුව සමඟ අත්සන් කරන ලද ණය ගිවිසුම් අනුව ලබාගත් අතර, එය සමස්තයෙන් ආසන්න වශයෙන් සියයට 35 ක් ද අනතුරුව ඉහළම ප්‍රමාණයක් පිළිවෙලින් ලෝක බැංකුව (සියයට 29), ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (සියයට 23), සහ ඉන්දියාව (සියයට 9), සමඟ අත්සන් කරන ලද ණය ගිවිසුම් අනුව සිදුවූ ප්‍රතිලබ්ධි වේ.

**වගුව 1.17: එක් එක් සංවර්ධන පාර්ශ්වකරු විසින් 2023 ජනවාරි 1 සිට සැප්තැම්බර් 30 දක්වා සිදු කරන ලද ප්‍රතිලබ්ධි**

| සංවර්ධන පාර්ශ්වකරු | ප්‍රතිලබ්ධි ප්‍රමාණය* (එ.ජ.ඩොලර් මිලියන) | | |
|---|---|---|---|
| | ණය | ප්‍රදාන | එකතුව |
| **ද්වීපාර්ශ්වික** | **155.9** | **2.1** | **158.0** |
| ඉන්දියාව | 142.5 | - | 142.5 |
| නෙදර්ලන්තය | 7.4 | - | 7.4 |
| අරාබි ආර්ථික සංවර්ධනය සඳහා වූ සෞදි අරමුදල | 5.6 | | 5.6 |
| ජර්මනිය | - | 2.1 | 2.1 |
| ප්‍රංශය | 0.4 | - | 0.4 |
| **බහුපාර්ශ්වික** | **1,349.8** | **8.5** | **1,358.3** |
| ආසියානු සංවර්ධන බැංකුව | 529.7 | 0.1 | 529.8 |
| ලෝක බැංකුව | 434.4 | 8.4 | 442.8 |
| ජාත්‍යන්තර මූල්‍ය අරමුදල | 343.7 | – | 343.7 |
| ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව | 22.9 | - | 22.9 |
| ඔපෙක් අරමුදල | 11.0 | - | 11.0 |
| කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල | 8.1 | - | 8.1 |
| **එකතුව** | **1,505.7** | **10.6** | **1,516.3** |

*මූලාශ්‍රය : විදේශ සම්පත් දෙපාර්තමේන්තුව*

*සටහන : එක් එක් විදේශ විනිමයෙන් සටහන් වන ප්‍රතිලබ්ධි අගයයන් එ.ජ.ඩොලර් බවට හැරවීමේදී 2023 සැප්තැම්බර් 27 දින පැවති විනිමය අනුපාතිකයන් භාවිත කර ඇත.*

** තාවකාලික අගයයන්*

**රූපසටහන 1.5: 2023 ජනවාරි 1 සිට සැප්තැම්බර් 30 දක්වා සිදුවූ ප්‍රතිලබ්ධි - ප්‍රධාන ආර්ථික අංශ අනුව (එ. ජ. ඩො. මිලියන)**




*මූලාශ්‍රය : විදේශ සම්පත් දෙපාර්තමේන්තුව*

***වෙනත් = අධ්‍යාපනය හා පුහුණු, ආරක්ෂක, විද්‍යාව සහ තාක්ෂණය, වාරිමාර්ග, පරිසරය, ග්‍රාමීය සංවර්ධනය, මානුෂීය ආධාර, ආපදා කළමනාකරණය, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධන, ඉඩම් සංවර්ධනය, සහ වැවිලි කර්මාන්ත*

**එකඟතා පළකරන ලදුව සංවර්ධන ව්‍යාපෘතිවල ඉදිරියේදී උපයෝජනය වීමට නියමිත ශේෂය**

දැනට පළ කර ඇති එකඟතා අනුව ඉදිරි වර්ෂ 3-5 කාලය තුළ විවිධ සංවර්ධන ව්‍යාපෘති හා වැඩසටහන්වල උපයෝජනය වීමට නියමිත විදේශ මූල්‍යයනවල ශේෂය 2023 සැප්තැම්බර් 30 දින වන විට එ.ජ. ඩොලර් බිලියන 6.3 ක් විය. මෙයින් ඉහළම ප්‍රමාණය චීනය විසින් ලබා දීමට නියමිත අතර, අනතුරුව ඉහළ ප්‍රමාණයන් පිළිවෙලින් ලෝක බැංකුව, ජපානය, ඉන්දියාව, සහ ආසියානු සංවර්ධන බැංකුව විසින් ලබා දීමට නියමිතය.

**රූප සටහන 1.6: 2023 සැප්තැම්බර් 30 වන විට පළ කරන ලද එකඟතා අනුව ප්‍රතිලබ්ධි වීමට නියමිත ශේෂය එක් එක් සංවර්ධන පාර්ශ්වකරු අනුව (එ.ජ.ඩොලර් මිලියන)**




*මූලාශ්‍රය : විදේශ සම්පත් දෙපාර්තමේන්තුව*

**වෙනත් = ඔස්ට්‍රේලියාව, එක්සත් රාජධානිය, කුවේට්, පාකිස්ථානය, කොරියාව, රුසියාව, ජර්මනිය, ඩෙන්මාර්කය, ස්පාඤ්ඤය, ඔස්ට්‍රියාව, යුරෝපීය ආයෝජන බැංකුව, කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ අන්තර්ජාතික අරමුදල*

එකඟතා පළකරන ලදුව ඉදිරියේ දී උපයෝජනය වීමට නියමිත විදේශ මූල්‍යයන ශේෂයෙන් සියයට 21 ක ප්‍රමාණයක් මාර්ග හා පාලම් අංශයේ ද, සියයට 15 ක ප්‍රමාණයක් ජල සම්පාදනය හා සනීපාරක්ෂාව අංශයේ ද, සියයට 11 ක ප්‍රමාණයක් ප්‍රවාහන අංශයේ ද එකඟතා පළ කරන ලද ව්‍යාපෘතිවල උපයෝජනය වීමට නියමිතය.

**රූප සටහන 1.7: 2023 සැප්තැම්බර් 30 වන විට පළ කරන ලද එකඟතා අනුව ප්‍රතිලබ්ධි වීමට නියමිත ශේෂය ප්‍රධාන ආර්ථික අංශ අනුව (එ.ජ.ඩොලර් මිලියන)**




*මූලාශ්‍රය : විදේශ සම්පත් දෙපාර්තමේන්තුව*

***වෙනත් = ආරක්ෂක, ආපදා කළමනාකරණය, පරිසරය, මානුෂීය ආධාර, නීතිය හා සාමය, කම්කරු හා වෘත්තීය අධ්‍යාපන, ඉඩම් සංවර්ධනය, පශු සම්පත් සංවර්ධනය, ජනමාධ්‍ය, වැවිලි කර්මාන්ත, වරාය හා නාවුක, ග්‍රාමීය සංවර්ධන, විද්‍යාව සහ තාක්ෂණය, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධන, සහ ක්‍රීඩා සංවර්ධනය*

**විදේශ ණය ප්‍රමාණය හා විදේශ ණය සේවාකරණය**

2023 සැප්තැම්බර් 30 වන විට රජය ලබාගත් විදේශ ණය මූල්‍යයනයන් සඳහා ආපසු ගෙවීමට එකතු වී තිබූ විදේශ ණය ප්‍රමාණය එ.ජ. ඩොලර් බිලියන 36.4[1]කි.

2023 ජනවාරි 1 සිට සැප්තැම්බර් 30 දක්වා සිදු කරන ලද ණය සේවාකරණය[2] එ.ජ.ඩොලර් මිලියන 912.8 කි. මෙයින්, එ.ජ.ඩොලර් මිලියන 631.9 ක් ණය වාරික ආපසු ගෙවීම සඳහා යොදවා ඇති අතර, ඉතිරිය වන එ.ජ.ඩොලර් මිලියන 280.9 ක ප්‍රමාණය පොලී ගෙවීම සඳහා යොදවා ඇත.

රජය විසින් අනුගමනය කරන ලද අතුරු ප්‍රතිපත්තියට අනුකූලව, බලපෑමට ලක් වූ ද්විපාර්ශ්වික සහ වාණිජ ණයහිමියන්ගේ විදේශ ණය සේවාකරණය 2022 අප්‍රේල් 12 වන දින සිට අන්තර්කාලීනව තාවකාලිකව අත්හිටුවන ලදී. ඒ අනුව, 2022 අප්‍රේල් 12 දින සිට 2023 සැප්තැම්බර් 30 දින දක්වා නොපියවා ඇති ණය වාරික ප්‍රමාණය එ.ජ.ඩොලර් මිලියන 4,229 ක්ද, පොලී ප්‍රමාණය එ.ජ.ඩොලර් මිලියන 1,819* ක්ද විය.

---

1. *තාවකාලික අගයයන්, ණය සේවාකරණය තාවකාලිකව නතරකිරීමේ ප්‍රතිපත්තිමය තීරණයෙන් පසු එකතුවූ නොගෙවූ ණය වාරිකද ඇතුළුව ඇති මධ්‍යම රජයේ විදේශ ණය ප්‍රමාණය පමණක් නිරූපණය වේ.*
2. *ණය සේවාකරණය = ණය ආපසු ගෙවීම + පොලී ගෙවීම*

* *ඉදිරියේදී පැවැත්වීමට නියමිත ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ සම්මුති සාකච්ඡාවලදී එක් එක් ණයහිමියා සමග සැසඳීමට යටත්වේ.*

# ආර්ථික උපනතීන් 02

## 2.1 සමාලෝචනය

විශේෂයෙන්, රාජ්‍ය මූල්‍ය, ණය නොවන විදේශ විනිමය ගලා ඒම් සහ මුදල් අංශයන්හි දීර්ඝ කාලයක් තුළ සිදුකළ යුතුව තිබූ ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමත් සමඟ උද්ධමනය, සංචිත තත්ත්වය සහ රාජ්‍ය මූල්‍ය ගැලපීම් වැනි බොහෝ සාර්ව ආර්ථික අංශයන්හි ස්ථාවරභාවය පිළිබඳ මූලික ලකුණු ශ්‍රී ලංකා ආර්ථිකය පිළිබිඹු කරන ලදී. (i) උද්ධමනය, පසුගිය වසරේ වූ සියයට 70 ක උපරිමයක සිට 2023 වසරේ ඔක්තෝබර් මාසයේ සියයට 1.5 ක් දක්වා අඩුවීම; (ii) විදේශ සංචිත 2022 වසරේ සැප්තැම්බර් මාසයේ දී ඇ.ඩො. බිලියන 1.8 සිට 2023 වසරේ සැප්තැම්බර් මාසය වනවිට ඇ.ඩො. බිලියන 3.5 ක් දක්වා ඇ.ඩො. බිලියන 1.7 කින් වර්ධනය වීම; (iii) ප්‍රාථමික අයවැය ශේෂය 2022 වසරේ පළමු මාස නවය තුළ වාර්තා වූ රු. බිලියන 317.0 ක හිඟයක සිට 2023 වසරේ සමාන කාලපරිච්ඡේදයේ දී රු. බිලියන 123.8 ක අතිරික්තයක් බවට පත්වීම; සහ (iv) ශ්‍රමික ප්‍රේෂණ හා සංචාරක අංශයේ ණය නොවන ගලාඒම් දෙගුණවීම වැනි ආර්ථිකය යථා තත්ත්වයට පත්වීමේ සලකුණු දක්නට ලැබිණ.

කෙසේ වෙතත්, ආර්ථික වර්ධනය පසුගාමී විය. කර්මාන්ත අංශයේ තියුණු පසුබෑස්ම හේතුවෙන් ආර්ථිකය 2022 වසරේ පළමු භාගයේ සියයට 3.6 ක සංකෝචනයේ සිට 2023 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ සියයට 7.9 කින් සංකෝචනය විය. සේවා වියුක්ති අනුපාතය 2022 වසරේ දෙවන කාර්තුවේදී වාර්තා කළ සියයට 4.6 ක අගයේ සිට 2023 වසරේ සමාන කාල පරිච්ඡේදය තුල සියයට 5.2 ක් දක්වා වැඩිවිය.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ක්‍රියාත්මක කරන ලද දැඩි මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය, 2023 වසරේ ජූනි මාසයේ සිට ලිහිල් කරන ලද අතර ප්‍රතිපත්ති පොලී අනුපාතික 2023 වසරේ ඔක්තෝබර් මාසය තෙක් පදනම් අංක 550 කින් ක්‍රමිකව අඩු කරන ලදී. ඒ අනුව, නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය (SDFR) හා නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය (SLFR) පිළිවෙලින් සියයට 10.00 හා සියයට 11.00 දක්වා අඩු විය. කෙසේ වෙතත්, පෞද්ගලික අංශය වෙත ලබාදුන් ණය, 2022 වසරේ සැප්තැම්බර් මස අවසානය වන විට රු. බිලියන 7,577 ක සිට 2023 වසරේ සැප්තැම්බර් මස අවසාන වන විට රු. බිලියන 7,168 ක් දක්වා සියයට 5.4 කින් අඩු විය.

**රූපසටහන 2.1 : දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය**




*මූලාශ්‍රය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව*

2023 වසරේ පළමු මාස පහ තුළ කොටස් වෙළෙඳපොළ මිශ්‍ර කාර්යයසාධනයක් පෙන්නුම් කරන ලද අතර, ඉතිරි මාස හතර තුළ වර්ධනයක් පිළිඹිබු කරන ලදී.

මේ අතර, විදේශීය අංශය මිශ්‍ර කාර්යයසාධනයක් පෙන්නුම් කරන ලදී. අපනයනයන්ට සාපේක්ෂව වෙළෙඳ භාණ්ඩ ආනයනයන් වේගයෙන් පහත වැටීම නිසා 2022 වසරේ පළමු මාස නවය තුළ වෙළඳ හිඟය ඇ.ඩො. මිලියන 4,093 සිට 2023 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ ඇ.ඩො. මිලියන 3,342 ක් දක්වා කැපීපෙනෙන ලෙස අඩු විය. 2023 වසරේ පළමු මාස නවය තුළ සංචාරක ඉපැයීම් ඇ.ඩො. මිලියන 1,456.7 දක්වා සියයට 66.8 කින් වර්ධනය විය. සංචාරක පැමිණීම් මිලියන 1 ක් දක්වා දෙගුණයකට වඩා වැඩි විය. 2023 වසරේ පළමු මාස නවය තුළ ශ්‍රමික ප්‍රේෂණ, ඇ.ඩො. මිලියන 4,345.1 ක් දක්වා සියයට 68.8 කින් සැළකිය යුතු ලෙස වර්ධනය විය. කෙසේ වෙතත්, දළ නිල සංචිත රැස් කිරීම මන්දගාමී විය.

**රූපසටහන 2.2 : දළ දේශීය නිෂ්පාදිතයේ සංයුතිය 2023 පළමු භාගය**




*මූලාශ්‍රය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව*

## 2.2 ආර්ථික වර්ධනය

2023 වසරේ පළමු භාගය තුළ ආර්ථිකය සියයට 7.9 ක සංකෝචනයක් වාර්තා කරන ලදී. කර්මාන්ත හා සේවා අංශ සංකෝචනය වී ඇති අතර කෘෂිකාර්මික අංශය ධනාත්මක වර්ධනයක් වාර්තා කර ඇත.

ඉදිකිරීම්, නිෂ්පාදන සහ පතල් කැණීම් කටයුතුවල කැපී පෙනෙන සංකෝචනය පිළිබිඹු කරමින් 2022 වසරේ පළමු භාගයේ කර්මාන්ත අංශයේ වූ සියයට 6.6 ක සංකෝචනයට සාපේක්ෂව 2023 වසරේ පළමු භාගයේ දී සියයට 18.3 කින් සංකෝචනය විය.

සේවා අංශය ද 2022 වසරේ පළමු භාගයේ පැවති සියයට 0.2 ක සුළු වර්ධනයට සාපේක්ෂව 2023 වසරේ සමාන කාලපරිච්ඡේදයේ දී සියයට 3.2 කින් සුළු වශයෙන් සංකෝචනය විය. ප්‍රධාන වශයෙන් මූල්‍ය සේවා, වෘත්තීයමය සේවා සහ පරිගණක වැඩසටහන් සම්පාදනය ආශ්‍රිත ක්‍රියාකාරකම්හි සිදු වූ පහත වැටීම මෙම සංකෝචනය සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය.

කෙසේ වෙතත්, පළමු භාගය තුළ කෘෂිකාර්මික අංශය සියයට 2.2 කින් වර්ධනය විය.

2022 වසරේ පළමු භාගයේ පැවති සියයට 20.1 ක සැලකිය යුතු සංකෝචනයට සාපේක්ෂව 2023 වසරේ සමාන කාලපරිච්ඡේදයේ දී බදු සහ සහනාධාර අතර වෙනසේ එකතු කළ අගය සියයට 14.2 ක සංකෝචනයක් පෙන්නුම් කර ඇත.

**වගුව 2.1 : ස්ථාවර (2015) මිල ගණන් අනුව ද.දේ.නි.යේ ආංශික සංයුතිය**

රු. මිලියන

| | අංශය | 2020 | 2021 | 2022(ආ) | පළමු භාගය | | වර්ධනය (%) | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | 2022(ආ) | 2023(අ) | 2022(ආ) | 2023(අ) |
| | **කෘෂිකර්මාන්තය, වන වගාව හා ධීවර කර්මාන්තය** | **941,046** | **949,929** | **906,505** | **444,471** | **454,251** | **-6.2** | **2.2** |
| 1 | ධාන්‍ය වගාව (වී හැර) | 21,342 | 21,949 | 17,200 | 8,266 | 10,523 | -32.2 | 27.3 |
| 2 | වී වගාව | 121,663 | 107,359 | 93,377 | 40,664 | 52,702 | -30.6 | 29.6 |
| 3 | එළවළු වගාව | 111,088 | 109,147 | 99,960 | 49,209 | 51,413 | -10.2 | 4.5 |
| 4 | උක් වගාව,දුම්කොළ වගාව සහ වෙනත් බහුවාර්ෂික නොවන භෝග | 4,021 | 3,729 | 3,797 | 1,934 | 1,973 | 3.4 | 2.0 |
| 5 | පළතුරු වගාව | 81,823 | 72,949 | 73,310 | 35,795 | 37,245 | -0.3 | 4.1 |
| 6 | තෙල් සහිත පළතුරු භෝග වගාව (පොල්,තැඹිලි සහ ඔයිල් පාම් වගාව) | 92,197 | 102,490 | 111,315 | 55,755 | 52,072 | 13.8 | -6.6 |
| 7 | තේ වගාව | 67,971 | 73,741 | 62,005 | 32,839 | 32,877 | -17.4 | 0.1 |
| 8 | වෙනත් පානීය භෝග වගාවන් (කෝපි, කොකෝවා ආදී) | 1,613 | 1,352 | 1,229 | 614 | 614 | -9.1 | -0.1 |
| 9 | කුළුබඩු, සුවඳ දෙන භෝග, බෙහෙත් සහ ඖෂධීය පැලෑටි වගාව | 93,776 | 98,021 | 101,235 | 46,939 | 50,300 | 3.9 | 7.2 |
| 10 | රබර් වගාව | 24,081 | 25,571 | 23,863 | 12,052 | 12,342 | -13.5 | 2.4 |
| 11 | වෙනත් බහුවාර්ෂික භෝග වගාව | 29,781 | 26,963 | 27,513 | 13,631 | 13,522 | 1.0 | -0.8 |
| 12 | සත්ව නිෂ්පාදනයන් | 86,907 | 94,039 | 81,874 | 43,997 | 41,384 | -4.9 | -5.9 |
| 13 | පැල බෝ කිරීම | 622 | 813 | 881 | 365 | 415 | 20.4 | 13.5 |
| 14 | කෘෂිකාර්මික කටයුතු සඳහා වන ආධාරක කාර්යයන් | 26,102 | 29,810 | 34,202 | 14,788 | 16,479 | 6.5 | 11.4 |
| 15 | වන වගාව, දැව හා වනාන්තර ආශ්‍රිත නිෂ්පාදන | 42,587 | 44,440 | 51,611 | 24,465 | 19,769 | 17.8 | -19.2 |
| 16 | කරදිය ධීවර කර්මාන්තය සහ කරදිය ජලජීවී වගාව | 111,307 | 112,814 | 95,451 | 51,747 | 49,310 | -7.5 | -4.7 |
| 17 | මිරිදිය ධීවර කර්මාන්තය සහ මිරිදිය ජලජීවී වගාව | 24,166 | 24,742 | 27,682 | 11,407 | 11,313 | 1.4 | -0.8 |
| | **කර්මාන්ත** | **3,724,566** | **3,937,880** | **3,309,764** | **1,851,593** | **1,512,276** | **-6.6** | **-18.3** |
| 18 | පතල් හා කැණීම් කර්මාන්තය | 284,079 | 287,969 | 198,661 | 124,366 | 77,899 | -13.4 | -37.4 |
| 19 | ආහාර, බීම සහ දුම්කොළ නිෂ්පාදනය | 980,863 | 1,014,150 | 869,715 | 455,050 | 433,410 | -9.8 | -4.8 |
| 20 | රෙදිපිළි, නිමි ඇඳුම් සහ සම් භාණ්ඩ නිෂ්පාදනය | 416,312 | 473,911 | 512,399 | 269,466 | 235,823 | 10.2 | -12.5 |
| 21 | ගෘහභාණ්ඩ හැර දැව හා ඒ ආශ්‍රිත නිෂ්පාදන | 32,831 | 35,579 | 29,758 | 14,736 | 10,281 | -12.4 | -30.2 |
| 22 | කඩදාසි හා ඒ ආශ්‍රිත නිෂ්පාදන,මුද්‍රණ කටයුතු සහ දෘශ්‍ය හා ශ්‍රව්‍ය තැටි නැවත නිෂ්පාදනය | 51,896 | 56,811 | 52,069 | 30,219 | 26,858 | -4.1 | -11.1 |
| 23 | අඟුරු සහ ඛනිජතෙල් පිරිපහදු කිරීමේ නිෂ්පාදන | 22,108 | 15,492 | 6,474 | 3,470 | 10,718 | -56.3 | 208.9 |
| 24 | රසායනික ද්‍රව්‍ය සහ ඒ ආශ්‍රිත නිෂ්පාදන, ඖෂධ හා ඒ ආශ්‍රිත නිෂ්පාදන | 92,157 | 95,793 | 82,350 | 44,523 | 41,513 | -9.0 | -6.8 |

රු. මිලියන

| | අංශය | 2020 | 2021 | 2022[ආ] | පළමු භාගය 2022[ආ] | පළමු භාගය 2023[අ] | වර්ධනය (%) 2022[ආ] | වර්ධනය (%) 2023[අ] |
|---|---|---|---|---|---|---|---|---|
| 25 | රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන | 81,182 | 97,436 | 67,507 | 37,552 | 29,014 | -13.5 | -22.7 |
| 26 | ලෝහමය නොවන වෙනත් ඛණිජ නිෂ්පාදන | 102,685 | 119,973 | 85,188 | 50,800 | 43,908 | -15.7 | -13.6 |
| 27 | ලෝහ හා ඒ ආශ්‍රිත නිෂ්පාදන | 77,859 | 81,174 | 58,781 | 32,262 | 22,276 | -18.5 | -31.0 |
| 28 | යන්ත්‍රෝපකරණ නිෂ්පාදන | 65,187 | 73,090 | 59,181 | 27,816 | 21,157 | -3.1 | -23.9 |
| 29 | ගෘහ භාණ්ඩ නිෂ්පාදන | 81,651 | 82,694 | 60,837 | 44,481 | 34,519 | -8.3 | -22.4 |
| 30 | වෙනත් නිෂ්පාදන කර්මාන්ත, යන්ත්‍රෝපකරණ අලුත්වැඩියාව හා සවි කිරීම | 87,586 | 101,048 | 79,088 | 47,051 | 38,718 | -9.5 | -17.7 |
| 31 | විදුලිය, ගෑස්, වායු හා වායු සමීකරණ සැපයීම | 180,176 | 188,924 | 177,783 | 94,476 | 86,674 | 2.2 | -8.3 |
| 32 | ජලය එක් රැස් කිරීම, පිරිසිදු කිරීම සහ බෙදා හැරීම | 15,908 | 13,083 | 13,168 | 6,852 | 6,531 | 13.8 | -4.7 |
| 33 | මලාපවහන කටයුතු, කසල කළමනාකරණය සහ එම ද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය | 28,960 | 27,992 | 29,088 | 13,374 | 13,417 | 3.2 | 0.3 |
| 34 | ඉදිකිරීම් කර්මාන්තය | 1,123,127 | 1,172,761 | 927,719 | 555,101 | 379,559 | -7.5 | -31.6 |
| | **සේවාවන්** | **7,166,506** | **7,414,251** | **7,265,095** | **3,590,144** | **3,476,316** | **0.2** | **-3.2** |
| 35 | තොග හා සිල්ලර වෙළඳාම | 1,650,889 | 1,675,083 | 1,672,370 | 845,046 | 840,718 | 1.4 | -0.5 |
| 36 | මගීන් හා භාණ්ඩ ප්‍රවාහන සේවාවන් සහ ගබඩා පහසුකම් සැපයීම | 1,313,312 | 1,325,233 | 1,372,116 | 661,176 | 686,566 | 0.5 | 3.8 |
| 37 | තැපැල් හා කුරියර් සේවාවන් | 17,620 | 18,714 | 19,780 | 9,646 | 10,006 | 7.8 | 3.7 |
| 38 | නවාතැන් සැපයීම සහ ආහාරපාන සැපයීමේ සේවාවන් | 128,556 | 130,743 | 166,059 | 84,125 | 96,620 | 27.1 | 14.9 |
| 39 | ගුවන්විදුලි සහ රූපවාහිනී විකාශනය සහ එම නිෂ්පාදන කටයුතු | 43,841 | 42,161 | 37,510 | 22,515 | 19,585 | -5.5 | -13.0 |
| 40 | විදුලි සංදේශ සේවාවන් | 118,845 | 135,663 | 139,919 | 70,062 | 67,103 | 6.8 | -4.2 |
| 41 | පරිගණක වැඩසටහන් සම්පාදනය පිළිබඳ උපදේශන සේවාවන් හා ඒ ආශ්‍රිත ක්‍රියාකාරකම් | 194,893 | 243,971 | 238,455 | 124,263 | 114,525 | 3.3 | -7.8 |
| 42 | මූල්‍ය සේවා ක්‍රියාකාරකම් හා අතිරේක මූල්‍ය සේවා | 557,357 | 596,106 | 530,274 | 302,360 | 221,744 | 1.7 | -26.7 |
| 43 | රක්ෂණය, ප්‍රති රක්ෂණය හා විශ්‍රාම අරමුදල් | 117,595 | 148,665 | 78,509 | 48,001 | 36,766 | -34.6 | -23.4 |
| 44 | නිවාස අයිතිය හා දේපල වෙළඳාම | 604,259 | 630,570 | 554,473 | 295,187 | 260,286 | -2.0 | -11.8 |
| 45 | වෘත්තීයමය සේවාවන් | 287,781 | 301,890 | 289,841 | 126,094 | 117,735 | -1.1 | -6.6 |
| 46 | රාජ්‍ය පරිපාලනය හා ආරක්ෂාව, අත්‍යාවශ්‍ය සමාජ ආරක්ෂාව | 616,176 | 621,834 | 629,213 | 295,419 | 293,805 | 2.2 | -0.5 |
| 47 | අධ්‍යාපනය | 284,751 | 290,475 | 301,510 | 153,784 | 158,405 | 2.9 | 3.0 |
| 48 | සෞඛ්‍ය, නේවාසික රැකවරණ සේවාවන් සහ සමාජ සේවාවන් | 246,735 | 260,482 | 238,638 | 107,157 | 101,204 | 6.0 | -5.6 |
| 49 | වෙනත් පෞද්ගලික සේවාවන් | 983,900 | 992,662 | 996,429 | 445,310 | 451,247 | -2.2 | 1.3 |
| | **සමස්ත එකතු කළ අගය (GVA), මූලික මිල ගණන් අනුව** | **11,832,118** | **12,302,060** | **11,481,364** | **5,886,208** | **5,442,843** | **-2.5** | **-7.5** |
| | **(+) භාණ්ඩ හා සේවා මත අය කරන බදු(-) සහනාධාර** | **763,432** | **735,874** | **536,485** | **313,266** | **268,784** | **-20.1** | **-14.2** |
| | **දළ දේශීය නිෂ්පාදිතය (GDP), වෙළෙඳපොළ මිල** | **12,595,550** | **13,037,934** | **12,017,849** | **6,199,474** | **5,711,627** | **-3.6** | **-7.9** |

*මූලාශ්‍රය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව*

*(අ) තාවකාලික*

*(ආ) සංශෝධිත*

### කෘෂිකර්මය

කෘෂිකාර්මික අංශය, 2022 වසරේ පළමු භාගයේ වූ සියයට 6.2 ක සෘණ වර්ධනයට සාපේක්ෂව 2023 වසරේ සමාන කාලපරිච්ඡේදයේ දී සියයට 2.2 ක ධනාත්මක වර්ධනයක් වාර්තා කර ඇත. මෙයට ප්‍රධාන වශයෙන් ධාන්‍ය වගාව (සහල් හැර), වී, එළවළු, තේ, රබර් සහ පලතුරු වැනි උප අංශයන්හි ධනාත්මක වර්ධනයන් හේතු විය. කෙසේ වුවද, පොල්, තෙල් සහිත පළතුරු භෝග සහ ධීවර කර්මාන්තය වැනි උප අංශ පහත වැටී ඇත.

**රූපසටහන 2.3 : කෘෂිකාර්මික අංශයේ සංයුතිය 2023 පළමු භාගය**




*මූලාශ්‍රය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව*

### වී නිෂ්පාදනය

2023 වසරේ පළමු භාගයේ වී වගාව සියයට 19.8 කින් වර්ධනය විය. 2022/23 මහ කන්නයේ වී නිෂ්පාදනය මෙට්‍රික් ටොන් මිලියන 2.63 ක් වූ අතර, එය ඇඹරූ සහල් මෙට්‍රික් ටොන් මිලියන 1.65 ක් විය. කෙසේ වුවද, 2023 වසරේ මැයි සිට සැප්තැම්බර් මාස තුලදී රටෙහි පැවති උග්‍ර නියඟ තත්ත්වය හේතුවෙන් යල කන්නයේ අස්වැන්න සැලකිය යුතු ලෙස අඩුවනු ඇතැයි අපේක්ෂා කෙරේ. 2022 වසරේ යල කන්නයේ වූ මෙට්‍රික් ටොන් මිලියන 1.5ක වී නිශ්පාදනයට සාපේක්ෂව 2023 වසරේ යල කන්නයේ අපේක්ෂිත නිෂ්පාදනය මෙට්‍රික් ටොන් මිලියන 1.8 ක් වේ.

### තේ, රබර් සහ පොල්

2023 වසරේ මුල් භාගයේ අගය එකතු කළ තේ නිෂ්පාදන සියයට 0.1 කින් විය. රබර් උප අංශය සියයට 2.4 කින් වර්ධනය විය. තවද, තෙල් සහිත පළතුරු උප අංශය, 2022 වසරේ පළමු භාගය තුළ වාර්තා කළ සියයට 13.8 ක වර්ධනයට සාපේක්ෂව 2023 වසරේ සමාන කාලපරිච්ඡේදයේ දී සියයට 6.6 කින් සංකෝචනය වී ඇත. 2022 වසරේ පළමු භාගයේ වාර්තා වූ කිලෝග්‍රෑම් මිලියන 153.2 තේ නිෂ්පාදනයට සාපේක්ෂව 2023 වසරේ ජනවාරි සිට ජූලි දක්වා කාලය තුළ තේ නිෂ්පාදනය කිලෝග්‍රෑම් මිලියන 155.5 ක් විය. රසායනික පොහොර තහනම ඉවත් කිරීමත් සමඟ තේ කර්මාන්තය ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්වීම මෙම සුළු වර්ධනයට හේතු ලෙස සැළකිය හැක.

2022 වසරේ මුල් භාගය තුළ වාර්තා වූ කිලෝග්‍රෑම් මිලියන 41.9 ක රබර් නිෂ්පාදනයට සාපේක්ෂව 2023 වසරේ පළමු භාගයේ දී රබර් නිෂ්පාදනය කිලෝග්‍රෑම් මිලියන 43.3 ක් දක්වා සුළු වශයෙන් වැඩි විය. කෙසේ වුවද, පොල් නිෂ්පාදනය, 2022 වසරේ මුල් භාගය තුළ වාර්තා කළ ගෙඩි මිලියන 1,988.3 ට සාපේක්ෂව, 2023 වසරේ පළමු මාස හය තුළ දී ගෙඩි මිලියන 1,837.0 දක්වා සියයට 7.6 කින් සංකෝචනය විය.

### ධාන්‍ය වර්ග, එළවළු, පළතුරු, කුළුබඩු සහ ඖෂධ බෝග

මෙම කාලය තුළ රසායනික පොහොර ලබා ගැනීමේ හැකියාව පැවතීම හේතුවෙන්, 2023 වසරේ මුල් භාගය තුළ වාර්තා වූ ධාන්‍ය (සහල් හැර) නිෂ්පාදනය 2022 වසරේ එම කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 27.3 කින් සැලකිය යුතු ලෙස ඉහළ ගොස් ඇත.

2023 වසරේ පළමු භාගය තුළ අගය එකතු කළ වටිනාකම මත එළවළු සහ පලතුරු වගා කිරීම පිළිවෙළින් සියයට 4.5 කින් සහ සියයට 4.1 කින් වර්ධනය වී ඇත. 2022 වසරේ පළමු භාගයේ දී වාර්තා කළ සියයට 3.9 ක වර්ධනයට සාපේක්ෂව අගය එකතු කළ වටිනාකම මත කුළුබඩු, සුවඳ දෙන භෝග, ඖෂධ සහ ඖෂධ නිෂ්පාදන 2023 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී සියයට 7.2 කින් වර්ධනය වී ඇත.

### ධීවර හා පශු සම්පත්

කරදිය ධීවර කර්මාන්තය හා කරදිය ජලජීවී වගා උප අංශය අගය එකතු කළ වටිනාකම මත, 2022 වසරේ පළමු භාගය තුළ දී වාර්තා කළ සියයට 7.5 ක පහත වැටීමට සාපේක්ෂව, 2023 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ සියයට 4.7 කින් සංකෝචනය විය. සමස්ත මත්ස්‍ය නිෂ්පාදනය, 2022 වසරේ පළමු භාගය තුළ දී වාර්තා කළ කිලෝග්‍රෑම් මිලියන 226.5 ට සාපේක්ෂව 2023 වසරේ සමාන කාලපරිච්ඡේදයේ දී කිලෝග්‍රෑම් මිලියන 222.1 ක් දක්වා සියයට 2.0 කින් පහත වැටී ඇත. අගය එකතු කළ වටිනාකම

මත සත්ව නිෂ්පාදන උප අංශය 2022 වසරේ මුල් භාගයේ පෙන්නුම් කළ සියයට 4.9 ක හැකිලීමට සාපේක්ෂව 2023 වසරේ පළමු භාගයේ සියයට 5.9 කින් සංකෝචනය විය.

**කර්මාන්ත හා නිෂ්පාදන**

ද.දේ.නි. යට සියයට 26.5 ක දායකත්වයක් දක්වන කර්මාන්ත අංශය, 2022 වසරේ පළමු භාගයේ දී පැවති සියයට 6.6 ක ඍණ වර්ධනයට සාපේක්ෂව 2023 වසරේ සමාන කාලපරිච්ඡේදයේ දී සියයට 18.3 කින් සංකෝචනය වී ඇත. මෙම පසුබෑස්ම සඳහා ප්‍රධාන වශයෙන් ඉදිකිරීම්, නිෂ්පාදන සහ පතල් හා කැණීම් යන අංශවල පිළිවෙලින් සියයට 31.6, සියයට 5.1 හා සියයට 37.4 වශයෙන් වූ පහත වැටීම් හේතු විය.

ආහාර, බීම හා පාන වර්ග හා දුම්කොළ නිෂ්පාදන (සියයට 4.8), රෙදිපිළි ඇඟලුම් හා සම් ආශ්‍රිත නිෂ්පාදන (සියයට 12.5), ගෘහ භාණ්ඩ හැර දැව හා දැව ආශ්‍රිත නිෂ්පාදන (සියයට 30.2), කඩදාසි නිෂ්පාදන, මුද්‍රණ හා මාධ්‍ය නිෂ්පාදන ප්‍රතිනිර්මාණය (සියයට 11.1), ලෝහමය නොවන වෙනත් ඛනිජ නිෂ්පාදන (සියයට 13.6) ලෝහ හා ඒ ආශ්‍රිත නිෂ්පාදන (සියයට 31.0) ගෘහ භාණ්ඩ නිෂ්පාදන (සියයට 22.4), රසායනික ද්‍රව්‍ය හා ඒ ආශ්‍රිත නිෂ්පාදන, ඖෂධ හා ඒ ආශ්‍රිත නිෂ්පාදන (සියයට 6.8), රබර් හා ප්ලාස්ටික් නිෂ්පාදන (සියයට 22.7), යන්ත්‍රෝපකරණ නිෂ්පාදන (සියයට 23.9) හා වෙනත් නිෂ්පාදන කර්මාන්ත (සියයට 17.7) යනා දී උප අංශයන් සියල්ලම 2022 වසරේ පළමු භාගයට සාපේක්ෂව 2023 වසරේ සමාන කාලපර්ච්ඡේදය තුළ පසුබෑමට ලක් විය.

**රූපසටහන 2.4 : කර්මාන්ත අංශයේ සංයුතිය - 2023 පළමු භාගය**




*මූලාශ්‍රය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව*

තවද, ජලය රැස් කිරීම, පිරිසිදු කිරීම හා බෙදා හැරීම (සියයට 4.7), විදුලිය, ගෑස්, වායු හා වායුසමීකරණ සැපයීම (සියයට 8.3), 2023 වසරේ පළමු භාගයේ දී ඝෘණාත්මක වර්ධනයක් වාර්තා කළ අතර, මලාපවහන කටයුතු, කසල කළමනාකරණය සහ එම ද්‍රව්‍ය ප්‍රතිචක්‍රිකරණය සියයට 0.3 කින් ආන්තිකව වර්ධනය විය.

කෙසේ වෙතත්, අඟුරු සහ ඛණිජ තෙල් පිරිපහදු කිරීමේ නිෂ්පාදන 2022 වසරේ පළමු භාගයේ දී වාර්තා කළ සියයට 56.3 සංකෝචනයට සාපේක්ෂව 2023 වසරේ සමාන කාලපර්ච්ඡේදයේ සියයට 208.9 ක සැළකිය යුතු අන්දමේ ධනාත්මක වර්ධනයක් පිළිබිඹු කරන ලදී.

**රූපසටහන 2.5 : නිෂ්පාදන අංශයේ සංයුතිය - 2023 පළමු භාගය**




*මූලාශ්‍රය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව*

සමස්ත බලශක්ති උත්පාදනය 2022 වසරේ පළමු මාස අට තුළ දී වාර්තා කළ ගිගාවොට් පැය 10,832 ට සාපේක්ෂව 2023 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ගිගාවොට් පැය 10,341 ක් දක්වා සියයට 4.5 කින් පහත වැටී ඇත. ඉන්ධන සහ අමුද්‍රව්‍ය හිඟකම සමඟින් ප්‍රධාන වශයෙන් කර්මාන්ත අංශයේ ක්‍රියාකාරකම් හි වූ පසු බෑස්ම හේතුවෙන් 2022 වසරේ පළමු මාස අටේ දී අලෙවි කළ විදුලි ඒකක ගිගාවොට් පැය 2,957 ට සාපේක්ෂව 2023 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ගිගාවොට් පැය 2,825 ක් දක්වා කර්මාන්ත අංශයට අලෙවි කළ විදුලි ඒකක ගණන සියයට 4.5 කින් පහත බැස ඇත.

2022 වසරේ මුල් මාස අට තුළ දී ජල විදුලිය හරහා උත්පාදනය කරන ලද විදුලි ඒකක ගිගාවොට් පැය 3,122 ට සාපේක්ෂව 2023 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ජල විදුලිය හරහා විදුලි උත්පාදනය විදුලි ඒකක ගිගාවොට් පැය 2,287 දක්වා සියයට 26.8 කින් පහත වැටී ඇත. ගල් අඟුරු (සියයට 3.6) හරහා විදුලිය උත්පාදනය කිරීමේදී ද එවැනිම අඩුවීමක් දැකිය හැක. තාප (ඉන්ධන) (සියයට 52.7) සහ සුළං (සියයට 13.9) මඟින් විදුලිය උත්පාදනයේ වැඩිවීමක් ද 2023 වසරේ පළමු මාස අට තුළ වාර්තා විය.

**සේවා අංශය**

2023 වසරේ පළමු භාගයේ, මූල්‍ය සේවා ක්‍රියාකාරකම්, වෘත්තීයමය සේවා සහ පරිගණක වැඩසටහන් සම්පාදනය ආශ්‍රිත ක්‍රියාකාරකම්හි පිළිවෙළින් සියයට 26.7 ක, සියයට 6.6 ක සහ සියයට 7.8 ක පසුබෑමත් සමඟ, සේවා අංශය සියයට 3.2 කින් සුළු වශයෙන් සංකෝචනය විය. මෙය 2022 වසරේ පළමු භාගයේ වාර්තා වූ සියයට 0.2 ක ආන්තික වර්ධනයට සාපේක්ෂවය.

2023 වසරේ පළමු භාගයේ දී තොග හා සිල්ලර වෙළෙඳාම් (සියයට 0.5), ගුවන් විදුලි හා රූපවාහිනී නිෂ්පාදන හා විකාශන කටයුතු (සියයට 13.0) හා සෞඛ්‍ය, නේවාසික රැකවරණ සේවාවන් සහ සමාජ සේවාවන් (සියයට 5.6) යන උප අංශයන්ගේ පසුබෑමක් වාර්තා විය. කෙසේ වෙතත්, තැපැල් හා කුරියර් සේවාවන් (සියයට 3.7), අධ්‍යාපනය (සියයට 3.0), නවාතැන් පහසුකම් (සියයට 14.9) හා වෙනත් පෞද්ගලික සේවාවන් (සියයට 1.3) 2023 වසරේ පළමු භාගයේ දී ධනාත්මක වර්ධනයක් වාර්තා කරන ලදී.

**රූපසටහන 2.6 : සේවා අංශයේ සංයුතිය - 2023 පළමු භාගය**




*මූලාශ්‍රය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව*

**ප්‍රවාහන සහ වරාය සේවා**

ප්‍රවාහන අංශය, 2023 පළමු භාගයේ සියයට 5.4 ක ධනාත්මක වර්ධනයක් වාර්තා කළේය. 2022 වසරේ මුල් මාස නවය තුළ දී 16,014 ක් වූ නව වාහන ලියාපදිංචි කිරීම් සංඛ්‍යාව 2023 වසරේ සමාන කාලපරිච්ඡේදයේ දී, 17,176 ක් දක්වා සියයට 7.3 කින් වර්ධනය වී ඇත.

2023 වසරේ පළමු මාස නවය තුළ දී මෝටර් කාර් සහ යතුරුපැදි ලියාපදිංචි කිරීම පිළිවෙලින් සියයට 20.6 කින් සහ සියයට 77.1 කින් ඉහළ ගොස් ඇත. 2023 වසරේ පළමු මාස නවය තුළ දී බස් රථ (සියයට 109.3) සහ ත්‍රීරෝද රථ (සියයට 53.1) ලියාපදිංචිය සැළකිය යුතු ලෙස ඉහළ ගොස් ඇත. එසේ වුවද, ද්විත්ව කාර්ය රථ, භාණ්ඩ ප්‍රවාහනය රථ සහ ගොඩබිම් වාහන ලියාපදිංචි කිරීම පිළිවෙලින් සියයට 45.5 කින්, සියයට 82.1 කින් සහ සියයට 9.4 කින් අඩු විය.

2022 වසරේ පළමු මාස නවය තුළ දී මෙහෙයවන ලද මුළු බහාලුම් සංඛ්‍යාව වන අඩි 20 බහාලුම් ඒකක (TEUs) මිලියන 5.2 ට සාපේක්ෂව, 2023 වසරේ සමාන කාලපරිච්ඡේදයේ දී එම සංඛ්‍යාව මිලියන 5.3 ක් දක්වා සියයට 0.6 කින් සුළු වශයෙන් වැඩි වී ඇත. දේශීය සහ නැවත ගබඩා කිරීම් සඳහා 2023 වසරේ පළමු මාස නවය තුළ දී මෙහෙයවන ලද බහාලුම් සංඛ්‍යාව පිළිවෙලින් සියයට 10.2 කින් සහ සියයට 8.1 කින් අඩු වී ඇති අතර, ප්‍රතිනැව්ගත කිරීම් සඳහා මෙහෙයවන ලද බහාලුම් සංඛ්‍යාව සියයට 2.9 කින් වැඩි වී ඇත.

සමස්ත භාණ්ඩ මෙහෙයුම් සංඛ්‍යාව 2022 වසරේ පළමු මාස නවය තුළ දී වාර්තා කළ මෙට්‍රික් ටොන් මිලියන 77.8 ට සාපේක්ෂව, 2023 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී මෙට්‍රික් ටොන් මිලියන 78.4 ක් දක්වා සියයට 0.7 කින් ආන්තික වශයෙන් වැඩි වී ඇත. මෙම ආන්තික වර්ධනය, 2022 වසරේ පළමු මාස නවය තුළ දී මුදා හරින ලද මෙට්‍රික් ටොන් මිලියන 41.7 ක භාණ්ඩ ප්‍රමාණයට සාපේක්ෂව, 2023 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී එම සංඛ්‍යාව මෙට්‍රික් ටොන් මිලියන 42.2 ක් දක්වා සියයට 1.2 කින් සුළු වශයෙන් වැඩි වීම හේතු විය හැක.

**විදුලි සංදේශ**

විදුලි සංදේශ උප අංශයේ අගය එකතු කළ වටිනාකම 2023 වසරේ පළමු භාගයේදී සියයට 4.2 ක සංකෝචනයක් වාර්තා කර ඇත. සෙලියුලර් දුරකථන ඇතුළු දුරකථන ඝණත්වය, 2022 වසරේ පළමු භාගයේ පැවති පුද්ගලයින් 100 කට 146.9 ට සාපේක්ෂව 2023 වසරේ සමාන කාලපරිච්ඡේදයේ දී පුද්ගලයින් 100 කට 137.0 දක්වා සියයට 6.8 කින් අඩු වී ඇත. ජංගම අන්තර්ජාල සම්බන්ධතා ඇතුළු අන්තර්ජාල ග්‍රාහකයින් සංඛ්‍යාව 2023 වසරේ පළමු භාගයේ දී මිලියන 21.9 ක් දක්වා සියයට 1.0 කින්

වගුව 2.2 : සේවා අංශයේ තෝරාගත් දර්ශකයන්

| දර්ශකය | 2019 | 2020 | 2021 | 2022 | 2022 | 2023 (අ) |
|---|---|---|---|---|---|---|
| **වරාය සේවා** | | | | | **ජන. - සැප්.** | **ජන. - සැප්.** |
| පැමිණි නැව් සංඛ්‍යාව | 4,697 | 4,337 | 4,180 | 4,073 | 2,959 | 3,629 |
| මෙහෙයවන ලද මුළු භාණ්ඩ (මෙ.ටො. '000) | 106,979 | 102,908 | 109,356 | 100,376 | 77,822 | 78,347 |
| මෙහෙයවන ලද මුළු බහාළුම් ( TEU' 000) | 7,228 | 6,855 | 7,249 | 6,862 | 5,235 | 5,267 |
| ප්‍රතිනැව්ගත කිරීම (ආ) ( TEU' 000) | 5,955 | 5,765 | 6,050 | 5,832 | 4,438 | 4,552 |
| **විදුලි සංදේශ අංශය** | | | | | **ජන. - ජූනි** | **ජන. - ජූනි** |
| ස්ථාවර දුරකථන (සංඛ්‍යාව '000) | 2,300 | 2,613 | 2,852 | 2,651 | 3,031 | 2,442 |
| ජංගම දුරකථන (සංඛ්‍යාව '000) | 32,884 | 28,739 | 29,959 | 28,838 | 29,561 | 27,980 |
| රැහැන් රහිත දුරකථන (සංඛ්‍යාව '000) | 1,055 | 1,367 | 1,587 | 1,388 | 1,765 | 1,242 |
| අන්තර්ජාල හා විද්‍යුත් තැපැල් ග්‍රාහකයන් (සංඛ්‍යාව '000) | 13,408 | 17,524 | 22,106 | 21,668 | 22,142 | 21,920 |
| **සෞඛ්‍ය අංශය** | | | | | **ජන. - ජූනි** | **ජන. - ජූනි** |
| පෞද්ගලික රෝහල් | 209 | 217 | 243 | 250 | 243 | 198 |
| රජයේ රෝහල් | 603 | 609 | 618 | 617 | 617 | 617 |
| ඇඳන් සංඛ්‍යාව (රජයේ) | 77,964 | 77,121 | 78,228 | 78,228 | 78,228 | 78,228 |
| වෛද්‍යවරුන් සංඛ්‍යාව (රජයේ) | 18,130 | 18,218 | 20,209 | 21,045 | 20,209 | 21,045 |
| හෙදියන් සංඛ්‍යාව (රජයේ) | 38,276 | 37,133 | 39,091 | 40,775 | 39,091 | 40,775 |
| **මූල්‍ය අංශය** | | | | | **සැප්. අවසානයට** | **සැප්. අවසානයට** |
| බැංකු ශාඛා හා අනෙකුත් සේවා මධ්‍යස්ථාන | 7,390 | 7,406 | 7,369 | 7,378 | 7,416 | 7,520 |
| ලියාපදිංචි මූල්‍ය සමාගම් (ඉ) | 42 | 40 | 39 | 37 | 35 | 33 |
| ලියාපදිංචි කල්බදු සමාගම් | 4 | 3 | 3 | 1 | 2 | 1 |
| | | | | | **අගෝ. අවසානයට** | **අගෝ. අවසානයට** |
| ණය කාඩ්පත් (ක්‍රියාකාරී) | 1,854,103 | 1,984,525 | 2,054,985 | 2,054,896 | 1,963,705 | 1,917,336 |
| **සංචාරක අංශය** | | | | | **ජන. - සැප්.** | **ජන. - සැප්.** |
| පැමිණි සංචාරක සංඛ්‍යාව | 1,913,702 | 507,704 | 194,495 | 719,978 | 526,232 | 1,016,256 |
| සංචාරක ඉපයීම් (ඇ.ඩො. මිලියන) | 3,607 | 682 | 507 | 1,136 | 873 | 1,457 |
| හෝටල් කාමර නැවතුම් අනුපාතය | 57.1 | 15.0 | 18.6 | 30 | ලැ.නැ. | ලැ.නැ. |
| **ප්‍රවාහන සේවා (අලුතින් ලියාපදිංචි කිරීම)** | | | | | **ජන. - සැප්.** | **ජන. - සැප්.** |
| බස් රථ | 1,613 | 578 | 281 | 404 | 270 | 565 |
| මෝටර් කාර් | 38,232 | 21,021 | 3,495 | 1,489 | 1,141 | 1,376 |
| භාණ්ඩ ප්‍රවාහන රථ (ඇ) | 5,223 | 3,941 | 2,593 | 940 | 1,663 | 298 |
| යතුරු පැදි | 284,301 | 151,634 | 8,011 | 9,060 | 7,067 | 12,518 |
| ත්‍රිරෝද රථ | 15,490 | 7,150 | 2,093 | 36 | 32 | 49 |
| ට්‍රැක්ටර් සහ ට්‍රේලර්ස් (ඈ) | 7,666 | 8,302 | 12,616 | 5,285 | 5,841 | 2,370 |

*මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකුව*

*: මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව*

*(අ) තාවකාලික*

*(ආ) නැවත ඇසිරීම් ඇතුළත් වේ.*

*(ඇ) විශේෂ කාර්ය වාහන, මෝටර් ලොරි සහ ලොරි අනෙකුත්*

*(ඈ) රෝද හතරේ ට්‍රැක්ටර්, අත් ට්‍රැක්ටර් සහ ට්‍රේලර්ස් මෙහි ඇතුළත් වේ.*

*(ඉ) ETI මූල්‍ය සමාගම ඇතුළත් නොවේ*

*ලැ.නො (ලැබී නොමැත)*

අඩු විය. 2023 වසරේ පළමු මාස හය තුළ, භාවිතයේ පවතින ස්ථාවර දුරකථන සහ සෙලියුලර් දුරකථන සංඛ්‍යාව ද පිළිවෙලින් සියයට 19.4 කින් සහ සියයට 5.3 කින් පහත බැස ඇත.

**මූල්‍ය සේවා, රක්ෂණ හා දේපල වෙළදාම් සහ වෙනත් සේවා**

2022 වසරේ පළමු භාගයේ දී රු. බිලියන 350.4 ක්ව පැවති මූල්‍ය සේවා හා රක්ෂණ උප අංශයෙහි අගය එකතු කළ වටිනාකම 2023 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 258.5 ක් දක්වා සියයට 26.2 කින් පහත වැටී ඇත. තවද, 2022 වසරේ පළමු භාගයේ දී රු. බිලියන 295.2 ක්ව පැවති නිවාස අයිතිය ඇතුළු දේපල වෙළදාම් කටයුතු උප අංශයෙහි අගය එකතු කළ වටිනාකම 2023 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 260.3 ක් දක්වා සියයට 11.8 කින් පහත වැටී ඇත. රක්ෂණ ක්ෂේත්‍රයේ මුළු වත්කම් වටිනාකම 2022 වසරේ ජුනි මස අවසානයට පැවති රු. බිලියන 906.3 ට සාපේක්ෂව 2023 වසරේ ජුනි මස අවසන් වන විට රු. බිලියන 1,023.5 ක් දක්වා සියයට 12.9 කින් වර්ධනය විය.

රාජ්‍ය පරිපාලනය, ආරක්ෂක, අධ්‍යාපන, සෞඛ්‍ය සහ සමාජ සේවාවන් යන උප අංශයන් 2022 වසරේ පළමු භාගයේ දී වාර්තා කළ රු. බිලියන 556.4 ට සාපේක්ෂව 2023 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 553.4 ක් දක්වා සියයට 0.5 කින් ආන්තික ලෙස පහළ ගොස් ඇති අතර වෘත්තීමය, විද්‍යාත්මක, තාක්ෂණික, පරිපාලන සහ උපකාරක සේවාවන් 2022 වසරේ පළමු භාගයේ දී වාර්තා කළ රු. බිලියන 126.1 ට සාපේක්ෂව 2023 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 117.7 ක් දක්වා සියයට 6.6 කින් පහත බැස ඇත.

**සේවා වියුක්තිය**

ආර්ථික ක්‍රියාකාරකම්වල සැළකිය යුතු මට්ටමේ මන්දගාමීබවක් පිළිබිඹු කරමින් 2023 වසරේ දෙවන කාර්තුවේ දී සේවා වියුක්ති අනුපාතය, එම වසරේ පළමු කාර්තුවේ දී වාර්තා වූ සියයට 4.7 ට සාපේක්ෂව සියයට 5.2 දක්වා වැඩි විය. ඒ හා සමගාමීව, ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතය 2023 වසරේ පළමු කාර්තුවේ දී සියයට 49.9 සිට 2023 වසරේ දෙවන කාර්තුවේ දී සියයට 48.6 ක් දක්වා අඩු විය.

මේ අතර 2023 දෙවන කාර්තුව තුල අනෙකුත් සියලුම වයස් කාණ්ඩයන් අභිබවමින් තරුණ වයස් කාණ්ඩයේ (වයස අවුරුදු 15-24) සේවා වියුක්ති අනුපාතය සියයට 25.8 ක අගයක් වාර්තා කරන ලද අතර එය 2023 පළමු කාර්තුවේ වාරතා කල සියයට 22.4 සිට වූ වර්ධනයකි.

**රූපසටහන 2.7 : ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතය සහ සේවා වියුක්තිය**




*මූලාශ්‍රය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව*

**වගුව 2.3 : සංචාරක අංශයේ කාර්යසාධනය**

| මාසය | සංචාරකයින්ගේ පැමිණීම | | | | | සංචාරක ඉපැයීම (ඇ.ඩො. මිලියන) | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2019 | 2020 | 2021 | 2022(ආ) | 2023(අ) | 2019 | 2020 | 2021 | 2022(ආ) | 2023(අ) |
| ජනවාරි | 244,239 | 228,434 | 1,682 | 82,327 | 102,545 | 460.3 | 307.0 | 4.4 | 151.7 | 153.5 |
| පෙබරවාරි | 252,033 | 207,507 | 3,366 | 96,507 | 107,639 | 475.0 | 278.9 | 8.8 | 169.4 | 161.6 |
| මාර්තු | 244,328 | 71,370 | 4,581 | 106,500 | 125,495 | 460.5 | 95.9 | 11.9 | 161.2 | 188.8 |
| අප්‍රේල් | 166,975 | - | 4,168 | 62,980 | 105,498 | 314.7 | - | 10.9 | 108.7 | 148.2 |
| මැයි | 37,802 | - | 1,497 | 30,207 | 83,309 | 71.2 | - | 3.9 | 43.5 | 100.0 |
| ජූනි | 63,072 | - | 1,614 | 32,856 | 100,388 | 118.9 | - | 4.2 | 45.0 | 122.9 |
| ජූලි | 115,701 | - | 2,429 | 47,293 | 143,039 | 218.1 | - | 6.3 | 85.0 | 219.0 |
| අගෝස්තු | 143,587 | - | 5,040 | 37,760 | 136,405 | 270.6 | - | 13.1 | 67.9 | 210.5 |
| සැප්තැම්බර් | 108,575 | - | 13,547 | 29,802 | 111,938 | 204.6 | - | 35.3 | 40.5 | 152.2 |
| ඔක්තෝබර් | 118,743 | - | 22,771 | 42,026 | | 223.8 | - | 59.3 | 54.9 | |
| නොවැම්බර් | 176,984 | - | 44,294 | 59,759 | | 333.6 | - | 115.4 | 81.0 | |
| දෙසැම්බර් | 241,663 | 393 | 89,506 | 91,961 | | 455.5 | - | 233.3 | 127.4 | |
| **එකතුව** | **1,913,702** | **507,704** | **194,495** | **719,978** | **1,016,256** | **3,606.8** | **682.4** | **506.8** | **1,136.3** | **1,456.7** |

*මූලාශ්‍රය: ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන අධිකාරිය*

වගුව 2.4 : ද.දේ.නි. වර්ධනයේ ආංශික ව්‍යාප්තිය (%)

| අංශය | 2018 | 2019 | 2020 | 2021 | 2022(ආ) | පළමු භාගය 2022(ආ) | පළමු භාගය 2023(අ) |
|---|---|---|---|---|---|---|---|
| **කෘෂිකර්මාන්තය** | **6.3** | **0.5** | **-0.9** | **0.9** | **-4.6** | **-6.2** | **2.2** |
| තේ වගාව | 2.0 | -3.3 | -6.5 | 8.5 | -15.9 | -17.4 | 0.1 |
| වී වගාව | 45.2 | 6.2 | 7.7 | -11.8 | -13.0 | -30.6 | 29.6 |
| රබර් වගාව | 1.8 | -7.8 | 0.2 | 6.2 | -6.7 | -13.5 | 2.4 |
| ධාන්‍ය වගාව | 2.1 | -9.0 | 59.8 | 2.8 | -21.6 | -32.2 | 27.3 |
| එළවළු වගාව | 0.5 | -2.9 | 8.9 | -1.7 | -8.4 | -10.2 | 4.5 |
| සත්ව නිෂ්පාදන | 4.1 | -4.5 | -3.7 | 8.2 | -12.9 | -4.9 | -5.9 |
| වන වගාව, දැව හා වනාන්තර ආශ්‍රිත නිෂ්පාදන | -13.6 | -3.3 | -1.3 | 4.4 | 16.1 | 17.8 | -19.2 |
| ධීවර කර්මාන්තය | -0.2 | -4.4 | -17.0 | 1.5 | -10.5 | -6.0 | -4.0 |
| **කර්මාන්ත** | **-1.1** | **-4.1** | **-5.3** | **5.7** | **-16.0** | **-6.6** | **-18.3** |
| පතල් හා කැණීම් | -2.7 | -1.2 | -10.9 | 1.4 | -31.0 | -13.4 | -37.4 |
| නිෂ්පාදන ක්‍රියාකාරකම් | 3.8 | 2.0 | -2.6 | -46.2 | -12.2 | -6.1 | -10.3 |
| අනෙකුත් කර්මාන්ත | 7.1 | 4.3 | -1.3 | 2.2 | -4.3 | 2.9 | -7.0 |
| ඉදිකිරීම් | -8.0 | -14.8 | -9.4 | 4.4 | -20.9 | -7.5 | -31.6 |
| **සේවා** | **4.3** | **2.9** | **-1.9** | **3.5** | **-2.0** | **0.2** | **-3.2** |
| තොග හා සිල්ලර වෙළඳාම | 4.7 | 3.6 | 0.9 | 1.5 | -0.2 | 1.4 | -0.5 |
| ප්‍රවාහනය හා ගබඩා කිරීම | 2.1 | 2.0 | -6.1 | 0.9 | 3.5 | 0.5 | 3.8 |
| නවාතැන් හා ආහාර සැපයීමේ ක්‍රියාකාරකම් | 5.1 | -6.0 | -40.8 | 1.7 | 27.0 | 27.1 | 14.9 |
| තොරතුරු හා සන්නිවේදනය | 7.2 | 12.0 | 11.1 | 18.0 | -1.4 | 3.4 | -7.2 |
| මූල්‍ය හා රක්ෂණ ක්‍රියාකාරකම් | 16.6 | 1.2 | 7.0 | 10.3 | -18.3 | -5.4 | -26.2 |
| නිශ්චල දේපල ක්‍රියාකාරකම් | 5.6 | 5.1 | -1.0 | 4.4 | -12.1 | -2.0 | -11.8 |
| වෘත්තීයමය සේවා | 3.8 | 5.4 | -3.3 | 4.9 | -4.0 | -1.1 | -6.6 |
| අධ්‍යාපන, සෞඛ්‍ය හා සමාජයීය ක්‍රියාකාරකම් | 1.4 | 4.6 | 2.5 | 3.7 | -2.0 | -0.9 | -0.5 |
| රාජ්‍ය පරිපාලන හා ආරක්ෂාව | 1.9 | 0.8 | 1.7 | 0.9 | 1.2 | 2.2 | -0.5 |
| අනෙකුත් සේවා (ස්වයං සේවා හැර) | 1.5 | 2.0 | -6.6 | 0.9 | 0.4 | -2.2 | 1.3 |
| **ද.දේ.නි.** | **2.3** | **-0.2** | **-4.6** | **3.5** | **-7.8** | **-3.6** | **-7.9** |

*මූලාශ්‍රය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව*

*(අ) තාවකාලික*

*:ආ* සංශෝධිත*

## 2.3 මුදල් අංශයේ වර්ධනයන්

උද්ධමනය පාලනය කිරීම සඳහා නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය, නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය සහ ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය (SRR) පිළිවෙළින් සියයට 14.50, සියයට 15.50 සහ සියයට 4.00 ක පවත්වාගෙන යමින් මහ බැංකුව විසින් 2023 වසරේ ජනවාරි මාසයේ සිට දැඩි මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයක් අනුගමනය කරන ලදී. තවදුරටත් ප්‍රතිපත්ති ස්ථාවරය දැඩි කරමින් 2023 වසරේ මාර්තු මාසය වන විට ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය සියයට 4.00 ක පවත්වා ගනිමින් ප්‍රතිපත්ති පොලී අනුපාතික පදනම් අංක 100 කින් වැඩි කරන ලදී. කෙසේ වෙතත්, උද්ධමනය මාස අටකට ආසන්න කාලසීමාවක් මුළුල්ලේ සැළකිය යුතු ලෙස පහළ යාම නිරීක්ෂණය වීමත් සමඟ, ප්‍රතිපත්ති පොලී අනුපාතික පදනම් අංක 250 කින් අඩු කරමින් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2023 වසරේ ජූනි මාසයේ සිට සිය ප්‍රතිපත්ති ස්ථාවරය වෙනස් කරන ලදී. 2023 වසරේ ජූනි මාසයේ අවසානය වන විට, නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය, නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය සහ ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය පිළිවෙළින් සියයට

13.00, සියයට 14.00 හා සියයට 4.00 ක පැවතිණ. 2023 වසරේ අගෝස්තු මාසයේ ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය සියයට 2.00 දක්වා අඩු කිරීමත් සමග මුදල් ප්‍රතිපත්තිය තවදුරටත් ලිහිල් විය.

මධ්‍යකාලීනව උද්ධමනය අපේක්ෂිත සියයට 5 මට්ටමේ ස්ථාවර කර ගැනීමේ අරමුණින්, ආර්ථිකයට එහි වර්ධන විභවය ලඟා කරගැනීමට හැකිවන අයුරින්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2023 වසරේ ඔක්තෝබර් මාසය වන විට ප්‍රතිපත්ති පොලී අනුපාතික පදනම් අංක 100 කින් තවදුරටත් අඩුකරමින් නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සියයට 10.00 ක හා නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය සියයට 11.00 ක පවත්වාගන්නා ලදී.

වෙළෙඳපොළ ණය පොලී අනුපාතික පහළ යාමේ අනම්‍යශීලී බව සැළකිල්ලට ගනිමින් 2023 වසරේ අගෝස්තු මාසයේ සිට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් උකස් පහසුකම්, පෙර ගිවිසගෙන ඇති තාවකාලික බැංකු අයිරා සහ ණය කාඩ්පත් මත උපරිම පොලී අනුපාතික පනවන ලදී. උකස් පහසුකම් සඳහා වසරකට සියයට 18 ක් ද, පෙර ගිවිසගෙන ඇති තාවකාලික බැංකු අයිරා සඳහා වසරකට සියයට 23 ක් ද, ණය කාඩ්පත් සඳහා වසරකට සියයට 28 ක් ද, වන ලෙස උපරිම පොලී අනුපාතික පනවා ඇත. මුදල් ප්‍රතිපත්තිය ලිහිල්වීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග ඵලදායී ලෙස ව්‍යාප්ත වීම හා පාරිභෝගිකයන් ආරක්ෂා කරගැනීම සඳහා මෙසේ උපරිම පොලී අනුපාතික හඳුන්වා දී ඇත.

2022 වසරේ දෙසැම්බර් මාසයේ අවසානය වන විට බරිත සාමාන්‍ය ණය පොලී අනුපාතිකය (AWLR) සියයට 18.7 ක පැවති අතර, එය 2023 වසරේ සැප්තැම්බර් මාසයේ අවසානය වනවිට සියයට 15.6 ක් දක්වා අඩු වූ අතර, බරිත සාමාන්‍ය තැන්පතු අනුපාතිකය (AWDR) 2022 වසරේ දෙසැම්බර් මාසයේ අවසානය වනවිට සියයට 14.06 ක පැවති අතර, එය 2023 වසරේ සැප්තැම්බර් මාසය අවසානය වනවිට සියයට 13.39 ක් දක්වා අඩුවිය.

පුළුල් මුදල් ($M_2b$), 2022 වසරේ දෙසැම්බර් මස අවසානයේ දී රු. බිලියන 12,290 සිට 2023 වසරේ අගෝස්තු මස අවසානයේ දී රු. බිලියන 12,806 ක් දක්වා සියයට 4.2 කින් වැඩි වූ අතර, පුද්ගලික අංශයට ලබාදුන් ණය, 2022 වසර අවසානයේ රු. බිලියන 7,414 සිට 2023 වසරේ සැප්තැම්බර් මස අවසානයේ දී රු. බිලියන 7,168 ක් දක්වා සියයට 3.3 කින් අඩු විය. කෙසේ වෙතත්, 2022 වසර අවසාන වනවිට රාජ්‍ය අංශයට ලබාදෙන ලද ශුද්ධ ණය රු. බිලියන 7,471 සිට 2023 වසරේ සැප්තැම්බර් මස අවසානය වන විට රු. බිලියන 8,204 ක් දක්වා සියයට 9.8 කින් වැඩි විය.

**රූපසටහන 2.8 : පොලී අනුපාත, මූල්‍ය සමස්තයන් සහ පෞද්ගලික අංශයට ලබා දුන් ණයෙහි වර්ධනය**




*මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකුව*




*මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකුව*

**රූපසටහන 2.9 : මතුපිට, මූලික සහ ආහාර උද්ධමන විචලතා**




*(2021 ජනවාරි සිට 2023 ජනවාරි දක්වා පදනම් වර්ෂය 2013=100 සහ 2023 පෙබරවාරි සිට පදනම් වර්ෂය 2021=100)*

**උද්ධමනය**

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුව හේතුවෙන්, උද්ධමනය සැළකිය යුතු ලෙස පහත වැටීමේ ප්‍රතිඵලයක් ලෙස 2023 වසරේ උද්ධමන අපේක්ෂාවන් විශාල වශයෙන් අඩු වී ඇත. ආහාර හා ආහාර නොවන උද්ධමනය අඩුවීම හේතුවෙන්, කොළඹ පාරිභෝගික මිල දර්ශකයේ (කො.පා.මි.ද., 2021=100) වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන මතුපිට උද්ධමනය 2023 සැප්තැම්බර් මාසයේ දී සියයට 1.3 ක් දක්වා මධ්‍යකාලීනව අපේක්ෂිත මැදි තනි අගයක මට්ටමට වඩා සැළකිය යුතු ලෙස පහළ යන ලදී. ඒ හා සමානව, ජාතික පාරිභෝගික මිල දර්ශකයේ (ජා.පා.මි.ද., 2021=100) වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන මතුපිට උද්ධමනය ද 2023 වසරේ සැප්තැම්බර් මාසයේ දී සියයට 0.8 ක් දක්වා අඩුවිය. කෙසේ වෙතත්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සුදුසු ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග අනුගමනය කිරීම හේතුවෙන් කො.පා.මි.ද. (2021=100) වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන මතුපිට උද්ධමනය 2023 වසරේ ඔක්තෝබර් මාසයේ දී සියයට 1.5 ක් දක්වා සුළු වශයෙන් වැඩිවිය.

උද්ධමනය පහළයාමේ ක්‍රියාවලියට අනුගත වෙමින් කො.පා.මි.ද. යේ වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන ආර්ථිකයේ යටිදැරි උද්ධමනය නිරූපණය කරනු ලබන මූලික උද්ධමනය, 2023 වසරේ ඔක්තෝබර් මාසයේ දී සියයට 1.2 ක් දක්වා තවදුරටත් අඩුවූ අතර, ජා.පා.මි.ද. යේ වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන මතුපිට උද්ධමනය, 2023 සැප්තැම්බර් මාසයේ දී සියයට 1.7 ක් දක්වා අඩුවිය.

**වගුව 2.5 : පාරිභෝගික මිල දර්ශකය**

| මාසය | 2022 (පදනම් වර්ෂය 2013=100) | | | | 2023 (පදනම් වර්ෂය 2021=100) | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | මතුපිට උද්ධමනය (වාර්ෂික ලක්ෂ්‍යමය) | | මූලික උද්ධමනය (වාර්ෂික ලක්ෂ්‍යමය) | | මතුපිට උද්ධමනය (වාර්ෂික ලක්ෂ්‍යමය) | | මූලික උද්ධමනය (වාර්ෂික ලක්ෂ්‍යමය) | |
| | කො.පා.මි.ද | ජා.පා.මි.ද | කො.පා.මි.ද | ජා.පා.මි.ද | කො.පා.මි.ද | ජා.පා.මි.ද | කො.පා.මි.ද | ජා.පා.මි.ද |
| ජනවාරි | 14.2 | 16.8 | 9.9 | 12.9 | 54.2* | 53.2 | 45.6* | 52.0 |
| පෙබරවාරි | 15.1 | 17.5 | 10.9 | 14.1 | 50.6 | 53.6 | 43.6 | 50.1 |
| මාර්තු | 18.7 | 21.5 | 13.0 | 17.3 | 50.3 | 49.2 | 39.1 | 44.2 |
| අප්‍රේල් | 29.8 | 33.8 | 22.0 | 27.9 | 35.3 | 33.6 | 27.8 | 31.8 |
| මැයි | 39.1 | 45.3 | 28.4 | 37.7 | 25.2 | 22.1 | 20.3 | 21.6 |
| ජූනි | 54.6 | 58.9 | 39.9 | 49.3 | 12.0 | 10.8 | 9.8 | 11.3 |
| ජූලි | 60.8 | 66.7 | 44.3 | 57.3 | 6.3 | 4.6 | 5.9 | 6.3 |
| අගෝස්තු | 64.3 | 70.2 | 46.6 | 60.5 | 4.0 | 2.1 | 4.6 | 4.1 |
| සැප්තැම්බර් | 69.8 | 73.7 | 50.2 | 64.1 | 1.3 | 0.8 | 1.9 | 1.7 |
| ඔක්තෝබර් | 66.0 | 70.6 | 49.7 | 62.4 | 1.5 | | 1.2 | |
| නොවැම්බර් | 61.0 | 65.0 | 49.4 | 60.1 | | | | |
| දෙසැම්බර් | 57.2 | 59.2 | 47.7 | 57.5 | | | | |

*මූලාශ්‍රය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව*

** පදනම් වර්ෂය (2013=100)*

**2.4 කොටස් වෙළෙඳපොළ**

වෙළෙඳපොළ දර්ශකවල උච්ඡාවචනයන් මගින් පිළිඹිබු කරන කොටස් වෙළෙඳපොළ කාර්ය සාධනය, 2023 වසරේ මැයි මස දක්වා මිශ්‍ර ප්‍රවණතාවක් පෙන්නුම් කරන ලදි. සියලු කොටස් මිල දර්ශකය වසර ආරම්භයේ පැවති ඒකක 8,510 සිට 2023 වසරේ ජූනි මාසය අවසන් වන විට ඒකක 9,443 ක් දක්වා සියයට 10.3 ක වැඩි වීමක් පෙන්නුම් කරන ලදි. මේ අතර, S&P SL20 දර්ශකය අදාළ කාලපරිච්ඡේදය තුළ දී ඒකක 2,641 සිට ඒකක 2,714 දක්වා සාමාන්‍ය වර්ධනයක් පෙන්නුම් කරන ලදී. 2023 වසරේ පළමු මාස නවය තුළ සියලු කොටස් මිල දර්ශකය එහි ඉහළම අගය වන 11,724 ක් දක්වා අගෝස්තු 08 වන දින ළඟා වූ අතර, 8,263 ක අවම අගයක් ජනවාරි 13 වන දින වාර්තා කළ අතර S&P SL20 දර්ශකය අගෝස්තු 08 වන දින 3,470 ක උපරිමයට ළඟා වූ අතර මැයි 30 වන දින 2,421 ක් වන අවම අගය වාර්තා කරන ලදී.

එසේ වුවද, සියලු කොටස් මිල දර්ශකය හා S&P SL20 දර්ශකයන්හිහි ඇති වූ ධනාත්මක ප්‍රවණතාවයන් හේතුවෙන් 2023 වසරේ ජූනි මස මුල සිට වෙළෙඳපොළ ප්‍රකෘතිමත් වීම පැහැදිලිව නිරීක්ෂණය

විය. සියලු කොටස් මිල දර්ශකය 2023 වසරේ ජූලි මස ආරම්භයේ දී ඒකක 10,077 සිට තුන්වන කාර්තුව අවසානයේ ඒකක 11,347 දක්වා වැඩි වූ අතර S&P SL20 දර්ශකය 2023 වසරේ ජූලි මස ආරම්භයේ දී ඒකක 2,973 සිට තුන්වන කාර්තුව අවසානයේ ඒකක 3,198 දක්වා ඉහළ යාමක් වාර්තා කරන ලදි.

වෙළෙඳපොළ ප්‍රාග්ධනීකරණය 2022 වසරේ සැප්තැම්බර් මස අවසානයේ පැවති රු. බිලියන 4,341 ට සාපේක්ෂව 2023 වසරේ සැප්තැම්බර් මස අවසානය වන විට රු. බිලියන 4,537 දක්වා සුළු වැඩිවීමක් පෙන්නුම් කරන ලදි. මෙය සියයට 4.52 ක ආන්තික වැඩිවීමකි. කොටස් වෙළෙඳපොළෙහි විදේශ ආයෝජන 2022 වසරේ පළමු මාස නවය තුළ රු. බිලියන 48.3 සිට 2023 වසරේ සමාන කාල පරිච්ඡේදය තුළ රු. බිලියන 32 ක් දක්වා සැලකිය යුතු ලෙස සියයට 33.8 කින් පහත වැටුණි. එසේම, කොටස් වෙළෙඳපොළ විදේශීය විකුණුම්, 2022 වසරේ පළමු මාස නවය තුළ පැවති රු. බිලියන 33 ක සිට 2023 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 28.3 ක් දක්වා කැපී පෙනෙන ලෙස මන්දගාමී විය.

**වගුව 2.6 : ප්‍රාග්ධන වෙළෙඳපොළ වෙනස්වීම්**

| දර්ශකය | 2017 | 2018 | 2019 | 2020 | 2021 | 2022 | සැප්තැම්බර් අවසානයට 2022 | සැප්තැම්බර් අවසානයට 2023(අ) |
|---|---|---|---|---|---|---|---|---|
| සමස්ත කොටස් මිල දර්ශකය (1985 = 100) | 6,369 | 6,052 | 6,129 | 6,774 | 12,226 | 8,490 | 9,931 | 11,336 |
| එස් ඇන්ඩ් පී එස් එල් 20 දර්ශකය | 3,672 | 3,135 | 2,937 | 2,638 | 4,233 | 2,636 | 3,165 | 3,198 |
| වෙළඳපොළ ප්‍රාග්ධනීකරණය (රු. බිලි.) | 2,899 | 2,840 | 2,851 | 2,961 | 5,489 | 3,847 | 4,341 | 4,537 |
| ලැයිස්තුගත සමාගම් සංඛ්‍යාව | 296 | 297 | 289 | 283 | 296 | 290 | 294 | 291 |
| වාර්ෂික පිරිවැටුම (රු. බිලි.) | 221 | 200 | 171 | 397 | 1,173 | 687 | 567 | 345 |
| විදේශ විකුණුම් (රු. මිලි.) | 94,627 | 100,316 | 68,272 | 104,165 | 86,689 | 36,863 | 33,034 | 28,354 |
| විදේශ ගැනුම් (රු. මිලි.) | 112,285 | 77,067 | 56,537 | 52,889 | 39,410 | 67,488 | 48,306 | 32,008 |
| ශුද්ධ ගැනුම් (රු. මිලි.) | 17,658 | -23,249 | -11,735 | -51,276 | -47,279 | 30,625 | 15,272 | 3,654 |

*මූලාශ්‍ර : කොළඹ කොටස් වෙළඳපොළ හා ශ්‍රී ලංකා මහ බැංකුව*

*(අ) තාවකාලික*

## 2.5 විදේශ අංශයේ වර්ධනයන්

රුසියානු - යුක්රේන ගැටුමත් සමඟ භූ දේශපාලනික අස්ථාවර තත්වයන් සහ රට තුළ පවතින අස්ථාවර ආර්ථික තත්වය මධ්‍යයේ වුවද, වෙළෙඳ හිඟයේ සැලකිය යුතු හැකිලීම, විදේශ ශ්‍රමික ප්‍රේෂණ ලැබීම් ඉහළ යාම සහ සංචාරක ව්‍යාපාරයෙන් ඉපැයීම් ඉහළ යාම හේතුවෙන් ශ්‍රී ලංකාවේ විදේශ අංශය 2023 වසරේ පළමු මාස නවය තුළ ස්ථාවර වීමේ ධනාත්මක ලකුණු පෙන්නුම් කළේය. 2023 වසරේ පළමු මාස නවය තුළ ආනයන වියදම ඇ.ඩො. මිලියන 12,323.4 ක් දක්වා සියයට 12.5 කින් වාර්ෂික පදනම මත අඩු වූ අතර, අපනයන ආදායම ඇ.ඩො. මිලියන 8,981.8 ක් දක්වා සියයට 10.1 කින් අඩු විය. කෙසේ වෙතත්, 2023 අගෝස්තු මාසය වන විට අඛණ්ඩව සිව්වන මාසයටත් මාසික අපනයන ආදායම ඇ.ඩො. බිලියන 1.0 ඉක්මවා පැවති අතර, එය සැප්තැම්බර් මාසයේ දී ඇ.ඩො. මිලියන 972 ක් දක්වා සුළු වශයෙන් අඩු විය. ඒ අනුව, වෙළෙඳ හිඟය 2022 වසරේ පළමු මාස නවය තුළ වූ ඇ.ඩො. මිලියන 4,093.3 ට සාපේක්ෂව 2023 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ඇ.ඩො. මිලියන 3,341.5 ක් දක්වා සංකෝචනය විය. ප්‍රධාන වශයෙන් කාර්මික අංශයේ අපනයන ඉපැයීම් අඩු වීම හේතුවෙන් අපනයන ඉපැයීම් 2022 වසරේ පළමු මාස නවය තුළ වූ ඇ.ඩො. මිලියන 9,992.0 ට සාපේක්ෂව 2023 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ඇ.ඩො. මිලියන 8,981.8 ක් දක්වා සියයට 10.1 කින් අඩු විය. කෘෂිකාර්මික අපනයන ඉපැයීම් ඇ.ඩො. මිලියන 1,945.4 ක් දක්වා සියයට 0.3 කින් සුළු වශයෙන් ඉහළ ගිය අතර, කාර්මික අපනයන සහ ඛනිජ අපනයන ඉපැයීම් පිළිවෙලින් ඇ.ඩො. මිලියන 6,997.9 ක් දක්වා සියයට 12.7 කින් සහ ඇ.ඩො. මිලියන 18.0 ක් දක්වා සියයට 25.6 කින් පහත වැටුණි. කාර්මික අපනයන ඉපැයීම් සමස්ත අපනයන ආදායමෙන් සියයට 77.9 ක දායකත්වයක් ලබා දුන් අතර, කෘෂිකාර්මික අපනයන ඉපැයීම් සමස්ත අපනයන ඉපැයීම්වලින් සියයට 21.7 ක දායකත්වයක් වාර්තා කළේය. මේ අතර, සලකා බලනු ලබන කාලසීමාව තුළ මෝටර් රථ ඇතුළු හදිසි නොවන ආනයන සඳහා පැන වූ ආනයන සීමා කිරීම් අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම හේතුවෙන් මුළු ආනයන වියදම 2022 වසරේ පළමු මාස නවය තුළ වාර්තා වූ ඇ.ඩො. මිලියන 14,085.2 ට සාපේක්ෂව 2023 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ඇ.ඩො. මිලියන 12,323.4 ක් දක්වා සියයට 12.5 කින් අඩු විය. පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම ඇ.ඩො. මිලියන 2,242.5 ක් දක්වා සියයට 4.5 කින් වර්ධනය වූ අතර,

අතරමැදි භාණ්ඩ සහ ආයෝජන භාණ්ඩ පිළිවෙලින් ඇ.ඩො. මිලියන 8,105.3 ක් දක්වා සියයට 14.7 කින් සහ ඇ.ඩො. මිලියන 1,963.0 ක් දක්වා සියයට 19.3 කින් අඩු වී ඇත.

සමස්ත ගෙවුම් ශේෂය 2022 වසරේ පළමු මාස නවය තුළ වූ ඇ.ඩො. මිලියන 2,927 ක හිඟයට සාපේක්ෂව 2023 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ඇ.ඩො. මිලියන 1,863 ක අතිරික්තයක් වාර්තා කළේය. 2023 වසරේ පළමු මාස නවය තුළ රාජ්‍ය සුරැකුම්පත් වෙළෙඳපොළට දළ ගලාඒම් ඇ.ඩො. මිලියන 709 ක් ලෙස වාර්තා විය. චීන මහජන බැංකුවේ ඇ.ඩො. බිලියන 1.3 ක විදේශ විනිමය හුවමාරු පහසුකම ද ඇතුළුව දළ නිල සංචිත 2023 වසරේ සැප්තැම්බර් මස අවසානය වන විට ඇ.ඩො. බිලියන 3.5 ක් විය. තවද, ලෝක බැංකුවෙන් ඇ. ඩො. මිලියන 250 ක් පමණ සහ ආසියානු සංවර්ධන බැංකුවෙන් ඇ. ඩො. මිලියන 350 ක් ලැබීම දළ නිල සංචිත මට්ටම ඉහළ යාමට දායක විය. මේ අතර, 2023 වසරේ ඔක්තෝම්බර් මස 31 වන විට ශ්‍රී ලංකා රුපියල ඇමෙරිකානු ඩොලරයට සාපේක්ෂව සියයට 10.9 කින් අධිප්‍රමාණය විය.

**රූපසටහන 2.10 : වෙළඳ ශේෂය සහ විනිමය අනුපාත වෙනස් වීම**




*මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකුව*




*මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකුව*

**අපනයන**

ගෝලීය ඉල්ලුම අඩුවීමත් සමඟ ප්‍රධාන වශයෙන් කාර්මික අපනයනවලින් ඉපැයීම් සැලකිය යුතු ලෙස පහත වැටීම හේතුවෙන් අපනයන ඉපැයීම් 2022 වසරේ පළමු මාස නවය තුළ වූ ඇ. ඩො. මිලියන 9,992.0 ට සාපේක්ෂව 2023 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ඇ. ඩො. මිලියන 8,981.8 ක් දක්වා සියයට 10.1 කින් පහත වැටුණි. ඒ අනුව, කාර්මික අපනයන ආදායම 2022 වසරේ පළමු මාස නවය තුළ වූ ඇ. ඩො. මිලියන 8,011.5 සිට 2023 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ඇ. ඩො. මිලියන 6,997.9 ක් දක්වා සියයට 12.7 කින් පහළ ගියේය. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ විශේෂයෙන්ම ඇමරිකා එක්සත් ජනපදය, යුරෝපා සංගමය සහ එක්සත් රාජධානිය ඇතුළු ප්‍රධාන අපනයන වෙළෙඳපොළවල් වලින් වාර්තා වූ ගෝලීය ඉල්ලුම පහත වැටීමත් සමඟ රෙදිපිළි හා ඇඟලුම්වලින් වාර්තා වූ ආදායම 2022 වසරේ පළමු මාස නවය තුළ වූ ඇ. ඩො. මිලියන 4,577.2 සිට 2023 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ඇ. ඩො. මිලියන 3,688.7 ක් දක්වා සියයට 19.4 කින් පහත වැටීමයි. මීට අමතරව, රබර් නිෂ්පාදන වලින් ඉපැයීම් ඇ.ඩො. මිලියන 668.6 ක් දක්වා සියයට 11.5 කින් ද, ඛනිජතෙල් නිෂ්පාදන ඇ.ඩො. මිලියන 371.4 ක් දක්වා සියයට 15.6 කින්ද, රසායනික නිෂ්පාදන ඇ.ඩො. මිලියන 142.6 ක් දක්වා සියයට 16.8 කින්ද පහත වැටීම 2023 වසරේ පළමු මාස නවය තුල අපනයන ඉපැයීම් මන්දගාමී වීමට හේතු විය. මේ අතර, යන්ත්‍ර සූත්‍ර හා යාන්ත්‍රික උපකරණවලින් ඉපැයීම් ඇ.ඩො. මිලියන 465.5 ක් දක්වා සියයට 8.8 කින් සහ මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ වලින් ඉපැයීම් ඇ.ඩො. මිලියන 394.3 ක් දක්වා සියයට 17.1 කින් ඉහළ ගියේය.

පොල්, මුහුදු ආහාර සහ රබර් වලින් අඩු ඉපැයීම් වාර්තා වුව ද, තේ, කුළුබඩු, සුළු කෘෂිකාර්මික නිෂ්පාදන, එළවළු සහ සකස් නොකළ දුම්කොළ නිෂ්පාදන වලින් ඉහළ ඉපැයීම් වාර්තා වීමත් සමඟ කෘෂිකාර්මික අපනයන ඉපැයීම් 2022 වසරේ පළමු මාස නවය තුළ වූ ඇ.ඩො. මිලියන 1,939.8 සිට 2023 වසරේ දී ඇ.ඩො. මිලියන 1,945.4 දක්වා සියයට 0.3 කින් සුළු වශයෙන් ඉහළ ගියේය. තේ සඳහා අඩු සාමාන්‍ය මිලක් තිබියදීත් තේ අපනයන පරිමාව වැඩි වීමත් සමඟ තේ අපනයනයෙන් වූ ඉපැයීම් ඇ.ඩො. මිලියන 937.1 සිට ඇ.ඩො. මිලියන 990.3 ක් දක්වා සියයට 5.7 කින් වැඩි විය. මීට අමතරව, කුළුබඩු, සුළු කෘෂිකාර්මික නිෂ්පාදන, එළවළු සහ සකස් නොකළ දුම්කොළ වලින් ඉපැයීම් පිළිවෙළින් ඇ.ඩො. මිලියන 298.5 ක් දක්වා සියයට 8.9 කින් ද, ඇ.ඩො. මිලියන 143.5 ක් දක්වා සියයට 3.3 කින් ද, ඇ.ඩො. මිලියන 20.5 ක් දක්වා සියයට 3.2 කින් ද, ඇ.ඩො. මිලියන 19.8 ක් දක්වා සියයට 11.4 කින් ද ඉහළ ගොස් ඇත. 2023 වසරේ පළමු මාස නවය තුළ ඛනිජ අපනයන ඉපැයීම් ඇ.ඩො. මිලියන 24.1 සිට ඇ.ඩො. මිලියන 18.0 ක් දක්වා සියයට 25.6 කින් පහත වැටීමක් වාර්තා වූ අතර අනෙකුත් වර්ගීකරණය නොකළ අපනයන ඉපැයීම් ඇ.ඩො. මිලියන 20.5 ක් දක්වා සියයට 23.7 කින් වැඩි විය.

**රූපසටහන 2.11 : අපනයන සංයුතිය**




*මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකුව*

## ආනයන

අතරමැදි සහ ආයෝජන භාණ්ඩ වලින් වාර්තා වූ ආනයන වියදම් අඩු වීම හේතුවෙන් ආනයන වියදම 2022 වසරේ පළමු මාස නවය තුළ වාර්තා වූ ඇ.ඩො. මිලියන 14,085.2 ට සාපේක්ෂව ඇ.ඩො. මිලියන 12,323.4 ක් දක්වා සියයට 12.5 කින් අඩු විය. කෙසේ වෙතත්, ආහාර පාන වර්ග සහ ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ යන කාණ්ඩයන් දෙකෙහිම ආනයන වියදම් වැඩි වීම හේතුවෙන් පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම ඇ.ඩො. මිලියන 2,146.7 සිට ඇ.ඩො. මිලියන 2,242.5 දක්වා සියයට 4.5 කින් වැඩි විය. සීනි හා රස කැවිලි, එළවළු සහ කිරි ආශ්‍රිත නිෂ්පාදනවලින් වාර්තා වූ ඉහළ ආනයන වියදමත් සමඟ ආහාර පාන ආනයන වියදම 2022 වසරේ පළමු මාස නවය තුළ වාර්තා වූ ඇ.ඩො. මිලියන 1,227.7 සිට ඇ.ඩො. මිලියන 1,266.6 ක් දක්වා සියයට

**රූපසටහන 2.12 : ආනයන සංයුතිය**




*මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකුව*

**වගුව 2.7 : විදේශීය වෙළෙඳාම**

ඇ.ඩො. මිලියන

| අයිතමය | 2020 | 2021 | 2022[ආ] | ජන. - සැප්. 2022[ආ] | ජන. - සැප්. 2023[අ] |
|---|---|---|---|---|---|
| **අපනයන** | **10,047** | **12,499** | **13,107** | **9,992** | **8,982** |
| **කෘෂිකාර්මික අපනයන** | **2,336** | **2,730** | **2,568** | **1,940** | **1,945** |
| තේ | 1,241 | 1,324 | 1,259 | 937 | 990 |
| අනෙකුත් කෘෂිකාර්මික නිෂ්පාදන | 1,095 | 1,405 | 1,309 | 1,003 | 955 |
| **කාර්මික අපනයන** | **7,672** | **9,702** | **10,465** | **8,012** | **6,998** |
| රෙදිපිළි හා ඇඟලුම් | 4,423 | 5,435 | 5,952 | 4,577 | 3,689 |
| ආහාර පාන සහ දුම්කොළ | 464 | 587 | 520 | 406 | 398 |
| රබර් නිෂ්පාදන | 786 | 1,050 | 977 | 755 | 669 |
| යන්ත්‍ර සූත්‍ර හා යාන්ත්‍රික උපකරණ | 338 | 501 | 581 | 428 | 466 |
| ඛනිජතෙල් නිෂ්පාදන | 374 | 506 | 568 | 440 | 371 |
| අනෙකුත් කාර්මික අපනයන | 1,288 | 1,625 | 1,868 | 1,406 | 1,406 |
| **ඛනිජමය අපනයන** | **25** | **45** | **50** | **24** | **18** |
| **වර්ගීකරණය නොකළ අපනයන** | **14** | **23** | **23** | **17** | **21** |
| **ආනයන** | **16,055** | **20,637** | **18,291** | **14,085** | **12,323** |
| **පාරිභෝගික භාණ්ඩ** | **3,402** | **3,849** | **2,813** | **2,147** | **2,243** |
| ආහාර සහ පාන | 1,554 | 1,667 | 1,608 | 1,228 | 1,267 |
| අනෙකුත් පාරිභෝගික භාණ්ඩ | 1,847 | 2,182 | 1,205 | 919 | 976 |
| **අතරමැදි භාණ්ඩ** | **9,077** | **12,309** | **12,439** | **9,497** | **8,105** |
| ඛනිජතෙල් | 2,543 | 3,743 | 4,897 | 3,694 | 3,476 |
| රෙදිපිළි හා ඇඟලුම් | 2,335 | 3,067 | 3,065 | 2,407 | 1,761 |
| තිරිඟු සහ බඩ ඉරිඟු | 384 | 418 | 303 | 189 | 264 |
| අනෙකුත් | 3,814 | 5,081 | 4,174 | 3,207 | 2,604 |
| **ආයෝජන භාණ්ඩ** | **3,563** | **4,463** | **3,031** | **2,433** | **1,963** |
| යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ | 2,176 | 2,810 | 1,969 | 1,571 | 1,356 |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 1,036 | 1,249 | 926 | 747 | 547 |
| ප්‍රවාහන උපකරණ | 348 | 399 | 132 | 113 | 58 |
| අනෙකුත් | 3 | 6 | 3 | 3 | 2 |
| **වර්ගීකරණය නොකළ ආනයනය** | **14** | **17** | **9** | **8** | **13** |
| **වෙළඳ හිඟය** | **6,008** | **8,136** | **5,185** | **4,093** | **3,342** |

*මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකුව*

*(අ) තාවකාලික*

*(ආ) සංශෝධිත*

3.2 කින් වැඩි විය. රෙදි පිළි සහ උපාංග, ගෘහ සහ දැව භාණ්ඩ සහ ගෘහ උපකරණයන්හි ආනයන වියදම් අඩු වුව ද, බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදන සහ විදුලි සංදේශ උපකරණයන්හි ආනයන වියදම් ඉහළ යාම හේතුවෙන් ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම ඇ.ඩො. මිලියන 919.0 සිට ඇ.ඩො. මිලියන 976.0 ක් දක්වා සියයට 6.2 කින් වැඩි විය. ප්‍රධාන වශයෙන් ඉන්ධන සහ රෙදි පිළි සහ රෙදි පිළි උපාංග ආනයන වියදම් අඩු වීම හේතුවෙන් අතරමැදි භාණ්ඩ ආනයන වියදම ඇ.ඩො. මිලියන 9,497.4 සිට ඇ.ඩො. මිලියන 8,105.3 ක් දක්වා සියයට 14.7 කින් අඩු විය. ඉන්ධන ආනයනය සඳහා වන වියදම ඇ.ඩො. මිලියන 3,694.3 සිට ඇ.ඩො. මිලියන 3,476.3 ක් දක්වා සියයට 5.9 කින් අඩු වී ඇති අතර, රෙදි පිළි සහ රෙදි පිළි උපාංග ආනයන වියදම ඇ.ඩො. මිලියන 2,407.2 සිට ඇ.ඩො. මිලියන 1,760.6 ක් දක්වා සියයට 26.9 කින් පහත වැටී ඇත.

යන්ත්‍ර සූත්‍ර හා උපකරණ, ගොඩනැගිලි ද්‍රව්‍ය, ප්‍රවාහන උපකරණ සහ වෙනත් ආයෝජන භාණ්ඩ ඇතුළු සියළුම උප කාණ්ඩයන්හි ආනයන වියදම් අඩුවීම හේතුවෙන් ආයෝජන භාණ්ඩ ආනයන වියදම 2022 වසරේ පළමු මාස නවය තුළ වූ ඇ.ඩො. මිලියන 2,433.0 සිට ඇ.ඩො. මිලියන 1,963.0 දක්වා සියයට 19.3 කින් අඩු විය. යන්ත්‍ර සූත්‍ර හා උපකරණ ආනයන වියදම ඇ.ඩො. මිලියන 1,355.7 ක් දක්වා සියයට 13.7 කින්, ගොඩනැගිලි ද්‍රව්‍ය ඇ.ඩො. මිලියන 547.4 ක් දක්වා සියයට 26.7 කින් සහ ප්‍රවාහන උපකරණ ඇ.ඩො. මිලියන 57.6 ක් දක්වා සියයට 48.8 කින් පහත වැටී ඇත.

**සංචාරක ඉපැයීම් සහ සේවක ප්‍රේෂණ**

දේශීය හා ගෝලීය සංචාරක ක්ෂේත්‍රයේ වර්ධනයත් සමඟ සංචාරක පැමිණීම් 2022 වසරේ පළමු මාස නවය තුළ වාර්තා වූ පුද්ගලයින් 526,232 ට සාපේක්ෂව 2023 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී පුද්ගලයින් 1,016,256 ක් දක්වා සැළකිය යුතු ලෙස ඉහළ ගොස් ඇත. සලකා බලනු ලබන කාලසීමාව තුළ ප්‍රධාන වශයෙන් ඉන්දියාව, එක්සත් රාජධානිය, චීනය, ජර්මනිය, රුසියාව සහ ප්‍රංශය යන රටවලින් සංචාරක පැමිණීම් වාර්තා විය. සංචාරක ඉපැයීම් 2022 වසරේ පළමු මාස නවය තුළ වූ ඇ.ඩො. මිලියන 873.1 සිට 2023 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ඇ.ඩො. මිලියන 1,456.7 ක් දක්වා වැඩි විය. මේ අතර, අවිධිමත් විදේශ විනිමය වෙළෙඳපොළේ ක්‍රියාකාරකම් සීමා කිරීමට රජය ගත් ක්‍රියාමාර්ග සමඟ සේවක ප්‍රේෂණ 2022 වසරේ පළමු මාස නවය තුළ වූ ඇ.ඩො. මිලියන 2,574.1 ට සාපේක්ෂව 2023 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ඇ.ඩො. මිලියන 4,345.1 ක් දක්වා සියයට 68.8 කින් සැළකිය යුතු ලෙස වැඩි විය.

**2.6 ලෝක ආර්ථික සංදර්භය**

කොවිඩ්-19 වසංගත තත්ත්වයෙන් සහ රුසියා-යුක්රේන ගැටුම් හේතුවෙන් අස්ථාවර තත්ත්වයට පත්වූ ලෝක ආර්ථිකය නැවත යථා තත්ත්වයට පත්වීම, ආර්ථික ක්‍රියාකාරිත්වයන්හි පවතින සීමාකාරි තත්ත්වයන් හා අවිනිශ්චිතතාවයන් හේතුවෙන් තවදුරටත් මන්දගාමී වී ඇත. පොදු වශයෙන් ලෝක ආර්ථිකයෙහි ඉහළ උද්ධමනය හේතුවෙන් කුටුම්භයන්ගේ ක්‍රය ශක්තිය හීන වී ඇත. උද්ධමනය පාලනය කිරීම සඳහා විවිධ රටවල මහ බැංකු විසින් අනුගමනය කරන දැඩි මුදල් ප්‍රතිපත්ති හේතුවෙන් මූල්‍ය පිරිවැය ඉහළ ගොස් ඇති අතර, එමගින් රාජ්‍ය හා පෞද්ගලික අංශයන් සඳහා ලබාදෙනු ලබන ණය සීමා වී ඇත.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් 2023 වසරේ ඔක්තෝබර් මස ප්‍රකාශයට පත් කරන ලද ලෝක ආර්ථික ඉදිරි දැක්ම (World Economic Outlook) අනුව ලෝක ආර්ථික වර්ධන වේගය 2022 වසරේ දී වාර්තා කළ වාර්ෂික සමානාය්‍ය වන සියයට 3.5 ක අගයේ සිට 2023 වසරේ සියයට 3.0 ක් දක්වා සහ 2024 වසර වන විට සියයට 2.9 ක් දක්වා පහත වැටෙනු ඇතැයි පුරෝකථනය කර ඇත. කෙසේ වුවද, මෙම තත්ත්වයන් මධ්‍යයයේ, සේවා අංශය 2023 වසරේ පළමු කාර්තුවේ ලෝක ආර්ථිකයෙහි ස්ථාවරත්වය සඳහා ඉහළ දායකත්වයක් දක්වන ලද අතර, පරිභෝජනය පහළ යාම, ලෝක ආර්ථික තත්ත්වයන්හි අවිනිශ්චිතතාවයන්, දුර්වල ආර්ථික ඵලදායීතා වර්ධන වේගය සහ මූල්‍ය වෙළෙඳපොළෙහි අභියෝගාත්මක තත්ත්වයන් මත නිෂ්පාදන ධාරිතාවයන් අවප්‍රමාණයවීම හේතු කොට ගෙන නිෂ්පාදන අංශය ඇතුළු සේවා නොවන අංශය අඩු වර්ධනීය තත්ත්වයක් පෙන්නුම් කරන ලදී.

**කලාපීය පුරෝකථනයන්**

2023 වසරේ ඔක්තෝබර් මස ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ වාර්තාවට අනුව සංවර්ධිත ආර්ථිකයන් හි පුරෝකථන කර ඇති වර්ධනයේ පසුබෑම 2023 වසරේදී ද සැලකිය යුතු ලෙස පවතී. 2022 වසරේ මෙම ආර්ථිකයන්හි වර්ධන වේගය සියයට 2.6 සිට 2023 වසරේ දී සියයට 1.5 ක් දක්වා පහත වැටෙනු ඇත. සංවර්ධිත ආර්ථිකයන්ගෙන් ආසන්න වශයෙන් සියයට 90 ක් පමණ සංවර්ධිත ආර්ථිකයේ 2023 වසරේ දී පහල ආර්ථික වර්ධනයක් හේතුවෙන් දුෂ්කරතාවයට පත්වනු ඇතැයි අපේක්ෂා කරන අතර, 2024 වසරේ දී එම ආර්ථිකයන්හි වර්ධන වේගය සියයට 1.4 ක්ව පවතිනු ඇත. ඇමරිකා එක්සත් ජනපදයේ ආර්ථිකය 2022 වසරේ මෙන්ම 2023 වසරේ දී ද සීයයට 2.1 ක වර්ධන වේගයක් අත්කර ගනු ඇතැයි අපේක්ෂා කරන අතර, 2024 වසරේ එම අගය සියයට 1.5

දක්වා පහත වැටෙනු ඇත, 'ෆිච්' (Fitch) ආයතනයේ පුරෝකථනයන්ට අනුව, ප්‍රශස්ථ පරිභෝජන මට්ටමක් සහ ඉහළ රැකියා වර්ධනයක් මධ්‍යයේ වුවද, එරට මූල්‍ය ප්‍රතිපත්තිය දැඩි කිරීම හේතුවෙන් ජනතාවගේ මූර්ත ආදායම පහත වැටීම නිසා ඇමෙරිකා එක්සත් ජනපද ආර්ථිකය 2023 වසරේ අගභාගයේ සිට සුළු අවපාතයකට ලක් වනු ඇත. 2022 වසරේ සියයට 3.3 ක් වූ යුරෝපීය කලාපයේ ආර්ථික වර්ධනය යුරෝපීය මධ්‍යම බැංකුවේ දැඩි මුදල් ප්‍රතිපත්ති හේතු කොට ගෙන 2023 වසරේ සියයට 0.7 ක් දක්වා පහළ යනු ඇතැයි පුරෝකථනය කර ඇති අතර, 2024 වසරේ සියයට 1.2 ක් දක්වා ඉහළ යනු ඇත. 2022 වසරේ සියයට 1.0 ක් වූ ජපානයේ ආර්ථික වර්ධනය, එක්රැස් වූ සමස්ත ඉල්ලුමෙහි ඉහල යාම සහ අනුග්‍රාහක ආර්ථික ප්‍රතිපත්ති හේතුවෙන් 2023 වසරේ ද සියයට 2.0 ක් දක්වා ඉහළ යනු ඇති අතර, 2024 වසර වන විට එය සියයට 1.0 ක් දක්වා පහළ යනු ඇත.

නැගී එන වෙළෙඳපොළ සහ සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන් හි වර්ධන වේගය 2022 වසරේ වාර්තා වූ සියයට 4.1 ක අගයේ සිට 2023 සහ 2024 යන දෙවසරේ සියයට 4.0 ක අගයක් දක්වා සුළු වශයෙන් පහළ යනු ඇත. එසේ වුවද, මෙම රාජ්‍යයන් අතුරින් සියයට 61 ක බහුතරයක් ස්ථාවර මධ්‍යයන අගයට වඩා ඉහළ වර්ධන වේගයක් අත් කර ගනු ඇති අතර, ලතින් ඇමරිකා සහ කැරිබියානු, මැද පෙරදිග හා මධ්‍යම ආසියානු සහ උප සහරා අප්‍රිකානු රාජ්‍යයන්හි වර්ධන වේගය පහළ වැටෙනු ඇත. නැගී එන සහ සංවර්ධනය වන ආසියානු රාජ්‍යයන්හි ආර්ථික වර්ධනය 2022 වසරේ වාර්තා කරන ලද සියයට 4.5 අගයට සාපේක්ෂව 2023 වසරේ සියයට 5.2 ක් දක්වා ඉහළ යනු ඇතැයි අපේක්ෂා කරන අතර 2024 වසරේ දී එම අගය සියයට 4.8 තෙක් පහළ යනු ඇත.

චීනයේ ආර්ථික වර්ධන වේගය 2023 වසරේ සියයට 5.0 ක අගයක් දක්වා පහළ යනු ඇතැයි අපේක්ෂා කරන අතර, 2024 වසර වන විට එය සියයට 4.2 ක් දක්වා තවදුරටත් පහළ බසිනු ඇතැයි අපේක්ෂා කෙරේ. ශක්තිමත් දේශීය ආයෝජනයන් හේතුවෙන් ඉන්දියාවේ ආර්ථික වර්ධන වේගය 2023 හා 2024 දෙවර්ෂයන් හි දීම සියයට 6.3 ක අගයක් වාර්තා කරනු ඇත.

රුසියාව ඇතුළු නැගී එන සහ සංවර්ධනය වන යුරෝපීය රාජ්‍යයන්හි ආර්ථික වර්ධන වේගය 2023 වසරේ සියයට 2.4 ක අගයක් වාර්තා කරනු ඇතැයි අපේක්ෂිත අතර, එය 2024 වසරේ සියයට 2.2 ක් දක්වා පහළ යනු ඇත. ඉහළ රාජ්‍ය මූල්‍ය දායකත්වය, ශක්තිමත් ආයෝජනයන් සහ ශ්‍රම වෙළෙඳපොළ තුළ රැකියා සුලභවීම මත ස්ථාවර පරිභෝජන මට්ටමක් පැවතීම යන කරුණු හේතු කර ගෙන, තීව්‍ර වන රුසියානු යුක්රේන අර්බුදය මධ්‍යයේ වුවද, රුසියානු ආර්ථිකය 2022 වසරේ දී වාර්තා කරන ලද සියයට 2.1 ක ඍණ වර්ධන වේගයට සාපේක්ෂව 2023 වසරේ දී සියයට 2.2 ක වර්ධන වේගයක් අත් කර ගනු ඇතැයි අපේක්ෂා කෙරේ.

**ගෝලීය වෙළඳාම සහ පාරිභෝගික භාණ්ඩ වෙළඳපොළ**

දේශීය සේවා අංශයන් කෙරෙහි යොමු වීම සහ සමස්ත ගෝලීය ඉල්ලුමෙහි අගය පහළ යාම හේතුවෙන්, 2022 වසරේ සියයට 5.1 ක් වූ ලෝක වෙළඳාමෙහි වර්ධන වේගය, 2023 වසරේ දී සියයට 0.9 ක අගයක් දක්වා පහළ යන බව අපේක්ෂා කරන අතර, 2024 වසරේ දී එය සියයට 3.5 ක අගයක් වාර්තා කරනු ඇත. තවද, ඇමරිකානු ඩොලරය අධිප්‍රමාණය වීම ඩොලර් මඟින් සිදු කෙරෙන ගණුදෙනු කෙරෙහි අහිතකර බලපෑමක් ඇති කිරීම මෙන්ම දිනෙන් දින ඉහළ යන වෙළඳ බාධක ද ගෝලීය වෙළඳාමේ වර්ධනය අඩාල වීමට හේතු වී ඇත. චීනයේ අනපේක්ෂිත ලෙස දුර්වලව ඇති බලශක්තිය සඳහා වන ඉල්ලුම මෙන්ම යුරෝපය තුල ඇති ගෑස් සංචිත ඉහළ යාම හේතුවෙන් 2023 වසර තුළ ඛණිජ තෙල් මිළ සියයට 16.5 කින් පහළ බසිනු ඇතැයි ද, එය තවදුරටත් පහළ යාමේ හැකියාවක් ඇතැයි ද, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් පළ කළ වාර්තාවෙහි දක්වා ඇත. බ්‍රෙන්ට්, ඩුබායි ෆතේ සහ බටහිර ටෙක්සාස් අතරමැදි මිළ දර්ශකයන්හි අනාගත මැදි අගය මත පදනම්ව ගණනය කරන ලද 2023 වසරේ බොරතෙල් බැරලයක අපේක්ෂිත මධ්‍යන්‍ය අගය ඇ.ඩො. 80.5 ක් වේ. 2026 වසර වන විට මෙම මිල ඇ.ඩො. 72.7 ක් දක්වා පහළ බසිනු ඇතැයි අපේක්ෂිතය.

සැපයුම් දාම සාමාන්‍යකරණය වීමට අමතරව, ඉහත සාධකයන්ද මතුපිට උද්ධමනයේ වේගවත් පහළ යාමට හේතු විය. එසේ වුවද, යටිදැරි උද්ධමනය තවදුරටත් ඉලක්කගත මට්ටමට ඉහළින් පැවතීම හේතුවෙන් ගෝලීය මහ බැංකු විසින් තවදුරටත් දැඩි මුදල් ප්‍රතිපත්ති මත කටයුතු කරනු ඇතැයි අපේක්ෂා කරන අතර, එමඟින් ණය පහසුකම් ප්‍රමාණාත්මකව වර්ධනය වීම සීමා වනු ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස, 2022 වසරේ දී වාර්ෂික පදනමින් සියයට 9.2 ක්ව පැවති ගෝලීය මතුපිට උද්ධමනය, මෙම වසරේ දී සියයට 5.9 ක් දක්වා පහළ යනු ඇතැයි ද, 2024 වසරේ දී එය සියයට 4.8 ක් දක්වා තවදුරටත් පහළ යනු ඇතැයි ද අපේක්ෂා කෙරේ. ආහාර හා බලශක්තිය ඇතුලත් නොවන යටිදැරි උද්ධමනය ද 2024 වසරේ සියයට 4.5 ක් දක්වා ක්‍රමයෙන් පහළ යනු ඇතැයි පුරෝකථනය කර ඇත.

**මැද පෙරදිග අර්බුධකාරී තත්ත්වය මගින් ලෝක ආර්ථිකය මත ඇතිවන බලපෑම**

බලශක්ති වෙළෙඳපොළෙහි තීරණාත්මක සැපයුම්කරුවෙකු මෙන්ම නාවික ප්‍රවාහන කේන්ද්‍රස්ථානයක්වන මැද පෙරදිග කලාපයේ සිදුවෙමින් පවතින ගැටුම් හේතුවෙන් ලෝක ආර්ථිකය මත විශාල බලපෑම් ඇති විය හැකිය. මෙම අර්බුදකාරී තත්ත්වය තවදුරටත් වර්ධනය වෙනු

ඇතැයි අනුමානය කෙරේ. බ්ලූම්බර්ග් ආර්ථික සඟරාව (Bloomberg Economics) විසින් ඇස්තමේන්තු කර ඇති පරිදි මැද පෙරදිග කලාපයේ බලවතුන් අතර යුධ ගැටුම් ඇති වුවහොත්, බොර තෙල් බැරලයක මිළ ඇ.ඩො. 150 ක් දක්වා ඉහළ යාමට හැකියාවක් පවතින අතර ලෝක ආර්ථික වර්ධන වේගය සියයට 1.7 කින් පහත වැටීම හේතුවෙන් ඇ.ඩො. ට්‍රිලියන 1 කට ආසන්න නිෂ්පාදන පහළ යාමකට තුඩු දෙන ලෝක ආර්ථික අර්බුදයක් ඇති වීමට අවකාශ පවතී. ගාසාතීරය තුළ පමණක් සීමා වූ ගැටුම්කාරී තත්ත්වයන් හේතුවෙන් පවා අවම වශයෙන් බොර තෙල් බැරලයක මිල ඇ.ඩො. 4 කින් ඉහළ යාමට අවකාශ පවතින අතර, එම පුරෝකථනයන්ට අනුව ලෝක ආර්ථික වර්ධන වේගයේ සියයට 0.1 ක පහළ යාමක් සිදු විය හැක. මෙම අර්බුදකාරී තත්ත්වය තවමත් වර්ධනය වෙමින් පවතින බැවින් නිශ්චිත පූරෝකථනයක් සිදුකිරීම අසීරු වන අතර, පවතින අවිනිශ්චිතතාවයන් ජාත්‍යන්තර වෙළදාම සහ ලෝක ආර්ථික වර්ධනය කෙරෙහි ඉහළ බලපෑමක් සිදු කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

**වගුව 2.8 : තෝරාගත් රටවල ප්‍රධාන ආර්ථික දර්ශක - 2023 (පුරෝකථනය)**

| රට | ද.දේ.නි.වර්ධනය (වාර්ෂික අනුපාතය) | උද්ධමනය (%) | සේවා වියුක්තිය (%) | මූල්‍ය හිඟය (ද.දේ.නි. % ලෙස) | දළ ණය (ද.දේ.නි. % ලෙස) |
|---|---|---|---|---|---|
| ආජන්ටිනාව | -2.5 | 121.7 | 7.4 | -4.0 | 89.5 |
| ඕස්ට්‍රේලියාව | 1.8 | 5.8 | 3.7 | -1.4 | 51.9 |
| බ්‍රසීලය | 3.1 | 4.7 | 8.3 | -7.1 | 88.1 |
| කැනඩාව | 1.3 | 3.6 | 5.5 | -0.7 | 106.4 |
| චිලී | -0.5 | 7.8 | 8.8 | -1.6 | 38.4 |
| චීනය | 5.0 | 0.7 | 5.3 | -7.1 | 83.0 |
| ප්‍රංශය | 1.0 | 5.6 | 7.4 | -4.9 | 110.0 |
| ජර්මනිය | -0.5 | 6.3 | 3.3 | -2.9 | 65.9 |
| ග්‍රීසිය | 2.5 | 4.1 | 10.8 | -1.6 | 168.0 |
| ඉන්දියාව | 6.3 | 5.5 | ලැ.නො. | -8.8 | 81.9 |
| ඉන්දුනීසියාව | 5.0 | 3.6 | 5.3 | -2.2 | 39.0 |
| ඉතාලිය | 0.7 | 6.0 | 7.9 | -5.0 | 143.7 |
| ජපානය | 2.0 | 3.2 | 2.5 | -5.6 | 255.2 |
| කොරියාව | 1.4 | 3.4 | 2.7 | -1.2 | 54.3 |
| මැලේසියාව | 4.0 | 2.9 | 3.6 | -4.7 | 66.9 |
| මෙක්සිකෝව | 3.2 | 5.5 | 2.9 | -3.9 | 52.7 |
| රුසියාව | 2.2 | 5.3 | 3.3 | -3.7 | 21.2 |
| සිංගප්පූරුව | 1.0 | 5.5 | 1.8 | 3.2 | 167.9 |
| දකුණු අප්‍රිකාව | 0.9 | 5.8 | 32.8 | -6.4 | 73.7 |
| ස්පාඤ්ඤය | 2.5 | 3.5 | 11.8 | -3.9 | 107.3 |
| තායිලන්තය | 2.7 | 1.5 | 1.2 | -2.9 | 61.4 |
| එක්සත් රාජධානිය | 0.5 | 7.7 | 4.2 | -4.5 | 104.1 |
| ඇමරිකා එක්සත් ජනපදය | 2.1 | 4.1 | 3.6 | -8.2 | 123.3 |
| වියට්නාමය | 4.7 | 3.4 | 2.1 | -1.3 | 34.0 |

*මූලාශ්‍ර : ලෝක ආර්ථික දර්ශකය, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, 2023 ඔක්තෝබර්, Fiscal Monitor, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, 2023 ඔක්තෝබර්, මුදල් අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා මහ බැංකුව*
*ලැ.නො. : ලැබී නොමැත*

# රජය සතු ව්‍යවසායයන්හි කාර්යසාධනය | 03

## 3.1 සමාලෝචනය

2022/23 කාලපරිච්ඡේදය තුළ පිරිවැය පරාවර්තක විදුලි ගාස්තු ගැලපීම, ඉන්ධන මිල සූත්‍රය ක්‍රියාත්මක කිරීම, ජල ගාස්තු සංශෝධනය ආදී නොයෙකුත් ප්‍රතිසංස්කරණ ක්‍රියාමාර්ග සිදු කිරීමත් සමඟ රජය සතු ව්‍යවසාය අංශය මූල්‍ය වර්ධනයක සලකුණු පෙන්නුම් කරයි. ප්‍රතිසංස්කරණ ක්‍රියාමාර්ග තුළින්, රාජ්‍ය ව්‍යවසායන්හි ණය ගැනීම්වලින් බැංකු අංශය කෙරෙහි ඇති අවදානම අඩු වනු ඇතැයි අපේක්ෂා කෙරේ. මේ අතර, ලංකා විදුලිබල මණ්ඩලය, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, මාර්ග සංවර්ධන අධිකාරිය සහ ශ්‍රී ලංකන් ගුවන් සමාගම යන රජය සතු ප්‍රධාන ව්‍යවසායයන් හතරක ශේෂ පත්‍ර ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා පුළුල් උපාය මාර්ගික සැලැස්මක් අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කර ඇති අතර, එමගින් මධ්‍ය කාලීනව රාජ්‍ය මූල්‍ය මෙහෙයුම් මත පවතින පීඩනය ලිහිල් වනු ඇත. 2023 වසරේ පළමු මාස අට තුළ, නව සැපයුම්කරුවන් දෙදෙනෙකු ඛනිජ තෙල් සිල්ලර වෙළඳපොළට ඇතුළු වූ අතර එමගින් කර්මාන්තයේ තරඟකාරිත්වය ඉහළ ගොස් ඇත.

ප්‍රතිසංස්කරණ සඳහා ඇති දැඩි අවශ්‍යතාවයට ප්‍රතිචාර වශයෙන්, අමාත්‍ය මණ්ඩලය විසින් රජය සතු ව්‍යවසායයන් ප්‍රතිව්‍යුහගත කිරීමේ ප්‍රතිපත්තියක්, රාජ්‍ය ව්‍යවසායයන්හි අයිතිය බැහැර කිරීම් සඳහා විශේෂ මාර්ගෝපදේශයක් සහ රජය සතු ප්‍රධාන ව්‍යවසායයන් හතක් සඳහා ගනුදෙනු උපදේශකයින් පත් කිරීම අනුමත කරන ලද අතර, ශ්‍රී ලංකන් ගුවන් සමාගම, ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම, ලංකා හොස්පිටල් සමාගම, සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව, කැන්විල් හෝල්ඩිං පෞද්ගලික සමාගම, හොටෙල් ඩිවලොපර්ස් සමාගම සහ ලිට්රෝ ගෑස් සමාගම එයට අයත් වේ. මේ අතරතුර, කාර්යසාධනය ඉලක්ක කරගත් වැඩ පරිසරයක් තුළින් ආයතනයේ කාර්යසාධනය වැඩිදියුණු කිරීමේ අරමුණින් රජය සතු ව්‍යවසායයන් පහක් සමඟ මහා භාණ්ඩාගාරය සාමූහික අභිලාශ ප්‍රකාශ කිරීමේ ගිවිසුම්වලට එළඹුණි.

රජය සතු ව්‍යවසායයන්හි කාර්යසාධනය සැලකිල්ලට ගත්විට, 2022 වසරේ පළමු මාස අට තුළ රු. බිලියන 726.9 ක් වූ ප්‍රධාන රජය සතු ව්‍යවසායයන් 52 හි මුළු අලාභය 2023 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 311.5 ක ලාභයක් බවට පත්වී ඇති අතර, ඒ අතරින් ව්‍යවසායයන් 38 ක් රු. බිලියන 338.5 ක බදු පෙර ලාභයක් හා සෙසු ව්‍යවසායයන් 14 විසින් රු. බිලියන 27.0 ක ශුද්ධ අලාභයක් වාර්තා කර ඇත. මෙහිදී සැලකිය යුතු කරුණ නම්, උක්ත ලාභයෙන් සියයට 26.2 ක් සඳහා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් මෙම කාලය තුළ ලබා දී ඇති දායකත්වයයි. 2022 වසරේ පළමු මාස අට තුළ එකතු කළ රු. බිලියන 17.8 ක බදු/ලාභාංශ ආදායම, 2023 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 22.2 ක් දක්වා ඉහළ ගොස් ඇත.

## 3.2 රජය සතු ප්‍රධාන ව්‍යවසායයන් දහය පිළිබඳ සමාලෝචනය

මෙම පරිච්ඡේදය මගින් මූල්‍ය හා රක්ෂණ, විදුලිය, ජලය සහ ගුවන් සේවා ආවරණය කරන රජය සතු ප්‍රධාන ව්‍යවසායයන් දහයක කාර්යසාධනය සමාලෝචනය කෙරේ.

### ලංකා බැංකුව

2022 වසර අවසානය වන විට රු. බිලියන 4,336.4 ක් වූ ලංකා බැංකුවේ වත්කම් පදනම 2023 අගෝස්තු මාසය අවසානය වන විට රු. බිලියන 4,137.3 ක් දක්වා සියයට 4.5 කින් පහල ගොස් ඇත. කෙසේ වෙතත්, 2022 වසර අවසානය වන විට රු. බිලියන 3,334.7 ක් වූ තැන්පතු පදනම 2023 අගෝස්තු මාසය අවසානය වන විට රු. බිලියන 3,571.9 ක් දක්වා සියයට 7.1 කින් සුළු වශයෙන් ඉහළ ගොස් ඇත. 2022 වසර අවසන් වන විට වාර්තා වන ලද සියයට 5.27 ක් වූ සමස්ත ණය ප්‍රමාණයට සාපේක්ෂව අදියර III ණය අනුපාතය 2023 අගෝස්තු මාසය අවසානය වන විට සියයට 7.1 ක් දක්වා ඉහළ ගොස් ඇත. 2022 වසරේ පළමු මාස අට තුළ රු. බිලියන 27.0 ක බදු පෙර ලාභයට සාපේක්ෂව 2023 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ බදු පෙර ලාභය රු. බිලියන 16.1 ක් දක්වා පහළ ගොස් ඇත. ගනුදෙනුකරුවන්ගේ තැන්පතු ඉහළ පොළී අනුපාතික යටතේ නැවත මිල කරන අතරතුර ගනුදෙනුකරුවන්ගේ ආර්ථික කටයුතු යථාතත්වයට පත් කිරීමට සහනයක් වීම උදෙසා ඉහළ පොළී අනුපාතිකයන්හි බලපෑම ගනුදෙනුකරුවන් වෙත සෘජුවම නොහැරවීම හේතුවෙන් මූල්‍ය සම්පාදන පිරිවැය ඉහළයාම තුළ ශුද්ධ පොළී ආදායම තියුණු ලෙස පහළයාම හා 2022 වසරේ සමාන කාලපරිච්ඡේදයට සාපේක්ෂව රුපියල අධිප්‍රමාණය වීම නිසා පොළී නොවන ආදායම පහළයාම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය.

### මහජන බැංකුව

2022 වසර අවසානය වන විට රු. බිලියන 2,972 ක් වූ මහජන බැංකුවේ වත්කම් පදනම 2023 අගෝස්තු මාසය අවසානය වන විට රු. බිලියන 2,909.9 ක් දක්වා සියයට 2.0 කින් සුළු වශයෙන් පහල ගොස් ඇත. 2022 වසර අවසානය වන විට රු. බිලියන 2,284.3 ක් වූ තැන්පතු පදනම 2023 අගෝස්තු මාසය අවසානය වන විට රු. බිලියන 2,456.6 ක් දක්වා සියයට 7.5 කින් ඉහල ගොස් ඇත. පැවති ඉහළ පොළී අනුපාතික හේතුවෙන් 2022 වසර අවසානය වන විට රු. බිලියන 1,715.2 ක් වූ ණය සහ අත්තිකාරම් වටිනාකම 2023 අගෝස්තු මාසය අවසානය වන විට රු. බිලියන 1,557.9 ක් දක්වා සියයට 9.1 කින් පහළ ගොස් ඇත. 2022 වසර අවසන් වන විට වාර්තා කරන ලද සියයට 4.4 ක් වූ සමස්ත ණය ප්‍රමාණයට සාපේක්ෂව අදියර III ණය අනුපාතය 2023 අගෝස්තු මාසය අවසානය වන විට

සියයට 5.5 ක් දක්වා ඉහළ ගොස් ඇත. සලකා බලන කාලසීමාව තුළ පැවති ඉහළ පොළී අනුපාත යටතේ ශුද්ධ පොළී ආදායම කැපී පෙනෙන ලෙස පහලයාම හේතුවෙන් 2022 වසරේ පළමු මාස අට තුළ වාර්තා කරන ලද රු. බිලියන 15.7 ක බදු පෙර ලාභයට සාපේක්ෂව 2023 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ වාර්තා කරන ලද බදු පෙර ලාභය රු. බිලියන 7.3 ක් දක්වා පහළ ගොස් ඇත.

**ජාතික ඉතිරිකිරීමේ බැංකුව**

2022 වසර අවසානය වන විට රු. බිලියන 1,616.6 ක් වූ ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ වත්කම් පදනම 2023 අගෝස්තු මාසය අවසානය වන විට රු. බිලියන 1,677.1 ක් දක්වා සියයට 3.7 කින් ඉහල ගොස් ඇත. කෙසේ වුවද, 2022 වසර අවසන් වන විට රු. බිලියන 1,476.7 ක් වූ පාරිභෝගික තැන්පතු ප්‍රමාණය 2023 අගෝස්තු මාසය අවසානය වන විට රු. බිලියන 1,475.5 ක් දක්වා සුළු වශයෙන් පහල ගොස් ඇත. 2022 වසර අවසන් වන විට රු. බිලියන 553 ක් වූ ණය සහ අත්තිකාරම් කළඹ ද 2023 අගෝස්තු මාසය අවසන් වන විට රු. බිලියන 536.4 ක් දක්වා සුළු වශයෙන් පහල ගොස් ඇත. මූල්‍ය සම්පාදන පිරිවැය ඉහළයාමත් සමඟ ශුද්ධ පොළී ආදායම කැපීපෙනෙන ලෙස පහළ යාම හා ශුද්ධ ගාස්තු හා කොමිස් ආදායම පහළ යාම හේතුවෙන් ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ 2022 වසරේ පළමු මාස අට තුළ වාර්තා කරන ලද රු. මිලියන 6,574.7 ක බදු පෙර ලාභයට සාපේක්ෂව 2023 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ වාර්තා වන ලද බදු පෙර අලාභය රු. මිලියන 316.7 ක් විය. කෙසේ වුව ද, 2023 සැප්තැම්බර් 30 න් අවසන් කාල පරිච්ඡේදය සඳහා රු. මිලියන 500 ක බදු පෙර ලාභයක් වාර්තා කිරීමට ජාතික ඉතිරි කිරීමේ බැංකුව සමත් වී ඇත.

**සී/ස ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව**

සී/ස ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින්, 2023 වසරේ පළමු මාස අට තුළ රු. බිලියන 19.5 ක බදු පෙර ලාභයක් වාර්තා කළ අතර, එය 2022 සමස්ත මූල්‍ය වසරේ බදු පෙර ලාභය වූ රු. බිලියන 12.5 හා සසඳන විට කැපී පෙනෙන වර්ධනයකි. එයට ප්‍රධාන හේතුව වූයේ 2022 වසරේ පළමු මාස අට තුළ වාර්තා කළ රු. බිලියන 44.8 ක ආදායමට සාපේක්ෂව 2023 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ ආදායම සියයට 5 කින්, රු. බිලියන 42.6 ක් දක්වා පහල ගිය ද වෙළඳපොලේ ආයෝජන මත ප්‍රතිලාභ වැඩිවීම නිසා ආයෝජනවලින් ලැබෙන ආදායම වැඩිවීමයි. 2022 වසර අවසන් වන විට රු. බිලියන 273.7 ක් වූ සී/ස ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ වත්කම් පදනම 2023 වසරේ අගෝස්තු මස අවසානය වන විට රු. බිලියන 301.6 ක් දක්වා වර්ධනය වී ඇති අතර ජීවිත සහ ජීවිත නොවන අරමුදල් පිළිවෙලින් රු. බිලියන 175 ක් සහ රු. බිලියන 20.3 ක් මෙහි ප්‍රධාන වශයෙන් ඇතුලත් වේ. එමෙන්ම, සී/ස ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙහි අයිතිය බැහැර කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කර ඇති අතර, මේ සඳහා ගනුදෙනු උපදේශකයෙකු (Transaction Advisor) මේ වන විට පත් කර ඇත.

**ලංකා විදුලිබල මණ්ඩලය**

2023 ජූලි 01 වැනිදා සිට විදුලි බිල සියයට 14.14 කින් අඩු කල ද, 2023 පෙබරවාරි 15 වැනි දින සියයට 66 ක සාමාන්‍යයකින් ඉහළ ගිය මිල සංශෝධනය හේතුවෙන් 2023 වසරේ පළමු මාස අට සඳහා විදුලි අලෙවියෙන් ලද ආදායම 2022 වසරේ එම කාලපරිච්ඡේදයට සාපේක්ෂව දෙගුණයකටත් වඩා වැඩි විය. ඒ අනුව 2023 පළමු මාස අට තුළ ලංකා විදුලිබල මණ්ඩලය උපයා ඇති ආදායම, 2022 වසරේ උපයා ඇති රු. බිලියන 172 ට සාපේක්ෂව රු. බිලියන 402 ක් ලෙස වාර්තා වී ඇත. කෙසේ වෙතත්, අදාළ කාලපරිච්ඡේදය තුළ විදුලි ඉල්ලුම 2022 වර්ෂයේ ගි.වො.පැ. 9,854 ට සාපේක්ෂව 2023 වර්ෂයේදී ගි.වො.පැ. 9,465 දක්වා සියයට 4 කින් සුළු වශයෙන් අඩු වී ඇත.

ඉන්ධන සහ ගල් අඟුරු මිල ඉහළ යාමේ ප්‍රතිඵලයක් ලෙස 2022 වර්ෂයේ පළමු මාස අට සඳහා රු. බිලියන 209.4 ක් වූ ඍජු උත්පාදන පිරිවැය 2023 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ සියයට 55 කින් එනම් රු. බිලියන 324 ක් දක්වා ඉහළ ගොස් ඇත. එසේම, බැංකු ණය පොළී අනුපාත ඉහළ යාම සමඟ, 2022 වසරේ පළමු මාස අට තුළ රු. බිලියන 18.2 ක් ලෙස පැවති මූල්‍ය පිරිවැය 2023 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 42.2 ක් දක්වා ඉහළ ගොස් ඇත. ප්‍රමාද වූ සහ සීමාවූ ගාස්තු ගැලපීම හේතුවෙන් උත්පාදන පිරිවැයේ සැළකිය යුතු වැඩි වීම සම්පූර්ණයෙන් ආවරණය කිරීමට අපොහොසත් වීම හේතුවෙන් 2023 වසරේ පළමු මාස අට තුළ රු. බිලියන 20.8 ක අලාභයක් ලංකා විදුලිබල මණ්ඩලය වාර්තා කර ඇත. ඒ අනුව, විකුණුම් ස්ථානයේදී ඒකක පිරිවැය කි.වො. පැයක් සඳහා රු. 29.17 සිට රු. 45.71 ක් දක්වා සැලකිය යුතු ලෙස ඉහළ ගොස් ඇත.

තවද, 2022 වසරේ පළමු මාස අට තුළ ජලः තාප (ඉන්ධන)ः තාප (ගල් අඟුරු)ः සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්තිය සහ සුළං සඳහා 29:20:34:17 ක් ලෙස පැවති උත්පාදන සංයුතිය 2023 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ 22:26:35:18 ලෙස අහිතකර අයුරින් වෙනස් වී ඇත.

තවදුරටත්, 2023 අගෝස්තු අවසානය වන විට ලංකා විදුලිබල මණ්ඩලය විසින් ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවට සහ ස්වාධීන බලශක්ති නිෂ්පාදකයින් වෙත ගෙවීමට ඇති ණය ප්‍රමාණය රු. බිලියන 212.3 ක් දක්වා ඉහළ ගොස් ඇත. කෙසේ වෙතත්, 2022 අගෝස්තු අවසානය වන විට රු. බිලියන 396 ක් ලෙස පැවති දිගුකාලීන ණය 2023 අගෝස්තු අවසානය වන විට රු. බිලියන 230.6 ක් දක්වා පහළ ගොස් ඇත.

මේ අතර, පසුගිය මාස කිහිපය තුළ පැවති අනපේක්ෂිත නියඟ තත්ත්වය සහ ලංකා විදුලිබල මණ්ඩලයෙහි අයහපත් මූල්‍ය තත්ත්වය සැලකිල්ලට ගෙන, 2023 වසර සඳහා ලංකා විදුලිබල මණ්ඩලයෙහි ලාභ අලාභ සමච්ඡේදනය වීම සහතික වීම උදෙසා 2023 වසරේ ඔක්තෝබර් 20 දින සිට බලපැවැත්වෙන

වගුව : 3.1: විදුලි උත්පාදනය සහ ධාරිතාවයේ සංයුතිය

| | 2022 ජනවාරි-අගෝස්තු විදුලි උත්පාදනය | | | 2023 ජනවාරි-අගෝස්තු (තාවකාලික) විදුලි උත්පාදනය | | |
|---|---|---|---|---|---|---|
| | ස්ථාපිත ධාරිතාවය මෙ.වො. | සමස්ත උත්පාදන ප්‍රතිශතයක් ලෙස (%) | ශුද්ධ උත්පාදන ගි.වො.පැ. | ස්ථාපිත ධාරිතාව මෙ.වො. | සමස්ත උත්පාදන ප්‍රතිශතයක් ලෙස (%) | ශුද්ධ උත්පාදන ගි.වො.පැ. |
| ජල විදුලිය | 1,413 | 29 | 3,122 | 1,413 | 22 | 2,287 |
| තාප විදුලිය-ලංවිම (ඉන්ධන) | 654 | 10 | 1,098 | 811 | 16 | 1,677 |
| තාප විදුලිය - ස්වාධීන තාප විදුලි උත්පාදකයන් - (ඉන්ධන) | 550 | 10 | 1,028 | 294 | 10 | 990 |
| සුළං - ලංවිම | 104 | 2 | 236 | 104 | 3 | 268 |
| තාප විදුලිය - ගල් අඟුරු | 900 | 34 | 3,707 | 900 | 34 | 3,574 |
| සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්තිය සහ සුළං | 732 | 12 | 1,294 | 769 | 11 | 1,112 |
| පියසි මත ඉදිකරන සූර්ය පැනල | 515 | 3 | 347 | 610 | 4 | 433 |
| **එකතුව** | **4,868** | **100** | **10,832** | **4,901** | **100** | **10,341** |

*මූලාශ්‍රය: ලංකා විදුලිබල මණ්ඩලය*

පරිදි විදුලි ගාස්තුව සාමාන්‍ය වශයෙන් සියයට 18 කින් ඉහළ නංවන ලදී.

**ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව**

පෙට්‍රල්, ඩීසල් සහ භූමිතෙල් සඳහා පිරිවැය පිළිබිඹු වන මිලකරණ ක්‍රමවේදයක් හඳුන්වාදීමේ ප්‍රතිඵලයක් ලෙස 2022 වසරේ පළමු මාස අට තුළ දී රු. බිලියන 716.6 ක්ව පැවති ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවේ ආදායම 2023 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 921.8 ක් දක්වා සියයට 28.6 කින් වර්ධනය වී ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස 2022 වසරේ පළමු මාස අට තුළ දී රු. බිලියන 23.2 ක් ලෙස වාර්තා වී තිබූ සංස්ථාවේ දළ අලාභය 2023 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 121.6 ක දළ ලාභයක් බවට පරිවර්තනය වී ඇත. 2023 වසරේ පළමු මාස අට තුළ ආදායමේ සිදු වූ වර්ධනය මෙන්ම රුපියල අධිප්‍රමාණය වීමේ වාසි හේතු කොටගෙන 2022 වසරේ පළමු මාස අට තුළ වාර්තා වූ රු. බිලියන 632 ක් වූ අලාභයට සාපේක්ෂව ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව 2023 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 88.6 ක ශුද්ධ ලාභයක් වාර්තා කරන ලදී.

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවෙහි තෙල් ආනයන වියදම 2023 වසරේ පළමු මාස අට තුළ ඇ.ඩො. බිලියන 1.8 ක් දක්වා පහත වැටී ඇත. මෙයට හේතු වූයේ 2022 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ ගෝලීය වෙළඳපොලේ ඇ.ඩො. 105 ක්ව පැවති බ්‍රෙන්ට් බොරතෙල් බැරලයක සාමාන්‍ය මිල ඇ.ඩො. 86 ක් දක්වා පහත වැටීමයි. කෙසේ වෙතත්, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවෙහි ඉල්ලුම සාමාන්‍යකරණය වීම හේතුවෙන් රු. බිලියන 737.4 ක සමස්ත විකුණුම් පිරිවැය, සියයට 4.2 කින් එනම් රු. බිලියන 768.1 ක් දක්වා සුළු වශයෙන් වැඩි වී ඇත.

2023 අගෝස්තු මාසය අවසානය වන විට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් ඉන්දියානු ණය පහසුකම යටතේ ඛනිජ තෙල් ආනයනය සඳහා රජයට රු. බිලියන 228.8 ක් ගෙවීමට තිබුනි. මීට අමතරව, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව 2023 අගෝස්තු මාසය අවසානය වන විට ජාතික ඉරාන තෙල් සමාගමට (NIOC) රු. බිලියන 82.1 ක් ගෙවීමට තිබුනි.

මූලික වශයෙන්, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවෙහි ප්‍රධාන ගැනුම්කරුවන් වන ලංකා විදුලිබල මණ්ඩලයේ සහ ශ්‍රී ලංකන් ගුවන් සමාගමේ ද්‍රවශීලතා ගැටළු හේතුවෙන් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවෙහි 2022 වසර අවසන් වන විට පැවති රු. බිලියන 268.8 ක සමස්ත හිඟ වෙළඳ ණය ශේෂය 2023 අගෝස්තු මාසය අවසානය වන විට සියයට 8.9 කින් එනම්, රු. බිලියන 292.6 ක් දක්වා වැඩි වී ඇත.

මීට අමතරව, ඛනිජ තෙල් නිෂ්පාදනයේ ප්‍රධාන නිෂ්පාදකයන් වන රටවල පිළිගත් ව්‍යාපාර දෙකක් වන සයිනොපෙක් ෆුවල් ඔයිල් ලංකා (පුද්ගලික) සමාගම සහ ආර්එම් පාර්ක්ස් සමාගම, ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය, ගබඩා කිරීම, බෙදා හැරීම සහ ශ්‍රී ලංකාව තුළ මෙහෙයුම් සිදුකරන කලින් තෝරාගත් බෙදාහරින්නන් හරහා විකුණුම් සිදු කිරීම සඳහා

වෙළඳපොළට ප්‍රවේශ විය. මෙමගින් සේවා ප්‍රමිතීන් ඉහළ නංවනු ඇතැයි අපේක්ෂා කරන අතර, එමගින් ඇතිවන තරගකාරීත්වය තුළින් පාරිභෝගිකයින්ට ප්‍රතිලාභ ලැබෙනු ඇත.

**ශ්‍රී ලංකා වරාය අධිකාරිය**

ලෝක නාවුක වෙළෙඳාමෙහි සහ ජාත්‍යන්තර වෙළෙඳාමෙහි බලපෑමක් කළ හැකි සන්ධිස්ථානයක් ලෙසට කොළඹ වරාය ස්ථානගත වී ඇත. ඇල්ෆා ලයිනර් ශ්‍රේණිගත කිරීම අනුව, කොළඹ වරාය වර්තමානයෙහි ලොව සියලු වරායන් අතර 23 වන ස්ථානයෙහි ශ්‍රේණිගත වී ඇත. නැගෙනහිර බහාලුම් පර්යන්තය සහ කොළඹ බටහිර ජාත්‍යන්තර පර්යන්තය වැනි අභිලාෂකාමී සංවර්ධන ව්‍යාපෘති ආරම්භ කිරීම මගින් වර්තමානයේ මිලියන 8.5 ක් වන අඩි විස්සේ සම ඒකක මෙහෙයුම් ධාරිතාවය මිලියන 14 ක් දක්වා ඉහළ නැංවීමට අපේක්ෂා කෙරේ. ගෝලීය සැපයුම් දාමයේ සුමට ක්‍රියාකාරිත්වය සහතික කිරීම සඳහා ප්‍රවේශයක් මෙම දැවැන්ත පිම්ම මගින් විවෘත වනු ඇති අතර, එය ශ්‍රී ලංකා වරාය අධිකාරිය ලෝකයේ හොඳම වරායන් 14 අතර ශ්‍රේණිගත කිරීමට ද හේතු වනු ඇත.

2023 වසරේ පළමු මාස අට තුළ, ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් අඩි විස්සේ සම ඒකක බහාලුම්ගත නැව් බඩු බහාලුම් 1,357,104 ක් සහ සාම්ප්‍රදායික නැව් බඩු මෙට්‍රික් ටොන් 5,306,166 ක් පමණ හසුරුවා ඇත. 2023 වසරේ පළමු මාස අට තුළ අධිකාරිය විසින් වාර්තා කළ බදු පෙර ලාභය රු. බිලියන 24.5 ක් වන අතර 2022 වසරේ එම කාල සීමාවේ දී වාර්තා කළ රු. බිලියන 36.3 ක් වූ බදු පෙර ලාභයට සාපේක්ෂව සියයට 32.5 ක අඩු වීමකි. 2022 වසරේ පළමු මාස අට තුළ වාර්තා කළ රු. බිලියන 4.6 ක් වූ විදේශ විනිමය ලාභයට සාපේක්ෂව 2023 වසරේ සමාන කාලපරිච්ඡේදයේ දී රු. බිලියන 3.5 ක විදේශ විනිමය අලාභයක් ලැබීම මෙන්ම රට තුළ ආනයන සීමා පනවා තිබීම ද බදු පෙර ලාභය අඩු වීමට හේතු වී ඇත.

**ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය**

2022 වසරේ පළමු මාස අට තුළ නල ජලය සහ සමස්ත සුරක්ෂිත පානීය ජල ආවරණය සඳහා මහජනතාවට ඇති ප්‍රවේශය පිළිවෙළින් සියයට 55.5 ක් සහ සියයට 95.6 ක් වූ අතර, එය 2023 වසරේ සමාන කාලපරිච්ඡේදයේ දී පිළිවෙළින් සියයට 61 ක් සහ සියයට 96.7 ක් දක්වා පුළුල් කර ගනිමින් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය සිය සේවාව අඛණ්ඩව පවත්වාගෙන යනු ලබයි. මෙම කාලසීමාව තුළ නව සම්බන්ධතා 113,904 ක් පද්ධතියට එක් කරන ලද අතර මුළු සම්බන්ධතා ප්‍රමාණය මිලියන 2.9 කි.

2022 වසරේ සැප්තැම්බර් 01 දින සහ 2023 වසරේ අගෝස්තු 02 දින සිට ක්‍රියාත්මක කරන ලද ජල හා ජලාපවහන ගාස්තු ඉහළ නැංවීම හේතුවෙන් 2022 වසරේ පළමු මාස අට තුළ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ආදායම වූ රු. බිලියන 18.2 ට සාපේක්ෂව 2023 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ ආදායම රු. බිලියන 33.6 ක් දක්වා සියයට 84 කින් වර්ධනය වී ඇත. එය 2022 වසරේ පළමු මාස අට තුළ වාර්තා කරන ලද දළ ලාභය වූ රු. බිලියන 7.2 ක් සහ මෙහෙයුම් පාඩුව වූ රු. බිලියන 1.8 ට සාපේක්ෂව 2023 වසරේ සමාන කාලපරිච්ඡේදයේ දී රු. බිලියන 15.3 ක දළ ලාභයක් සහ රු. බිලියන 5.5 ක මෙහෙයුම් ලාභයක් ලබාගැනීමට හේතු වී ඇත.

මේ අතර, සමාලෝචිත කාලපරිච්ඡේදය තුළ ජල නිෂ්පාදනය සහ ජල අලෙවිය 2022 වසරේ සමාන කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 2 කින් සහ සියයට 3 කින් අඩු වී ඇති අතර එය පිළිවෙලින් ඝන මීටර මිලියන 540 ක් සහ ඝන මීටර මිලියන 403 කි. තවද, 2022 වසරේ අගෝස්තු මාසය අවසානය වනවිට සියයට 24.87 ක් වූ ආදායම් නොලබන ජලය (Non Revenue Water) 2023 වසරේ අගෝස්තු මාසය අවසානය වන විට සියයට 25.32 ක් දක්වා පෙර වසරට සාපේක්ෂව වර්ධනය වී ඇත.

**සී/ස ගුවන් තොටුපොළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම**

සී/ස ගුවන් තොටුපොළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම විසින් 2022 වසරේ පළමු මාස අට තුළ උපයන ලද රු. බිලියන 16 හා සැසඳීමේ දී 2023 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 25.3 ක ආදායමක් උපයා ඇති අතර, ඉන් රු. බිලියන 20.2 ක් ගගන නාවික නොවන ආදායම් වේ. කාලපරිච්ඡේදය තුළ වාර්තා කළ මෙහෙයුම් වියදම රු. බිලියන 11 කි. ඒ අනුව, 2023 වසරේ පළමු මාස අට තුළ සී/ස ගුවන් තොටුපොළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම විසින් රු. බිලියන 14.2 ක මෙහෙයුම් ලාභයක් වාර්තා කර ඇත. 2022 වසරේ පළමු මාස අට තුළ වාර්තා කල රු. බිලියන 2.5 ක බදු පෙර අලාභය හා සැසඳීමේ දී, සී/ස ගුවන් තොටුපොළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම විසින් 2023 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ ශුද්ධ මූල්‍ය ආදායම හා විදේශ විනිමය ලාභය ගැලපූ පසු වාර්තා කළ බදු පෙර ලාභය රු. බිලියන 26.6 ක් වේ.

සැලකිය යුතු ආර්ථික ප්‍රතිලාභ අපේක්ෂා කරන බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළෙහි 2 වන පර්යන්තයෙහි සංවර්ධන කටයුතු රටේ අතුරු ණය ප්‍රතිපත්තිය හේතුවෙන් තාවකාලිකව අත්හිටුවා ඇත.

**ශ්‍රී ලංකන් ගුවන් සමාගම**

ශ්‍රී ලංකන් ගුවන් සමාගම සහ එහි අනුබද්ධිත සමාගම් ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් ලබා දුන් මූලික අනුමැතියට අනුකූලව, ශ්‍රී ලංකන් ගුවන්

සමාගමේ අයිතිය බැහැර කිරීමට පහසුකම් සැලසීම සඳහා ගනුදෙනු උපදේශක වශයෙන් ජාත්‍යන්තර මූල්‍ය සංස්ථාව (IFC) පත් කිරීමට 2023 ජූලි මාසයේ දී අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය ලබා දෙන ලදී. රාජ්‍ය ව්‍යවසායයන් කිහිපයක ශේෂ පත්‍ර ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද උපාය මාර්ගයට අනුව, 2023 අප්‍රේල් මස අවසන් වන විට ශ්‍රී ලංකන් ගුවන් සමාගම විසින් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට ගෙවිය යුතු රු. බිලියන 102.5 ක මුදල පියවනු ඇත.

සංචාර සඳහා ඇති ගෝලීය උද්යෝගය සහ විදේශ විනිමය ලාභවල ප්‍රතිඵලයක් ලෙස, ශ්‍රී ලංකන් ගුවන් සමාගමේ මූල්‍ය කාර්ය සාධනයේ වර්ධනයක් වාර්තා වන අතර එය 2023 වසරේ පළමු මාස අටෙහි බදු පෙර ලාභය වන රු. බිලියන 79.8 මගින් පිළිබිඹු වේ. 2022 වසරේ පළමු මාස අට තුළ වාර්තා කළ රු. බිලියන 187.8 ක ආදායම හා සැසඳීමේ දී, 2023 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ ශ්‍රී ලංකන් ගුවන් සමාගමේ මුළු ආදායම රු. බිලියන 238.9 ක් දක්වා සියයට 27.2 කින් වැඩි වී ඇත. ශ්‍රී ලංකන් ගුවන් සමාගම විසින් 2022 වසරේ පළමු මාස අට තුළ වාර්තා කළ රු. බිලියන 192.2 ක සමස්ත වියදම, ප්‍රධාන වශයෙන්ම ගුවන් තොටුපළ වියදම්, ගමන්වාර අතරමැද වියදම් සහ මගී වියදම්වල සැලකිය යුතු වැඩි වීම හේතුවෙන් 2023 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 207.5 ක් දක්වා සියයට 8 කින් වැඩි විය.

කෙසේවුවද, ශ්‍රී ලංකන් ගුවන් සමාගම විසින් දේශීය රාජ්‍ය බැංකු, සමුච්චිත නොගෙවූ ඉන්ධන බිල්පත්, ජාත්‍යන්තර බැඳුම්කර සහ ගුවන් යානා කල්බදු සඳහා වන හිඟ ගෙවීම් ඇතුළුව විවිධ ආයතන සඳහා ඇ.ඩො. බිලියන 1.2 ක ණය ප්‍රමාණයක් සහ රු. බිලියන 594.4 ක සමුච්චිත අලාභයක් දරා සිටී.

වගුව 3.2 : ප්‍රධාන රාජ්‍ය ව්‍යවසායයන් 52 හි බද්දට පෙර ලාභය

රු. මිලියන

| | රාජ්‍ය ව්‍යවසාය | 2021 තත්‍ය | 2022 කෙටුම්පත් | 2023.08.31 කෙටුම්පත් |
|---|---|---|---|---|
| 1 | ලංකා බැංකුව | 43,190 | 30,977 | 16,116 |
| 2 | මහජන බැංකුව | 30,387 | 21,338 | 7,353 |
| 3 | ජාතික ඉතිරි කිරීමේ බැංකුව | 28,381 | 4,510 | -317 |
| 4 | රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව | 422 | -48 | -786 |
| 5 | නිවාස සංවර්ධන හා මූල්‍ය සංස්ථා බැංකුව | 878 | 303 | 2,092 |
| 6 | ප්‍රාදේශීය සංවර්ධන බැංකුව | 776 | 359 | 743 |
| 7 | සේවා නියුක්තයන්ගේ භාරකාර අරමුදල් මණ්ඩලය | 33,159 | 43,428 | 43,246 |
| 8 | සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව | 11,725 | 12,476 | 19,451 |
| 9 | ජාතික රක්ෂණ භාරකාර අරමුදල | 5,936 | 8,010 | 9,933 |
| 10 | ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව | 334 | 1,884 | 379 |
| 11 | කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය | 1,780 | 2,651 | 1,094 |
| 12 | ලංකා විදුලිබල මණ්ඩලය | -34,139 | -261,869 | -20,789 |
| 13 | ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව | -81,816 | -615,053 | 88,646 |
| 14 | ශ්‍රී ලංකා වරාය අධිකාරිය | 25,601 | 57,026 | 24,464 |
| 15 | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය | -3,054 | -3,064 | 5,639 |
| 16 | සීමාසහිත ගුවන් තොටුපොළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගම | -961 | 6,433 | 26,626 |
| 17 | සීමාසහිත ශ්‍රී ලංකන් ගුවන් සමාගම | -166,370 | -74,673 | 79,789 |
| 18 | ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය | -3,054 | 484 | -2,198 |
| 19 | රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව | -1,597 | -940 | -568 |
| 20 | ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය | 48 | 69 | 88 |
| 21 | රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව | 43 | 37 | 114 |

රු. මිලියන

| | රාජ්‍ය ව්‍යවසාය | 2021 තත්‍ය | 2022 කෙටුම්පත් | 2023.08.31 කෙටුම්පත් | |
|---|---|---|---|---|---|
| 22 | සීමාසහිත මිල්කෝ (පුද්ගලික) සමාගම | 114 | -391 | -265 | |
| 23 | ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය | 160 | 133 | 65 | * |
| 24 | ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව | -232 | 19 | -78 | |
| 25 | ජනතා වතු සංවර්ධන මණ්ඩලය | -490 | -5 | -20 | |
| 26 | සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම | 468 | 511 | 397 | |
| 27 | සීමාසහිත හලාවත වැවිලි සමාගම | 511 | 514 | 293 | |
| 28 | සීමාසහිත කළුබෝවිටියන තේ කර්මාන්තශාලාව | -3 | 347 | 28 | |
| 29 | ශ්‍රී ලංකා කජු සංස්ථාව | -16 | 14 | 1 | |
| 30 | සීමාසහිත ලංකා ඛනිජ වැලි සමාගම | 1,387 | 6,160 | 510 | |
| 31 | සීමාසහිත ලංකා පොස්පේට් සමාගම | 157 | 58 | 29 | * |
| 32 | සීමාසහිත කහටගහ ග්‍රැෆයිට් ලංකා සමාගම | 11 | 60 | 30 | * |
| 33 | සංවර්ධන ලොතරැයි මණ්ඩලය | 2,953 | 3,267 | 2,221 | |
| 34 | ජාතික ලොතරැයි මණ්ඩලය | 1,004 | 1,390 | 734 | |
| 35 | රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව | 1,235 | 1,586 | 2,139 | * |
| 36 | ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව | -15 | 15 | 38 | |
| 37 | රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව | 3,199 | 854 | -402 | |
| 38 | ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල | -254 | 247 | 470 | |
| 39 | සීමාසහිත ස්වාධීන රූපවාහිනී ජාලය | -344 | -370 | -172 | |
| 40 | ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව | -229 | -541 | -279 | * |
| 41 | ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව | 11 | -236 | -384 | |
| 42 | සීමාසහිත ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය (ලක්සල) | -59 | -101 | 25 | |
| 43 | රාජ්‍ය දැව සංස්ථාව | 1,496 | 1,016 | 153 | |
| 44 | සීමාසහිත ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව | 473 | 735 | 427 | ** |
| 45 | සීමාසහිත ලංකා සතොස සමාගම | -840 | -687 | -124 | |
| 46 | රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාව | -208 | -381 | 996 | |
| 47 | ලංකා ධීවර සංස්ථාව | -166 | -150 | 26 | |
| 48 | ලංකා ධීවර වරාය නිෂ්පාදන නීතිගත සංස්ථාව | -136 | 370 | 91 | |
| 49 | සීමාසහිත ලංකා පොහොර සමාගම | 65 | 401 | 115 | |
| 50 | සීමාසහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගම | 234 | 501 | 205 | |
| 51 | සීමාසහිත හොටෙල් ඩිවලොපර්ස් ලංකා ලිමිටඩ් | -976 | -633 | -628 | |
| 52 | සීමාසහිත ලංකා සීනි සමාගම | 445 | 2,917 | 3,702 | |
| | **එකතුව** | **-98,376** | **-748,042** | **311,459** | |

*මූලාශ්‍රය: රාජ්‍ය ව්‍යවසායයන් සහ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව*

* *ජනවාරි - ජූලි*

** *ජනවාරි - ජූනි*

වගුව 3.3 : රාජ්‍ය ව්‍යවසායයන් වෙතින් ලද අයබදු/ ලාභාංශ ආදායම

රු. මිලියන

| රාජ්‍ය ව්‍යවසාය | තත්‍ය | | | පුරෝකථන | |
|---|---|---|---|---|---|
| | 2021 | 2022 | 2023.08.31 දක්වා | 2024 | 2025 |
| **අයබදු** | **25,919** | **22,004** | **17,142** | **64,945** | **68,200** |
| ජාතික ඉතිරිකිරීමේ බැංකුව | 3,500 | – | – | – | – |
| ලංකා බැංකුව | 1,500 | – | – | 7,500 | 7,875 |
| මහජන බැංකුව | 1,977 | 441 | – | 7,260 | 7,623 |
| විදුලි සංදේශ හා නියාමන කොමිසම | 8,500 | 13,200 | 8,000 | 15,000 | 15,750 |
| ප්‍රාදේශීය සංවර්ධන බැංකුව | - | – | – | 300 | 315 |
| නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව | - | – | – | 180 | 189 |
| රාජ්‍ය දැව සංස්ථාව | 100 | 320 | 191 | 100 | 105 |
| රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව | 100 | 100 | – | 150 | 158 |
| ජාතික රක්ෂණ භාර අරමුදල | 1,824 | 1,608 | 450 | 2,000 | 2,100 |
| භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය | 2,000 | 1,000 | 1,500 | 3,000 | 3,150 |
| ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය | 15 | 35 | 40 | 50 | 53 |
| ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව | – | – | – | 15,000 | 15,750 |
| ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය | – | 416 | 500 | 350 | 368 |
| කාර්මික සංවර්ධන මණ්ඩලය | – | – | – | 5 | 5 |
| ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව | – | – | – | 9 | 9 |
| ජාතික ලොතරැයි මණ්ඩලය | 900 | 361 | 1,000 | 410 | 431 |
| ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය | - | 10 | – | 15 | 16 |
| ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව | 25 | 50 | 500 | 300 | 315 |
| ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය | – | – | – | 50 | 53 |
| ඉංජිනේරු කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශන කාර්යාංශය | 25 | – | – | 10 | 11 |
| ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය | - | – | – | 500 | 525 |
| සිවිල් ගුවන් සේවා අධිකාරිය | 50 | 1,000 | 1,000 | 750 | 788 |
| රාජ්‍ය ඖෂධ සංස්ථාව | – | 350 | – | 200 | 210 |
| ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය | 110 | 290 | 150 | 200 | 210 |
| ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය | - | 1,200 | 3,000 | 1,000 | 1,050 |
| ජාතික ගමනාගමන කොමිෂන් සභාව | - | 10 | 100 | 50 | 53 |
| ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව | - | - | - | 10 | 11 |
| ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව | - | - | - | 25 | 26 |
| ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව | – | – | – | 50 | 53 |
| ශ්‍රී ලංකා වරාය අධිකාරිය | – | 1,015 | – | 10,000 | 10,500 |
| ජාතික ඖෂධ නියාමන අධිකාරිය | 147 | 400 | 646 | 250 | 263 |
| මාර්ග සංවර්ධන අධිකාරිය | 4,000 | – | – | – | – |
| ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසම | 1,100 | – | – | 15 | 16 |
| සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය | 25 | 50 | 15 | 20 | 21 |
| ව්‍යාපාර කළමනාකරණ පිළිබඳ ජාතික ආයතනය | 16 | 33 | – | 70 | 74 |
| ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව | 5 | – | – | 10 | 11 |
| කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය | - | 90 | – | 30 | 32 |
| ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරිත්ව ආයතනය | - | - | - | 10 | 11 |

රු. මිලියන

| රාජ්‍ය ව්‍යවසාය | තත්‍ය | | | පුරෝකථන | |
|---|---|---|---|---|---|
| | 2021 | 2022 | 2023.08.31 දක්වා | 2024 | 2025 |
| ශ්‍රී ලංකා කජු සංස්ථාව | - | - | - | 5 | 5 |
| ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව | - | - | - | 15 | 16 |
| ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශය | - | - | - | 15 | 16 |
| ශ්‍රී ලංකා තේ මණ්ඩලය | - | - | - | 30 | 32 |
| වෙනත් රාජ්‍ය ව්‍යවසායයන් | - | 25 | 50 | 1 | 1 |
| **ලාභාංශ** | **4,672** | **6,087** | **5,060** | **5,055** | **5,310** |
| ජාතික ඉතිරිකිරීමේ බැංකුව | 60 | 60 | 30 | 60 | 63 |
| ලංකා බැංකුව | 346 | 346 | 173 | 350 | 368 |
| මහජන බැංකුව | 316 | 316 | 158 | 300 | 315 |
| ජාතික සංවර්ධන බැංකුව | 1 | 0.9 | - | 2 | 2 |
| කොමර්ෂල් බැංකුව | – | 0.17 | - | 2 | 2 |
| සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව | 899 | 1,511 | 1,001 | - | - |
| සීමාසහිත ගුවන්තොටුපල සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගම | - | 500 | 500 | 1,000 | 1,050 |
| සීමාසහිත ලංකා ඛණිජ වැලි සමාගම | 700 | 759 | 1,726 | 1,500 | 1,575 |
| සීමාසහිත ලංකා පොස්පේට් සමාගම | 20 | 20 | 20 | 25 | 26 |
| සීමාසහිත ලංකා ලේලන්ඩ් සමාගම | 3 | 13 | - | 3 | 3 |
| සීමාසහිත රක්නා ආරක්ෂක ලංකා සමාගම | - | - | 25 | 46 | 48 |
| සීමාසහිත ජාතික ලූණු සමාගම | 15 | - | 20 | 15 | 16 |
| සීමාසහිත ලංකා පොහොර සමාගම | 29 | 15 | - | 15 | 16 |
| සීමාසහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගම | - | 10 | - | 50 | 53 |
| සීමාසහිත කොළඹ තෙළුම් කුළුණ කළමනාකාරිත්ව (පුද්ගලික) සමාගම | - | - | - | 12 | 13 |
| සීමාසහිත බීසීසී ලංකා සමාගම | - | - | - | 25 | 26 |
| සීමාසහිත කහටගහ ග්‍රැෆයිට් ලංකා සමාගම | - | - | - | 5 | 5 |
| සීමාසහිත පරන්තන් කෙමිකල් සමාගම | 3 | 50 | 30 | 40 | 42 |
| සීමාසහිත ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව | - | 11 | - | 50 | 53 |
| සීමාසහිත ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම | 1,331 | 1,805 | - | - | - |
| සීමාසහිත ඩී ලා රූ ලංකා පුද්ගලික සමාගම | 345 | 313 | - | 300 | 315 |
| සීමාසහිත ලංකා විදුලිබල සමාගම | 327 | 218 | 436 | 350 | 368 |
| සීමාසහිත ලංකා කාර්මික වතු සමාගම | 82 | - | 86 | 100 | 105 |
| සීමාසහිත නිපුණතා සංවර්ධන අරමුදල | - | - | - | 5 | 5 |
| සීමාසහිත ලංකා කෘෂි කර්මාන්ත සමාගම | 95 | 24 | 119 | 120 | 126 |
| සීමාසහිත ලංකා සීනි සමාගම | - | - | 352 | 100 | 105 |
| වැවිලි සමාගම් | 98 | 95 | 349 | 445 | 467 |
| සීමාසහිත ලංකා ත්‍රිපෝෂ සමාගම | – | 10 | 10 | 10 | 11 |
| ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව | – | – | – | 15 | 16 |
| සැලසිනේ මීඩියා සොලූෂන්ස් පුද්ගලික සමාගම | – | – | – | 100 | 105 |
| සීමාසහිත ලංකා කැනරීස් සමාගම | – | – | – | 10 | 11 |
| වෙනත් | 2 | 10 | 25 | – | – |
| **එකතුව** | **30,591** | **28,091** | **22,202** | **70,000** | **73,510** |

*මූලාශ්‍ර: රාජ්‍ය ව්‍යවසායයන් සහ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව*

# 2024 අයවැය සැකසීම සඳහා පදනම් වූ සාධක

# 04

2.2

**සමාලෝචනය**

අයවැය සකස් කිරීමේදී යොදා ගන්නා ලද උපකල්පන, විශ්ලේෂණ සහ විනිශ්චයන් මාලාවක් මත 2024 වර්ෂයේ අයවැයෙහි සාර්ව ආර්ථික සහ මූල්‍ය ඇස්තමේන්තු පදනම් වී ඇත. ආදායම් සහ වියදම් ඇස්තමේන්තු සකස් කිරීමේ දී යොදා ගන්නා දළ දේශීය නිෂ්පාදිතය, උද්ධමනය, විදේශීය අංශයේ ප්‍රවණතා සහ විරැකියාව වැනි ප්‍රධාන සාර්ව ආර්ථික දර්ශක සම්බන්ධයෙන් වන උපකල්පන පිළිබඳ විස්තරාත්මක කරුණු ලබා දෙන අතරතුර, ඇස්තමේන්තුවල සංවේදීතාවය ද මෙම පරිච්ඡේදය මගින් ලබා දෙනු ලබයි.

2024 වසරේ අයවැය ඇස්තමේන්තු සකස් කරන ලද්දේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීරණ ණය පහසුකම් වැඩසටහනෙහි දක්වා ඇති පරාමිතීන්ට අනුකූලවය. ඒ අනුව 2024 වසරේ දී දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 12.1 ක් වන බදු ආදායමක් ද දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 0.8 ක ප්‍රාථමික ශේෂයේ අතිරික්තයක් ද ලබා ගැනීමට අපේක්ෂිතය.

**දළ දේශීය නිෂ්පාදිතය**

2022 වසරේ මුල් කාලයේ දී ඇති වූ පෙර නොවූ විරූ ආර්ථික අර්බුදයෙන් පසු, රජය විසින් ක්‍රියාත්මක කරන ලද ස්ථායීකරණ ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග ප්‍රධාන වශයෙන්ම හේතුකොට ගෙන 2024 අයවැය ඇස්තමේන්තු සකස් කරන කාලය වන විට ශ්‍රී ලංකාව ආර්ථිකය යථා තත්ත්වයට පත් වීමේ ලක්ෂණ පෙන්නුම් කරමින් සිටියි. කෙසේ වුවද, තවදුරටත් අභියෝග පවතියි. 2022 වසරේ කාර්මික අංශයේ වාර්තා වූ සියයට 18.3 ක සැළකිය යුතු සංකෝචනයක් සමඟ, 2023 වසරේ පළමු භාගයේ දී ආර්ථිකය සියයට 7.8 කින් සංකෝචනය විය.

ආර්ථිකය 2023 වසරේ දී සියයට 3.6 කින් සංකෝචනය වනු ඇතැයි අපේක්ෂිත අතර, 2024 වසරේ දී සියයට 1.8 ක වර්ධනයක් වාර්තා කරනු ඇතැයි අපේක්ෂිතය. ආනයන සීමා ඉවත් කිරීම හා යෙදවුම් සඳහා ප්‍රවේශය වැඩි වීම සමඟ නිෂ්පාදනය තවදුරටත් සාමාන්‍ය මට්ටමට පත් වීම, 2024 වසරේ දී ආර්ථිකය යථා තත්ත්වයට පත් වීම සඳහා ප්‍රධාන වශයෙන් හේතු වනු ඇත. කෙසේ වුවද, මැද පෙරදිග කලාපයේ මෑත කාලීනව ඇති වී ඇති භූ-දේශපාලනික ව්‍යාකූලතාවයන් නිසා තවදුරටත් ඇති විය හැකි සැපයුම් අංශයේ කම්පන දේශීය මිල ගණන්වලට බලපෑ හැක. පොහොර සහනාධාරය අඛණ්ඩව ලබා දීම හා අනෙකුත් යෙදවුම් ලබා ගත හැකි වීම නිසා කෘෂිකාර්මික අංශය ද වර්ධනය විය හැක. ආර්ථිකය ස්ථායීවීමත් සමඟ ම සේවා අංශය ද වර්ධනය වනු ඇත. ඊට අමතරව, වසංගතයට පෙර පැවති තත්ත්වයට ළඟා වීමට සංචාරක පැමිණීම් ඉහළ යනු ඇති බව ද, ශ්‍රමික ප්‍රේෂණ ද අඛණ්ඩව ඉහළ යනු ඇති බවට ද අපේක්ෂිතය.

**පාරිභෝගික මිල ගණන්**

2022 වසරේ සැප්තැම්බර් මස වාර්තා වූ සියයට 69.8 ක ඉහළම අගයේ සිට, කොළඹ පාරිභෝගික මිල දර්ශකය (කො.පා.මි.ද. 2021=100) මඟින් මනිනු ලබන උද්ධමනය 2023 වසරේ ඔක්තෝබර් මස වන විට සියයට 1.5 ක් දක්වා සැළකිය යුතු ලෙස අඩු විය. 2024 වසරේ දී සාමාන්‍ය උද්ධමනය තනි ඉලක්කමක මට්ටමින් පවත්වා ගෙන යාමට අපේක්ෂා කෙරේ.

ගෝලීය උද්ධමනය, 2022 වසරේ දී සියයට 8.7 සිට 2023 වසරේ දී සියයට 6.9 දක්වා ද, 2024 වසරේ දී සියයට 5.8 දක්වා ද අඩු වනු ඇතැයි අපේක්ෂිත අතර, බොහෝ රටවල් 2025 වන තෙක් ඉලක්ක ගත උද්ධමන මට්ටම ළඟා නොවනු ඇත. වාර්ෂික ලක්ෂමය ගෝලීය උද්ධමනය අඩු වනු ඇතැයි අපේක්ෂා කළ ද, පසුගිය වසරේ වාර්තා වූ දශක ගණනාවක වැඩිම උද්ධමනය හේතුවෙන් මිල මට්ටම් ඉහළ අගයක පවතිනු ඇත. තවද, මැද පෙරදිග කලාපයේ නැගී එමින් පවතින භූ-දේශපාලනික ව්‍යාකූලතා මිල මට්ටම්වලට තවදුරටත් බලපෑමේ හැකියාව ඇත.

**සේවා නියුක්තිය සහ සේවා වියුක්තිය**

ආර්ථික අර්බුදයේ බලපෑම හේතුවෙන්, 2023 වසරේ දෙවන කාර්තුවේදී, සේවා වියුක්ති අනුපාතය සියයට 5.2 දක්වා වැඩි වූ අතර, ශ්‍රම බලකා දායකත්ව අනුපාතය සියයට 48.6 දක්වා අඩු වී ඇත. කෙසේ වුවද, ක්‍රමයෙන් වේගවත් වනු ඇතැයි අපේක්ෂිත ආර්ථික ක්‍රියාකාරකම් සමඟ, 2024 වසරේ දී සේවා වියුක්ති අනුපාතය සියයට 5 කට අඩු මට්ටමක පවතිනු ඇතැයි අපේක්ෂිතය. පොහොර ලබා ගැනීමේ හැකියාව තහවුරු කිරීම සමඟ කෘෂිකාර්මික අංශය පුනර්ජීවනය වනු ඇති අතර, ආනයන සීමා ඉවත් කිරීම සහ එහි ප්‍රතිඵලයක් ලෙස අමුද්‍රව්‍ය ලබා ගැනීමේ හැකියාව වැඩි වීම සමඟ කාර්මික අංශය සැළකිය යුතු ලෙස යථා තත්ත්වයට පත් වනු ඇත. මෙම දියුණුව 2024 වසරේ දී රැකියා උත්පාදනය සඳහා උපාකාරී වනු ඇත.

**විදේශ අංශය**

2022 වසරේ පළමු මාස නවය තුළ වාර්තා වූ ඇ. ඩො. මිලියන 4,093 ට සාපේක්ෂව, වෙළඳ හිඟය 2023 වසරේ සමාන කාල පරිච්ඡේදය තුළ දී ඇ. ඩො. මිලියන 3,342 දක්වා සංකෝචනය වුව ද, ආනයන සීමා ලිහිල් කිරීම සමඟ වෙළඳ ශේෂය 2023 වසරේ දී තවදුරටත් පුළුල් වීමට නියමිතය. කෙසේ වුවද, අපනයන ආදායම වැඩි වනු ඇතැයි අපේක්ෂිතය. මීට අමතරව 2024 වසරේ දී සංචාරක පැමිණීම් හා විශේෂ ප්‍රේෂණ ලැබීම් වර්ධනය වනු ඇතැයි අපේක්ෂිත අතර, ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම හා හිතකර ආර්ථික තත්ත්වයන් සමඟ සෘජු විදේශ ආයෝජන ගලා ඒම් ද වර්ධනය වනු ඇත. තවද, විනිමය අනුපාතය ද 2024 වසරේ දී ස්ථාවරව පවතිනු ඇත.

## මුදල් සමස්තයන්

මුදල් සැපයුම සුදුසු මට්ටමක පවත්වා ගෙන යාමට අපේක්ෂා කෙරේ. ආදායම් මූලික රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ප්‍රයත්න සහ 2024 වසරේ දී අඩු වෙතැයි අපේක්ෂිත අයවැය හිඟය සමඟ රජය සතු ව්‍යවසායයන් ප්‍රතිව්‍යුහගත කිරීම හා ඉන්ධන සහ විදුලිය සඳහා පිරිවැය ආවරණය කරන මිල ක්‍රමයක් හඳුන්වා දීම හේතුවෙන් රජයට ලබා දෙන ශුද්ධ ණය ක්‍රමයෙන් අඩු වනු ඇති අතර, පෞද්ගලික අංශයේ ආයෝජන සඳහා පහසුකම් සලසනු ඇත.

## ආදායම

ආදායම් ඇස්තමේන්තු සකස් කිරීම සඳහා භාවිතා කළ උපකල්පන ඇමුණුම III හි දක්වා ඇත.

## වියදම

වියදම් ඇස්තමේන්තු සකස් කිරීමට යොදාගත් උපකල්පන පහත සඳහන් වේ.

